# අලුත් කළ පදනමක් මත ගොඩනගන ලද නොනවතින ගම්‍යතාව

වාර්ෂික වාර්තාව 2024

SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
LIFE



ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්

වෘත්තීමයභාවය, ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව සහ අධිෂ්ඨානය
සමඟ ජීවිත ආරක්ෂා කිරීම සහ ජීවිතයේ ඉදිරිපත්වන බොහෝ
අවදානම් අවම කිරීම කෙරෙහි ඒකමතික අවධානය සහිත
දශක කිහිපයක් සමඟ, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ්
ලිමිටඩ් ශක්තිමත් පදනමක් මත එහි ප්‍රවනතා සැකසීමේ ගමන
ඉදිරියට ගෙන යයි. අපගේ ආරක්‍ෂාවේ පියාපත් ජාතින් අතර
ව්‍යාප්තව ඇති අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී පුද්ගලයින්ට සහ
පවුල්වලට සැනසීම සහ ආරක්ෂාව ලබා දෙමින්, දිගු කාලීන
රක්‍ෂණය සඳහා අසම සම කැපවීමකින් යුතුව, දිගු කාලීනව
ඔබ සහ ඔබගේ ආදරණීයන් ආරක්ෂා කිරීම සඳහා අපගේ
නොසැලෙන කැපවීම තුළ අපි නැවැත්විය නොහැක.

SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
LIFE

පටුන


## 4. අපගැන

5 ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් පිළිබඳ

6 අධ්‍යක්ෂ මණ්ඩලය

11 නායකත්ව කණ්ඩායම

18 මූල්‍යමය නොවන වැදගත් සිදුවීම්

20 මූල්‍යමය වැදගත් සිදුවීම්

## 21. නායකත්ව සමාලෝචනයන්

22 සභාපතිතුමාගේ පණිවිඩය

25 සමූහ විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

## 28. වාර්තාවේ පැතිකඩ

## 31. උපායමාර්ගය සහ අවධානය

32 ව්‍යාපාර ආකෘතිය

34 ප්‍රමාණාත්මක කරුණු

36 පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතා

38 උපායමාර්ගික ප්‍රමුඛතාවයන්

## 39. කළමනාකරණ විස්තර ප්‍රකාශය

40 මෙහෙයුම් පරිසරය

42 මූල්‍ය ප්‍රාග්ධනය

55 නිෂ්පාදිත ප්‍රාග්ධනය

58 බුද්ධිමය ප්‍රාග්ධනය

60 මානව ප්‍රාග්ධනය

66 සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

74 ස්වභාවික ප්‍රාග්ධනය

## 78. යහපාලනය සහ අවදානම් පාලනය

79 ආයතනික පාලන වාර්තාව

84 විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

86 ආයෝජන කමිටු වාර්තාව

87 අවදානම් කලමනාකරණ වාර්තාව

93 අනුකූලතා වාර්තාව

96 අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

# 97.

## මූල්‍ය වාර්තා


98 සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව

101 අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

102 ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම් ප්‍රකාශය

103 දිගුකාලීන රක්ෂකයාගේ ආයුගණක සහතිකය

104 වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණය

105 ස්වාධීන විගණක වාර්තාව

108 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

109 ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

111 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

112 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

114 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්


# 165.

## අතිරේක තොරතුරු


166 ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් ආදායම් ප්‍රකාශය

167 ඔප්පුහිමියන්ගේ අරමුදලේ මූල්‍ය කාර්යසාධනය

168 අතිරේක මූල්‍ය තත්ත්වය ප්‍රකාශය – ඔප්පුහිමියන්ගේ

169 අරමුදල් අනුව ආයෝජන ආදායම

170 දස වසරක ආදායම් ප්‍රකාශන සාරාංශය

172 ශාඛා ජාලය

178 ආයතනික තොරතුරු

179 වාර්ෂික මහා සභා රැස්වීමේ නිවේදනය

පෙරකලාසි ආකෘතිය ඇතුළත්ය


Scan to view this Annual Report
Online at https://www.srilankainsurance.com/en/about-us/annual-reports

# 4.

# අප ගැන


5 ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් පිළිබඳ

6 අධ්‍යක්ෂ මණ්ඩලය

11 නායකත්ව කණ්ඩායම

18 මූල්‍යමය නොවන වැදගත් සිදුවීම්

20 මූල්‍යමය වැදගත් සිදුවීම්

# ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් පිළිබඳ



රජයට අයත් සංස්ථාවක් ලෙස 1962 දී පිහිටුවන ලද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (SLIC) රක්ෂණ ක්ෂේත්‍රයේ ජාතියේ පුරෝගාමියා වන අතර, රටේ වඩාත් පළපුරුදු රක්ෂණ සපයන්නා වීමේ ගෞරවයට හිමිකම් කියයි. වඩාත් හොඳින් ජනතාවට සේවය කිරීමේ එහි ප්‍රධාන මෙහෙවර සමඟ යමින්, මෙම සමාගම එහි සේවාවල ලඟාවීම පුළුල් කිරීමට කැප වී සිටින අතර, නව්‍යකරණය, අගය එකතුකළ විසඳුම් අඛණ්ඩව ලබා දේ. ගනුදෙනුකාර පහසුව සහ සේවා අත්දැකීම කෙරෙහි මෙම නොසැලෙන අවධානය ක්ෂේත්‍රයේ මංසලකුණු අඛණ්ඩව තබන අතර රක්ෂණ වාතාවරණය තුළ සමාගමේ නායකත්වය ශක්තිමත් කරයි.

රක්ෂණ නියාමකගේ මාර්ගෝපදේශ හා රජයේ උපදෙස් සමඟ පෙළ ගැසෙමින්, මෙම සමාගම 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව නෛතික ප්‍රතිව්‍යුහගතකරණයක් සිදුකර ඇත. සමාගම හිමිකාර සමාගම් ව්‍යුහයක් යටතේ වෙනම නීතිමය ආයතන දෙකක් ලෙස වෙන් කරන ලද අතර, සම්පූර්ණයෙන් අයත් පරිපාලිත සමාගම දෙකක් එනම් ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLIC Life) සහ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් (SLIC General) ස්ථාපිත කිරීමට හේතු විය. මෙම ප්‍රතිව්‍යුහගතකරණය එක් එක් සමාගමට අදාළ ව්‍යාපාරය කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කිරීම සඳහා කැපවීම ශක්තිමත් කරන අතර වඩා ඉහළ වටිනාකම් ලබා දීමට සහ සිය ඉලක්කගත වෙළෙඳපොළ අංශවල අසමසම අවශ්‍යතා හඳුනා ගැනීමට හැකියාව ඇත.

ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියා ලෙස, අපගේ ලඟාවීම විශාල වන අතර ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයෙහි වෙනස්වන අවශ්‍යතා විසඳීමට සමාජයේ සෑම කොටසක් කරා ලඟාවෙමින් අපගේ මූලයන් ශක්තිමත්ය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සහතික කළ මනාව පුහුණුව ලත් ජීවිත රක්ෂණ වෘත්තීමය කණ්ඩායම විවිධ නිෂ්පාදන කළඹ තුළින් අවශ්‍යතාව පදනම් නිෂ්පාදන පිරිනමමින් ප්‍රජාවට සේවය කරන අතර, ජීවිතයේ සෑම මොහොතකම අපගේ රක්ෂණ ඔප්පු හිමියන් සමඟ රැඳී සිටිමින්, ගනුදෙනුකරුවන්ගේ දත්ත සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් උපරිම සැලකිල්ලක් දැක්වීම.

බැංකුකරණය, මූල්‍ය, සෞඛ්‍යාරක්ෂාව, විදුලි බලය හා බලශක්තිය, සහ සත්කාර සේවාවන් කිහිපයක් විචක්ෂණ ආයෝජන මත ඔරොත්තුදෙන ප්‍රතිලාභ, තිරසාර මෙහෙයුමට දායක වීම සහ වර්තමනයට අදාළ සහ අනාගතයට සූදානම්බව සහතික කරයි. සියලුම ශ්‍රී ලාංකිකයින්ට රක්ෂණ විසඳුම් පිරිනැමීමේ විධි නියෝගයක් සමඟ, ජාතියේ ආර්ථික ප්‍රතිසාධන ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකා රජය සමඟ අපි අඛණ්ඩව හවුල් වී ඇත.

## අපගේ අරමුණ

ගලපනලද ජීවිත රක්ෂණ විසඳුම් සමඟ සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත ශක්තිමත් කරමින්, කාර්යක්ෂම හා සහකම්පන සේවා පිරිනමමින් සියලු දෙනාට රක්ෂණය කරා පිවිසුම අපි සකස් කරමු.

## අපගේ දැක්ම

ජීවිත රක්ෂණ සංගතිය තුළ ජාතියේ පළමු තේරීම බවට පත් වීම.

## අපගේ මෙහෙවර

ගතික ජීවිත රක්ෂණ අවශ්‍යතා සපුරාලීමට සේවා සකස් කිරීම සහ නිර්මාණය, අපගේ ආයතනික සංස්කෘතිය තුළ තිරසාරභාවය, ඔරොත්තුදීම සහ සියලුම දෙනා ඇතුළත් කිරීම සහ පාර්ශ්වකාර වටිනාකම නිර්මාණය.

## අපගේ වටිනාකම්

**අන්‍යෝන්‍ය විශ්වාසය හා ගරුත්වය:** ස්ත්‍රීපුරුෂභාවය, ජාතිය, කුලය, ආගම හෝ වෙනත් යම් වෙසන්වීම නොසලකා පුද්ගලයින් සහ තනතුරු සඳහා ගෞරවය විදහා දැක්වීම සෑම සේවකයෙකුගෙන්ම අපේක්ෂා කෙරේ. අධීක්ෂණයින්, සහකාරයින්, සමානයින්, සහයකයින්, ගනුදෙනුකරුවන් සහ ජනතාවගේ සාමාජිකයින් ඇතුළුව ආයතනයේ සියලුම පාර්ශ්වකරුවන්ට මෙය අදාළ වේ. මෙම ආකල්පය පාර්ශ්වකරුවන් සමඟ සියලුම මැදිහත්වීම්වල දී පිළිබිඹු විය යුතුය.

**එකමුතුබව:** සියලුම පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කිරීමේදී සහ උපකාරී වැඩ කණ්ඩායමක් ගොඩ නැගීමේ අරමුණ සමඟ සහය, සම්පත්, සහ සහයෝගිතාව පුළුල් කිරීම මගින් සෑම අවස්ථාවකදීම පුද්ගල හෝ කණ්ඩායම් අරමුණුකළ අරමුණු ඉටු කිරීම කරා වැඩ කිරීමේදී මෙම හැසිරීම විදහා දැක්වීම සෑම සේවකයෙකුගෙන්ම අපේක්ෂා කෙරේ.

**නිවැරදි ආචාරධර්ම සහ අවංක බව:** සමාගම සේවකයින්ගේ ස්ථිර අවංකකම සහ ශක්තිමත් සදාචාරාත්මක චර්යාව ශක්තිමත්ව ප්‍රවර්ධනය කරන අතර, සෑම සේවකයෙකුගෙන්ම සෑම අවස්ථාවකදීම සදාචාරාත්මක සහ සමාජීය වශයෙන් පිළිගත හැකි ආකාරයෙන් ඔවුන්ගේ පුද්ගලික හා වෘත්තීමය රාජකාරි කරගෙන යනු ඇතැයි බලාපොරොත්තු වේ.

**වෘත්තීමය කැපවීම:** සමාජයට අයත් ඉහළ සාදාචාරාත්මක සම්මත සමඟ පෙළ ගැසෙමින් සමාගමේ පාර්ශ්වකරුවන් සමඟ පුද්ගලික හා වෘත්තීමය මැදිහත්වීම් තුළ සාධාරණ, විධිමත් හා කාර්යක්ෂම හැසිරීම සහතික කිරීම සෑම සේවකයෙකුගෙන්ම අපේක්ෂා කෙරේ.

**නොනවතින විශිෂ්ඨත්වය:** සමාගමේ නියමිත නීති හා රෙගුලාසි සහ ප්‍රමිති පිළිපදිමින් පාර්ශ්වකාර අපේක්ෂාවන් ලබාදීම සහ ඉක්මවායාම කරා සියලුම උත්සාහයන් යොමු කළ යුතුය.

# අධ්‍යක්ෂ මණ්ඩලය



රොහාන් බුල්ජන්ස් මහතා

දුෂ්මන්ත තොටවත්ත මහතා

නුසිත් කුමාරතුංග මහතා



කේ. රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා

නීල් උනම්බුව මහතා ජනාධිපති නීතිඥ

රජීව් ධර්මේන්ද්‍ර මහතා

ශිරෝමි කෝඳාගොඩ මිය

# අධ්‍යක්ෂ මණ්ඩලය



### නුසිත් කුමරතුංග මහතා

සභාපති

නුසිත් කුමාරතුංග මහතා දශක තුනක අත්දැකීම සහිත කීර්තිමත් මූල්‍ය වෘත්තිකයෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහය සාමාජිකයෙක් වන අතර, සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙක් ද වේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වතු කළමනාකරණය හා ඇගැයීම පිළිබඳ විද්‍යාපති උපාධියක් ඔහු සතුවේ. ඔහුගේ වෘත්තීය ප්‍රයිස් වොටර්හවුස් කූපර්ස් හි ආරම්භ කළ අතර, 2000 වසර තුළ, නුසිත් කුමාරතුංග සමාගම නමින් ඔහුගේම සමාගමක් ආරම්භ කළේය. එය විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) කෙරෙහි අවධානය යොමුකළ විගණනය, බදු සැලසුම් කිරීම, සහ ව්‍යාපාර උපදේශන සේවා පිරිනමන මනාව පිළිගත් ආයතනයකි.

කුමාරතුංග මහතා ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය කිරීමේදී ප්‍රධාන තැනැත්තෙක් වූ අතර ව්‍යවසායකයින්ට ඔවුන්ගේ මූල්‍ය කළමනාකරණ නිපුනතා වැඩිකර ගැනීමට ඔවුන්ට සහයවීමට ලෝක බැංකුව හා මුදල් අමාත්‍යාංශය විසින් අරමුදල් යොදන ලද පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත. එමෙන්ම ඔහු බදුකරණය සහ ආර්ථික ප්‍රතිපත්ති වර්ධනය කිරීමේ උපදේශක මණ්ඩලවල සේවය කරමින් ජාතික ආර්ථික සාකච්ඡාවන් හී මැදිහත් වී ඇත. වර්තමානයේ කුමාරතුංග මහතා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් සභාපතිවරයා වන අතර ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා හොස්පිට්ල් කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක්ද වේ.



### දුෂ්මන්ත තොටවත්ත මහතා

අධ්‍යක්ෂ

දුෂ්මන්ත තොටවත්ත මහතා 2022 අගෝස්තු 22 දින සිට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) සහ 2023 ඔක්තෝබර් 06 දින සිට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු කැන්විල් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ එල්සීබී ෆිනෑන්ස් පීඑල්සී හි සභාපතිවරයාද වේ.

තොටවත්ත මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජ උපාධියක් (විශේෂ උපාධිය) සහිත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහය සාමාජිකයෙක් වන අතර, කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය ආර්ථිකයන් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකි. ඔහු ප්‍රවීන නායකයෙක් වන අතර, ඔහුට මූල්‍ය කළමනාකරණය, ආයතනික පාලනය, උපායමාර්ගික කළමනාකරණය සහ මහජන සම්බන්ධතා සමඟ රජයට අයත් ව්‍යවසාය සහ පුද්ගලික ආයතනවල ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක යන තනතුරුවල සාර්ථක ගමන් වාර්තාවක් සමඟ විස්තීර්ණ පළපුරුද්ද ඇති අතර වසර 40කට වැඩි පළපුරුද්ද ඇත.



### රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා

අධ්‍යක්ෂ

රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා 2022 සැප්තැම්බර් 30 දින සිට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) සහ 2023 ඔක්තෝබර් 06 දින සිට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් හි (SLICLL) අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

පත්මප්‍රිය මහතා කීර්තිමත් රාජ්‍ය සේවකයෙන් වන අතර ඔහුට රාජ්‍ය අංශයේ විවිධ තනතුරුවල වසර 35කට වැඩි පළපුරුද්ද ඇත. ඔහු දැනට මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරයි.

ඔහු කැලණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (භෞතික විද්‍යාව) උපාධිය ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලය



### රජීව් ධර්මේන්ද්‍ර මහතා

අධ්‍යක්ෂ

2019 මාර්තුවල, ධර්මේන්ද්‍ර මහතා මාස් සමූහයේ විශාලතම ව්‍යාපාර ඒකකය වන, මාස් ඉන්ටිමේට්ස් හි නායකත්වය භාරගන්නා ලදී. මාස් හී වසර 21කට වැඩි පළපුරුද්ද ලබාගනිමින්, ධර්මේන්ද්‍ර මහතා 2003 දී යුනිචෙලා පානදුර - සාමාන්‍යාධිකාරි ලෙස බැඳුණු අතර, 2004 දී MAS/Sara Lee Courtaulds හවුල් ව්‍යාපාරයේ අධ්‍යක්ෂ වෙළෙඳ භාණ්ඩ කාර්යභාරයට උසස් කරන ලදී. ඔහුගේ කාර්යභාරය 2006 දී එවකට ඉන්ටිමේට්ස් හී නිෂ්පාදන පෙළේ ප්‍රධාන ගනුදෙනුකරුවන් හතර දෙනෙකු කෙරෙහි අවධානය යොමු කළ මාස් ඉන්ටිමේට්ස් හි ව්‍යාපාර අධ්‍යක්ෂ දක්වා පුළුල් විය. 2010 දී ඔහු Silueta හි ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්කරන ලද අතර එහිදී ඔහු සාර්ථක ඇඟලුම් සහ තාක්ෂණික නව්‍යකරණ කේන්ද්‍රය ලෙස Silueta පරිනාමය මෙහෙයවීම සඳහා වගකීම දරා ඇත. ඉන්පසුව ඔහු මාස් ඉන්ටිමේට්ස් හි අධ්‍යක්ෂ - සිමිත සන්නාම ලෙස පත්කරන ලද අතර 2016 සිට ප්‍රධාන විධායක නිලධාරී ලෙස ඔහුගේ පරිනාමනය දක්වා මාස් ඉන්ටිමේට්ස් හි ප්‍රධාන අලෙවිකරණ නිලධාරීගේ කාර්යභාරය සිදුකරන ලදි. මාස් ඉන්ටිමේට්ස් හි ඔහුගේ වගකීම්වලට අමතරව, ධර්මේන්ද්‍ර මහතා මාස් නවෝත්පාදන මණ්ඩලයට නායකත්වය ලබා දුන් අතර එම මණ්ඩලය සමස්ත මාස් සමූහ සමාගම් අතර නවෝත්පාදන න්‍යාය පත්‍රය හා ගමන්මග තීරණය කරයි.

ඔහු ලන්ඩන් කින්ග්ස් කොලීජියෙන් ගණිතය හා ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය දරන අතර ලන්ඩන් ආර්ථික විද්‍යා පාසලෙන් මූල්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගෙන ඇත. ඔහුගේ විධායක අධ්‍යාපනය හාවර්ඩ් සහ INSEAD හි ව්‍යාපාර පාසල්වලින් විය. ඔහු 2025 ජනවාරි 01 දින සිට විධායක නොවන අධ්‍යාක්ෂවරයාගේ භූමිකාව තුළ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.



### රොහාන් බුල්ජන්ස් මහතා

අධ්‍යක්ෂ

න්‍යෂ්ටික, මූල්‍ය සේවා, තොරතුරු තාක්ෂණ, ඉන්ධන හා ගෑස් අංශවල ජ්‍යෙෂ්ඨ වෘත්තිකයෙක් වන, බුල්ජන්ස් මහතා ආයතනයේ උපායමාර්ගික වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට ටෙලිකොම්, ඩිජිටල් පරිනාමනය, දත්ත විශ්ලේෂණ, සයිබර් ආරක්ෂාව, ඩිජිටල් වාණිජ්‍ය සහ මතුවන තාක්ෂණයන් හි ඉටුකිරීම් තුළින් නායකත්වය ලබාදීමට ස්ථානගත කර ඇත. ඔහු ඕස්ට්‍රිලියාවේ රෝයල් මැල්බෝර්න් තාක්ෂණික ආයතනයෙන් තොරතුරු තාක්ෂණය (MBIT) පිළිබඳ ව්‍යාපාර ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. සේවා විශිෂ්ටත්වය, පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, නව ආදායම් මාර්ග උත්පාදනය කිරීම සහ ව්‍යාපාර විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා විශාල පරිවර්තනීය තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති මෙහෙයවීම කෙරෙහි අවධානය යොමු කරමින් තොරතුරු තාක්ෂණ උපාය මාර්ග හා බැඳුණු ව්‍යාපාර නිර්මාණය කිරීමේ අත්දැකීම් ඔහු සතුය.

බුල්ජන්ස් මහතා ව්‍යාපාර ඵලදායිත්වය සහ හැකියාව වර්ධනය කිරීමට ව්‍යාපාර නවෝත්පාදනය, ප්‍රශස්ත සේවා ලබාදීම, පාරිභෝගික සහභාගීත්වය සහ තොරතුරු තාක්ෂණ පරිවර්තන ව්‍යාපෘති ගෙන එන ව්‍යවසාය ගෘහ නිර්මාණ/ව්‍යාපාර ගෘහ නිර්මාණ ශිල්පය ස්ථාපිත කර ඇත. ඔහුගේ ප්‍රවීනත්වයට ආයතනයේ තරඟකාරී වාසිය ඇගයීම, ඩිජිටල් අවස්ථා සහ තර්ජන හඳුනා ගැනීම සහ ඩිජිටල් උපායමාර්ගයක නිශ්චිත තරඟකාරී තත්ත්වය ශක්තිමත් කිරීමේ හැකියාව ඇතුළත්ය. සමස්ත ටෙලිකොම් වටිනාකම් දාමය සහ බැංකු ඩිජිටල් පරිවර්තන ගමන පුරා ව්‍යාපාර ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාව මෙහෙයවීමේදී සහ ව්‍යාපාරයට වටිනාකමක් ලබා දීම සඳහා තොරතුරු තාක්ෂණ මෙහෙයුම් ආකෘති ස්ථාපිත කිරීමේදී ඔහු දක්ෂයෙකි.

ජාත්‍යන්තරව පළපුරුදු බුල්ජන්ස් මහතාගේ ප්‍රවීනතාව එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕස්ට්‍රේලියාව, ටැන්සානියාව, ඉන්දියාව, ඊජිප්තුව, සෞදි අරාබිය සහ ශ්‍රී ලංකාවේ බොහෝ සමාගම් විසින් ලබාගනී. විචක්ෂණ හා පිරිවැය ඵලදායී ආකාරයෙන් තාක්ෂණය භාවිතා කරමින් ලාභදායි ප්‍රතිඵල ලබාදීමේදී විචක්ෂකයෙක් වන අතර විශාල ව්‍යාපාති කිහිපයක් හරහා බහුසංස්කෘතික කණ්ඩායම් මෙහෙයවයි. ඩිජිටල් තාකත්ෂණය හා එහි බලපෑම (IoT, කෘතීම බුද්ධිය, ඩිජිටල් සේවා ස්ථානය, Cognitive Computing, Blockchain, Big Data, Cloud, සමාජ මාධ්‍ය යනාදිය) යන ක්ෂෙත්‍රවල සුවිශාල දැනුම් සම්භාරයක් හා අවබෝධයක් ඔහු සතුය.



### නීල් උනම්බුව මහතා

අධ්‍යක්ෂ

නීති ක්ෂෙත්‍රයෙහි දශක තුනකට වැඩි පළපුරුද්ද සහිත නීති වෘත්තිකයෙක් වන, ජනාධිපති නීතිඥ උනම්බුව මහතා විශ්‍රාමික අතිරේක සොලිසිටර් ජනරාල් වේ. ඔහුගේ කාලසීමාව තුළ, ඔහුගේ ප්‍රවීනතාව ඉහළ පැතිකඩ නීති විමර්ෂණ, නියාමන අනුකූලතාව සහ රජයේ උපදේශන කාර්යභාරයන් හී ආයෝජනය කර ඇත. බුද්ධිමය දේපල නීතිය, වානිජ නීතිය සහ මූල්‍ය නීතිය පිළිබඳ විශේෂඥයෙක් වන, ඔහු ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝර්ජ් වොෂින්ටන් විශ්ව විද්‍යාලයෙන් සහ ඉතාලියේ ටියුරින් විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධි දෙකක් ලබා ඇත. ඔහු සයිබර් නීතිය, ගුවන් නීතිය සහ න්‍යෂ්ටික ආරක්ෂණ ක්‍රම පිළිබඳ ජාත්‍යන්තර පුහුණුවක් ලබා ඇත.

නීතිපති දෙපාර්තමේන්තුවේ ඔහුගේ ධුරය තුළ, ඔහුගේ නීතිමය උපදේශය මුදල් අමාත්‍යංශය, ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා ගෙන ඇත. ඊට අමතරව, ඔහු ශ්‍රී ලංකා න්‍යෂ්ටික බලශක්ති අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ රජයේ වෙනත් ආයතන කිහිපයක් සඳහා නීති උපදේශකයෙක ලෙස සේවය කර ඇත. ඔහු දැනට නීතිය ක්‍රියාත්මක කිරීමෙහි යෙදී සිටින අතර ශ්‍රී ලංකා ටෙලිකොම් සහ මොබිටෙල් කම්පැනි ලිමිටඩ්හී අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කරයි.

# අධ්‍යක්ෂ මණ්ඩලය



**ශිරෝමී කෝදාගොඩ මහත්මිය**

සමාගම් ලේකම්

ශිරෝමී කෝදාගොඩ මහත්මිය 2024 අප්‍රේල් 02 දින සිට සමාගම් ලේකම් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලදී. ඇය සමාගම් ලේකම් කාර්යාලයේ ක්‍රමවත් පරිපාලනය සහතික කිරීමේදී සහ සමාගම් පනතේ විධිවිධානවල අවශ්‍යතාවන්ට අනුකූලතාව දක්වමින් අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

ඇය සතුව පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියක් (BA) ඇත. ශ්‍රී ලංකා නීති විද්‍යාලයට බැඳුණු ඇය 1992 දී නීතිඥවරියක් ලෙස සිය වෘත්තිය ආරම්භ කර ඇත.

මෙම සමාගම හා බැඳීමට පෙර, කෝදාගොඩ මහත්මිය වසර 30ක් සඳහා කොකාකෝලා බෙවරේජස් ශ්‍රී ලංකා ලිමිඩට් හි සේවය කර ඇත. එම සමාගමේ ඇයගේ වෘත්තිය තුළ අධ්‍යක්ෂ (නීතිය හා පාලනය) සහ දේශීය සදාචාර නිලධාරිණී (LEO) ලෙස ඇය කටයුතු කර ඇත. එම පත්වීමට පෙර, ඇය අභ්‍යන්තර පොදු නීති උපදේශකවරිය ලෙස මෙන්ම එම සමාගමේ නීති නිලධාරිනී සහ කළමනාකරු - නීති ලෙස කටයුතු කර ඇත. ඇය දශකයට වැඩි කාලයක් කොකාකෝලා බෙවරේජස් හී සමාගම් ලේකම් ලෙස සේවය කර ඇත.

කෝදාගොඩ මහත්මියට ආයතනික නීති කටයුතු, අනුකූලතාවය, පාලනය, සදාචාර, නිෂ්පාදන වගකීම් නඩුකීම, සහ සිවිල් සහ කාර්මික නඩුකීම යන ක්ෂෙත්‍රවල වසර 30කට අධික වෘත්තීමය නීති පළපුරුද්ද ඇත. කොකාකෝලා බෙවරේජස් හී ඇයගේ වෘත්තීය කාලය තුළ, ඇය ආයතනික පාලන ක්‍රියාවලි, ව්‍යවස්ථාපිත අනුකූලතාව සහ අංශයේ අනුකූලතා පාලන තන්ත්‍ර සංවර්ධනය කර පුළුල් වශයෙන් දායක වී ඇත.

# නායකත්ව කණ්ඩායම



**චන්දන එල්. අලුත්ගම මහතා**

සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී
B.com (Sp), CMgr FCMI (UK), MBA, ANZIIF (ජ්‍යෙෂ්ඨ සාමාජික) CIP

අලුත්ගම මහතා 2018 දී ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ප්‍රධාන විධායක නිලධාරී ලෙස රාජකාරී භාරගෙන ඇත. ඔහුට රක්ෂණ කර්මාන්තය තුළ විවිධ ක්ෂේත්‍රයන් හී වසර 33කට වැඩි පළපුරුද්ද ඇත. ඔහුගේ ගමන්මඟ සීටීසී ඊගල් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් හි 1992 දී ආරම්භ කළ අතර, එහිදී ඔහුගේ වෘත්තිය ගොඩ නැගීම ඔහු ආරම්භ කර ඇත. වසර ගණනාවක් පුරා, ඊගල් ඉන්ෂුවරන්ස් පීඑල්සී (සූරිච් මූල්‍ය සේවා සමූහයේ සාමාජික) සහ එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී වැනි පිළිගත් ආයතනවල ජ්‍යෙෂ්ඨ තනතුරු රාශියක් හොබවා ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි ඔහුගේ වර්තමාන තනතුර භාර ගැනීමට පෙර, අළුත්ගම මහතා එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් හි ප්‍රධාන ව්‍යාපාර නිලධාරියා සහ ප්‍රධාන නිලධාරියා ලෙස කටයුතු කළේය. ඔහු සිය රක්ෂණ වෘත්තියට අමතරව, දේශීය හා ජාත්‍යන්තර සංගම් කිහිපයකම නායකත්ව තනතුරු දරා ඇත. ඔහු දැනට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්හි ප්‍රධාන නිලධාරියා වන අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ ආසන්නතම හිටපු සභාපතිවරයා ද වේ.

ඔහුගේ වෘත්තිය ජයග්‍රහනයන්ට අමතරව, අලුත්ගම මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පශ්චාත් උපාධි ඒකකයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙස සේවය කරමින් පසුගිය දශක දෙකකට අධික කාලයක් අධ්‍යාපනය සඳහා වටිනා දායකත්වයන් සිදුකර ඇත.

ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී උපාධිය ලබා ඇත. ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයේ වරලත් කළමනාකරුවෙක් (CMgr FCMI) ද ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තයේ රක්ෂණය හා මූල්‍ය ආයතනයේ (ANZIIF ජ්‍යෙෂ්ඨ සාමාජික) සාමාජිකයෙක් ද වේ. අලුත්ගම මහතා රක්ෂණය සහ බැංකු රක්ෂණය පිළිබඳ දේශීය හා විදේශීය සම්මන්ත්‍රණ සඳහා පර්යේෂණ පත්‍රිකා රැසක් ඉදිරිපත් කර ඇති අතර ඔස්ට්‍රියාවේ වියානා හි Generali Insurance AG සහ සිංගප්පූරුවේ NUS Business School හි ඇතුළුව දේශීය හා විදේශීය ආයතන කිහිපයකින්ම සවිස්තර පුහුණුව ලබා ඇත.



**ආලෝක ජයවර්ධන මහතා**

ප්‍රධාන තොරතුරු නිලධාරී
DCSD, HDCBS (NIBM), BSc (MIS), PGDBFA (ICASL), MBA, PMP, SAP, CISM, දත්ත විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිධාරී

2020 සැප්තැම්බර් 07 දින Colombo Dockyard PLC අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කළ, ආලෝක ජයවර්ධන මහතා තොරතුරු තාක්ෂණය, ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ සහ ව්‍යාපෘති කලමනාකරණ ක්ෂේත්‍රයන්හි වෘත්තීය විධායකයෙකු වන අතර විදුලි සංදේශන, නිෂ්පාදන, අලෙවිකරණ හා බෙදාහැරීම්, ප්‍රාග්ධන වෙළෙඳපොල සහ රක්ෂණය වැනි ව්‍යාපාර අංශ ගණනාවක වසර 23 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත. ඔහු දැනට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්හි ප්‍රධාන තොරතුරු නිලධාරී ලෙස සේවය කරයි.

ජයවර්ධන මහතා අයර්ලන්තයේ ඩබ්ලින් විශ්ව විද්‍යාලයෙන් කලමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ගෙන ඇති අතර ඔස්ට්‍රේලියාවේ සදර්න් ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශාරද උපාධිය ලබා ගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර හා මූල්‍යකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබා ඇත. ඔහු PMP සහතික ලත් ව්‍යාපෘති කලමනාකරුවෙකු වන අතර, ඇමෙරිකාවේ CISM සහතික ලත් තොරතුරු ආරක්ෂණ කලමනාකරුවෙක්ද වේ. තවද, ඔහු අලෙවිකරණය හා බෙදාහැරීම පිළිබඳ SAP සහතික ලත් උපදේශකයෙකු ද වේ. ඊට අමතරව, ඔහු එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් දත්ත විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන අවසන් කර ඇති අතර, මේ වන විට ඔහු මැලේසියාවේ ඒෂියා ඊ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය හදාරමින් සිටී.

# නායකත්ව කණ්ඩායම



**දයාරත්න පෙරේරා මහතා**

ප්‍රධාන නිලධාරී - ජීවිත

BSc (Hons), FCII, වරලත් රක්ෂක MBA (PIM-USJ), ANZIIF (Fellow) CIP, ව්‍යාපාර පරිපාලක ආචාර්ය උපාධිය සඳහා කියවීම (PIM-USJ)

දයාරත්න පෙරේරා මහතාට රක්ෂණ ක්ෂේත්‍රයෙහි වසර 26කට වැඩි පළපුරුද්ද ඇත. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබාගෙන ඇති අතර භෞතික විද්‍යාව පිළිබඳ දෙවන පෙළ (ඉහළ සමාර්ථය) BSc. (Hons) ගෞරව විශේෂ උපාධියක් ඔහු සතුය. උපාධිය ලබාගැනීමෙන් පසු, එම විශ්ව විද්‍යාලයේම අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කොටස්කරුවෙක් වීමට ඔහුට වරප්‍රසාද හිමි වු නමුත් ඔහුගේ කැමැත්ත මත එම තනතුරෙනි ඉවත් වී ආයතනික අංශයට බැඳී ඇත.

පෙරේරා මහතා වරලත් රක්ෂකයෙක් සහ ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයේ (FCII) සහය සාමාජිකයෙක් ද වේ. එමෙන්ම ඔහු ඕස්ට්‍රේලියාව සහ නවසීලන්ත රක්ෂණ හා මූල්‍ය ආයතනයේ සහය සාමාජිකයෙක් ද වේ – ANZIIF (Fellow) CIP.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් (PIM) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇති අතර දැනට එම විශ්ව විද්‍යාලයෙන්ම ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය හදාරමින් සිටි.

වර්තමානයේ ඔහු සී බැන්ක් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ් හී අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර ඔහු ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්හි විශේෂ නිලධාරී (Specified Officer) ලෙස සේවය කරයි.



**නාමලී ඒ සිල්වා මහත්මිය**

ප්‍රධාන ව්‍යාපාර නිලධාරිණී

MBA, MCIM (UK), Chartered Marketer, Prof. Dip. in Marketing-CIM, ACIB (UK)

නාමලී සිල්වා මහත්මිය බැංකු සහ මූල්‍ය සහ රක්ෂණ ක්ෂේත්‍ර පුරා විහිදෙන වසර 37කට වැඩි අලෙවිකරණ හා විකුණුම් පළපුරුද්දෙන් සමන්විත වේ. ඒෂියා ඉ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ CIM (UK) වෙතින් අලෙවිකරණය පිළිබඳ වෘත්තීමය ඩිප්ලෝමාවක්ද සමඟින්, ඇය ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි ප්‍රධාන ව්‍යාපාර නිලධාරිණී ලෙස ඇයගේ වත්මන් තනතුර වෙත පුළුල් දැනුමක් සහ ප්‍රවීනතාව ලබා දේ.

ඇයගේ වෘත්තීය ගමන්මඟ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හී 1987 දී ආරම්භ කර ඇති අතර, පසුව 1990 සිට 1995 දක්වා එක්සත් ජනපදයේ ලන්ඩන් හී Nationwide Building Society සහ Lloyds බැංකුවේ සේවය කර ඇත. ශ්‍රී ලංකාවට ආපසු පැමිණි නාමලී මහත්මිය, 1996 දී සන්නාම කළමනාකාරිණියක් ලෙස සෙලාන් බැංකව හා එක්වෙමින් මෙරට මූල්‍ය ක්ෂේත්‍රය තුළ ඇයගේ වත්මන් වෘත්තීය ගමනේ ආරම්භය සනිටුහන් කළාය.

2003 දී, ඇය මහජන බැංකුව සමඟ එක්වූ අතර එහිදී ඇය 2006 දී ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හා එක්වන තුරු අලෙවිකරණ සන්නිවේදන තුළ අතිමහත් කාර්යභාරයක් ඉටු කරන ලදී. අලෙවිකරණ සන්නිවේදන අධීක්ෂණයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් තුළ ඇරඹි ඇයගේ වෘත්තීය භූමිකාව වර්තමානයේ පුළුල් පරාශයක වගකීම් ආවරණය කරයි. විශේෂයෙන් 2023 දී ඇය ප්‍රධාන ව්‍යාපාර නිලධාරිණිය ලෙස ඇයගේ වර්තමාන තනතුර භාරගැනීමට පෙර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/අලෙවිකරණ සහ බෙදාහැරීම (ජීවිත) ප්‍රධානී ලෙස සේවය කර ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි වසර 18ක් වන ඇයගේ සේවා කාලය පුරා, නාමලී මහත්මිය ආයතනයේ වර්ධන ගමන්මඟ හැඩගැස්වීමේදී තීරණාත්මක වී ඇත. ඇයගේ උපායමාර්ගික තීක්ෂණභාවය සහ නායකත්වය ආයතනයේ වෙළෙඳපොල ප්‍රසිද්ධියට සැලකියයුතු ලෙස දායක වී ඇත.

එමෙන්ම ඇය 2024 දී ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ අලෙවිකරණ හා විකුණුම් සංසදයේ සභාපතිනිය ලෙස වසර තුනක කාලය සම්පූර්ණ කර ඇත.

## නායකත්ව කණ්ඩායම



**ශ්‍රියානි කුලසිංහ මහත්මිය**

ප්‍රධාන මූල්‍ය නිලධාරිණී
FCA, ACMA, MBA-Finance (කොළඹ), B.Com (ගෞරව) Spl.

ශ්‍රියානි කුලසිංහ මහත්මිය 2002 දී මූල්‍ය ක්ෂෙත්‍රයෙහි ඇයගේ වෘත්තිය ආරම්භ කළ අතර, විගණනය, මූල්‍ය, සහ බදුකරණය පිළිබඳ වසර 23 කට වැඩි පළපුරුද්ද ඇය සතුය. ඇය 2009 දී ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හා එක් වූ අතර, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වසර 16ක කැප වූ සේවයක් සමඟ දැනට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් හි ප්‍රධාන මූල්‍ය නිලධාරිනී තනතුර දරයි. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහය සාමාජිකයෙක් වන අතර, 2003 දී මූල්‍ය ගිණුම්කරණ ත්‍යාගය හැඳින්වීම (Introduction to Financial Accounting prize) ප්‍රදානය කරන ලදී.

ඊට අමතරව, ඇය ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවකි (associate member). ඇය කැලණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (ගෞරව) විශේෂ උපාධිය ලබාගෙන ඇති අතර, කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත.

2011දී ඇය ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලබන රක්ෂණ පිළිබඳ ඩිප්ලෝමාව සඳහා රක්ෂණ නීතිය හා රෙගුලාසිය පිළිබඳ පාඨමාලා කථිකාචාර්යවරියක් ලෙස සේවය කලාය. 2022 පෙබරවාරි සිට, කුලසිංහ මහත්මිය සී බැන්ක් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ් හී විධායක නොවන අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කරමින් සිටින අතර, සී බැන්ක් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ් හී විගණන හා අනුකූලතා කමිටුවේ සාමාජිකාවකි

# නායකත්ව කණ්ඩායම

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු



**චමින්ද අතාවුද මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ජීවිත (තාක්ෂණික)
BSc.(Hons), FCII, AIII, ANZIIF (Fellow) CIP, MBA (Colombo), Chartered Insurer



**ශෂික රණසිංහ මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ආයෝජන
MBA, CFA, FRM, BSc(Engineering), ACMA, AIB



**ජගත් වෙල්ගම මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ජාතික විකුණුම් (ජීවිත)
MBA, MABE (UK), Graduate Dip in Mgt. (Aus), PG Dip. – Marketing Mgt. (USJ), NDHTD (SLITAD), Ad. Dip in Marketing. Mgt. (USJ), Dip. in Mass Com. (USJ), Dip. in NIT, MSLIM



**උදයප්‍රිය ඉබුල්පිටියලාගේ මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මානව සම්පත්
BSc HRM (Special) (Hons) – SJP (SL), Chartered Member – CIPM (SL), Certificate in Business Administration – NIBM
2025 මැයි 22 දින සිට පත්කර ඇත

# නායකත්ව කණ්ඩායම

## සහකාර සාමාන්‍යාධිකාරිවරු



**මහේන්ද්‍ර පෙරේරා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී – පරිපාලන
Attorney-at-Law, LLB(Sri Lanka), MBA in HRM (OUSL), PGDip in HRM (OUSL), PGDip in Archae (UOK), NDES(IET), GCGI(UK), MIIE(SL), I Eng. AMCIPM



**ජීවන්ත වැලිහිඳ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී – ඉංජිනේරු සේවා
BSc (Eng)



**කසුන් සමීර මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී – ආයතනික ව්‍යාපාර හා අලෙවිකරණ
Chartered Marketer, Pgd Dip in Marketing (CIM, UK), CPM (Asia Pacific), MCIM, Pgd Dip in Management (UoW UK), MBA (UWTSD, UK)



**අමන්ද පෙරේරා මහතා**
ප්‍රසම්පාදන ප්‍රධානී
HND (ISMM), Dip. In Hardware Eng.



**දුමින්ද පීරිස් මහතා**
කලාප ප්‍රධානී – මධ්‍යම හා දකුණ
Ndip. In SM (SL)



**උපුල් රත්නකුමාර මහතා**
වැඩබලන කලාප ප්‍රධානී – වයඹ හා බස්නාහිර
MBA (Cardiff Metropolitan)



**පලන්තිරන් සතියන් මහතා**
කලාප ප්‍රධානී – උතුරු හා නැගෙනහිර
B com(Hons) PG Dip in Pub. Administration. M.A.



**ප්‍රශාන් ජයතිස්ස මහතා**
ආයුගණක ප්‍රධානී
Fellow Member (FIA), Fellow Member (FCII), CFA Charterholder, CFA Institute

# නායකත්ව කණ්ඩායම

## ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්



**රුවන් ද සිල්වා මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ජීවිත



**සුජීවා නානායක්කාර මහත්මිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ජීවිත



**අංජන ධර්මසේන මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ජීවිත



**නිශාන්ති පෙරේරා මහත්මිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ජීවිත



**සුරාජි හෙට්ටිආරච්චි මහත්මිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – මෘදුකාංග සංවර්ධනය



**සමිත පෙරේරා මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ආයුගනක



**තිලංක ගිගනගේ මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ස්ථාවර ආදායම් ආයෝජන



**සුභාෂි ජයසුමන මහත්මිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ව්‍යවසාය අවදානම් කළමනාකරණ,වෙළෙඳපොල බුද්ධිය හා ආයතනික සැලසුම්කරණය



**මංජුලා ජයතිලක මෙනවිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – නෛතික (හිමිකම්)



**විරාජිනි රාමනායක මහත්මිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – මූල්‍ය වාර්තාකරණය, IFRS, අනුකූලතා වාර්තාකරණය සහ පද්ධති සංවර්ධනය



**නාමල් හේරත් මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු – සයිබර් ආරක්ෂාව

# නායකත්ව කණ්ඩායම

## ප්‍රාදේශීය කළමනාකරුවන්



**අජිත් කුලසේන මහතා**
ප්‍රාදේශීය කළමනාකරු -
බස්නාහිර 01



**ගාමිණී සරත්චන්ද්‍ර මහතා**
ප්‍රාදේශීය කළමනාකරු -
ඌව



**සමන්ත ධම්මික බණ්ඩාර මහතා**
ප්‍රාදේශීය කළමනාකරු -
මධ්‍යම



**අජිත් තිලකරත්න මහතා**
ප්‍රාදේශීය කළමනාකරු -
දකුණ 01



**මහින්ද දිසානායක මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
වයඹ 01



**පී පුවනේන්ද්‍රන් මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
නැගෙනහිර



**නාමල් ලියනගේ මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
ඉහළ බස්නාහිර



**ප්‍රසන්න සමන් කුමාර මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
වයඹ 02



**සුනිල් සේනාධීර මහතා**
ප්‍රාදේශීය කළමනාකරු -
බස්නාහිර 02



**සුලාතා ආනන්දමාන මහත්මිය**
ප්‍රාදේශීය කළමනාකරු –
බස්නාහිර 03



**නිශාන්ත අල්විස් මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
බස්නාහිර 04



**නිහාල් රාජපක්ෂ මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
දකුණ 02



**සෞගි දිසානායක මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
රත්නපුර



**ඒ සුපේසන් මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
උතුරු



**සජිත් වීරසිංහ මහතා**
ප්‍රාදේශීය කළමනාකරු –
උතුරු මැද

# මූල්‍යමය නොවන වැදගත් සිදුවීම්

## සම්මාන සහ ජයග්‍රහණ



- ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් අඛණ්ඩව 8 වැනි වරටත් වඩාත් ආදරනීය ජීවිත රක්ෂණ සන්නාමය ලෙස පිළිගැනීම
- 2024 වඩාත් කළමනාකරණ ව්‍යවහාර සම්මාන
  - "රක්ෂණ - රාජ්‍ය අංශයේ සමාගම්" කාණ්ඩයේ ශූරතා ජයග්‍රාහකයා
- ඉහළම සමාගම් 10 අතර වීම

## නව නිෂ්පාදන හා සේවා



- ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ලයිෆ් මෙඩි චැම්ප් (Life Medi champ)- ඔප්පුහිමියන්ගේ කලත්‍රයින්, ළමුන්, දෙමව්පියන් ඇතුළුව පරම්පරා තුනක් දක්වා පුළුල් සෞඛ්‍ය ආවරණය ලබා දෙමින් 2024 දී සෞඛ්‍ය රක්ෂණය දියත් කරන ලදී.
- ගනුදෙනුකරුවන්ගේ කෙටිකාලින ආයෝජන අවශ්‍යතා සපුරාලමින් ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් ජීවිත Value Max – වසර 5 ක් සඳහා ඔප්පුවක් දියත් කරන ලදී
- ජීවිත ඔප්පුහිමියන් සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් දියත් කරන ලදී

## හවුල්කාරත්වයන්



- ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් DTA මෙහෙයුම් සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ හවුල්කාරත්වයකට ඇතුළත් විය

## ශ්‍රේණිගතකිරීම්



- ජාතික රක්ෂණ මූල්‍ය ශක්තිය ශ්‍රේණිගතකිරීම 2025 පෙබරවාරි නිකුතුව පරිදි ශක්තිමත් දැක්මක් සහිත A+(lka) විය.

## මූල්‍යමය නොවන වැදගත් සිදුවීම්

# පාරිසරික ප්‍රමිති



- ISO 14064-1:2018 ජාත්‍යන්තර ප්‍රමිතිය සමඟ අනුකූලවීම සඳහා හරිතාගාර වායු සත්‍යාපන මතය ප්‍රදානය කරන ලදී

# පාලනය, අවදානම හා අනුකූලතාව



- ජාත්‍යන්තර ප්‍රමිති ඇතුළත් කර ගැනීම සහ ක්ෂෙත්‍රයේ ප්‍රමිතිවලට අනුකූලවීම – ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් IFRS 17 ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.
- AISO/IEC 27001:2022 ප්‍රමිතිය අත්කර ගැනීම ප්‍රදානය, තොරතුරු ආරක්ෂක කළමනාකරණ පද්ධති (ISMS) සඳහා ප්‍රධාන මංසලකුණ
- ESG රාමුව ඵලදායීව ක්‍රියාත්මක කිරීම
- නවතම අනුකූලතා අවශ්‍යතා ඇතුළත් කරමින් ප්‍රතිපත්ති යාවත් කිරීම

# විශේෂ වැඩසටහන්

- 2023 වසර සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් MDRT සාක්ෂාත් කරගත් අය පිළිගැනීම සහ ප්‍රදානය සඳහා MDRT දිනය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් විසින් පවත්වන ලදී.
- 2023 පළමු මාස 6 තුළ ඉහළම කාර්යසාධකයින්ට ප්‍රදාන ලබාදෙමින් ජීවිත සම්මේලන නේවාසික වැඩසටහන නුවරඑළියේදී පවත්වන ලදී.
- නුවරඑළිය සැලලිහිණි වසන්තය ප්‍රවර්ධනය දිවයින පුරා විශාල ජනතාවක සහභාගිත්වයෙන් 2024 අප්‍රේල් පවත්වන ලදී.
- පොසොන් උත්සවය තුළ අනුරාධපුරය, කතරගම විශේෂ වැඩසටහන් සහ නල්ලූර් උත්සවය තුළ යාපනය සහ වෙනත් උත්සව ගණනාවකට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් විශාල පිරිසක් අනුයුක්ත වූ අතර ඔවුන් මෙවැනි උත්සවවල සැලකියයුතු සහභාගිත්වයක් සලකුණු කළ අතර මෙම කාලසීමාව තුළ ජීවිත රක්ෂණ කණ්ඩායමේ විශාල පිරිසක් මේ සඳහා සහභාගි විය.
- 2021/22 විභාගවලදී ජීවිත රක්ෂණ ඔප්පුහිමියන්ගේ ළමුන්ගේ ඉහළම කාර්යසාධනය හඳුනා ගනිමින්, සුබ පැතුම් ශිෂ්‍යත්ව 300ක් වසර තුළ ප්‍රදානය කරන ලදී.
- 2024 Super Women සම්මාන උත්සවය කාන්තා දිනය සමරමින් පවත්වන ලදී.



# මූල්‍යමය වැදගත් සිදුවීම්

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ මාස 11ක් සඳහා සිය ජීවිත රක්ෂණ ව්‍යාපාරය ක්‍රියාත්මක කරන ලදී. කෙසේවෙතත්, සැසැඳීමේ අරමුණ සඳහා, ජීවිත රක්ෂණ මෙහෙයුම්වල සම්පූර්ණ කාර්යසාධනය පිළිබිඹු කිරීමට ජනවාරි මාසය ද ඇතුළුව 2024 පූර්ණ වසර සඳහා තොරතුරු ඉදිරිපත් කෙරේ. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් යටතේ 2023 වසර සඳහා මාස 12 ජීවිත රක්ෂණ ව්‍යාපාර කාර්යසාධනයට මෙය සසඳා ඇත.

| | 2024<br>රු. මිලියන | 2023<br>රු. මිලියන |
|---|---|---|
| **වසර සඳහා ප්‍රතිඵල** | | |
| මුළු ආදායම | 53,238 | 43,327 |
| දළ ලිඛිත වාරිකය | 26,359 | 21,080 |
| ශුද්ධ උපයන ලද වාරිකය | 25,331 | 20,406 |
| ආයෝජන හා වෙනත් අදායම් | 27,907 | 22,921 |
| ජීවිත අරමුදලට මාරු කිරීමට පෙර බදු පෙර ලාභය | 30,767 | 23,596 |
| ජීවිත අරමුදලට මාරු කිරීමෙන් පසු බදු පෙර ලාභය | 4,358 | 5,306 |
| ජීවිත අරමුදලට මාරු කිරීමට පෙර බදු පසු ලාභය | 29,004 | 21,734 |
| ජීවිත අරමුදලට මාරු කිරීමෙන් පසු බදු පසු ලාභය | 2,595 | 3,444 |
| ප්‍රතිලාභ/හිමිකම්, මෙහෙයුම්, පරිපාලන සහ වෙනත් වියදම් | 48,880 | 38,021 |
| **වසර අවසානයේදී තත්ත්වය** | | |
| ස්කන්ධය | 15,272 | 30,738 |
| ජීවිත රක්ෂණ අරමුදල | 213,228 | 180,870 |
| ආයෝජන | 230,577 | 211,291 |
| මුළු වත්කම් | 238,625 | 220,508 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය** | | |
| ලබාගතහැකි මුළු ප්‍රාග්ධනය (TAC) | 125,497 | 126,522 |
| අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන අවශ්‍යතාවය (RCR) | 22,229 | 29,770 |
| අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (CAR) | 565% | 425% |
| නියාමක විසින් නියම කරන අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය | 120% | 120% |
| **අනුපාත** | | |
| මුළු වත්කම් මත ඉපයීම | 13% | 11% |
| ආයෝජන මත ඉපයීම | 12% | 11% |
| ස්කන්ධය මත ඉපයීම | 17% | 11% |
| හිමිකම් ගෙවීම | 51% | 58% |
| වියදම් අනුපාතය | 37% | 39% |

### මුළු වත්කම්
රු. මිලියන

| 2024 | 2023 |
|---|---|
| 238,625 | 220,508 |

### ප්‍රකාශිත ප්‍රසාද දීමනා
රු. මිලියන

| 2024 | 2023 |
|---|---|
| 12,522 | 11,242 |

### ජීවිත අරමුදලට මාරුකිරීමෙන් පසු බදු පෙර ලාභය
රු. මිලියන

| 2024 | 2023 |
|---|---|
| 4,358 | 5,306 |

### මුළු ආදායම
රු. මිලියන

| 2024 | 2023 |
|---|---|
| 53,238 | 43,327 |

### දළ ලිඛිත වාරිකය
රු. මිලියන

| 2024 | 2023 |
|---|---|
| 26,359 | 21,080 |

### ජීවිත අරමුදල
රු. මිලියන

| 2024 | 2023 |
|---|---|
| 213,228 | 180,870 |

# 21.

# නායකත්ව සමාලෝචනයන්

22 සභාපතිතුමාගේ පණිවිඩය
25 සමූහ විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

# සභාපතිතුමාගේ පණිවිඩය

> "අපගේ විශිෂ්ඨ කාර්යසාධනය, බොහෝ අභියෝග මධ්‍යයේ අපගේ ඉලක්ක සපුරා ගැනීම සඳහා නොනවත්වා කටයුතු කිරීම සහ මෙම ප්‍රතිඵල අත් කරගැනීම සඳහා ආයතනයක් ලෙස සහයෝගීව වැඩ කිරීමට අපට ඇති හැකියාව පිළිබඳ සාක්ෂියකි."



2024 පෙබරවාරි මාසයේදී ව්‍යාපාරයේ සාර්ථක නීතිමය වෙන් කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) වෙනුවෙන් 2024 වසර සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මට සතුටකි. මෙම වෙන් කිරීම 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි (සංශෝධිත) පනත සහ 2023 මාර්තු 17 දිනැති අංක 23/0431/604/046 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව ක්‍රියාවට නන්වන ලදි. ඒ අනුව පෙර පැවති ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙනම නීතිමය ආයතන දෙකක් ලෙස වෙන් කරන ලදී. මෙම වාර්තාවෙන් ඔබට මෙන්ම අපගේ වටිනා පාර්ශ්වකරුවන්ට සමාගමේ දිගුකාලීන වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය, තිරසාර වර්ධනය කරා උපායමාර්ගික රාමුව, පාලන දර්ශනය හා සමාගම එහි කටයුතු පවත්වා ගැනීමේදී පාදක වූ මූලධර්ම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාදෙන බව මම විශ්වාස කරමි.

# සභාපතිතුමාගේ පණිවිඩය

## කර්මාන්තය සඳහා ප්‍රවනතා සැකසීම

රජයට අයත් ආයතනයක් ලෙස, අපගේ සමාගම දිගුකාලින මූල්‍ය ආරක්ෂාව සහ ජීවිතයේ බොහෝ අනපේක්ෂිත සිදුවීම්වලදී අවදානම අවම කිරීම සහතික කිරීමේ උපායමාර්ගික විධානයක් සමඟ ක්‍රියාත්මක වේ. එම නිසාම, අපගේ මූල්‍ය ජයග්‍රහණ ජාතික ආර්ථික ස්ථායිතාව ශක්තිමත් කිරීමට හා උසස් වැඩ ආචාරධර්ම, පාලන මූලධර්ම සහ නියාමනයට අනුකූල නුබුන්වත් කළමනාකරණය නගා සිටුවීමට අතිශයින් වැදගත් වේ. මෙවැනි සාධක දිගුකාලින තිරසාරභාවය සඳහා ඔප්පුහිමියන්ට ප්‍රතිඵල ලබාදීමට ස්වභාවිකව පර්වර්තනය වේ. අපගේ ආයතනය මත මෙම වගකීමට සහ වගවීමට අනුකූලවීම ස්ථාපිත කරමින්, ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ ක්ෂෙත්‍රය තුළ පුරෝගාමී බලකායක් ලෙස අප සමාගම (SLICLL) ස්ථානගත කිරීමට නිෂ්පාදන නවෝත්පාදනය හා දත්ත පදනම් තීරණ ගැනීම සමඟ ශක්තිමත් ආයුගණක රාමුවක් මත අපි අඛණ්ඩව ගොඩ නැගෙමු.

අප සමාගම (SLICLL) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ මාස එකොළහක් සඳහා වෙනම සමාගමක් ලෙස සිය ජීවිත රක්ෂණ ව්‍යාපාරය ක්‍රියාත්මක කරන ලදී. කෙසේවෙතත්, සැසැඳීමේ අරමුණ සඳහා, රක්ෂණ මෙහෙයුම්වල පූර්ණ කාර්යසාධනය පිළිබිඹු කිරීමට ජනවාරි මාසය ද ඇතුළුව 2024 සම්පූර්ණ වසර සඳහා තොරතුරු ඉදිරිපත් කෙරේ. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් යටතේ 2023 වසර සඳහා මාස 12 ජීවිත රක්ෂණ ව්‍යාපාර කාර්යසාධනයට මෙය සසඳා ඇත.

මෙම 2024 වසර, ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනය, උපායමාර්ගික නැවත සකස් කිරීම සහ නියාමන අනුකූලතාව මත පදනම් වූ මෙහෙයුම් වෙන් කිරීම අපගේ කොටස්කරුවන්ට සන්ධිස්ථාන වටිනාකමක් ලබා දීම සඳහා ස්ථිර කාර්ය සාධනයක් සනිටුහන් කළ බැවින් සමාගමේ පරිණාමයේදි තීරණාත්මකය. ශ්‍රී ලංකා රක්ෂණ ක්ෂෙත්‍රයේ ශක්තිමත් ක්‍රියාකරන්නෙක් ලෙස අපගේ තත්ත්වය මනාව ශක්තිමත් කිරීමට හේතුවන අපගේ ආයතනික ගමන්මඟ, මූල්‍ය ඔරොත්තුදීම සහ උපායමාර්ගික විධි පිළිබඳ විශ්ලේෂණාත්මක සමාලෝචනයක් ඉදිරිපත් කිරීම මට සතුටකි.

## මෙහෙයුම් පරිසරය

ප්‍රතිපාදන ගමන්මඟක් මත ශ්‍රී ලංකාවේ ගමන්මඟ එහි දුෂ්කර ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හා මූල්‍ය වගකීම තුළින් 2024 දී ආරම්භ විය. මේවා පසුකාලීන මූල්‍ය ස්ථාවරත්වයට, උද්ධමනය අඩුවීම (disinflation) සහ විදේශ සංචිතවල සුවිශේෂී වර්ධනයට මඟ පාදන ලද අතර එය උපකාරී ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කර ඇත. ස්වෛරී ණය අනුපාතවල යාවත් කිරීම්වලින් ඇති වූ සාර්ථක ණය ප්‍රතිව්‍යූහගතකරණය ශ්‍රී ලංකා රජයේ මහත් උත්සාහයන් තවදුරටත් ශක්තිමත් කර ඇති අතර එය ආයෝජක විශ්වාසය ඇති කරමින් ආර්ථික සාමය නැවත ඇති කිරීමට කැප වී ඇත.

## මූල්‍ය කාර්යසාධනය

2024 දී සමාගමේ මූල්‍ය ජයග්‍රහණ එහි ඉතිහාසය තුළ ඉහළම අගය සලකුණු කරයි. දළ ලිඛිත වාරිකය රු. බිලියන 26.3 දක්වා ඉහළ ගිය අතර එය 25%ක වැඩි වීමකි. 23%ක වැඩිවීමක් සමඟ ආදායම රු. බිලියන 53.2ක් වූ අතර, වාර්ෂිකව 22%ක වර්ධනයක් සමඟ ආයෝජන හා වෙනත් ආදායම් රු. බිලියන 27.9ක් අත්කරගෙන ඇත. සමාගම නව ව්‍යාපාරවල රු. බිලියන 5.3ක් සාක්ෂාත් කරගෙන ඇති අතර ඉන් 48%ක වැඩි වීමක් වාර්තා කර ඇත. මෙයද ඉතිහාසය තුළ ඉහළම අගයකි. ජීවිත අරමුදල රු. බිලියන 213.3 දක්වා පුළුල් වූ අතර 18%ක වැඩිවීමක් වාර්තා කර ඇත. ශක්තිමත් රක්ෂණ ඔප්පු හිමියන්ගේ විශ්වාසය, නව්‍ය නිෂ්පාදන පිරිනැමීම, විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය සහ ශක්තිමත් අවදානම් කළමනාකරණය සඳහා මෙම ඓතිහාසික සන්ධිස්ථාන කාර්ය සාධනය අපි අගය කරමු. අවදානම් පදනම් ප්‍රාග්ධන අනුපාතය ක්ෂෙත්‍රයේ අවම අවශ්‍යතාවලට වඩා 565% දක්වා ඉහළ ගියේය. රට පුරා විහිදී ඇති සමාගමේ විශාල ආයතන ව්‍යාප්තිය මෙම ශක්තිමත් වර්ධන ප්‍රවර්තක ශක්තිය සඳහා අඛණ්ඩව උත්ප්‍රේරකයක් වූ අතර උපායමාර්ගික ක්‍රියාමාර්ග ඔප්පු රඳවා ගැනීම සහ අප්‍රතිහත ධෛර්යය ඇති කිරීමට ප්‍රධාන විය.

## ආයෝජන මත ඉපයීම්

අවදානම් පදනම් ප්‍රාග්ධන වෙන් කිරීමේ මූලධර්ම පිළිපදිමින් රජයේ සුරැකුම්පත්, බැඳුම්කර සහ ස්කන්ධ වෙළෙඳපොල ඇතුළුව විවිධාංගීකරණය කළ ආයෝජන කළඹක උපායමාර්ගික වත්කම් වෙන් කිරීම අපගේ ප්‍රධාන නියමක වන, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) මාර්ගෝපදේශවලට අනුකූල වෙමින් ක්ෂෙත්‍රයේ ප්‍රතිමාන සමඟ සහතික කර ඇත.

## ඩිජිටල් පරිවර්තනය

වෙළෙඳපොලට අපි ප්‍රතිචාර දක්වන කඩිසරකම සහ වේගය නව්‍යකරණ ඩිජිටල් සහ තාක්ෂණික බිහිදොර විසින් වර්තමානයේ මෙහෙයවනු ලබයි. එබැවින්, අපි අපගේ ඩිජිටල් පරිවර්තනය, ප්‍රාරක්ෂණ ඒකාබද්ධ කිරීම්, ස්වයංක්‍රිය හිමිකම් පිරිසැකසුම වේගවත් කළ අතර ගනුදෙනුකාර සහභාගිත්ව අවස්ථා වැඩි කරන ලදී.

මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ රෙගුලාසි අනුව, මූල්‍ය අපරාධ අවදානම අවම කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස නවීන මෘදුකාංගයක් ක්‍රියාත්මක කර ඇත. මෙම පද්ධතියට දේශීය හා විදේශීය ත්‍රස්තවාදීන් පිළිබඳ පුළුල් දත්ත පදනමක් මෙන්ම දේශපාලන වශයෙන් නිරාවරණය වූ (PEPs) පුද්ගලයින්ගේ ලැයිස්තුවක් ඇතුළත්ය. අපගේ අභ්‍යන්තර පද්ධති සමඟ ඒකාබද්ධ වෙමින්, මෙම වේදිකාව ගනුදෙනු ස්වයංක්‍රීයව පරීක්ෂා කිරීම සහ පුද්ගලයින් පිළිබඳ නිසි සම්ප්‍රජන්‍ය ඉටුකිරීම සඳහා ඉඩ දේ.

මෙම ක්‍රියාමාර්ග මෙහෙයුම් කාර්යක්ෂමතාවන් ක්‍රමවත් කර වැඩි කරන අතර ගනුදෙනුකාර සේවා විශිෂ්ඨත්වය සහ අපගේ ගනුදෙනුකාර කළඹ තුළ යම් අනපේක්ෂිත කටයුතු සේවීම සහතික කර ඇත.

## උපායමාර්ගික ආයෝජන

වෙළෙඳපොල ප්‍රවනතා සමඟ විවිධාංගීකරණය සහ උපායමාර්ගිකව බැඳෙමින්, අවදානම් අවම කරමින් ප්‍රශස්ථ ප්‍රතිඵල ලබාගනිමින් ලාභදායී මූල්‍ය ආයෝජන අතර අපගේ ආයෝජන විචක්ෂණශීලීව බෙදාහැර ඇත. හරිත බැඳුම්කර සහ පාරිසරික, සමාජීය හා පාලන අනුකූල වත්කම් වැනි තිරසාර ආයෝජනවලට වැඩි වශයෙන් යොමු වීම තුළින් අපගේ මූල්‍ය කළමනාකරණය පිළිබිඹු කිරීම පමණක් නොව දිගුකාලීනව තිරසාර ව්‍යාපාරයක් ගොඩ නැගීමට අපගේ කැපවීම පිළිබඳ සාක්ෂියක් ද වේ.

## පාරිභෝගික කේන්ද්‍රියතාව

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ අවදානම් අවම කිරීම අපගේ මූලික අවධානය දෙන්නක් වන අතර එය අපගේ ව්‍යාපාරයේ හරය වේ. අපගේ දැක්ම, මෙහෙවර සහ මූලික වටිනාකම් මත පදනම් වූ අපගේ රක්ෂණ ඔප්පුහිමියන් කෙරෙහි ඇති කැපවීම, කල්පිරීමේ හිමිකම් ගෙවීම් හා හිමිකම් ගෙවීම් වලින්  රු. බිලියන 12.9ක් පෙන්නුම් කළ අතර, එය සාමාන්‍ය අගයන් ලෙස ගත්විට මාසයකට රු. බිලියන 1.1කි සාමාන්‍ය, හිමිකම් ගෙවීමකින් පෙන්නුම් කරයි. රු. බිලියන 11.2ක වාර්තාගත ප්‍රසාද දීමනා 2023 දී ප්‍රකාශයට පත් කිරීම තුළින් 2024 දී සමාන ඉහළ ප්‍රසාද දීමනා ගෙවීම සඳහා පදනම සකස් කර ඇති අතර විවිධාකාරයෙන් අපගේ වෙළෙඳපොල නායකත්වය වැඩි කරයි. ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් අපගේ වටිනා ඔප්පුහිමියන් සඳහා ධනය ඉපැයීම් කිරීමට අපට ඇති බැඳිම ශක්තිමත් කරමින් පසුගිය දශක දෙක තුළ රු. බිලියන 116.6ක ඉක්මවන සමුච්චිත ප්‍රසාද දීමනා ප්‍රකාශ කිරීම් ස්ථිරව ලබාදී ඇති බව සඳහන් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙමි.

වර්ධන උපායමාර්ග, වෙළෙඳපොළ සංවර්ධනය, විනිවිදයාම සහ නව නිෂ්පාදන සංවර්ධනය යන සියල්ලම පාරිභෝගික අවශ්‍යතා මත පදනම් වේ. අපගේ ක්‍රියාවලි, සේවක සංවර්ධනය, සහ සන්නාමය ගොඩනැගීමේ උත්සාහයන් හි මෙහෙයුම් විශිෂ්ටත්වය පාරිභෝගික කේන්ද්‍රීයතාව සඳහා අපගේ කැපවීම වැඩි කරන අතර අපගේ සියලුම ඇමතුම් ස්ථාන හරහා ගනුදෙනුකාර අත්දැකීමක් ලබා දේ.

# සභාපතිතුමාගේ පණිවිඩය

## ආයතනික පාලනය

රජයට අයත් ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් ශක්තිමත් අචාරධර්ම සංග්‍රහ සහ ශක්තිමත් මූල්‍ය පාලනයන් යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ 2022 අංක 2 නිර්දේශයට අනුකූලව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ 2017 (2023 සංශෝධිත) විධිවිධාන අපි පිළිපදිමු. තවද, ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ හා මුදල් අමාත්‍යංශය විසින් නිකුත් කළ රජයට අයත් ව්‍යවසාය සඳහා මෙහෙයුම් අත්පොත අපි අනුගමනය කරමු. මෙවැනි රාමු ආයතනික පාලනය ශක්තිමත් කිරීමට සහ වගවීම සහ විනිවිදභාවය පිළිබඳ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීමට අපගේ කැපවීමට සාමූහිකව සහය වේ.

ශක්තිමත් ආයතනික පාලන ව්‍යූහයක් තුළ කටයුතු කිරීම විශේෂ අවදානම් අවම කිරීමේ නියෝග මත පදනම් වන ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවකි. එබැවින්, මෙම ක්ෂෙත්‍ර දෙකම 2024 දී අපගේ සැලකියයුතු ජයග්‍රහනයන්ට මූලික විය. අපි වෙනස් ලෙස නොසලකන, විවිධ හා සියලු දෙනා ඇතුළත් සේවා ස්ථානයක් ක්‍රියාත්මක කරන බැවින් අල්ලස සහ දූෂණය, සහ යම් ආකාරයක වෙනස්ව සැලකීම සඳහා සදාචාර හා නෛතික ගනුදෙනු, ශුන්‍ය ඉවසීම කෙරෙහි අවධාරණය සමඟ සමාගමේ ප්‍රතිපත්ති නගා සිටුවීමට අපි කැප වී සිටින බව සහතික කිරීමට මම කැමැත්තෙමි.

ජීවිත රක්ෂණ සේවා සපයන්නෙක් හා වගකිම්සහගත ආයතනික පුරවැසියෙක් වශයෙන් අපට අවශ්‍ය ඉහළම සදාචාර නගා සිටුවමින් විනිවිදභාවය, නිරවද්‍යතාව සහ කාලීනබව සමඟ, සියලූම නියාමන අනාවරණ අවංකව සිදු කරන බව අපි සහතික කරමු.

## පාරිසරික, සමාජීය හා පාලනය හා තිරසාරභාවය

අපගේ ව්‍යාපාරයේ ප්‍රතිමානය වන්නේ ජීවිත සුරක්ෂිතකරණය සහ අවදානම අවම කිරීමයි. රක්ෂණ ක්ෂෙත්‍රයේ මනා පරිචයන් හා බැඳුණු පුළුල් පාරිසරික, සමාජීය හා පාලන (ESG) හා තිරසාර රාමුව ක්‍රියාත්මක කිරීමට අපගේ කැපවීම සමඟ මෙය බැඳී ඇත.

මෙවැනි මූලධර්ම අපගේ ව්‍යාපාර උපායමාර්ගය, දෛනික මෙහෙයුම්, තීරණ ගැනීම, සහ අවදානම් කළමනාකරණයට අපි ඒකාබද්ධ කර ඇත. පාරිසරික, සමාජීය හා පාලනය අපගේ ව්‍යාපාරයේ සහ එහි පාර්ශවකරුවන්ගේ තිරසාර වර්ධනය සඳහා අදාළවන සහ ප්‍රමාණතාව මත අවධානය යොමු කරමින් දිගුකාලීන වටිනාකම නිර්මාණය කිරීමට අපි භාවිතා කරමු. තිරසාරභාවය ඇති කිරීමට තීරණාත්මක වැදගත්කම සලකමින් SLFRS 1 සහ SLFRS 2 ක්‍රියාත්මක කිරීමේ සංක්‍රාන්ති ක්‍රියාවලිය තුළ අපි සිටිමු.

## දක්ෂතා සංවර්ධනය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් විසින් මෙතෙක් ඉහළම වාර්තාකළ අගයක් වන 319ක් වූ මිලියන් ඩොලර් වට මේස (MDRT) සුදුසුකම් ලබන්නන් හරහා අපගේ වෙළෙඳපොල නායකත්වය අපි පැහැදිලිව 2024දී පෙන්නුම් කර ඇත. අපගේ ඉහළම වත්කම වන ශ්‍රම බලකාය අඛණ්ඩව පුහුණු කිරීම සහ දක්ෂතා සංවර්ධනය තුළින් වෘත්තීමය විශිෂ්ටත්වය ලබා ගැනීම කරා අපගේ කැපවීම පිළිබඳ මෙය සාක්ෂියකි. පුද්ගල සංවර්ධනය, නිපුනතා වැඩි කිරීම, සහ නායකත්ව සංවර්ධනය හා බැඳුණු අපගේ සාකල්‍ය ප්‍රවේශය සේවක යහපැවැත්ම තුළ මුදුන් පත් වන අතර එය 2024 දී අප අත්කර ගත් මූල්‍ය කාර්යසාධනය ලබාගත් කැපවුනු පාරිභෝගික කේන්ද්‍රිය කාර්යසාධනයට ස්වභාවිකවම පරිවර්තනය කරයි.

විශිෂ්ඨ දක්ෂයින් ආකර්ෂණය කරගෙන රඳවා ගැනීම සිදුකරමින්, විවිධ මානව සම්පත් මුලපිරිම් සහ ශුභසාධන ක්‍රියාමාර්ග තුළින් වෘත්තීමය ප්‍රගතිය හා පුද්ගල සංවර්ධනය සඳහා අපගේ කණ්ඩායමෙහි අපි අඛණ්ඩව ආයෝජනය කරමු. සමස්ත උපායමාර්ගික පරමාර්ථ සපුරාලන මූලික කාර්යසාධන දර්ශක පදනම් ආයතනයක් ලෙස, අපව පිළිගෙන ඇති අතර කාර්යසාධන පරතර ව්‍යූහගත පුහුණු මගින් විසඳනු ලැබේ.

## ඔප්පුහිමියාගේ වටිනාකම

පාරිභෝගිකයින්ගේ මතුවන අවශ්‍යතා සපුරාලීමට සමාගමේ කැපවීම සිය මූල්‍ය කාර්යසාධනයෙන් පෙන්නුම් කරයි. පුළුල් හා අවශ්‍යතාවට අදාළ නිෂ්පාදන කළඹක් සමඟ ඒකාබද්ධ වී, විශිෂ්ට පාරිභෝගික සේවාවක් ලබා දීම රක්ෂණ ඔප්පු හිමියන්ට හිමිවන රු. බිලියන 12.5ක ප්‍රසාද දීමනාව ප්‍රකාශ කිරීමෙන් පැහැදිලි වන අතර එය කර්මාන්තයේ ඉහළම අගය වේ.

## බෙදාහරින්නාගේ වටිනාකම

8,000කට වැඩි රක්ෂණ උපදේශකයින්, බැංකු හවුල්කරුවන් සහ තැරැව්කාර ආයතන 2024 දී ශ්‍රී ලාංකිකයින් 62,000කට වැඩි පිරිසකට ආරක්ෂාව සැලසීමේදී අප සමඟ උන්න්දුවෙන් කටයුතු කළ අතර, මෙය අප සමාගම් ඉතිහාසය තුළ මෙතෙක් ඉහළම මූල්‍ය කාර්යසාධනයට පරිවර්තනය කර ඇත. ඔවුන්ගේ කාර්යසාධනය සුවිශාල වශයෙන් හඳුනා ගනිමින්, වසර තුළ අපගේ බෙදා හරින්නන්ගේ ජාලය වෙත කොමිස් මුදල් හා දිරිදීමනා ලෙස රු. බිලියන 3.7ක් අපි ගෙවා ඇත.

## අනාගත අවධානය

නව ව්‍යාපාර සහ අලුත්කිරීම් කෙරෙහි අවධානය යොමු කරමින් ඉහළම මට්ටමේ ව්‍යාපාර වර්ධනයට අපි කැපවී සිටින අතර වියදම් ව්‍යාපාර වර්ධනය සමඟ පෙළ ගැසි ඇති බව සහ තිරසාර පසු කාර්යාල කටයුතු පවත්වා ගන්නා බව සහතික කරමු. රට තුළ ඉහළම මට්ටමේ සහ වඩාත් ආදරණීය රක්ෂණ සන්නාමය වීමට අපි නිරන්තරයෙන් උත්සාහ ගන්නා අතර, පාරිභෝගිකයින් සඳහා සමාජීය වශයෙන් වගකීම් සහගත සන්නාමය වීමට සහ අපගේ ඔප්පුහිමියන්ට සහ පාර්ශ්වකරුවන්ට වටිනාකම ලබා දෙමින් අපගේ සේවකයින් සඳහා “Great Place to Work” සංස්කෘතියක් නිර්මාණය කිරීමට කටයුතු කරමු.

තිරසාර වර්ධනයන් ලබාදෙමින් හා ජාතියේ ආර්ථික ප්‍රගතිය තුළ එහි කාර්යභාරය ශක්තිමත් කරමින්, සමාගම නැවත වරක් එහි වෙළෙඳපොල නායකත්වය සනාථ කර ඇත. අපගේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනයට සැලකියයුතු ලෙස අඛණ්ඩව දායක වීම වන අතර වර්තමාන සහ ඉදිරි අනාගත පරම්පරාවන්ට මූල්‍ය සුරක්ෂිතතාව සහතික කිරීම වේ.

අවසාන වශයෙන්, කැපවීමෙන් සහ උනන්දුවෙන් අපගේ සාර්ථකත්වයට සහ තිරසාරභාවයට දායක වූ සියලුම දෙනා වෙත ස්තුතිය පළ කිරීමට මම කැමත්තෙමි. ව්‍යාපාරයට කිසිදු බාධාවක් නොමැතිව පහසු වෙන් කිරීමකට සහය වූ අධ්‍යක්ෂ මණ්ඩලයට හා සමූහයේ ප්‍රධාන විධායක නිලධාරිට සහ අනුකූලතා ගැටළුවලදී ඉහළින් අප වෙත සහය වූ නියාමකයින්ට මාගේ අවංක ස්තුතිය ප්‍රකාශ කර සිටිමි. එමෙන්ම අපගේ ව්‍යාපාරයේ හැරවුම අඛණ්ඩව තබාගැනීමට උපකාරි වූ අපගේ නියෝජිතයින්ට මෙන්ම අපගේ කාර්ය මණ්ඩලයට සිය කැපවීම සහ බැඳීම වෙනුවෙන් මාගේ ස්තුතිය ප්‍රකාශ කර සිටිමි. අවසාන වශයෙන්, දිවයින පුරා ශ්‍රී ලාංකීය ජනතාවගෙන් විශාල කොටසකට තිරසාර දිගු කාලීන වටිනාකම එකතු කිරීම සඳහා වූ අපගේ උත්සාහයේදී අප කෙරෙහි විශ්වාසය තබන ලද අපගේ පාරිභෝගිකයින්ට ස්තුතිවන්ත වෙමි.



**නුසිත් කුමාරතුංග**
සභාපති

03 ජූනි 2025

# සමූහ විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

> “ අපගේ කැපවීම මෙහෙයවමින්, නවෝත්පාදනය, සහ හැමවිටම පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් 2024 දී, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් වාර්තාගත සාර්තකත්වයක් සාත්ෂාත් කරගෙන ඇත. ජීවිත රක්‍ෂණ ක්‍ෂේත්‍රයේ පෙරමුණ ගැනීමට සුවිශේෂී වටිනාකමක් ලබා දීමට සහ සැමට තිරසාර අනාගතයක් ගොඩනැගීමට හැකිවීම ගැන අපි ආඩම්බර වෙමු. ”



### හැඳින්වීම

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (“SLIC ලයිෆ්”) 2024 වාර්ෂික වාර්තාව වෙනුවෙන් ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය ඉදිරිපත් කිරීමට ලැබීම මට සතුටකි. නිරන්තර වෙනස්වන බාහිර පරිසරයන් මධ්‍යයේ ඔරොත්තුදීමේ හැකියාව, නවෝත්පාදනය සහ අඛණ්ඩ ප්‍රගතිය මගින් සලකුණු කළ මෙම වසර අපගේ ගමන්මඟ තුළ තීරණාත්මක පරිච්ඡේදයකි. 2024 මුල් භාගයේදී විධිමත් වෙන් කිරීමෙන් පසුව ස්වාධිනව පාලනය වන නීතිමය ආයතනයක් ලෙස මෙහෙයුම් සිදුකරන අතරම, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් විනය හා කඩිසරකමෙන් යුතුව සිය අවධානය යොමු කළ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේදී ස්ථිරව පැවතුණි.

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් 2024 පෙබරවාරි සිට ආරම්භවන මාස එකොළහක් සඳහා ස්වාධින නීතිමය ආයතනයක් ලෙස මෙහෙයුම් සිදුකරනු ලැබූවද, මෙම වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් යටතේ වාර්තා කරන ලද පෙර වසරේ ප්‍රතිඵල සමඟ අර්ථවත් සංසන්දනයක් සහතික කිරීම සහ පුළුල් දැක්මක් ලබා දීම සඳහා ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ සම්පූර්ණ වසරේ කාර්ය සාධනය මෙම වාර්තාව මගින් පිළිබිඹු කෙරේ.

# සමූහ විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

වසර පුරාම, අපගේ පරිවර්තන වැඩසටහන් දියුණු කළ අතර ගනුදෙනුකාර සහභාගිත්වය ශක්තිමත් කර වෙළෙඳපොලට අදාළ නිෂ්පාදන නව්‍යකරණ හඳුන්වා දී අපගේ මූල්‍ය පදනම් ශක්තිමත් කරන ලදී. සියලුම පාර්ශ්වකාර කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු කරමින් ශක්තිමත් ප්‍රතිඵල ලබාදීමේ අපගේ හැකියාව අපගේ කණ්ඩායමේ ශක්තිය සහ අනාගතය සඳහා අපගේ දැක්මේ පැහැදිලිබවට සාක්ෂියක් ලෙස පෙනී සිටී.

## මූල්‍ය කාර්යසාධනය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් 2024 දී ඉහළ මූල්‍ය කාර්යසාධනයක් අත් කරගෙන ඇති අතර රු. බිලියන 30.7ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. දළ ලිඛිත වාරිකය රු.බිලියන 26.3ක දක්වා ලඟා වූ අතර ඉන් 25%ක වාර්ෂික වර්ධනයක් පිළිබිඹු කරයි. රු. බිලියන 5.3ක නව ව්‍යාපාර පරිමාවක් සමඟ ඓතිහාසික මංසලකුණක් සාක්ෂාත් කර ගත් අතර එය සමාගමේ ඉතිහාසය තුළ ඉහළම අගය වෙමින් 48%ක වැඩි වීමක් විය.

ඔප්පුහිමියන් වෙත අපගේ නොසැලෙන කැපවීම පිළිබිඹු කරමින්, සමාගම කල්පිරීම් සහ හිමිකම් පියවීම් තුළ රු. බිලියන 12.9ක් බෙදාහැර ඇත. වත්කම් පදනම රු. බිලියන 238.6 දක්වා පුළුල් වූ අතර ජීවිත අරමුදල රු. බිලියන 213.3 දක්වා වර්ධනය විය. මින් සමාගමේ අඛණ්ඩ මූල්‍ය ශක්තිය හා නායකත්වය පිළිබිඹු කරයි.

නව ව්‍යාපාර අත්කර ගැනීම කෙරෙහි උපායමාර්ගික ආදායම් වර්ධනයේ මූලික ධාවකයා වූ අතර ඉන් පළමු වසරේ වාරිකවල රු. බිලියන 5.3ක මංසලකුණක් පෙන්නුම් කරයි. නියෝජිත මාර්ග පුළුල් කිරීම, ශක්තිමත් බැංකුආරක්ෂණ හවුල්කාරත්වයන්, සහ ඩිජිටල් විකුණුම් හැකියාව ඇතුළුව අපගේ බෙදාහැරීම් ජාලයෙහි සැලකියයුතු වර්ධනයන් මෙයට සහය විය. වෙනත් සාධක වන්නේ නිෂ්පාදන නව්‍යකරණය, ඩිජිටල් පරිනාමනය, ක්‍රියාවලි ප්‍රශස්ථකරණය, දත්ත පදනම් තීරණ ගැනීම, දක්ෂතා සංවර්ධනය තුළින් කාර්යසාධනය අරමුණු කළ සංස්කෘතියක් පෝෂණය කිරීම ඇතුළත්ය.

රු. බිලියන 213.2 දක්වා ලඟා වූ ජීවිත අරමුදලේ 18%ක වර්ධනය විචක්ෂණ හා ඉදිරිය දකින ආයෝජන උපායමාර්ග සහ පිරිවැය ඵලදායී මෙහෙයුම් කාර්යක්ෂමතාවන් මගින් විශාල වශයෙන් මෙහෙයවන ලදී. අපගේ ආයෝජන කමිටුව වෙළෙඳපොල අවබෝධතාවය භාවිතා කරමින් ප්‍රතිඵල උපරිම කිරීම සඳහා මනා කාලීන, අවදානම් ක්‍රමාංකන තීරණ ක්‍රියාත්මක කරන ලද අතර කළඹේ ස්ථාවරත්වය පවත්වා ගන්නා ලදී. මූල්‍ය ඔරොත්තුදීමේ සහතික කරමින් පොලී අනුපාත හා ස්කන්ධ වෙළෙඳපොල තුළ අපේක්ෂිත වෙනස්වීම්වලදී අපි කඩිසරව සිටියෙමු.

## උපායමාර්ගික ප්‍රමුඛතා

2024 දී, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් වර්ධනය, මෙහෙයුම් විශිෂ්ටත්වය, සහ සන්නාම හිමිකම යන ප්‍රධාන උපායමාර්ගික අරමුණු තුන කෙරෙහි අවධානය යොමු කළේය. වර්ධන පෙරමුණ මත, ඉලක්කගත විකුණුම් උත්සාහයන් සහ නව නිෂ්පාදන දියත් කිරීම් තුළින් අපගේ වෙළෙඳපොල පැවැත්ම අපි ශක්තිමත් කළ අතර, පළමු වසරේ වාරිකවල රු. බිලියන 5.3 ඉක්මවා යමින් ඓතිහාසික සන්ධිස්ථානයක් සාක්ෂාත් කරගෙන ඇත. මෙහෙයුම් විශිෂ්ටත්වය ඩිජිටල් පරිනාමනය, ක්‍රියාවලි වර්ධනය, සහ සේවක සංවර්ධනය මගින් මෙහෙයවනු ලැබූ අතර, එය ISO/IEC 27001:2013, ISO 9001:2015 සහ ISO 14064-1:2018 යන විවිධ ගෝලීය සහතික කිරීම් වලට හේතු වූ අතර ඉන් තත්ත්වය, ආරක්ෂාව හා තිරසාරභාවය කරා අපගේ ශක්තිමත් කැපවීම පිළිබිඹු කරයි. සන්නාම පෙරමුණ මත, ඒකාබද්ධ වැඩසටහන, ඩිජිටල් සහභාගිත්වය, සහ අරමුණ පදනම් ආයතනික සමාජීය වගකීම් මුලපිරීම් තුළින් දෘශ්‍යතාව සහ විශ්වාසය අපි වැඩි කළ අතර පියෙකු මෙන් මවක මෙන් යන අපගේ සන්නාම පොරොන්දුව ශක්තිමත් කර ඇත.

## ඩිජිටල් පරිනාමනය

ඔප්පු නිකුත් කිරීම, වාරික ගෙවීම, සහ හිමිකම් ආරම්භ කිරීම වැනි සේවා සඳහා පහසු ප්‍රවේශය සැලසීමට අපගේ ඩිජිටල් පරිසර පද්ධතිය අපි පුළුල් කළෙමු. විශ්ලේෂණ තුළින් පාරිභෝගික අවබෝධය වැඩි කළ අතර පුද්ගලගත සන්නිවේදනය සහ ගලපන ලද නිෂ්පාදන නිර්දේශ ශක්තිමත් කරන ලදී. සේවා කරා පිවිසීම ඩිජිටල් වේදිකා, 24/7 ඇමතුම් මධ්‍යස්ථාන, සහ වට්ස්ඇප් පදනම් සහය තුළින් වර්ධනය කරන ලදී. පසු අන්තයේ ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය පාරිභෝගික තෘප්තිය වැඩි කරමින් ගතවන කාලසීමා සැලකියයුතු ලෙස අඩු කර ඇත.

## නිෂ්පාදන ප්‍රභේදනය

2024 දී, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් මතුවන පාරිභෝගික අවශ්‍යතාවන්ට ගලපනලද නව්‍යකරණ නිෂ්පාදන හඳුන්වා දෙන ලදී. Sri Lanka Insurance Life Medi Champ ඉහලයන සෞඛ්‍යාරක්ෂිත පිරිවැය විසඳමින් පුළුල් පවුල් වෛද්‍ය ආවරණයක් පිරිනමන ලදී. 2024 දී, Sri Lanka Insurance Life Value Max, නිෂ්පාදන වර්ධනය අරමුණු කළ පාරිභෝගිකයින් ආකර්ශණය කරගනිමින් ශක්තිමත් ප්‍රතිඵල සහිත කෙටි කාලීන ආයෝජනය අරමුණු කළ ජීවිත රක්ෂණයක් ලබා දී ඇත. එමෙන්ම අපි Sri Lanka Insurance Life Wealth Plus ආරක්ෂාව සහ දිගු කාලීන ඉතුරුම් සඳහා වඩා ඉහළ නම්‍යතාව සමඟ වර්ධනය කළේය. මෙවැනි විසඳුම්වලින් ප්‍රවේශ්‍යතාව, මූල්‍ය සවිබලගැන්වීම සහ වෙළෙඳපොල තුළ වෙනස් වටිනාකම කරා අපගේ කැපවීම පිළිබිඹු කරයි.

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් අපගේ ප්‍රමුඛ පෙළේ නිෂ්පාදනය වන දිවි තිළිණ, 2024දී පළමු වසරේ වාරිකයෙන් 45%ක් විය. වසර අගදී දියත් කළ කෙටි කාලීන ආයෝජනය අරමුණු කළ Sri Lanka Insurance Life Medi Champ Value Max එහි ශක්තිමත් වෙළෙඳපොල පිළිගැනීම පෙන්නුම් කරමින් මාසයක් තුළ පළමු වසරේ වාරිකවලට 10%ක සැලකියයුතු දායකත්වයක් සිදුකර ඇත.

## පාරිභෝගික කේන්ද්‍රියතාව

අපි ජීවිතයේ අදියර හා බැඳුණු අවශ්‍යතාව පදනම් විසඳුම්, සරළ කල ඇතුළත් කර ගැනීම සහ සක්‍රිය උපදේශ සේවා කෙරෙහි අවධානය යොමු කලෙමු. ඩිජිටල් සේවා මාර්ග පහසුව සඳහා තවදුරටත් ප්‍රශස්ත කරන ලදී. සමාජ සත්කාර පදනම් සහභාගිත්වය සහ අධ්‍යාපනික වැඩසටහන් වැනි අගය එකතුකළ සේවා විශ්වාසය හා පක්ෂපාතිත්වය පෝෂණය කිරීමට සහය විය. අපගේ සේවා විශිෂ්ඨත්වය සහ පාරිභෝගික සංවේදී සේවා ලබාදීම, ශක්තිමත් අලෙවියෙන් පසු සහය, පුද්ගලගත සහභාගිත්වය, සහ ඩිජිටල් අලුත් කිරීමේ මෙවලම් තුළින් ඉහළ ඔප්පුහිමියන් රඳවා ගැනීම සහතික කර ඇත. සමාජ සත්කාර වැඩසටහන්, කාලීන සන්නිවේදනය, සහ අගය එකතුකළ සේවා මගින් අප්‍රතිහත ධෛර්ය තවදුරටත් ශක්තිමත් කරන ලද අතර මේ සියල්ල පාරිභෝගිකයින් වෙත අපගේ දිගුකාලීන කැපවීම ඉස්මතු කර දක්වයි.

## ආයතනික පාලනය සහ අනුකූලතාව

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ලයිෆ් සමාගම අඛණ්ඩතාව, වගවීම සහ විනිවිදභාවය මත මුල් බැසගත් ශක්තිමත් පාලන රාමුවක් ආරක්ෂා කරයි. පුළුල් චර්යාධර්ම සංග්‍රහයක් නිතිපතා අනුකූලතා විගණන, අඛණ්ඩ පුහුණුව සහ මනාව නිර්වචනය කළ දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන් හරහා සදාචාරාත්මක හැසිරීම ශක්තිමත් කරනු ලැබේ. සියලුම පාරිභෝගික ස්පර්ශක ස්ථානවලදී අනුරූපතාව සහ වෘත්තීමයභාවය මෙයින් සහතික කරයි. යම් මතුවන අවදානම් කලින්ම මනාව හඳුනා ගන්නා බව සහ සිදුවීම් නොමැතිව අවදානම් අවම කරන බව සහතික කිරීමට අවදානම් කළමනාකරණය හා විගණන සහ සහතික කිරීමේ කාර්යයන් කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අවදානම් කමිටුවක් අධීක්ෂණය කරන ව්‍යුහගත ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවක් අපගේ අවදානම් ප්‍රවේශය මෙහෙයවයි. ප්‍රාරක්ෂණය යහපත් ආයුගණක මූලධර්ම, දත්ත විශ්ලේෂණ, සහ නියාමන අනුකූලතාව තුළ පදනම් වන අතර විචක්ෂණ අවදානම් තෝරාගැනීම සහ කළඹේ තිරසාරභාවය සහතික කරයි.

## අපගේ සේවකයින්

බුද්ධිගලනය හා ජනතා සංක්‍රමණය මගින් ඇති කළ අභියෝග හමුවේ, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් එහි මානව ප්‍රාග්ධනය පෝෂණය කිරීම සහ රඳවාගැනීම සඳහා දැඩිව කැප වී සිටී. අභ්‍යන්තර හැකියාවන් ගොඩ නැගීමට නිපුනතා ඉහළ දැමීම සහ හරස් නිපුනතා මුලපිරීම්වල අපි ආයෝජනය කළ අතර අපගේ කණ්ඩායම් කඩිසරව හා අනාගතයට සූදානම්ව සිටින බව සහතික කරයි.

# සමූහ විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

ව්‍යුහගත පුහුණුව, ඩිජිටල් ඉගෙනුම් වේදිකා, සහ නායකත්ව සංවර්ධන වැඩසටහන්වලින් සහයවන අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් දක්ෂයින් ඉවත්වයාමේ බලපෑම අවම කිරීමට සහය වේ. අපගේ ශක්තිමත් සන්නාමය, රැකියා ස්ථාවරත්වය, සහ වටිනාකම පදනම් ආයතනික සංස්කෘතිය ආර්ථික අවිනිශ්චිතතාවන් හමුවේ පවා සේවක පක්ෂපාතිත්වයට දායක වී ඇත. උපායමාර්ගිකව දක්ෂයින් අත්කර ගැනීම, සහ රඳවා ගැනීමේ උපායාමර්ග සමඟ වෘත්තිය වර්ධන අවස්ථාවන් හා පිළිගැනීම වසර පුරාම මෙහෙයුම් අඛණ්ඩතාව සහ සේවා විශිෂ්ටත්වය පවත්වා ගැනීමට අපව ශක්තිමත් කර ඇත.

## තිරසාරභාවය හා ආයතනික සමාජීය වගකීම

තිරසාරභාවය සමාගමේ ප්‍රධාන මූලධර්මය වේ. අපි පාරිසරික හා සමාජීය වගකීම උපායමාර්ගික සැලසුම් කිරීම, මෙහෙයුම් හා පාරිභෝගික සහභාගිත්වයට ඒකාබද්ධ කළෙමු. ඩිජිටල් පරිනාමනය, කඩදාසි රහිත ක්‍රියාවලි, සහ බලශක්ති කාර්යක්ෂමතාව මෙයට ඇතුළත්ය. එය අපගේ ආයතනික සැලැස්ම තුළින් ප්‍රවාහය වන අතර සේවක දැනුවත්භාවය නිරන්තර පුහුණුව සහ තිරසාරභාවය කේන්ද්‍ර කරගත් මූලපිරීම් මගින් ඇති කරයි.

2024 දී, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සෞඛ්‍ය, අධ්‍යාපනය, ආපදා සහන, සහ සංස්කෘතික සංරක්ෂණය හරහා මූලික කරගත් මූලපිරීම් තුළින් සමාජීය වගකීමට සිය බැඳීම සවිබල ගැන්වීය. ගම්පහ, රත්නපුර සහ මාතර යන දිස්ත්‍රික්කවල ගංවතුරෙන් පීඩාවට පත් වූ 1,100කට වැඩි පවුල් සඳහා අවදානම් කළමනාකරණ මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව අත්‍යවශ්‍ය වියලි ආහාර ඇසුරුම් ලබා දෙන ලදී. ලෝක ළමා දිනය සැමරීම සඳහා, අඛණ්ඩව තුන්වැනි වරටත් මෙරට සියලුම රෝහල්වල ඔක්තෝබර් 01 දින උපන් සෑම ළමයෙකුගේම දෙමව්පියන් ආවරණය කිරීමට රු. මිලියන 1ක රක්ෂණ ආවරණයක් අපි නොමිලේ ලබා දුනිමු. අපගේ සන්නාමයක් වන, සුබ පැතුම් ශිෂ්‍යත්ව වැඩසටහනින් රු. මිලියන 30ක මූල්‍ය බැඳීමක් ජාතික විභාගවලදී සිය කාර්යසාධනය ඉහළින් අත්කරගත් සිසුන් 370ක් වෙත ප්‍රදානය කරන ලදී.

ඊට අමතරව, අනුරාධපුරයේ අපගේ වාර්ෂික පොසොන් සහය වැඩසටහනින් අතරමං වූ අය සොයා දීමේ සහය සහ ප්‍රවේශ්‍යතාව වැඩි කරමින් සුවිශේෂී රෝද පුටු සේවාවක් හඳුන්වාදීම වැනි සේවාවන්ගෙන් වන්දනාකරුවන් දහස් ගණනකට සහය විය. එමෙන්ම මහනුවර ඇසළ පෙරහැර, නවම්, බෙල්ලන්විල, ගැටබරුව, කතරගම සහ කෝට්ටේ පෙරහැර ඇතුළුව ප්‍රධාන පෙරහැර (සංස්කෘතික ප්‍රදර්ශන) කිහිපයකට සහයවෙමින් ශ්‍රී ලංකාවේ උරුමය සුරැකීමට දායක වී ඇත. අපගේ ආයතනික සමාජීය වගකීම්සහගත වැඩසටහන්, හරිත මෙහෙයුම් සහ ISO 14064-1:2018 සහතික කිරීම තුළින තිරසාර සංවර්ධනය සඳහා අපගේ ඉදිරියට යන කැපවීම පෙන්නුම් කරයි.

## අභියෝග

2024 දී, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සාර්ව ආර්ථික පීඩනයන්, වෙනස්වන පාරිභෝගික අපේක්ෂාවන් සහ වේගවත් ඩිජිටල් බිඳවැටීම් හමුවේ ක්‍රියාත්මක විය. ප්‍රධාන අභ්‍යන්තර අභියෝගය වූයේ සේවකයින්, ක්‍රියාවලි හා ප්‍රමුඛතාවන් නැවත පෙළ ගැසීම අවශ්‍ය කරන සංකීර්ණ කාර්යයක් වන ව්‍යාපාරය වෙන් කිරීම සාර්ථකව ක්‍රියාත්මක කිරීමයි. විනිවිද සන්නිවේදනය, සේවක සහතික කිරීම හා මෙහෙයුම් අඛණ්ඩතාව කෙරෙහි අවධානයක් සමඟ අපි මෙය ඉදිරියට ගෙන ගියෙමු. බාහිර වශයෙන්, අපි බෙදාහැරීම ශක්තිමත් කිරීම, ඩිජිටල් හැකියාවන් වැඩි කිරීම සහ මෙහෙයුම් ප්‍රශස්ථ කිරීම සිදු කළෙමු. මෙවැනි මූලපිරීම් ස්ථාවරත්වය පවත්වා ගැනීමට, ගනුදෙනුකාර ලඟාවීම වර්ධනය කිරීමට සහ ව්‍යාපාරික ගම්‍යතාව රඳවා ගැනීමට අපට සහය විය.

## අනාගත අවධානය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් තිරසාර නායකත්වය ලබාදීමට සැලසුම්කළ ප්‍රධාන කුළුණු හයක් වටා සිය උපායමාර්ගය පදනම් කරමින් තරඟකාරී වාතාවරණය හඹා යමින් සිටී. දිගු කාලීන වර්ධනයට සහය වීමට අපගේ මූල්‍ය තත්ත්වය අපි ශක්තිමත් කරමින් සිටින අතර අඛණ්ඩ ඩිජිටල් නව්‍යකරණය සහ ක්‍රියාවලි නැවත සකස් කිරීම තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කරමු. නිර්මාණය කරන ලද ආරක්ෂාව හා ආයෝජක අවශ්‍යතා සඳහා අවශ්‍ය සැලසුම් සමඟ සියලුම ව්‍යාපාරික මෙහෙයුම් සහ තීරණ ගැනීමේදී පාරිභෝගිකයාගේ අවශ්‍යතා සහ මනාපයන්ට ප්‍රමුඛතාව පවත්වා ගනී. මේ සමගම, වඩා ශක්තිමත් අනුකූලතා සහ අවදානම් කළමනාකරණය තුළින් අපගේ පාලන රාමුව අපි සවිබල ගන්වමු. දේශීය හා කලාපීය උපායමාර්ගික සන්ධාන නව අවස්ථාවන් විවෘත කර ගැනීමට අපට සහයවන අතර දක්ෂ හා සවිබලගන්වන ලද සංස්කෘතියක් පෝෂණය කිරීම වෙත අපගේ කැපවීම අපි අනාගතයට සූදානම් බව සහතික කරයි. මෙම කුළුණු එක්ව අපගේ රක්ෂණ ඔප්පු හිමියන්ට සුවිශේෂී වටිනාකමක්, විශ්වාසයක් සහ අදාළත්වයක් ලබා දෙමින්, චක්‍රයේ ඉදිරියෙන් සිටීමට අපව මෙහෙයවනු ලබයි.

දිගුකාලීන, තිරසාර වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ජීවිත රක්ෂණ ක්ෂෙත්‍රයෙහි සිය නායකත්ව ස්ථානය ශක්තිමත් කිරීම අපගේ අරමුණකි. අපගේ උපායමාර්ගික දිශානතිය මූල්‍ය ස්ථාවරත්වය ශක්තිමත් කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඇති කිරීම, පාරිභෝගික කේන්ද්‍රීය පිරිනැමීම් වැඩි කිරීම සහ ශක්තිමත් පාලනය තුළින් විශ්වාසය තියුණු කිරීම වටා කේන්ද්‍රගත වී ඇත. එමෙන්ම අර්ථවත් හවුල්කාරත්වයන් ගොඩ නැගීම සහ ඉහළ කාර්යසාධනයක් සහිත අනාගතයට සූදානම් ශ්‍රම බලකායක් සංවර්ධනය තුළ ආයෝජනය කිරීම අප තවදුරටත් සිදු කරමු. ඉදිරි වසරවල ක්ෂෙත්‍රයේ විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීමට අප උත්සාහ දරන බැවින් මෙවැනි ප්‍රමුඛතාවන් අපව මෙහෙයවනු ඇත.

## පිළිගැනීම

තවත් එක් බලපෑම්සහගත වසරක් අප නිමකරන බැවින්, 2024 දී ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් අඛණ්ඩ සාර්ථකත්වයට දායක වූ සියලුම දෙනා වෙත මගේ හෘදයංගම අගය කිරීම ප්‍රකාශ කරමි. මෙම වසරේ අපගේ ජයග්‍රහනයන් තුළින් නොසැලෙන කැපවීම, ඔරොත්තුදීම සහ අපගේ සේවකයින්ගේ වෘත්තීමයභාවය පිළිබිඹු කරන අතර, ඔවුන්ගේ ලැදියාව සහ කැපවීම සියලුම පෙරමුණු මත අපගේ කාර්යසාධනය නැවත වරක් ඉහළ දමා ඇත.

අපගේ පක්ෂපාතී ගනුදෙනුකරුවන් වෙත, වඩාත් වැදගත් වන ආරක්ෂාව සඳහා අප කෙරෙහි ඔබ තබන ලද අඛණ්ඩ විශ්වාසය සඳහා ඔබට ස්තුතිය පුදකරමි. ඔබගේ වෙනස්වන අවශ්‍යතා සැබැවින්ම සපුරාලන විසඳුම් නව්‍යකරණය කිරීමට, අනුවර්තනය වීමට සහ ලබාදීමට අප මෙහෙයවා ඇත.

අපගේ ශ්‍රමබලකායේ, රක්ෂණ තැරැව්කරුවන්ගේ, ප්‍රතිරක්ෂණ සහයකයින්ගේ සහ අනෙකුත් සියලුම මැදිහත්කරුවන්ගේ සහ පාර්ශවකරුවන්ගේ අමිල දායකත්වය මම බෙහෙවින් අගය කරන අතර ඔවුන් අපගේ ලඟාවීම සහ බලපෑම දැඩි කිරීමට අපත් සමඟ වෙහෙස නොබලා කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ මුදල්, ආර්ථික ස්ථායිතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යංශය විසින් ලබාදෙන ලද අමිල සහයෝගය අපි අගය කොට සලකමු. ඔවුන්ගේ මඟපෙන්වීම සහ සහයෝගය සංකීර්ණ හා වෙනස්වන වාතාවරණයක් තුළින් අපගේ ගමන්මඟ හැඩ ගැස්වීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

අවසාන වශයෙන්, උපායමාර්ගික මග පෙන්වීම, ප්‍රඥාව සහ දූර දර්ශී නායකත්වය වෙනුවෙන් සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පුදකරමි. දිගුකාලීන වටිනාකම් නිර්මාණය කෙරෙහි අවධානය තබා ගනිමින් වෙනස තුළින් ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ලයිෆ් මෙහෙයවීමේ දී ඔවුන්ගේ පෙර දැක්ම උපකාරී වී ඇත.

අපගේ සේවකයින්ගේ ශක්තිය, අපගේ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය, අපගේ හවුල්කරුවන්ගේ සහය, සහ අපගේ නායකත්වයේ දැක්ම සමඟ එක්ව, දැනටමත් අත්කරගෙන ඇති සාර්තකත්වය මත ගොඩනැගෙමින් ජීවිත රක්ෂණයේ අනාගතය අඛණ්ඩව හැඩ ගැස්වා ගැනීමට අපි අපේක්ෂා කරන්නෙමු.



**චන්දන එල්. අලුත්ගම**
සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී

03 ජුනි 2025

# 28.

# වාර්තාවේ පැතිකඩ

# වාර්තාවේ පැතිකඩ



2024 පෙබරවාරි සිය මෙහෙයුම් වෙන් කිරීමේ සිට සමාගමේ පළමු වාර්ෂික වාර්තාව සලකුණු කරමින් ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (“සමාගම” හෝ “SLICLL”) වෙනුවෙන් 2024 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම අපට සතුටකි. ඉන් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර තුළ සමාගමේ කාර්යසාධනය පිළිබඳ පුළුල් නමුත් පැහැදිලි සමාලෝචනයක් සපයයි. මෙම වාර්තාවෙන් අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය හා උපායමාර්ග විස්තර කරන අතර අපගේ මෙහෙයුම් වාතාවරණයේ සන්දර්භය තුළ මූල්‍ය, සමාජ, පාරිසරික සහ පාලන ක්ෂේත්‍ර අතර අදාළ තොරතුරු ඉදිරිපත් කරයි. තවද, අපි අපගේ ඉදිරි දැක්ම පිරිනමන අතර ඉදිරි වසර වල ආර්ථික සත්‍යතාවන් විසින් මේවා හැඩගන්වනු ඇති බවට පිළිගනිමින් අනාගතය සඳහා අපගේ අපේක්ෂාවන් හුවමාරු කරමු.

වාර්තාවේ මූලික විෂයපථයෙන් සමාගමේ ප්‍රධාන උපායමාර්ගය ආවරණය කරන අතර එය ක්ෂේත්‍රයට අදාළ නීතියෙහි දක්වා ඇති පැහැදිලි නිර්ණායක යටතේ ජීවිත රක්ෂණ නිෂ්පාදන පිරිනැම්මකි. මෙම වාර්තාවෙන් විවිධ කාර්යයන් අතර අන්තර් සම්බන්ධතා මනාව පිළිබිඹු කරමින් සමාගමේ උපායමාර්ගය හා කාර්යයන් පිළිබඳ ගැඹුරු දළ විශ්ලේෂණයක් ලබා දේ. යහපාලන සහ තිරසාර මූලධර්ම මත පදනම් වටිනාකම් නිර්මාණයට සමාගමේ ප්‍රවේශය සහ දිගුකාලීනව ආර්ථිකය, පරිසරය සහ සමාජය කෙරෙහි මේවා බලන ආකාරය ඉන් ඉස්මතු කරයි.

## විෂයපථය හා සීමාව

මෙම වාර්තාවෙන් සමාගමේ මූල්‍ය හා මූල්‍ය නොවන කාර්යසාධනය ආවරණය කරයි. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා අපගේ පෙර වාර්තාවෙන් මෙය ගොඩ නංවන අතර එයට අපගේ ව්‍යාපාර උපායමාර්ගයෙන් ඇතිවන අවදානම් හා අවස්ථා, විවිධ පාර්ශ්වකරුවන්, අපගේ ව්‍යාපාර කටයුතු තුළින් අපි වටිනාකම නිර්මාණය, ආරක්ෂා සහ එය අඩුවන ආකාරය ඇතුළත්ය.

මෙවැනි සංකීර්ණ ව්‍යාපාර සම්බන්ධතා කළමනාකරණය කිරීමට අපි අරමුණු කරන අතර අපගේ සාර්ථකත්වය පැහැදිලි කරන ප්‍රමාණාත්මක කරුණු කෙරෙහි අවධානය යොමු කරමු. ඒවානම්:

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **අපගේ ව්‍යාපාර ආදර්ශය**<br>පිටුව 38 | **අපගේ උපායමාර්ගය**<br>පිටුව 32 | **අපගේ මෙහෙයුම් සන්දර්භය**<br>පිටුව 40 | **අපගේ ප්‍රමාණාත්මක ගැටළු**<br>පිටුව 34 | අපගේ මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණ සීමාව හා බැඳුණු මූල්‍ය වාර්තාකරණ සීමාව | **අපගේ පාර්ශ්වකාර සම්බන්ධතා**<br>පිටුව 36 | ගනුදෙනුකරුවන්, සේවකයින්, නියාමකයින් සැපයුම්කරුවන්, ව්‍යාපාර හවුල්කරුවන්, ප්‍රජාව |

අපි ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ ප්‍රමිති සභාවේ (IIRC) රාමුවට යොමු වෙමින් වාර්තාකරණ අතර එම රාමුව සය වැදෑරුම් ප්‍රාග්ධනය හා සම්බන්ධිත නිමැවුම ඇතුළත් වේ, මෙයින් සමාගමේ සහ වඩා පුළුල්ව ප්‍රජාවගේ තිරසාරතාව සහතික කරන අතර වගවන ඒකාබද්ධ වාර්තාකරණ ව්‍යාහාර කරා අපගේ කැපවීම පිළිබිඹු කරමින් වටිනාකම නිර්මාණය කරමින් විනිවිද ආකාරයකින් අපගේ පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය සිදු කරයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| **මූල්‍ය ප්‍රාග්ධනය** | **නිෂ්පාදිත ප්‍රාග්ධනය** | **බුද්ධිමය ප්‍රාග්ධනය** | **මානව ප්‍රාග්ධනය** | **ස්වභාවික ප්‍රාග්ධනය** | **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය** |

රජයට අයත් ආයතනයක් ලෙස, වාර්තාකරණය සඳහා අපගේ ප්‍රවේශය විවිධ වාර්තාකරණ පාලන තන්ත්‍ර අතර පහත ප්‍රධාන සඳහන් රාමු, ප්‍රමිති, සහ රෙගුලාසිවලින් මෙහෙයවනු ලබයි:

| රෙගුලාසිය | අභ්‍යන්තර සහතිකවීම | බාහිර සහතිකවීම |
|---|---|---|
| **මූල්‍ය පවාර්තාකරණය, පාලනය, අවදානම් කළමනාකරණය සහ මෙහෙයුම්** | | |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්<br>ශ්‍රී ලංකා රජයට අයත් රක්ෂණ සමාගම් සඳහා අදාළ නෛතික සහ රෙගුලාසි රාමු<br>ආයතනික පාලන රෙගුලාසි | අධ්‍යක්ෂ මණ්ඩල විගණන හා අනුකූලතා කමිටුවට වාර්තා කිරීම | වාර්ෂික මූල්‍ය ප්‍රකාශවල නිරවද්‍යතාව විගණක සහතික කිරීම<br>105 පිටුව බලන්න |
| **ඒකාබද්ධ වාර්තාකරණය** | | |
| ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ ප්‍රමිති සභාවේ (IIRC) ජාත්‍යන්තර රාමුවට යොමුවීම | | |
| එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු (UN SDGs) | | |

# වාර්තාවේ පැතිකඩ

## ප්‍රමාණතාව

ව්‍යුහගත, සංවිධාන මට්ටමින් ප්‍රමාණතාව තක්සේරු ක්‍රියාවලියක් මඟින් සමාගමට වැදගත් වන ගැටළු හඳුනා ගනී. ද්විත්ව ප්‍රමාණාත්මක මූලධර්මය මත පදනම්ව, මෙම ක්‍රියාවලිය සමාගම කෙරෙහි ඇති විය හැකි බලපෑම් සහ සේවකයින්ට සහ පරිසරයට එහි බලපෑම් යන දෙකම ආමන්ත්‍රණය කරයි. මෙම තක්සේරුව මගින් ප්‍රාග්ධනයන්ට සම්බන්ධ ප්‍රමාණතාව කෙරෙහි සහ සිය පාර්ශ්වකරුවන්ට වටිනාකම ලබාදීම සහ අඩුවීම අවම කිරීමට සමාගමට ඇති හැකියාව කෙරෙහි බලපාන අවදානම්, සාර්ව ආර්ථික ප්‍රවනතා, සහ වෙනත් අංග ක්‍රමානුකූලව ආමන්ත්‍රණය කරයි. රක්ෂණ සේවා සපයන්නෙක් ලෙස, මෙම වාර්තාවේ 34 පිටුවේ දක්වා ඇති ප්‍රධාන ප්‍රමාණාත්මක අංග හඳුනා ගැනීමට ශක්තිමත්, මනාව දැනුවත් සහ සාකල්‍ය ප්‍රවේශයක් අපි යොදා ගනිමු. කාර්ය සාධනය වැඩි කිරීම, අපගේ තිරසාර රාමුව ශක්තිමත් කිරීම, ශක්තිමත් පාලන මූලධර්මවලට අනුගත වීම සහ අපගේ නියාමන අනුකූලතාවය තුළින් වගවීම පෙන්නුම් කිරීම සඳහා මෙම ගැටළු අපි සියුම්ව පරීක්ෂා කරමින් විසඳා ගනිමු.

## ඉදිරි දැක්ම සහ දත්ත ප්‍රකාශ කිරීම සඳහා අයිතිය අත්හැරීම

මෙම වාර්තාවේ සමාගමේ විභව අනාගත කාර්යසාධනය හා දර්ශනයන් සම්බන්ධයෙන් ඉදිරිය දකින ප්‍රකාශයන් ඇතුළත් වේ. මෙම ප්‍රකාශනවලින් අනාගත ප්‍රතිඵල පිළිබඳව සහතික කිරීම් නොමැති අතර අනපේක්ෂිත සිදුවීම්, වෙනස්වන ආර්ථික හා දේශපාලන තත්ත්වයන්, සහ අපගේ පාලනයෙන් තොර වෙනත් සාධක ඇතුළුව විවිධ අවදානම් සහ අවිනිශ්චිතතාවන්ට යටත් වේ. සැබෑ ප්‍රතිඵල වර්තමාන අපේක්ෂාවන්ගෙන් සැලකියයුතු ලෙස වෙනස්විය හැකිය. එවැනි සියලුම අංග පිළිබඳව ප්‍රවීන වෘත්තීමය උපදේශය ලබාගන්නා මෙන් පාඨකයින්ට අවවාද කරනු ලබයි.

## වටිනාකම් නිර්මාණය

අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය ව්‍යාපාර ආදර්ශය තුළ පුළුල් වශයෙන් විස්තර කෙරේ. (32 පිටුව බලන්න). වටිනාකම නිර්මාණයේදී ප්‍රාග්ධනයේ යෙදවුම්, නිමැවුම්, සහ ප්‍රතිඵල මෙන්ම ඒවායේ වගකීම්සහගත කළමනාකරණය ඉන් විස්තර කරයි. මූල්‍ය ප්‍රාග්ධනයේ උත්පාදනය සමාගමට සහ එහි පාර්ශ්වකරුවන්ට වටිනාකම නිර්මාණය කිරීමට මූල්‍ය සහ මූල්‍ය නොවන මැදිහත්වීම් අතර අනෝන්‍ය වශයෙන් රඳා පවතින සංයුක්තතාවය මගින් මෙහෙයවන බව ඒකාබද්ධ වාර්තාකරණය කරා අපගේ යොමුව තුළින් සහතික කරන අතර ක්‍රියාවලීන් තුළ මෙවැනි ප්‍රාග්ධනයන් භාවිතය සංවර්ධනය හා පරිවර්තනය සිදු කරයි.

## පූර්වාරක්ෂක මූලධර්මය

අපගේ මෙහෙයුම්වල දිගුකාලීන ශක්තිය සහතික කිරීමට සම්පූර්ණ සාක්ෂි සහ තොරතුරු නොමැති වුවද විභව අවදානම් කාර්යය අවම කරමින් සමාජීය හා පාරිසරික තීරණ ගැනීම කරා අප කැපවන බැවින් අපි පූර්වාරක්ෂක මූලධර්මය භාවිතා කරමු. අප බලපෑම් කරන අපගේ පාර්ශ්වකරුවන්, පරිසරය සහ ප්‍රජාව සුරක්ෂිත කරමින් වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස අපට ක්‍රියාත්මක වීමට මින් ඉඩ ලබා දේ. මෙම පූර්වාරක්ෂක මූලධර්මය ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත අභියෝගවලදී අපට සහයවන අතර අපගේ පාර්ශ්වකරුවන් අතර විශ්වාසය ප්‍රවර්ධනය කරමින් අපගේ ඔරොත්තුදීම සවිබල ගන්වන විසඳුම් ඇති කරයි.

## ඒකාබද්ධ සහතික කිරීම

මෙම ඒකාබද්ධ වාර්තාවේ ඇතුළත් අන්තර්ගතය සඳහා සහතික කිරීම අභ්‍යන්තර හා බාහිර මූලාශ්‍ර පිළිබඳ පරීක්ෂාකාරීව සිදුකළ සංයෝජනයක් මගින් සවිබල ගන්වයි. මෙම වාර්තාවේ ඇතුළත් තොරතුරුවලට අදාළ ව්‍යාපාර ඒකකවල නායකයින්ගේ අනුමැතිය ලැබී ඇති අතර අවසාන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර ආයතනික කළමනාකරණ කණ්ඩායම විසින් සියුම්ව පරීක්ෂා කර ඇත. ගිණුම්වලට සටහන් ඇතුළුව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අත්‍යවශ්‍ය ස්වාධීන සමාලෝචනය ශ්‍රී ලංකාවේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අතර දෙපාර්තමේන්තුවේ සමාලෝචනය මෙම වාර්තාවේ 105 පිටුවේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම බාහිර වලංගුකිරීම තුළින් මෙම වාර්තාවේ ඉදිරිපත් කරන මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයත්වය හා විනිවිදභාවය ශක්තිමත් කරයි.

## අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් ප්‍රකාශය

ඒකාබද්ධ වාර්ෂික වාර්තාව මගින් 2024 දී සිය කාර්යසාධනය පිළිබඳ තුලනාත්මක දැක්මක් ලබාදෙන බව සහතික කිරීමට ඇති සිය වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගන්නා අතර, කෙටිකාලීනව වටිනාකම නිර්මාණය කිරීමට සමාගමේ හැකියාව මත සම්බන්ධයක් ඇතැයි විශ්වාස කරන සියලුම ප්‍රමාණාත්මක ගැටළු ආමන්ත්‍රණය කර ඇතැයි යන මතය තුළ ඔවුන් සිටී. ආයතනික කළමනාකරණ කණ්ඩායම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව සකස් කර සහ සමාලෝචනය කර එය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට ඉදිරිපත් කර ඇති අතර ඔවුන් බලතල පැවරීමට අනුකූලව අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාව නිර්දේශ කර ඇත. මෙම වාර්තා 2025 අප්‍රේල් 28 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

## මෙහෙයුම් මූලධර්ම

අපගේ කාර්යසාධනය හා මෙහෙයුම් පිළිබඳ විශ්වාසනීය සමාලෝචනයක් ලබාදීමට මෙම වාර්තාව සකස් කිරීමේදී පහත සඳහන් මූලධර්ම යොදා ගන්නා ලදී.

- විශ්වාසනීයත්වය - මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරුවල විශ්වාසනීයත්වය ලබාදීමට දැනට ක්‍රියාත්මක කළ අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාවලි.
- සංක්ෂිප්තබව - අපි සියලුම වැදගත් කරුණු සම්පූර්ණ නමුත් සංක්ෂිප්ත ආකාරයෙන් ආවරණය කර ඇත.
- සත්‍ය ඉදිරිපත් කිරීම – ධනාත්මක හෝ සෘණාත්මක ප්‍රතිඵල මත පදනම් වූ තුලනාත්මක දැක්මක් විශ්වාසනිය ආකාරයෙන් වාර්තා කිරීම.
- ප්‍රමාණතාව – ප්‍රමාණතා කරුණු වගකීම්සහගත අයුරින් හඳුනාගෙන වාර්තා කර ඇත.
- ඒකාබද්ධ වාර්තාකිරීම සහතික කිරීම – තොරතුරුවල සම්බන්ධතාව වාර්තාකරමින් හා ලබාදෙමින් විවිධ මාතෘකා ඒකාබද්ධ කිරීමට අයිකන් (Icons) භාවිතා කර ඇත.
- වාර්තාකරණය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති ඇතුළත් කිරීම – අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිති සමඟ අනුකූලවීමට GRI tagging භාවිතා කර ඇත.

## ප්‍රතිපෝෂණය

වාර්තාකරණ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ සිය ඉදිරියට යන කැපවීමේ කොටසක් ලෙස මෙම වාර්තාව සහ වෙනත් කරුණු පිළිබඳව පාර්ශ්වකාර ප්‍රතිපෝෂණ අපි සාදරයෙන් පිළිගනිමු.

**සමාගම් ලේකම්**
ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්
"රක්ෂණ මන්දිරය",
අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
දුරකතනය: +94 11 235 7741

# 31.

# උපායමාර්ගය සහ අවධානය


32 ව්‍යාපාර ආකෘතිය

34 ප්‍රමාණාත්මක කරුණු

36 පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතා

38 උපායමාර්ගික ප්‍රමුඛතාවයන්

# ව්‍යාපාර ආකෘතිය

## දැක්ම

| යෙදවුම් මූලාශ්‍ර | යෙදවුම් |
| --- | --- |
| **කොටස්හිමියන්**<br>100% ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | **මූල්‍ය ප්‍රාග්ධනය**<br>කොටස් හිමියන්ගේ අරමුදල, ආයෝජනය, ජීවිත අරමුදල |
| **පාරිභෝගිකයින්**<br>989,963 ජීවිත රක්ෂණ ඔප්පු | **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**<br>ගනුදෙනුකරුවන්<br>නිෂ්පාදන පිළිගැනීම<br>වාරික ගෙවීම්<br>ඔප්පු අලුත් කිරීම් |
| **සේවකයින්**<br>පිරිමි 429<br>කාන්තාවන් 485<br>එකතුව 914 | **මානව ප්‍රාග්ධනය**<br>පාරිභෝගික සම්බන්ධතා<br>ඵලදායිතාව<br>මනා පරිචයන්<br>අලෙවියෙන් පසු සේවා<br>මෙහෙයුම් |
| **ව්‍යාපාර හවුල්කරුවන්**<br>ප්‍රතිරක්ෂකයින්<br>නියෝජිතයින්<br>තැරැව්කරුවන්<br>බැංකු | **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**<br>ව්‍යාපාර හවුල්කරුවන්<br>සහතික කිරීමේ සේවා<br>සහයෝගිතා සේවා සහ සන්ධාන<br>සේවා සහ සැපයීම්<br>උපයෝගිතා |
| **පරිශ්‍ර/ශාඛා ජාලය**<br>ශාඛා 142<br>ABDCs (නියෝජිතායතන ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය) | **නිෂ්පාදිත ප්‍රාග්ධනය**<br>දේපළ, පිරියත හා උපකරණ<br>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය |
| **ආයතනික දැනුම** | **බුද්ධිමය ප්‍රාග්ධනය**<br>සාමූහික ප්‍රවීනතාව<br>ආයතනික දැනුම<br>දත්ත විශ්ලේෂණ<br>සමීක්ෂණ සොයාගැනීම් හා කාර්යය |
| **ප්‍රජා වැඩසටහන්** | **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**<br>ප්‍රජාව<br>සමාජ සත්කාරක සේවා |
| **නියාමක – ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසන් සභාව (IRCSL), සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව (DROC), බුද්ධි මූල්‍ය ඒකකය ශ්‍රී ලංකා මහ බැංකුව (FIU-CBSL)** | **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**<br>නියාමකයින්<br>නීති හා රෙගුලාසිවලට අනුකූලවීම<br>කාලීන වාර්තාකරණය |
| **පරිභෝජනය** | **ස්වභාවික ප්‍රාග්ධනය**<br>බලශක්තිය<br>විදුලිය<br>ජලය |

## මෙහෙවර

**ක්‍රියාපටිපාටි/ක්‍රියාකාරකම්**




**මෙහෙයුම් පරිසරය**

## පරමාර්ථ




නියාමන වාර්තාකරණය

| නිමැවුම් | ප්‍රතිඵල |
|---|---|
| **මූල්‍ය ප්‍රාග්ධනය**<br>ජීවිත අරමුදල රු. මිලියන 213.2<br>ආයෝජන මත ඉපැයීම 12%<br>ජීවිත අරමුදලට මාරු කිරීමට පෙර බදු පෙර ලාභය රු. මිලියන 30,767<br>නුබුන්වත් අනුපාතය 565%<br>වෙළෙඳපොළ කොටස 14.4% | ලාභාංශ ලෙස රු. මිලියන 250 යෝජනා කර ඇත.<br>බදු ලෙස රු. මිලියන 804.4ක් ගෙවා ඇත. |
| **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**<br>පාරිභෝගිකයින්<br>නව ඔප්පු 62,346<br>වාර්ෂික වර්ධනය 0.19% | හිමිකම් ලෙස රු. මිලියන 12,994 ක් පියවන ලදී.<br>ඔප්පුහිමියන්ට ප්‍රසාද දීමනා ලෙස රු. මිලියන 12,522 ප්‍රකාශයට පත්කර ඇත. |
| **මානව ප්‍රාග්ධනය**<br>නව බඳවාගැනීම 129/ස්ථිර සේවක සංඛ්‍යාව<br>93.4%ක සේවක රඳවා ගැනීමේ අනුපාතය | වැටුප් හා ප්‍රතිලාභ ලෙස රු. මිලියන 3,187ක් ගෙවා ඇත.<br>විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ ලෙස රු. මිලියන 70.8ක් ගෙවා ඇත.<br>පුහුණුවීම් සඳහා රු. මිලියන 30ක් ආයෝජනය කර ඇත. |
| **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**<br>ව්‍යාපාර හවුල්කරුවන්<br>නව ව්‍යාපාර සම්බන්ධතා 4 | ප්‍රතිරක්ෂණ වාරික ලෙස රු. මිලියන 1.028ක් ගෙවා ඇත. |
| **නිෂ්පාදන ප්‍රාග්ධනය**<br>ශාඛා 2ක් වැඩි දියුණු කරන ලදී<br>නව තාක්ෂණය/ඩිජිටල්කරණ අත්කරගැනීම්<br>වඩා ඉහළ සන්නාම දෘශ්‍යතාවයට දායකවීම | ඉහළ දෘෂ්‍යතාව, දිවයින පුරා ව්‍යාප්තිය, විශ්වාසය |
| **බුද්ධිමය ප්‍රාග්ධනය**<br>රක්ෂණ නිෂ්පාදන සඳහා පහසු හා බාධාරහිත ප්‍රවේශයට දායක වන ඩිජිටල්කරණය<br>කාර්යක්ෂම සැකසුම් | ප්‍රතිචාරාත්මකබව, නිර්මාණශීලී නව්‍යකරණය, ඉක්මන් විසඳුම් |
| **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**<br>ප්‍රජාව<br>ක්‍රියාත්මකවීමට සමාජීය බලපත්‍රය<br>වැඩ කිරීමට දායක වන CSR කටයුතු | ප්‍රජා ප්‍රතිලාභී සමාජ සත්කාර වැඩසටහන්, ආයතනික සමාජීය වටිනාකම රඳවා ගැනීම සහ වර්ධනය කිරීම |
| **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**<br>නියාමකයින්<br>බාධාරහිත මෙහෙයුම් | විගණකවරුන්ගේ වාර්තාවේ අනාවරණය කරන දෑ හැර සියලුම අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලවීම |
| **ස්වභාවික ප්‍රාග්ධනය**<br>පරිසරය සංරක්ෂණයට දායක වන වගකීම් සහිත පරිභෝජනය | ශක්තිමත් ප්‍රජාවන්, තිරසාරභාවය, ජාතික අරමුණු සාක්ෂාත් කරගැනීමට දායක වීම සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ පෙළ ගැස්වීම |

# ප්‍රමාණාත්මක කරුණු

## අපගේ සමස්ත උපායමාර්ගවල තීරණාත්මක සංරචකය, ප්‍රමාණාත්මක තක්සේරු කිරීම අපගේ සමස්ත ව්‍යාපාර මෙහෙයුම්වලට බලපාන වඩාත් සැලකියයුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහය වේ.

### අපගේ ප්‍රවේශය

යෙදවුම් හඳුනාගෙන රැස්කිරීම, බලපෑම් තක්සේරු කිරීම සහ අපගේ ව්‍යාපාර මෙහෙයුම් සහ පාර්ශ්වකරුවන්ට බලපාන ප්‍රධාන ගැටළු සම්බන්ධවන උපායමාර්ගය සංවර්ධනය කිරීම සිදු කරමු. මෙයට ආර්ථික වාතාවරණය ඇගයීම, නියාමන අවශ්‍යතා සහ අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවන්ගෙන් ඇතිවන අපේක්ෂාවන් හා අදහස් ඇතුළත්ය. එම නිසා, අපි ව්‍යුහගත සහ ක්‍රමානුකූල ආකාරයෙන් ප්‍රමාණතා තීරණයට එළඹෙන අතර එයට දැඩි තක්සේරු කිරීම, සියුම් විශ්ලේෂණ,සහ හඳුනාගත් ගැටළු ඵලදායි ලෙස ශ්‍රේණිගතකරණය සම්බන්ධ වේ. මෙම ප්‍රවේශයෙන් අපගේ තිරසාරතා වැඩසටහන් සැලකියයුතු අභියෝග විසඳන බව සහ රට තුළ රක්ෂණ වෙළෙඳපොලට ධනාත්මක බලපෑමක් ඇති කරන බව සහතික කරයි.




### ප්‍රමාණාත්මක මාතෘකා

| අංකය | ප්‍රමාණාත්මක මාතෘකාව | SLICLL ඇති වැදගත්කම | පාර්ශ්වකරුවන් ඇති වැදගත්කම | වාර්තාවට යොමුව |
|---|---|---|---|---|
| 1 | ආර්ථික කාර්යසාධනය | ඉතා ඉහළ | ඉතා ඉහළ | මෙහෙයුම් පරිසරය – පිටුව 40 |
| 2 | වෙළෙඳපොල පැවැත්ම | ඉතා ඉහළ | ඉතා ඉහළ | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – පිටුව 66 |
| 3 | දූෂණ විරෝධී වීම | ඉහළ | ඉහළ | ආයතනික පාලනය – පිටුව 79 |
| 4 | තරඟ විරෝධී හැසිරීම | ඉතා ඉහළ | ඉහළ | ආයතනික පාලනය – පිටුව 79 |
| 5 | රැකියා නියුක්තිය | ඉතා ඉහළ | ඉතා ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 60 |
| 6 | වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව | ඉතා ඉහළ | ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 60 |
| 7 | පුහුණුව සහ සංවර්ධනය | ඉහළ | ඉතා ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 60 |
| 8 | විවිධත්වය, ඇතුළත්වීම සහ සමාන අවස්ථාව | ඉතා ඉහළ | ඉතා ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 60 |
| 9 | වෙනස් ලෙස නොසැලකීම | ඉහළ | ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 60 |
| 10 | රැස්වීමේ නිදහස හා සාමූහික කේවල් කිරීම | ඉහළ | ඉහළ | මානව ප්‍රාග්ධනය – පිටුව 60 |
| 11 | දේශීය ප්‍රජාවන් | ඉහළ | මධ්‍යම | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – පිටුව 66 |
| 12 | ගනුදෙනුකාර සෞඛ්‍යය සහ ආරක්ෂාව | ඉහළ | ඉහළ | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – පිටුව 66 |
| 13 | අලෙවිකරණය සහ ලේබල් කරණය | ඉහළ | මධ්‍යම | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය – පිටුව 66 |
| 14 | සමාජ ආර්ථික අනුකූලතාව | ඉහළ | ඉහළ | ආයතනික පාලනය – පිටුව 79 |
| 15 | සාර්ව ආර්ථික සංවර්ධනයන් | ඉතා ඉහළ | ඉතා ඉහළ | මෙහෙයුම් පරිසරය – පිටුව 40 |

### ප්‍රමාණතාව තීරණය කිරීම

තිරසාරභාවය කෙරෙහි අපගේ අවධානය ශක්තිමත් වී ඇති බැවින්, ප්‍රමාණාත්මක ගැටළු හඳුනා ගැනීමේ අපගේ ප්‍රවේශය වසර ගණනාවක් පුරා පරිනාමනය වී ඇත. ප්‍රමාණාත්මක අංග තීරණය කිරීමේදී අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් අපි සලකා බලමු. මොවුන් අපගේ මෙහෙයුම් කටයුතු හා උපායමාර්ගික අරමුණු හැඩගැස්වීමේදී සැලකියයුතු කාර්යභාරයක් ඉටු කරයි. එයට හේතුව ජීවිතයට ඇතිකරන අවදානම් සහ සෞඛ්‍යයට ඉහළ අවදානමක් ඇති කරන තත්ත්වයන් හා බැඳුණු පුද්ගලයින්ගේ අවදානම අවම කිරීමේ ව්‍යාපාරයක අප යෙදී සිටිමයි.

### ප්‍රමාණතාව තීරණය කිරීමේ ක්‍රියාවලිය

ප්‍රමාණාතාව තීරණය කිරීමේ ක්‍රියාවලිය තුළින් වටිනාකම නිර්මාණය කිරීමට විභව හැකියාව මත පදනම් වී ප්‍රධාන මාතෘකා විසඳීමට උත්සාහ දරයි. මෙම වැදගත් අවශ්‍යතාව කාර්යසාධනය ඇති කර තිරසාර ව්‍යවහාර කරා අපගේ බැඳීම ශක්තිමත් කරයි. එය අපගේ පාර්ශ්වකාර සහභාගිත්ව ක්‍රියාවලිය තුළින් අපි හඳුනා ගන්නා සියලුම පාර්ශ්වකාර කණ්ඩායම් සමඟ ඵලදායී සහභාගිත්වය සමඟ ආරම්භ වන අතර බලපෑම නැවත සිදුවීමේ සහ විශාලනය වීමේදි ඔවුන්ගේ අදහස් තවදුරටත් විශ්ලේෂණය කෙරේ. ක්‍රියාවලිය තුළ, අපගේ මූලික අවධානය යොමු වන්නේ ජීවිතයට අනපේක්ෂිත අනතුරු නිතරම ඇතිකරන සමාජයක් තුළ ජීවිතය සහ ජීවිතයට ඇති අවදානම රක්ෂණය කිරීම සඳහා නිර්මාණය කළ වටිනාකම කෙරෙහිය.

## ප්‍රමාණාත්මක කරුණු


පාර්ශ්වකරුවන්ට ඇති වැදගත්කම
ඉතා ඉහළ
ඉහළ
මධ්‍යම
1, 2, 5,
7, 8, 15
3, 6, 9,
10, 12, 14
4
11, 13
මධ්‍යම
ඉහළ
ඉතා ඉහළ
SLICLL ට ඇති වැදගත්කම

# පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතා

## අපගේ කැපවීම වන්නේ ජාතිය තුළ ප්‍රමුඛ ජීවිත රක්ෂණ සපයන්නා ලෙස අපගේ ස්ථානය පවත්වා ගැනීම සහ සියලූම ශ්‍රී ලාංකිකයින් අතර වඩාත් විශ්වාසනීය රක්ෂක ලෙස අපගේ කීර්තිනාමය නගා සිටුවීමයි.

### කළමනාකරණ ප්‍රවේශය

විනිවිදභාවය හා අන්‍යෝන්‍ය වටිනාකම එකතු කිරීම, දිගුකල් පවත්නා සම්බන්ධතා අගය කරන සහ අන්‍යෝන්‍ය වටිනාකම ඇති කිරීමට පෝෂණය කළ හැකි නව සම්බන්ධතා ගොඩ නැගීමට සක්‍රියව උත්සාහ කරන අපගේ ව්‍යාපාරයේ මෙම අංශයට අපි ප්‍රවේශවන මාර්ග වෙති. එමනිසාම, අපි ප්‍රධාන පාර්ශ්වකරුවන් කිහිපයක් හඳුනාගෙන ඇති අතර, ඒවායේ යෙදවුම සහ සහභාගිත්වය සමාගමේ ලාභය කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරන බැවින් ඒවා පහත අනුක්‍රමිවල සිතියම් ගත කෙරේ. ශ්‍රී ලංකාව තුළ සුදුසු ජනතාවට ජීවිත රක්ෂණය පිරිනැමීම සහ තර්ජනාත්මක අවස්ථාවල අවදානම් අවම කිරීම තුළ අපි නිරත වන බැවින් අපගේ සමාජීය වගකීමට අපි අනුකූල වෙමු.

### පාර්ශ්වකාර සහභාගිත්ව රාමුව

**හඳුනාගැනීම**

මෙම සබඳතාවල තිරසාරභාවය සහතික කිරීම සඳහා මනාව ව්‍යුහගත ආකාරයකින් ස්ථාපිත කිරීමට අප උත්සාහ කරන ප්‍රධාන සබඳතා හඳුනා ගැනීම කෙරෙහි අපි ආක්‍රමණශීලීව අවධානය යොමු කරමු.

**ඇගයීම**

ඇගයීමේ ක්‍රියාවලියට සමාගමේ ව්‍යාපාර හැසිරීම් සමාගමේ ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා අපේක්ෂිත සම්බන්ධතා පිළිබඳ තොරතුරු රැස් කිරීම සම්බන්ධ වේ.

**ඇතුළත් කිරීම**

ඉන්පසු අපි වෙනස්ව නොසලකන ප්‍රවේශයක් සම්බන්ධවන සබඳතා ස්ථාපිත කරමු.

**කළමනාකරණය**

මෙම සබඳතා පෝෂණය කිරීම සහ වර්ධනය කිරීම සඳහා අපි මහත් සැලකිල්ල, විනිවිදභාවය සහ විවෘත සන්නිවේදනය සේවයේ යොදවන්නෙමු.

**නියාමනය**

දිගු කාලීනව වටිනාකම ලබා දෙමින් ව්‍යුත්පන්න කිරීමේ අරමුණින් අපි මෙම සබඳතා ප්‍රවේශමෙන් නියාමනය කරමු.

### පාර්ශ්වකාර සහභාගිත්ව මූලධර්ම

සහභාගිත්ව මාර්ගය පාර්ශ්වකාර වර්ගය සහ සම්බන්ධතාවය අනුව වෙනස් වේ. ක්‍රමවේදය සියලුම සම්බන්ධතා හරහා ක්‍රියාත්මක වන ප්‍රධාන ප්‍රතිඥා තුනක් මත රඳා පවතී.

- උපදේශන සාකච්ඡාව පෝෂණය කිරීම සඳහා විවෘතභාවය සහ විනිවිදභාවය
- තොරතුරු වල කාලෝචිතභාවය, නිරවද්‍යතාවය සහ අදාළත්වය
- ප්‍රතිචාරාත්මක බව වැඩි කිරීම සඳහා අඛණ්ඩ සහ ඉදිරියට යන සමාලෝචනය

තවද, පාර්ශ්වකාර සහභාගිත්වය රාමුව තුළ අභ්‍යන්තර හා බාහිර සම්බන්ධතා කළමනාකරණය කිරීමට වගකියන සෑම සේවකයෙක් සමඟ විමධ්‍යගත කෙරේ. ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ වෙළෙඳපොල රක්ෂණය සපයන්නන් විසින් සංතෘප්ත කරන බැවින් හා විනිවිදයාම අභියෝගාත්මක කාර්යයක් වන බැවින්, ස්ථාපිත අභ්‍යන්තර සන්නිවේදන මාර්ග තුළින් ප්‍රධාන ගැටළු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම අත්‍යවශ්‍යය. ජීවිත රක්ෂණ වෙළෙඳපොල තුළ

# පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතා

සුදුසු අනාගත පාරිභෝගික අංශවල ගැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයට දැනෙන බැවින් මෙම වටිනා දර්ශන ඉහළ මට්ටමේ තීරණ ගැනීමට වැදගත් වේ.

| පාර්ශ්වකාර වර්ගය | පාර්ශ්වකරුවන්ට අදාළවන ප්‍රමාණාත්මක ගැටළු | සහභාගිත්ව යාන්ත්‍රණය | වාරගණන | ප්‍රමුඛතාව |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රජය | ආයෝජනය. ව්‍යාපාර සංවර්ධනය, ප්‍රතිලාභ, නව්‍යකරණය, සහ ක්ෂේත්‍රයේ වර්ධනය, අනුකූලතාව | අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ<br>කළමනාකාරීත්වය සමඟ<br>රැස්වීම් සහ සාකච්ඡා | අවශ්‍යතාව පරිදි<br>අවශ්‍යතාව පරිදි<br>වාර්ෂික | ඉහළ |
| වෙනත් නියාමකයින් | නීති සහ රෙගුලාසි, යහපාලනය, ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය, සදාචාර හැසිරීමට අනුකූලතාව | නියාමන අධිකාරීන් සමඟ රැස්වීම්<br>වාර්ෂික වාර්තාව<br>පුවත් නිවේදන<br>කර්මාන්ත සංසද<br>ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ සහ තත්ත්ව වාර්තා<br>පුවත් නිවේදන | අවශ්‍යතාව පරිදි<br>වාර්ෂික<br>අවශ්‍යතාව පරිදි<br>අවශ්‍යතාව පරිදි<br>කාර්තුමය/වාර්ෂික<br>අවශ්‍යතාව පරිදි | ඉහළ |
| ගනුදෙනුකරුවන් | ගනුදෙනුකාර සම්බන්ධතාවය, රඳවා ගැනීම, අදාළ නිෂ්පාදන, නිෂ්පාදන තොරතුරු, රක්ෂණාවරණ ප්‍රසාද දීමනා, ඔප්පු හිමිකම්, වෙනත් නියාමකයින් | ඇමතුම් මධ්‍යස්ථානය<br>ගනුදෙනුකාර තෘප්තිය පිළිබඳ සමීක්ෂණ<br>මුහුණට මුහුණ අන්තර් ක්‍රියා<br>වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ | නිරන්තර<br>අවශ්‍යතාව පරිදි<br>නිරන්තර<br>නිරන්තර<br>නිරන්තර | ඉහළ |
| ව්‍යාපාර හවුල්කරුවන් | සැපයුම් දාම කළමනාකරණය, ක්ෂේත්‍රයට සම්බන්ධ සංසද, තෙවැනි පාර්ශ්ව බැඳීම් | රැස්වීම්<br>විද්‍යුත් තැපැල/දුරකථනය/<br>ලිපි හරහා සන්නිවේදනය | අවශ්‍යතාව පරිදි<br>නිරන්තර | මධ්‍යම |
| සේවකයින් | සේවක සුභසාධනය, තෘප්තිය, රඳවා ගැනීම, පුහුණු සහ සංවර්ධනය, පිළිගැනීම සහ ප්‍රදාන, වෘත්තීය ප්‍රගතිය, රැකියා සුරක්ෂිතතාව | රැස්වීම්<br>විද්‍යුත් තැපැල, දුරකථනය, මාර්ගගත වේදිකා හරහා සන්නිවේදනය<br>අනුප්‍රාප්ත සැලැස්ම<br>පුහුණු හා සංවර්ධනය<br>සම්මාන උත්සව<br>ප්‍රජා ව්‍යාපෘතිවල සහභාගිත්වය<br>දුක්ගැනවිලි මෙහෙයවීම<br>අන්තර්ජාලය හරහා තොරතුරු හුවමාරුව<br>B-Connect App<br>පරමාර්ථ/මූලික කාර්යසාධන දර්ශක සැකසුම් | නිරන්තර<br>අවශ්‍යතාව පරිදි<br>වාර්ෂික/අවශ්‍යතාව පරිදි<br>අවශ්‍යතාව පරිදි වාර්ෂික<br>අවශ්‍යතාව පරිදි<br>අර්ධ වාර්ෂික<br>නිරන්තර<br>වාර්ෂික<br>අර්ධ වාර්ෂික | ඉහළ |
| ප්‍රජාව සහ පරිසරය | ප්‍රජා ආයෝජන, ආයතනික සමාජ වගකීම් වැඩසටහන් | ප්‍රජා ව්‍යාපෘති<br>පුවත් නිවේදන<br>වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය<br>උත්සව<br>CSR ව්‍යාපෘති<br>තිරසාර වැඩසටහන් | නිරන්තර<br>අවශ්‍යතාව පරිදි<br>නිරන්තර<br>අවශ්‍යතාව පරිදි<br>නිරන්තර<br>නිරන්තර | මධ්‍යම |

# උපායමාර්ගික ප්‍රමුඛතාවයන්

2024 දී ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වෙන් කිරීම සම්පත් පරිභෝජනය ප්‍රශස්ත කිරීම, අදාළ ව්‍යාපාර ප්‍රවාහ කෙරෙහි අවධානය, සහ මෙරට ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හරහා ඇති වන අවස්ථා මත සාර්ථකත්වය ලඟාකරගැනීමට හේතු විය. මුල් අදියර අභියෝග සහිත වුවද, SLICLL හි කැප වූ කණ්ඩායමට බාධාවන් අභිබවා යාමට හැකි වූ අතර ආර්ථික හා සමාජීය බාධාවන් හමුවේ වුවත් සැලකියයුතු වර්ධනයක් අත්පත්කරගෙන ඇත.

2024 වසර සඳහා ජීවිත රක්ෂණ ව්‍යාපාරය මෙහෙයවීම සඳහා සැලසුම්කළ ප්‍රධාන උපායමාර්ග පහත සාරාංශ කෙරේ.

## SLIC ලයිෆ්හි උපායමාර්ගික අවධානය

- නව ව්‍යාපාර (FYP) සහ ඔප්පු අලුත් කිරීම් කෙරෙහි අවදනය යොමුකරමින් ව්‍යාපාර ආදායම වර්ධනය කිරීම
- මෙහෙයුම් වියදම් සහ ව්‍යාපාර වර්ධනය සඳහා පිරිවැය ඵලදායීව කළමනාකරණය තිරසාර ප්‍රතිපත්ති අනුගමනය
- වේගවත්, පහසු සහ පිවිසියහැකි සේවා ලබාදීමට පසු සේවා ක්‍රියාපටිපාටි ඩිජිටල් ආකාරයෙන් කඩිසර කරමින් පාරිභෝගික කේන්ද්‍රීය සංස්කෘතියක් ක්‍රියාත්මක කිරීම
- රටතුළ වඩාත් ආදරණීය රක්ෂණ සපයන්නා ලෙස ඉහළින් සිටීම සහ සමාජීය වශයෙන් වගකීම් සහගත සන්නාමයක් ලෙස ස්ථාපිත වීම
- **"වැඩකිරීමට සුදුසුම ස්ථානයක්"** ("Great Place to Work") ලෙස SLICLL ස්ථාපිත කිරීම සහ එවැනි සේවා ස්ථානයකට සුදුසු ගුණාංග වලින් පරිපූන් සේවා ස්ථාන සංස්කෘතියක් පෝෂණය කිරීම

# 39.

# කළමනාකරණ විස්තර ප්‍රකාශය


40 මෙහෙයුම් පරිසරය

42 මූල්‍ය ප්‍රාග්ධනය

55 නිෂ්පාදිත ප්‍රාග්ධනය

58 බුද්ධිමය ප්‍රාග්ධනය

60 මානව ප්‍රාග්ධනය

66 සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

74 ස්වභාවික ප්‍රාග්ධනය

# මෙහෙයුම් පරිසරය

## ගෝලීය ආර්ථිකය – ඔරොත්තුදීම හා නැවත සකස් කිරීම

කොවිඩ් -19 වසංගතය, උත්සන්න වෙමින් පැවති දේශපාලනික ගැටුම් සහ වෙළඳාමට බාධා ඇතිකළ සහ උද්ධමනයේ සුවිශේෂී වැඩිවීමට මග පෑදූ අතිශය හා අහිතකර දේශගුණික විපර්යාස සිදුවීම් සමඟ ඇති වූ පෙර නොවූ විරූ බාධක හේතුවෙන් ගෝලීය ආර්ථිකය පීඩාවට පත් විය. ලෝක ආර්ථික සංසදයේ සංඛ්‍යාලේඛණවලට අනුව, ගෝලීය සහයෝගිතාවයෙන් 91%කට භූදේශපාලනික ආතතින් මගින් සහ 83%කට දේශීය දේශපාලන ආතතින් මගින් බලපෑම් කර ඇත. අභියෝග හමුවේ, 2024 සඳහා වර්ධනය 3.2%ක් හා 2025 සඳහා 3.3%ක් පුරෝකථනය කරමින් ගෝලීය ආර්ථිකය ස්ථාවරව හා ඔරොත්තු දෙමින් පැවතුණි. වසර හතරක අඛණ්ඩව වැඩි වූ උද්ධමනයෙන් පසුව ශීර්ෂ උද්ධමනය 2025 දී 4.2% දක්වා අඩුවන බවට පුරෝකථනය කෙරේ. මෙය ගෝලීය ආර්ථික වාතාවරණය තුළ මහ බැංකුවලට මුදල් පාලනය දැඩි කිරීමට ආරෝපනය වන අතර, සැපයුම් දාම බිඳවැටීම් තුළ මන්දගාමී ස්වරූපයක් දක්නට ලැබුණි. 2024 දී 5.4% සිට 2025 දී 3.8% දක්වා ලිහිල් වනු ඇතැයි අපේක්ෂා කරන OECD රටවල උද්ධමනය සමඟ ගෝලීය ආර්ථිකය සඳහා ප්‍රවේශම් සහගත ශුභවාදී හැඟීමක් පවතී.

ඉන්දියාව ආර්ථික වර්ධනය සඳහා ප්‍රාවරණය දරන අතර 2024 දී දළ දේශීය නිෂ්පාදිතයේ පුරෝකතනය කළ 6.5%ක පුළුල් කිරීමක් ආරක්ෂා කර ඇත. එය 2025 දී තවදුරටත් 0.3%කින් වර්ධනය වනු ඇති බවට පුරෝකථනය කෙරේ. ඉන්දියාවට පසුව ඉන්දුනීසියාව, චීනය සහ තුර්කිය සිටින අතර, දියුණු ආර්ථිකයන් 2024 දී පහළ වර්ධන පොරොන්දුවක් පෙන්නුම් කරයි. දියුණු ආර්ථිකයන් සමස්තයක් ලෙස 1.7% කින් වර්ධනය වූ අතර, ඇමරිකා එක්සත් ජනපදය ආර්ථිකයේ ශක්තිමත් ප්‍රසාරණයක් පෙන්නුම් කරයි. 2024 දී ආර්ථිකය සුළු වශයෙන් වර්ධනය වූ ජපානයට ප්‍රතිවිරුද්ධව යුරෝපය ආර්ථික වර්ධනය සුළු වශයෙන් ඉහළ දමා ඇත. වැටුප් නැවත පහළයාමේ සංඥා පෙන්නුම් කලද, ස්වයං නිෂ්පාදන කම්හල් වසා දැමීම, පරිභෝජනයේ සුළු ප්‍රතිසාධනය, අඩු ගනුදෙනුකාර විශ්වාසය හේතුවෙන් ජපානය විශේෂයෙන් පිඩනයට ලක් කරන ලදී. චීනය 2024 දී 4.9%ක වර්ධනය පෙන්නුම් කළ අතර එක්සත් ජනපද ආර්ථිකය පළමු කාර්තු දෙක තුළ වඩා ශක්තිමත් වර්ධනය පෙන්නුම් කර ඇත.

## ශ්‍රී ලංකා ආර්ථිකය

2024 දී, ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩව වසර දෙකක ආර්ථික සංකෝචනයෙන් පසුව මූර්ත දළ දේශීය නිෂ්පාදිතය තුළ 5%ක ස්ථිර වර්ධනයක් වාර්තා කරමින් ශක්තිමත් යලි නැගිටීමක් වාර්තා කරන ලදී. මෙම ප්‍රතිසාධනය වසර පුරාම ස්ථාවර වූ අතර 2017 පළමු කාර්තුවේ සිට සියලුම කාර්තු සඳහා ධනාත්මක දළ දේශීය නිෂ්පාදිතයක් වාර්තා කර ඇත. නිෂ්පාදන හා ඉදිකිරීම් කටයුතුවල යලි පුබුදුව මගින් සනාථ කළ කර්මාන්ත අංශය විසින් සමස්ත ආර්ථික ප්‍රසාරණය මූලිකවම මෙහෙයවා ඇත. සේවා අංශ ද නවාතැන් හා ප්‍රවාහන සේවාවල අඛණ්ඩ වර්ධනය මගින් සහය ලබමින් සැලකියයුතු ලෙස දායක වී ඇත. තවද, කෘෂිකාර්මික අංශය සමස්ත ආර්ථික කාර්යසාධනයට ධනාත්මක දායකත්වයක් සිදු කර ඇත. මෙම ප්‍රවනතාවලින් අනාගතය සඳහා හිතකර දැක්මක් පෙන්නුම් කරයි.

2024 දී, කෘෂිකර්මය 2023 දී පැවති 1.6% සිට සුළු අඩුවීමක් වන 1.2%කින් වර්ධනය වූ අතර පොල් නිෂ්පාදනය අඛණ්ඩව පහත වැටීමක් තුළින් සත්ත්ව නිෂ්පාදනය හා පළතුරු වගාව තුළ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය. කර්මාන්ත අංශය 2023 දී 9.2%ක සංකෝචනයෙන් පසු 11.0% කින් ප්‍රසාරණය වෙමින් ශක්තිමත් ප්‍රතිසාධනයක් පෙන්වා ඇත. එය ගෘහස්ථ හා බාහිර ඉල්ලුම ඉහළයාම සහ ඉදිකිරීම් ව්‍යාපෘතිවල පුබුදුවක් මගින් ඇති කරන ලදී. සේවා අංශය පසුගිය වසරේ 0.2%ක පහත වැටීමක සිට 2.4% කින් වර්ධනය වු අතර සංචාරක වර්ධනය, වර්ධිත මුල්‍ය සහ නිශ්චල දේපල සේවා සහ තොරතුරු තාක්ෂණ හා සන්නිවේදනයේ අත්කරගැනීම් වලින් එයට සහය විය.

මූල්‍ය ප්‍රතිපත්ති වසර පුරාම උපකාරීව පැවති අතර 2023 මැදදී ආරම්භ කළ වඩා පුළුල් 775ක පදනම් ලකුණු ලිහිල් කිරීමේ චක්‍රයේ කොටසක් ලෙස 2024 දී පදනම් ලකුණු 125ක මුළු ප්‍රමාණයකින් මහ බැංකුව ප්‍රතිපත්ති අනුපාත අඩු කරන ලදී. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාත රාමුවක් සහිත පෙර ද්විත්ව අනුපාත පද්ධතිය වෙනුවට එක් දින ප්‍රතිපත්ති අනුපාතය හඳුන්වාදීම සමඟ ප්‍රධාන ප්‍රතිපත්ති වෙනසක් නොවැම්බර්වල සිදුවිය. වර්ධිත ද්‍රවශීලතා තත්ත්වයන් සහ පහළයන උද්ධමනය වෙළෙඳපොල පොලී අනුපාතවල අඛණ්ඩ පහත වැටීමට දායක විය.

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතය (AWCMR) වසර තුළ ක්‍රමයෙන් පහත වැටුන අතර දෙසැම්බර් වන විට ආසන්න වශයෙන් 8.00% හි ස්ථාවර විය. 2024 මැදදී රජයේ සුරැකුම්පත් ඉපයීම්වල තාවකාලික ඉහළයාමක් හමුවේ, ණය හා තැන්පතු අනුපාත වසර අගදී පහළ වැටීමේ ප්‍රවනතාවක් පෙන්නුම් කළේය. 2025 දී වර්ධනීය මූල්‍ය තත්ත්වයන්, ණය ප්‍රතිව්‍යුහගතකරණයේ ප්‍රගතිය හමුවේ අඩු වූ අවදානම් වාරික සහ වඩාත් උපකාරී පරිසරය ණය වර්ධනයේ මෙවැනි සංවර්ධනයන් තුළින් පිළිබිඹු වේ.

2024 දී, බාහිර අරමුදල් කරා සීමිත පිවිසීම පිළිබිඹු කරමින් අයවැය හිඟය මූල්‍යකරණය සඳහා දේශීය මූලාශ්‍ර කෙරෙහි රජය මූලිකව විශ්වාසය තබන ලදී. ශුද්ධ දේශීය මූල්‍යකරණයේ බහුතරය රජයේ සුරැකුම්පත් නිකුතුව තුළින් ලබා ගන්නා ලදී.

2025 දී, වෙළෙඳ භාණ්ඩ හිඟය ප්‍රධාන වනු ඇති බවට අපේක්ෂා කරන අතර, ආනයන සීමා ලිහිල් කිරීමෙන් ඇතිවන ඉහළ ආනයන ඉල්ලුම, උපකාරී මූල්‍ය තත්ත්වයන් මගින් සහයවන ශක්තිමත් ආර්ථික කටයුතු, සහ ව්‍යාපාර හා ගෘහස්ථ අතර වැඩිකළ වියදම් කිරීමේ හැකියාව එයට මූලිකවම හේතු වේ.

ගෝලීය බොර තෙල් මිලගණන් 2025 දී සාපේක්ෂව අඩුවෙන් පවතිනු ඇති බව පුරෝකථනය කර තිබුනද, පෙට්‍රෝලියම් ආනයන වියදම 2024ට සාපේක්ෂව මධ්‍යස්ථ ඉහළයාමක් පුරෝකථනය කෙරේ. අපේක්ෂිත දේශීය ආර්ථික ප්‍රකෘතිය හා බැඳුණු වැඩි වූ ආනයන පරිමාවන් සහ මිල උච්චාවචනය මත භූදේශපාලනික අවදානම්වල විභව බලපෑම එයට හේතු වේ. එයට සමානම, වෙනත් අතරමැදි සහ ආයෝජන භාණ්ඩ මත ආනයන වියදම ආර්ථික කටයුතුවල ඉදිරියට යන පුනර්ජීවය සමඟ ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෙසේ වෙතත්, අඛණ්ඩ ආනයන ප්‍රසාරණය මධ්‍ය කාලීනව අපනයනවල ස්ථාවර වර්ධනයක් මගින් සහාය ලබමින්, වෙළෙඳ හිඟය මධ්‍ය කාලීනව කළමනාකරණය කළ හැකි මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. සංචාරක ආදායම ඉහළ යාම සහ අනෙකුත් සේවා අපනයනවල තරඟකාරිත්වය වැඩි වීම හේතුවෙන් 2025 සහ ඉන් ඔබ්බට සේවා ගිණුම් අතිරික්තය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## මෙහෙයුම් පරිසරය

ව්‍යුහගත, නෛතික හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල පුළුල් එකතුවක් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සහතික කිරීමට අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ. ශ්‍රී ලංකාව 2026 දී තෙවැනි අන්‍යෝන්‍ය ඇගයීම (ME) සඳහා සූදානම් වෙමින් සිටින අතර, ගෝලීය ප්‍රමිතිවලට අනුකූල වෙමින් මුදල් විශුද්ධිකරණ විරෝධී හා ත්‍රස්තවාදයට මූල්‍යකරණය වැලැක්වීමේ රාමු ශක්තිමත් කිරීමට එහි කැපවීම තහවුරු කරයි.

ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික දර්ශනය දැඩිව උපයාගත් සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීම සහ ඵලදායී, වර්ධනයට යොමු වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මත විශාල වශයෙන් රඳා පවතිනු ඇත. නිතරම ප්‍රතිපත්ති නොගැලපීම් සහ ආපසු හැරවීම් සෑමවිටම ලාභ ආපසු හරවමින් වසර ගණනාවක් පුරා රටේ ආර්ථික ප්‍රගතියට බාධා කර ඇත. මෑතකාලීන ආර්ථික පහත වැටීම, අර්බුදය තුළ පුරවැසියන් මුහුණ දුන් දුෂ්කරතා, සහ සමුච්චිත හානිකරබව අනාගත ප්‍රතිපත්ති වැරදීම් සඳහා ඉඩ සලස්වනු ඇත. අඛණ්ඩ ප්‍රතිසංස්කරණ මුලපිරීම් මූල්‍ය සහ ණය තිරසාරභාවය සඳහා තීරණාත්මක වන අතර ආර්ථික ස්ථායිතාව සහ වර්ධනය රඳවා ගැනීමට ඇති දිගුකාලීන ව්‍යුහගත බාධාවන් විසඳනු ඇත.

### ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය

2024 වසර තුළ, ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය ශක්තිමත් කාර්යසාධනයක් පෙන්වා ඇති අතර දළ ලිඛිත වාරිකවල 20%ක වාර්ෂික වැඩිවීමක් වාර්තා කර ඇත. මෙය 2023 දී පැවති රු. බිලියන 153 සිට රු. බිලියන 184 දක්වා ඉහළ යාමකි. මෙම වර්ධනය නව ව්‍යාපාර වාරිකවල 32%ක ප්‍රසාරණය සහ කෙටි ගෙවීම් නිෂ්පාදන දායකත්වයන් තුළ 22%ක වැඩිවීම මගින් විශාල වශයෙන් තහවුරු කර ඇත.

මෙම ක්ෂේත්‍රය වාරික ආදායම තුළ සැලකියයුතු වර්ධනයක් අත්කර ගෙන ඇති අතර, වසර තුළ ගෙවන ලද හිමිකම් ද පසුගිය වසරේ රු. මිලියන 76,502ට සාපේක්ෂව රු. මිලියන 83,719 දක්වා ලඟාවෙමින් 9%කින් ඉහළ ගොස් ඇත. හිමිකම්වල වැඩිවීම හමුවේ, මෙම ක්ෂේත්‍රය ලාභදායිතාව පවත්වා ගත් අතර, 2023 වසරේ හතරවැනි කාර්තුව තුළ වාර්තාකළ රු. මිලියන 30,617 සිට රු. මිලියන 32,520 දක්වා 6%කින් බදු පෙර ලාභය වැඩි විය.

සමස්තයක් වශයෙන්, ලාභදායිත්වය සහ ප්‍රාග්ධන කාර්යක්ෂමතාව මත පීඩනයක් එල්ල වුවද, මෙම අංශය දිගුකාලීන ශක්තිමත් රක්ෂණ අංශයක සහයෝගය මත අභියෝගවලට සාර්ථකව මුහුණ දුන්නේය.

*මූලාශ්‍ර*

*1* ලෝක ආර්ථික දැක්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2025 ජනවාරි*

*2* ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික ආර්ථික සමාලෝචනය - 2024*

*3* ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, කාර්තුමය ප්‍රකාශ*

# මූල්‍ය ප්‍රාග්ධනය

විචක්ෂණශීලී මූල්‍ය ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අපගේ කැපවීම සමගින්, රක්ෂණ ඔප්පු හිමියන්ට සහ කොටස්කරුවන්ට සමානවම ස්ථාවරත්වය, වර්ධනය සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය සහතික කිරීමේදී SLICLL නොසැලී සිටියේය. ප්‍රාග්ධන වෙන් කිරීම, මූල්‍ය ශක්තිය ශක්තිමත් කිරීම, තිරසාර මූල්‍ය උපකරණවල ආයෝජනය කිරීම සහ වත්කම් ආරක්ෂා කරමින් ප්‍රතිලාභ උපරිම කරන උපාය මාර්ග යොදාගැනීම සඳහා අපි සමබර ප්‍රවේශයක් භාවිතා කළෙමු.

මූල්‍ය ප්‍රාග්ධනය අධීක්ෂණය හා පාලනය විගණන කමිටුව, ආයෝජන කමිටුව, සහ අවදානම් කළමනාකරණ කමිටුව වැනි විශේෂිත කමිටු මගින් සහය ලබන ශක්තිමත් රාමුවක් තුළ ඇතුළත් කර ඇත. මෙම කමිටු මගින් විනිවිදභාවය, වගවීම සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ වෙනත් අදාල පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් ඉටුකිරීම සහතික කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

වෙනස්වන නියාමන අවශ්‍යතා සහ සාර්ව ආර්ථික ප්‍රවනතා හමුවේ අපි ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා සීමා සපුරාලීම, මූල්‍ය ස්ථාවරත්වය සුරක්ෂිත කිරීම සහ ප්‍රමාණවත් ද්‍රවශීල ස්වාරක්ෂක රඳවා ගනිමු. විනිවිදභාවය, අඛණ්ඩතාව, සහ නව්‍යකරණය කෙරෙහි SLICLL නොසැලෙන අවධානය සම්පත් ප්‍රශස්ථ කිරීමට අපට හැකියාව තවදුරටත් ශක්තිමත් කර ඇති බැවින්, එය ඩිජිටල් වර්ධනයන්ට සහය වීම තුලින් අපගේ පාරිභෝගිකයින්ට වෙළෙඳපොලට අදාළ අවශ්‍යතා පදනම් නිෂ්පාදන පිරිනමමින් ශක්තිමත් අවදානම් කළමනාකරණය සහ නියාමන අනුකූලතාවය ස්ථාවර මට්ටමකට ගෙන ඇත.

### ප්‍රධාන මූල්‍ය නිලධාරිගේ ප්‍රකාශය

සාර්ව ආර්ථික අභියෝග හා වෙළෙඳපොල උච්ඡාවචනයන් හමුවේ වුවද, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් ශක්තිමත් මූල්‍ය විනයක් සහ ඔරොත්තුදීමේ හැකියාවක් පෙන්වා ඇත. අපගේ විචක්ෂණ ආයෝජන උපායමාර්ග සහ යහපත් ප්‍රාරක්ෂණ ව්‍යවහාර පුරුදු අපගේ ඔප්පුහිමියන්ට හා පාර්ශ්වකරුවන්ට ස්ථිර ප්‍රතිඵල හා තිරසාර වටිනාකම ලබාදීමට අපව ශක්තිමත් කර ඇත. ගතික ආර්ථික පරිසරයක් තුළ මූල්‍ය ශක්තිය, විනිවිදභාවය, සහ දිගු කාලින වර්ධනය පවත්වා ගැනීමට අපි කැපවී සිටිමු.

**ශ්‍රියානි කුලසිංහ**
ප්‍රධාන මූල්‍ය නිලධාරිණී



# මූල්‍ය ප්‍රාග්ධනය

## මූල්‍යමය අභියෝග

සංකීර්ණ හා වෙනස්වන පරිසරයක් තුළ, රක්ෂණ ක්ෂේත්‍රය බහුවිධ මූල්‍ය අභියෝග මත ක්‍රියාත්මක වන අතර, එය ලාභදායිතාවයට, නුබුන්වත්බවට සහ සමාගමේ කාර්යසාධනයේ දිගුකාලීන තිරසාරභාවයට බලපෑම් කළ හැකි අතර ඒවා පහත දක්වා ඇත.

| අභියෝගය | බලපෑම | අපගේ ප්‍රතිචාරය |
|---|---|---|
| **පොලී අනුපාත අවදානම්**<br>සමාගමට තම ආයෝජන කළඹ, රක්ෂණ වගකීම් සහ සමස්ත මූල්‍ය ස්ථාවරත්වය කළමනාකරණය කිරීමේදී සැලකිය යුතු මූල්‍ය අභියෝගයකි. | ආයෝජන ප්‍රතිලාභ කෙරෙහි බලපෑම<br>රක්ෂණ වගකීම් තක්සේරු කිරීම<br>ආර්ථික අවිනිශ්චිතතාව | පොලී අනුපාත පරිසරයන් සහ මුදල් ප්‍රතිපත්ති ප්‍රවණතා සක්‍රියව නියාමනය කිරීම<br>ලාභදායිතාවය සහ නුබුන්වත්භාවය කෙරෙහි ඇති විය හැකි බලපෑම් තක්සේරු කිරීම සඳහා නිරන්තර පරීක්ෂණ සහ අවස්ථා විශ්ලේෂණය |
| **මූල්‍ය ආයතනවල ණය හානිකරණය**<br>විශේෂයෙන් බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන මත සමාගම විශ්වාසය තැබීම හේතුවෙන් සමාගමේ මූල්‍ය ස්ථාවරත්වයට ඇති අවදානම. | ආයෝජන වටිනාකම් මත අහිමි වීම<br>ද්‍රවශීලතා සංරෝධක | ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීම<br>මූල්‍ය ආයතනවල ණය ශ්‍රේණිගත කිරීම් සහ මූල්‍ය යහපත්බව අඛණ්ඩව නියාමනය කිරීම. |
| **සමාගම තුළ පිරිවැය තාර්කිකකරණය සහ අයවැය සැලසුම් කිරීම** | රක්ෂණ වගකීම් තක්සේරු කිරීමේ උච්චාවචනය<br>හිමිකම් ගෙවීමේ පිරිවැය වැඩිවීම<br>ලාභදායිතාවයට ඇති බලපෑම<br>ආයෝජන කෙරෙහි සෘණාත්මක බලපෑම් | අයවැය දැඩි ලෙස නියාමනය කිරීම<br>අනවශ්‍ය වියදම් කපා හැරීම<br>ඩිජිටල්කරණ පිළිවෙත් සහ තිරසාරභාවය පිළිබඳ පිළිවෙත් |
| **රාජ්‍ය බදු හා අයකිරීම්**<br>රජයෙන් පනවන බදු, ගාස්තු සහ නියාමක ගාස්තු ඉහළ යාම | වැඩිවන ගාස්තු ලාභදායීතාවය සහ ආයෝජන ආන්තික සම්පීඩනය කරයි<br>නිතර සිදුවන නියාමන වෙනස්කම් වලට අනුකූල වීම සඳහා මෙහෙයුම් සඳහා වන වක්‍ර පිරිවැය | අඩු කිරීම් ප්‍රශස්ත කිරීම සඳහා ව්‍යුහගත බදු සැලසුම් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සහ වැඩිපුර ගෙවීමකින් තොරව අනුකූලතාව සහතික කිරීම.<br>නියාමනවල පැහැදිලි බව තහවුරු කර ගැනීම සඳහා ක්ෂේත්‍රයේ ආයතන සහ නියාමකයින් සමඟ සම්බන්ධවීම |

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස 11 සඳහා සිය ජීවිත රක්ෂණ ව්‍යාපාරය ක්‍රියාත්මක කරන ලදී. කෙසේවෙතත්, සැසැඳීමේ අරමුණ සඳහා, ජීවිත රක්ෂණ මෙහෙයුම්වල සම්පූර්ණ කාර්යසාධනය පිළිබිඹු කිරීමට ජනවාරි මාසය ද ඇතුළුව 2024 පූර්ණ වසර සඳහා තොරතුරු ඉදිරිපත් කෙරේ. ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලිමිටඩ් යටතේ 2023 වසර සඳහා මාස 12 ජීවිත රක්ෂණ ව්‍යාපාර කාර්යසාධනයට මෙය සසඳා ඇත.

## ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය විශ්ලේෂණය

ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ වෙළෙඳපොල තුළ ක්‍රියාත්මක සමාගම් 15ක් සමඟ, මෙම ක්ෂේත්‍රය දළ ලිඛිත වාරික සහ මුළු වත්කම්වල සැලකියයුතු වර්ධනයන් සමඟ 2024 දී ස්ථිර වර්ධනයක් පෙන්වන ලදී.

| | ක්ෂේත්‍රය රු. බිලියන | SLICLL රු. බිලියන | දායකත්වය % |
|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය | 184.0 | 26.3 | 14 |
| දළ ලිඛිත වාරික වර්ධන අනුපාතය | 20% | 25% | |
| ගෙවන ලද ප්‍රතිලාභ | 83.7 | 12.9 | 15 |
| ගෙවන ලද ප්‍රතිලාභ වර්ධනය | 9% | 10% | |
| ආයෝජන ආදායම | 101.1 | 27.5 | 27 |
| ආයෝජන ආදායම් වර්ධනය | 5% | 21% | |
| ජීවිත අරමුදලට මාරු කිරීමෙන් පසු බදු පෙර ලාභය | 32.5 | 4.0 | 12 |
| ලාභ වර්ධන අනුපාතය | 6% | -18% | |
| මුළු වත්කම් | 924.4 | 238.6 | 26 |
| මුළු වත්කම් වර්ධන අනුපාතය | 13% | 8% | |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය | 338% | 565% | |

*මූලාශ්‍රය: 4 කාර්තුවේ ක්ෂේත්‍රයේ වැදගත් අවස්ථා (IRCSL විසින් 2023 4 කාර්තුවට අනුව 4 කාර්තුව 2024)*

### ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්යසාධනය – වෙළෙඳපොල කොටස 2024




*මූලාශ්‍රය: IASL සංඛ්‍යාලේඛණ: – 4 කාර්තුව 2024*

# මූල්‍ය ප්‍රාග්ධනය

## අනුපාත විශ්ලේෂණය

2024 ජීවිත රක්ෂණ වෙළෙඳපොල සඳහා අනුපාත විශ්ලේෂණය තුළින් ප්‍රධාන මූල්‍ය දර්ශක ඉස්මතු කරන අතර, ඒවායින් ක්ෂේත්‍රයේ ලාභදායිතාව, කාර්යක්ෂමතාව, විචක්ෂණ ආයෝජන අවස්ථා,සහ අවදානම් කළමනාකරණය පිළිබිඹු කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, දළ ලිඛිත වාරිකයේ සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය පවත්වා ගැනීමට සේවා සපයන්නන්ගේ හැකියාව තුල සැලකියයුතු වෙනස්වීම නියමිත සීමාවල දක්වා ඇති අගයට වඩා ඉහළින් ඇත.

| ආදායම් අනුපාතය | 2024 % | 2023 % |
|---|---|---|
| දළ ලිඛිත වාරික වර්ධනය (දළ ලිඛිත වාරිකයේ වාර්ෂික වර්ධනය) | 25 | 1 |

### දළ ලිඛිත වාරික වර්ධනය
(දළ ලිඛිත වාරිකයේ වාර්ෂික වර්ධනය)




| ලාභදායිතා අනුපාත | 2024 % | 2023 % |
|---|---|---|
| ශුද්ධ ලාභ ආන්තිකය | 5 | 8 |
| වත්කම් මත ඉපයීම | 13 | 11 |
| ස්කන්ධය මත ඉපයීම | 17 | 11 |
| ආයෝජන මත ඉපයීම | 12 | 11 |

### ශුද්ධ ලාභ ආන්තිකය




### වත්කම් මත ඉපයීම (ROA)




### ස්කන්ධය මත ඉපයීම (ROE)




### ආයෝජන මත ඉපයීම (ROI)



# මූල්‍ය ප්‍රාග්ධනය

| නුබුන්වත් අනුපාතය | 2024 % | 2023 % |
|---|---|---|
| අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (CAR) | 565 | 425 |

රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ (RII) 26 (1) වගන්තියට අනුව, සියලුම රක්ෂකයින් සිය ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා යහපත් නුබුන්වත්භාවයක් හා ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයක් පවත්වාගෙන යාම අවශ්‍යය.

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) අපගේ මෙහෙයුම් ස්ථාවරත්වය තුළ පාර්ශ්වකාර විශ්වාසය හා ලැදියාව ශක්තිමත් කරමින් පසුගිය වසර 5 තුළ 120%ක් වූ අවම නියාම අවශ්‍යතාවන්ට වඩා අඛණ්ඩව ඉහළින් පවත්වා ගෙන ඇත. 2024 මූල්‍ය වසර සඳහා, 2023 මූල්‍ය වසර තුල වාර්තාකළ 425% සිට සැලකියයුතු වර්ධනයක් පිළිබිඹු කරමින් 565% ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයක් සමාගම වාර්තා කර ඇත.

## අවදානම් පදනම් ප්‍රාග්ධන අනුපාතය (CAR)




## හිමිකම් ගෙවීම් අනුපාතය




## හිමිකම් ගෙවීම් අනුපාතය (කල්පිරීම් හා පවාරණ රහිත)




## අත්කරගැනීමේ අනුපාතය




## කළමනාකරණ වියදම් අනුපාතය




## ඒකාබද්ධ ගෙවීම් අනුපාතය




| රක්ෂණ ක්ෂෙත්‍රය සඳහා විශේෂිත අනුපාත | 2024 % | 2023 % |
|---|---|---|
| හිමිකම් ගෙවීම් අනුපාතය (හිමිකම් පිරිවැය/ශුද්ධ ඉපයූ වාරිකය) | 51 | 58 |
| හිමිකම් ගෙවීම් අනුපාතය (කල්පිරීම් හා පවාරණ රහිත) | 12 | 17 |
| අත්කර ගැනීමේ අනුපාතය (අත්කර ගැනීමේ පිරිවැය/ශුද්ධ ඉපයූ වාරිකය) | 14 | 13 |
| කළමනාකරණ පිරිවැය අනුපාතය (කළමනාකරණ වියදම්/ශුද්ධ ඉපයූ වාරිකය) | 23 | 26 |
| ඒකාබද්ධ ගෙවීම් අනුපාතය (හිමිකම්+අත්කර ගැනීමේ පිරිවැය+කළමනාකරණ වියදම්) | 88 | 97 |

# මූල්‍ය ප්‍රාග්ධනය

## ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශයේ ප්‍රධාන රේඛීය අයිතම වන දළ ලිඛිත වාරික, ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම් උත්පාදනය, ඒ ආශ්‍රිත පිරිවැය සහ වසර සඳහා ලැබෙන ලාභදායිතාවය සමඟ නිරූපණය කරමින් පහත දක්වා ඇත. වඩා හොඳ සංසන්දනයක් සඳහා, සමාගමේ අභ්‍යන්තර වෙන් කිරීම සැලකිල්ලට නොගනිමින් 2023 රක්ෂණ ව්‍යාපාර කාර්යසාධනය සමඟ සංඛ්‍යාලේඛණ ඉදිරිපත් කෙරේ. මෙම ප්‍රවේශයෙන් මූල්‍ය කාර්යසාධනය පිලිබඳ වඩා පැහැදිළි දක්මක් ලබා දෙන අතර ආයතනයේ දිගුකාලීන ආදායම උත්පාදන හැකියාව පිළිබඳ තක්සේරු කිරීම සහය වේ.

| | 2024 ජනවාරි 01 දින සිට 2024 ජනවාරි 31 දක්වා (SLIC) රු. මි. | 2024 පෙබරවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා (SLICLL) රු. මි. | 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා රු. මි. | 2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා රු. මි. | වෙනස % |
|---|---|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය | 1,828 | 24,531 | **26,359** | 21,080 | +25 |
| ශුද්ධ ලිඛිත වාරිකය | 1,762 | 23,569 | **25,331** | 20,406 | +24 |
| දරන ලද ශුද්ධ හිමිකම් | (978) | (12,016) | **(12,994)** | (11,760) | +10 |
| අත්කර ගැනීමේ පිරිවැය | (268) | (3,260) | **(3,529)** | (2,746) | +29 |
| මෙහෙයුම් හා පරිපාලන වියදම් | (447) | (5,501) | **(5,948)** | (5,224) | +14 |
| ආයෝජන හා වෙනත් ආදායම් | 1,746 | 26,161 | **27,907** | 22,921 | +22 |
| ජීවිත අරමුදලට මාරුකිරීමට පෙර බදු පෙර ලාභය | 1,816 | 28,951 | **30,767** | 23,596 | +30 |
| ජීවිත අරමුදලට මාරු කිරීමෙන් පසු බදු පෙර ලාභය | (19) | 4,377 | **4,358** | 5,306 | -18 |
| ජීවිත අරමුදලට මාරුකිරීමට පෙර බදු පසු ලාභය | 1,788 | 27,217 | **29,004** | 21,734 | +33 |
| ජීවිත අරමුදලට මාරු කිරීමෙන් පසු බදු පසු ලාභය | (47) | 2,642 | **2,595** | 3,444 | -25 |

සමස්තයත් වශයෙන්, ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ වෙළෙඳපොල 2024 දී ඔරොත්තුදීමේ හැකියාවක් හා වර්ධනයක් පෙන්වන ලද අතර එයට ශක්තිමත් රක්ෂණ නියාමන පරිසරිය, වාරිකවල ප්‍රසාරණය, ආයෝජනය සඳහා වැඩි වූ අවස්ථා, කාර්යක්ෂම පිරිවැය හා අවදානම් කළමනාකරණය විසින් ශක්තිමත්ව සහය විය. ගනුදෙනුකාර කේන්ද්‍රිය විසඳුම්, ඔප්පුහිමියන්ට විවිධාංගීකරණය කළ ආයෝජන අවස්ථා, සහ දළ ලිඛිත වාරිකවල ස්ථිර වැඩිවීම ක්ෂෙත්‍රය ශක්තිමත් කළ අතර එය 2025 දී තවදුරටත් ප්‍රසාරණය කිරීමට හේතු වේ.

### දළ ලිඛිත වාරිකය (GWP) සහ ශුද්ධ ඉපයූ වාරිකය (NEP)

රක්ෂණ සමාගමක් විසින් එකුකළ වාරිකවල මුළු එකතුව මින් නියෝජනය කරයි. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා, වසරකට පෙර වාර්තාකළ රු. මිලියන 21.080 සිට රු. මිලියන 26,359 දක්වා වාර්ෂිකව 25%ක වර්ධනයක් දළ ලිඛිත වාරිකය වාර්තාකර ඇත. මෙම වර්ධනය සමාලෝචිත වසර තුළ නව ව්‍යාපාරික වාරිකය, අලුත් කිරීමේ වාරිකය සහ සමූහ ජීවිත වාරිකය තුළ වැඩිවිමේ ප්‍රතිඵලයකි. ශුද්ධ ඉපයූ වාරිකය වාර්ෂිකව 24%ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2023දී පැවති රු. මිලියන 20.406ට සාපේක්ෂව රු. මිලියන 25,331 දක්වා ඉහළ ගොස් ඇත.

### දළ ලිඛිත වාරික සැසැඳීම 2023 සහ 2024 අතර

| සංයුතිය | 2024 රු.මි. | 2023 රු.මි. | වෙනස % |
|---|---|---|---|
| නව ව්‍යාපාරික වාරිකය | **5,320** | 3,598 | 48 |
| අලුත් කිරීමේ වාරිකය | **15,005** | 13,542 | 11 |
| සමූහ ජීවිත වාරිකය | **4,011** | 1,437 | 179 |
| තනි වාරිකය | **2,023** | 2,503 | -19 |
| මුළු දළ ලිඛිත වාරිකය | **26,359** | 21,080 | 25 |

### දළ ලිඛිත වාරික සැසැඳීම 2023 සහ 2024 අතර

දළ ලිඛිත වාරිකවල සංයුතිය 2024




දළ ලිඛිත වාරිකවල සංයුතිය 2023



# මූල්‍ය ප්‍රාග්ධනය

සමාගම 48%ක වැඩිවීමක් සලකුණු කරමින් රු. මිලියන 5,320ක නව ව්‍යාපාර පරිමාවක් වාර්තා කර ඇති අතර මෙය සිය ඉතිහාසය තුළ වැඩිම අගය වේ. මෙය ආර්ථික අභියෝග හමුවේ සමාගමේ ඔරොත්තු දීමේ හැකියාව සහ ආයතනික පරිවර්තනයන්ට අනුවර්තනය වීමේ අවශ්‍යතාවය ඉස්මතු කරයි.

### දළ ලිඛිත වාරික




### ශුද්ධ ඉපයූ වාරිකය




### නව ව්‍යාපාරික වාරිකය (FYP)




## ආයෝජන ආදායම

ජීවිත රක්ෂණ සමාගමේ ආදායම් ආයෝජනය කළ අරමුදල් මත පොලී ආදායම, ලාභාංශ ආදායම, මූල්‍ය ආයෝජන ඉපයීම් හෝ අලාභ, සහ විදේශ විනිමය ලාභ හෝ අලාභවලින් සමන්විත වේ. 2024 වසර තුළ, සමාගම ආයෝජනවලින් රු. මිලියන 27,510ක ආදායමක් වාර්තා කළ අතර එය සමස්ත ආයෝජන ආදායම තුළ 21%ක වාර්ෂික වැඩි වීමකි. ඵලදායී ආයෝජන කළමනාකරණය හා හිතකර වෙළෙඳපොළ තත්ත්වයන්ගේ ශක්තිමත් දර්ශක මින් පිළිබිඹු කරයි.

### ආයෝජන ආදායම




| ආයෝජන වර්ගය | ආයෝජන ආදායම 2024 රු. මි. | ආයෝජන ආදායම 2023 රු. මි. |
|---|---|---|
| රජයේ සුරැකුම්පත් | 10,889 | 9,463 |
| ස්ථාවර තැන්පතු | 2,024 | 4,359 |
| වාණිජ පත්‍රිකා | 2,419 | 866 |
| ණයකර | 7,071 | 7,116 |
| ලැයිස්තුගත කළ/නොකළ කොටස් | 4,624 | 560 |
| ඒකක භාර | 225 | 303 |
| සේවක ණයවලින් ලද පොලී ආදායම | 258 | 481 |
| එකතුව | 27,510 | 23,148 |

### ආයෝජන ආදායමේ සංයුතිය – 2024



# මූල්‍ය ප්‍රාග්ධනය

## ගෙවන ලද දළ ප්‍රතිලාභ හා හිමිකම්

අප කෙරෙහි ඔප්පුහිමියන් තබා ඇති විශ්වාසය අපි හිමිකම් පිළිගන්නා ආකාරය පිළිබඳ සාක්ෂියක් වන අතර එය 2023ට වඩා 10%ක වැඩිවීමක් වාර්තාකරමින් රු. මිලියන 12,994ක් විය. මේ තුළින් බැඳීම් ඉටු කිරීමේදී හා විශ්වාසදායි ආරක්ෂාව ලබාදීමේදී අපගේ හැකියාව සහ විශ්වාසනියත්වය පිළිබිඹු කරයි. සමාගමේ කඩිනම් හිමිකම් ගෙවීම, සමාගමේ විශ්වාසනීයත්වය ගනුදෙනුකාර විශ්වාසය සහ කීර්තිනාමය තවදුරටත් ශක්තිමත් කරයි.

2024 තුළ ගෙවන ලද දළ ප්‍රතිලාභ සහ හිමිකම්වල වැඩිවීම පරිනත හා මනාව ස්ථාපිත රක්ෂකයෙක් වශයෙන් සමාගමේ පැතිකඩට අනුකූලව ඉහළ ප්‍රමාණයක ඔප්පු කල්පිරීම මගින් විශාල වශයෙන් ඇති කරන ලදී. කල්පිරීම් සඳහා ගෙවීම රු. මිලියන 8,159 ට ලඟා වූ අතර ඉන් දිගු කාලීන ඔප්පු බැඳීම් ස්ථිරව ඉටු කිරීම පිළිබිඹු කරයි.

ඔප්පු පවාරණය කිරීමේ මට්ටම රු. මිලියන 1,691 (2023: රු. මිලියන 1,718) දක්වා සුළු පහත වැටීමක් පෙන්වා ඇති අතර එයට වර්ධනීය ආර්ථික තත්ත්වයන් හා සමාගම විසින් සිදුකළ ඔප්පුහිමියන් රඳවා ගැනීමේ උත්සාහයන් සහය විය. පසුගිය වසරට සාපේක්ෂව මරණ සහ ආබාධිත හිමිකම්, වාර්ෂිත හා උකස් හිමිකම්වල අඩුවීම මගින් සමාගම සිය බැඳීම් ඉටු කිරීමට ඇති අඛණ්ඩ කැපවීම ඉස්මතු කරයි.

සමාගම එහි ව්‍යුහගත හිමිකම් අඛණ්ඩව නගා සිටුවීම මගින් ඉහළ මට්ටමක ගනුදෙනුකාර තෘප්තියක් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් පමත්වා ගැනීමට කටයුතු කර ඇත.

### ඔප්පු හිමියන් සඳහා ශුද්ධ හිමිකම් හා ප්‍රතිලාභ




| ගෙවන ලද දළ ප්‍රතිලාභ හා හිමිකම් | 2024 රු. මි. | 2023 රු. මි. |
|---|---|---|
| මරණ හිමිකම් | 1,863 | 2,019 |
| ඔප්පු කල්පිරීම | 8,159 | 6,152 |
| පවාරණ | 1,691 | 1,718 |
| ආබාධිතතාව, පාරිතෝශිත ලෙස වාර්ෂික ගෙවීම හා උකස් ආරක්ෂනය | 1,975 | 2,304 |
| ගෙවන ලද මුළු දළ ප්‍රතිලාභ හා හිමිකම් | 13,688 | 12,193 |
| ප්‍රතිරක්ෂකයින්ට පැවරූ හිමිකම් | (694) | (433) |
| මුළු ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම් | 12,944 | 11,760 |

## ගිවිසුම් වගකීම්වල දළ වෙනස

2024 තුළ, සමාගම දිගු කාලින රක්ෂණ අරමුදලට රු. මිලියන 26,409ක සැලකියයුතු ප්‍රමාණයක් මාරු කර ඇති අතර පසුව කොටස්හිමි අරමුදලට රු. මිලියන 2,595ක් මාරු කර ඇත. වාරික රැස් කිරීමේ ශක්තිමත් භාවය, ඵලදායි පිරිවැය කළමනාකරණය හා විනයානුකූල ආයෝජන උපායමාර්ගවලින් මෙය කළ හැකි වූ අතර ඒවා එකට රක්ෂණ අරමුදලේ තිරසාර වර්ධනයට සහය විය.

සංචිත තත්ත්වය ස්වාධීන ආයුගණකවරයෙක් විසින් වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණයක් (LAT) මගින් වලංගු කරන ලද අතර යම් වැඩිදුර වෙන් කිරීම් නොමැතිව අනාගත ඔප්පුහිමියන්ගේ බැඳීම් සපුරාලීමට සංචිත ප්‍රමාණවත් බව ඉන් සහතික කරන ලදී.

| අත්කර ගැනීමේ පිරිවැය | 2024 රු. මි. | 2023 රු. මි. | වර්ධනය % |
|---|---|---|---|
| අත්කර ගැනීමේ පිරිවැය | 3,529 | 2,746 | 29 |

## අත්කරගැනීමේ පිරිවැය

අත්කර ගැනීමේ පිරිවැය පසුගිය වසරේ සිට 29%කින් වැඩි වී ඇති අතර වැඩිකළ ව්‍යාපාර අත්කර ගැනීමේ උත්සාහයන් සහ දළ ලිඛිත වාරික අනුව එය රු. මිලියන 3,529 දක්වා (2023: රු. මිලියන 2,746) ලඟාවිය. මෙම වැඩිවීමට නිකුත්කළ ඔප්පුවල ඉහළ පරිමාව සහ පුළුල්කළ විකුණුම් වැඩසටහන් ප්‍රධාන වශයෙන් හේතු විය.

### අත්කරගැනීමේ පිරිවැය




## වෙනත් මෙහෙයුම් හා පරිපාලන වියදම්

වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම්වලට ප්‍රධාන වශයෙන් පරිපාලන පිරිවැය, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් සහ සේවක ආශ්‍රිත වියදම් ඇතුළත් වේ.

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙන් කිරීමෙන් පසු, ව්‍යාපාරික කටයුතුවලට සහයවීමට SLICLL විසින් ස්වාධීන මෙහෙයුම් ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් විසින් කලින් හුවමාරුකර දරන ලද තොරතුරු තාක්ෂණ සහ යටිතල පහසුකම් සංවර්ධනය, කල්බදු, නෛතික සහ අනුකූලතා වියදම්, සන්නාම දැනුවත්භාවය, අලෙවිකරණය සහ මහජන සම්බන්ධතා වියදම් සමාගම විසින් දරනු ලැබ ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් යටතේ සමාගම ක්‍රියාත්මක වීමට සාපේක්ෂව සමහර පරිපාලන වියදම් ඉහළ බව පෙනී යන අතර, ස්වාධීන ව්‍යාපාර ව්‍යුහයකට සහයවීමට දැනට අවශ්‍ය සම්පූර්ණ තනි මෙහෙයුම් ඉන් පිළිබිඹු කරයි.

පෙර ඒකාබද්ධ ව්‍යුහයට සාපේක්ෂව තාවකාලික වැඩිවීමක් තිබුනද, අනාගත වසරවල සමාගම සිය ස්වාධීන මෙහෙයුම් කරගෙන යන බැවින් මෙම පිරිවැය කාරයක්ෂමව කළමනාකරණය කිරීම කෙරෙහි සමාගම අවධානය යොමු කරයි.

# මූල්‍ය ප්‍රාග්ධනය

| වෙනත් මෙහෙයුම් හා පරිපාලන වියදම් | 2024 රු.මි. | 2023 රු.මි. | වෙනස % |
|---|---|---|---|
| පරිපාලන හා වෙනත් වියදම් | 1,956 | 1,799 | 8.7 |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 805 | 719 | 11.9 |
| සේවක සම්බන්ධ වියදම් | 3,187 | 3,180 | 0.2 |
| එකතුව | 5,948 | 5,698 | 4.4 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල හානිකරණය ආපසු හැරවීම | 0 | (473) | 0 |
| එකතුව | 5,948 | 5,225 | 14 |

## ලාභදායිතාව

### ජීවිත අරමුදලට මාරු කිරීමට පෙර බදු පෙර ලාභය




### ජීවිත අරමුදලට මාරු කිරීමෙන් පසු පෙර බදු පෙර ලාභය




### ජීවිත අරමුදලට මාරු කිරීමට පෙර බදු පසු ලාභය




### ජීවිත අරමුදලට මාරු කිරීමෙන් පසු පෙර බදු පසු ලාභය



# මූල්‍ය ප්‍රාග්ධනය

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තාකරණ දිනට ආයතනයේ වත්කම්, වගකීම් සහ ස්කන්ධය ලැයිස්තුගත කර ඇත

**මුළු වත්කම්**
රු. මි. 238,625

=

**මුළු වගකීම්**
රු. මි. 223,353

+

**මුළු ස්කන්ධය**
රු. මි. 15,272

**දේපල,පිරියත හා උපකරණ**
රු. මි. 440

**ආයෝජන**
රු. මි. 219,921

**වෙනත් වත්කම්**
රු. මි. 18,264

**රක්ෂණ ගිවිසුම් වගකීම්**
රු. මි. 216,783

**වෙනත් වගකීම්**
රු. මි. 6,570

### මුළු වත්කම්

ඉහළින් පුරෝකතනය කළ නොහැකි වාතාවරණයක් තුළ ශක්තිය හා ස්ථාවරත්වය ලබා දෙමින් සිය දිගුකාලීන අඛණ්ඩතාව සහතික කිරීම සඳහා සමාගමේ වත්කම් සහ ආයෝජන අත්‍යවශ්‍යය. 2024 දෙසැම්බර් 31 දිනට, සමාගමේ මුළු වත්කම් පදනම රු. මිලියන 238,625ක් වූ අතර, ප්‍රධාන වශයෙන් මූල්‍ය වත්කම්වල ආයෝජන, දේපළ, පිරියත සහ උපකරණවල (PPE) ශුද්ධ පොත් වටිනාකම සහ මුළු වත්කම් මගින් මෙහෙයවනු ලැබේ.

### මූල්‍ය ආයෝජන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව (SLFRS/LKAS), ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සිය මූල්‍ය උපකරණ පහත වර්ගීකරණයන්ට වර්ගීකරණය කර ඇතː

2024 මූල්‍ය වසර සඳහා සමාගමේ ස්කන්ධය මත ඉපයීම් (ROE) 17%ක් වූ අතර, 2023 මූල්‍ය වසර තුළ වාර්තාකළ 11% සිට වර්ධනයක් පෙන්නුම් කරයි. ආයෝජන මත ඉපයීම 2023 මූල්‍ය වසර තුළ වාර්තාකළ 11% සිට 12%ක සුළු වැඩිවීමක් පිළිබිඹු කර ඇත.

| මූල්‍ය ආයෝජනවල සංයුතිය | 2024 රු. මි. | සංයුතිය % |
|---|---|---|
| කල් පිරීමට තබා තිබෙන මූල්‍ය වත්කම් (HTM) | 79,757 | 36 |
| ණය හා ලැබීම් (L&R) | 35,574 | 16 |
| අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් (AFS) | 89,307 | 41 |
| ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVTPL) | 15,283 | 7 |
| **එකතුව** | 219,921 | 100 |

# මූල්‍ය ප්‍රාග්ධනය

| | |
|---|---|
| HTM | • භාණ්ඩාගාර බැඳුම්කර<br>• ලැයිස්තුගත ණයකර |
| L&R | • ලැයිස්තුගත නොකළ ණයකර<br>• කාලීන තැන්පතු<br>• සේවක ණය<br>• නියෝජිත ණය |
| AFS | • ඒකක භාර<br>• ලැයිස්තුගත කොටස්<br>• ලැයිස්තුගත ණයකර<br>• භාණ්ඩාගාර බැඳුම්කර<br>• වාණිජ පත්‍රිකා |
| FVTPL | • ඒකක භාර<br>• ලැයිස්තුගත කොටස් |

## ආයෝජන සංයුතිය




ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් ජීවිත රක්ෂණ සමාගමක් බැවින් SLFRS 17: රක්ෂණ ගිවිසුම ගිනුම්කරණ ප්‍රමිතිය යටතේ ලබාදුන් ව්‍යතිරේකයට අනුව SLFRS 9 ගිණුම්කරන ප්‍රමිතිය යොදා ගැනීම 2026 ජනවාරි 01 දින SLFRS 17 හි ක්‍රියාත්මක දිනය දක්වා ප්‍රමාද කර ඇත.

මූල්‍ය උපකරණවල ආයෝජන නියාමන අවශ්‍යතා සහ අභ්‍යන්තර ආයෝජන මාර්ගෝපදේශවලට අනුකූලව දැඩි නියාමනය තුළ කළමනාකරණය කෙරේ. සමාගමේ උපායමාර්ගයෙන් සාපේක්ෂව අඩු අවදානම් ආයෝජන විකල්ප තුළින් ස්ථිර ප්‍රතිලාභ උත්පාදනය කෙරෙහි අවධානය යොමු කරයි.

## කල් පිරීමට තබා ගන්නා මූල්‍ය උපකරණ (HTM)

කල් පිරීමට තබා ගන්නා මූල්‍ය වත්කම් ස්ථිර හෝ තීරණයකළ හැකි ගෙවීම් සහ විශේෂ කල්පිරීම් මගින් අර්ථවත් කරන අතර ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් මෙම වත්කම් කල්පිරෙන තෙක් තබාගැනීමට තිරණය කර ඇත. මේවා සමාගමේ මූල්‍ය උපකරණවලින් 36%ක් සමන්විතය. විචක්ෂණ ජීවිත රක්ෂකයෙක් ලෙස, ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් උපායමාර්ගිකව සිය දිගුකාලින රක්ෂණ වගකීම් සමඟ පෙළ ගැසීමට දිගු කාලීන වත්කම්වල ආයෝජනය කරයි. කල්පිරෙන තෙක් තබාගන්නා මූල්‍ය වත්කම්වලින් සැලකියයුතු 77%ක් “අවදානම්-රහිත” භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වෙන් කරන අතර ඉතිරි කොටස පිළිගත් ආයතන විසින් නිකුත් කළ උසස් තත්ත්වයේ ආයතනික ණයකරවල ආයෝජනය කෙරේ.

## කල් පිරීමට තබා ඇති (HTM)




## ණය හා ලැබීම් (L&R)

මෙම ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ස්ථිර හෝ තීරණයකළ හැකි ගෙවීම් පෙන්වන අතර සක්‍රිය වෙළෙඳපොල තුළ අලෙවි කරනු නොලැබේ. ලැයිස්තුගත නොකළ ණයකරවලින් සමන්විත මෙම ආයෝජන 76%ක් සමඟ ණය හා ලැබීම් වර්ගීකරණය යටතේ සමාගම සිය මූල්‍ය උපකරණවලින් 16%ක් වර්ගීකරණය කරයි.

## ණය හා ලැබීම් (L&R)



# මූල්‍ය ප්‍රාග්ධනය

## අලෙවියට තබා ඇති මූල්‍ය උපකරණ (AFS)

අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් යනු අලෙවියට තබා ඇති ලෙස නම්කළ වත්කම් වන අතර වෙනත් යම් වර්ගීකරණ යටතේ වර්ගීකරණය නොකෙරේ. අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් සමාගමේ මුළු මූල්‍ය උපකරණ ආයෝජනවලින් 41%කට දායක වී ඇත. මෙයින්, 38%ක් භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර ඇති අතර ඉතිරි කොටස ලැයිස්තුගත කොටස්, ඒකක භාර, ලැයිස්තුගත ණයකර සහ වාණිජ පත්‍රිකාවල ආයෝජනය කර ඇත.

### අලෙවියට තබා ඇති (AFS)




## ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVTPL)

මෙම මූල්‍ය වත්කම් අලෙවිකරණ අරමුණ සඳහා තබා ගනී. වසර තුළ, සමාගම ලැයිස්තුගත කොටස්වල සැලකියයුතු ආයෝජනයක් සිදු කර ඇති අතර, වර්තමානයේ එය ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්වලින් 84%ක් සමන්විතය. ඉතිරි කොටස ඒකක භාරවල ආයෝජනය කෙරේ.

### ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL)




### මුළු වගකීම්

සමාගමේ මුළු වගකීම් 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 223,353ක් විය. මෙයට රක්ෂණ ගිවිසුම් වගකීම් මගින් ප්‍රධාන වශයෙන් සිදුකරන ලද අතර එය මුළු වගකීමේ ශේෂයෙන් 97%ක් නියෝජනය කරමින් රු. මිලියන 216,783කට දායක වී ඇත.

### රක්ෂණ ගිවිසුම් වගකීම්

රක්ෂණ ගිවිසුම් වගකීම් හෝ ජීවිත අරමුදල සංශෝධිත 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට අනුකූලව සිය දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් විසින් පවත්වා ගන්නා සංචිත ඉදිරිපත් කරයි. ජීවිත අරමුදලේ ප්‍රමාණය හා ශක්තිය ජීවිත රක්ෂකයෙකුගේ මූල්‍ය ශක්තිය හා ස්ථාවරත්වය පිළිබඳ ප්‍රධාන දර්ශකයක් ලෙස සේවය කරයි.

2024 දෙසැම්බර් 31 දිනට, ජීවිත අරමුදල රු. මිලියන 216,783ට ළඟා වූ අතර දළ ලිඛිත වාරික සහ ආයෝජන ආදායම තුළ වර්ධනය මගින් සහයවන වාර්ෂික වැඩිවීමක් පිළිබිඹු කරයි. ජීවිත අරමුදලේ ශුද්ධ වර්ධනය වසර තුළ කොටස්හිමියන්ගේ අරමුදලට රු. මිලියන 2,641ක මාරු කිරීමකින් පසු සිදු වී ඇත. 2024 දෙසැම්බර් 31 දිනට, ජීවිත අරමුදලේ ආයුගණක ඇගයීම සිදු කරන ලැබුවේ විලිස් ටවර්ස් වොට්සන්, එක්සත් රාජධානියේ ආයුගණක ආයතනයේ සහ පීඨයේ සාමාජික කුන්ජ් බෙහාරි මහේෂ්වරී විසිනි.

### මුළු ස්කන්ධය

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 12,500කි. 2024 දෙසැම්බර් 31 අවසානයට රඳවාගත් ඉපයීම් ශේෂය රු. මිලියන 2,485ක් විය. 2024 දී ප්‍රත්‍යාගණන සංචිතය රු. මිලියන 223ක් වූ අතර මෝටර් රථ ප්‍රත්‍යාගණනය මත හඳුනාගත් ලාභ ඉන් පිළිබිඹු කරයි. 2024 දෙසැම්බර් 31 අවසානයට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 16 නියෝගයට අනුව 2017 දී ස්ථාපිත සීමාකළ නියාමන සංචිතය රු. මිලියන 98හි පැවතුණි.

## SLFRS ක්‍රියාත්මක කිරීම

SLFRS 17 ක්‍රියාත්මක කිරීම රක්ෂණ සමාගම් සඳහා මූල්‍ය වාර්තාකරණ වාතාවරණය සැලකියයුතු ලෙස වෙනස් කරන අතර, ඉන් විනිවිදභාවය වැඩි කරමින් ආයතන අතර මූල්‍ය කාර්යසාධනය වඩා යහපත් තුළනාත්මකභාවයක් ඇති කරයි. SLICLL සඳහා, SLFRS 17 ක්‍රියාත්මක කිරීම උපායමාර්ගික අවස්ථාවක් වන නිත්‍යානුකූල අවශ්‍යතාවයට වැඩි යමක් දැකිය හැකිය. මෙම මූලපිරීම කාර්යසාධන වර්ධනයන් ඇති කිරීමට සිය උපායාමර්ගය සහ ආයතනික සැලසුම් නැවත සම්පූර්ණයෙන් තක්සේරු කිරීමට සමාගමට ඉඩ ලබා දේ. මෙම ක්‍රියාත්මක කිරීම නව ව්‍යාපාරවල වටිනාකම වැඩි කිරීම මත අවධානය සමඟ වටිනාකම් පදනම් ආයතනයක සිට වටිනාකම කේන්ද්‍රිය ආයතනයකට පරිවර්තනය කිරීමේ සමාගමේ අරමුණ මත පෙළ ගැසේ. නව ව්‍යාපාර වටිනාකම හා ගිවිසුම්ගත සේවා ආන්තිකය අතර පැහැදිලි සම්බන්ධතාවක් ඇති අතර එය රක්ෂණ ගිවිසුමකට ආරෝපනය කළ හැකි සමස්ත ලාභ නියෝජනය කරයි.

පහසු පරිවර්තනයක් සහතික කිරීමට හා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් කාලය ලබාදීමට, ICASL හි සභාව SLFRS 17 හි බලාත්මක දිනය සඳහා එක් වසරක දීර්ඝ කිරීමක් අනුමත කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, SLFRS 17 2026 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භවන වාර්ෂික වාර්තාකරණ කාලසීමා සඳහා අදාළ වනු ඇත. ඒ සමඟම, SLFRS 9 – මූල්‍ය උපකරණ ගිණුම්කරන ප්‍රමිති අනිවාර්ය ක්‍රියාත්මක කිරීමට 2026 ජනවාරි 01 දින SLFRS 17 හි

## මූල්‍ය ප්‍රාග්ධනය

බලාත්මක දිනය දක්වා කල් දමා ඇත. මූල්‍ය උපකරණවල ආයෝජන නියාමන අවශ්‍යතා සහ අභ්‍යන්තර ආයෝජන මාර්ගෝපදේශවලට දැඩි අනුකූලතාවයකින් කළමනාකරණය කෙරේ. සමාගමේ උපායමාර්ගයෙන් සාපේක්ෂව අවදානම් අඩු ආයෝජන විකල්ප තුළින් ස්ථිර ප්‍රතිඵල උත්පාදනය කෙරෙහි අවධානය යොමු කරයි.

SLFRS 17 වාර්තාකරණය තුළ අනිවාර්ය වෙනස්වීම් - අපගේ පාර්ශ්වකරුවන්ට පණිවිඩය

IFRS 17 ක්‍රියාත්මක කිරීම රක්ෂණ ක්ෂේත්‍රයෙහි වාර්තාකරණ ව්‍යූහයට සැලකියයුතු වෙනස්වීම් ගෙනෙනු ඇති අතර ප්‍රතිරක්ෂණ ව්‍යවහාර, ආයුගණක ලාභ හඳුනාගැනීමේ ක්‍රම, මූල්‍ය ක්‍රියාවලි හා සමහර විකුණුම් ශිල්ප කෙරෙහිද බලපානු ඇත.

මෙම නව ප්‍රමිතිය සමඟ, අපගේ මූල්‍ය ප්‍රතිඵලවලින් අපගේ ව්‍යාපාරයේ ආර්ථික විද්‍යාවන් වඩාත් නිවැරදිව පිළිබිඹු කරන අතර කාලය සමඟ අපි ලාභ උපදවන ආකාරය, අප කළමනාකරණය කරන අවදානම් මට්ටම, සහ ඔප්පුහිමියන්ට හා කොටස්හිමියන්ට අප ලබාදෙන වටිනාකම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දේ.

IFRS 17 යොදා ගැනීම ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් හා සම්බන්ධ වන අතර, එය අපගේ ප්‍රධාන ව්‍යාපාර මෙහෙයුම්, මුදල් ප්‍රවාහය හෝ වටිනාකම ලබාදීමට කැපවීම කෙරෙහි බලපෑම් නොකරයි. IFRS 17 ස්ථිරව යොදා ගැනීම ඉදිරිපත් කරන තොරතුරුවල තත්ත්වය වැඩි කරන අතර, අපගේ මූල්‍යය පිළිබඳව වඩාත් ශක්තිමත් නියෝජනය භාවිතා කරමින් වඩාත් දැනුවත් තීරණ ගැනීමට අපගේ පාර්ශ්වකරුවන්ට ඉඩ ලබා දේ.

SLICLL විසින් සිය IFRS 17 ක්‍රියාත්මක කිරීම 2024 මැයිවල අභ්‍යන්තර කණ්ඩායමක් ස්ථාපිත කරමින් හා වෘත්තීමය උපදේශකයෙක් සඳහා RFP ක්‍රියාවලිය ආරම්භ කළේය. ක්‍රියාවලියට සහයවීම සඳහා 2024 දෙසැම්බර් Deloitte Partners ඇතුළත් කර ගන්නා ලදී. GAP විශ්ලේෂණය, අභ්‍යන්තර කණ්ඩායම් සංවර්ධනය හා උපදේශන තෝරාගැනීම නිමකිරීමත් සමඟ, ව්‍යාපෘතියේ ප්‍රධාන මංසලකුණුවලින් 30%ක් SLICLL සාක්ෂාත් කර ගෙන ඇත.

SLICLL Deloitte සමඟ තාක්ෂණික විශ්ලේෂණය සහ 2025 ජූලිවල විකුණුම්කරුවන් ඇතුළත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. ICASL හි නියාමන කාලය සපුරාලන බව SLICLL විශ්වාස කරන අතර 2026 මූල්‍ය වසරේ සිට IFRS 17 අනුකූල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අරමුණු කරයි.

### අනාගත ගිණුම්කරණ සංවර්ධනයන්

**අනුරූපතාව** – IFRS 17 හි ප්‍රධාන අරමුණ සෑම රක්ෂණ ගිවිසුමක් සඳහාම තනි, මූලධර්ම පදනම් රාමුවකි.

**කුමක්ද** – වැඩිකළ විනිවිදභාවය, අනුකූලතාව සහ සංසන්දනාත්මක බව සමඟ මූල්‍ය ප්‍රතිඵල වාර්තාකරණයෙහි සැලකියයුතු වෙනස්වීම.

**කවදාද** – 2026 ජනවාරි 01 සිට බලාත්මක වේ.

**පුහුණුව** – ඉහළ මට්ටමේ කළමනාකරණය සමඟ තොරතුරු තාක්ෂණ සහ පද්ධති, මූල්‍ය, ආයුගණක, ජීවිත සහ ප්‍රතිරක්ෂණය අනුකූලතා උපදේශන හවුල්කරුවන් විසින් මෙහෙයවනු ලබන පුහුණුවීම්වලට යොමු කරන ලදී.

**අපගේ හවුල්කරුවන්** – IFRS 17 ක්‍රියාත්මක කිරීම Deloitte partners සමඟ ආරම්භ කර ඇත.

**තොරතුරු තාක්ෂණ පද්ධතිය** – දත්ත නිරවද්‍යතාවය, ඒකාබද්ධ කිරීම, සොයා ගැනීමේ හැකියාව සහ පරිමාණය කිරීමේ හැකියාව සඳහා පද්ධති ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

# මූල්‍ය ප්‍රාග්ධනය

## අගය එකතුකළ ප්‍රකාශය

ශුද්ධ ඉපයූ වාරිකය




ආයෝජනය හා වෙනත් ආදායම




මුළු එකතුකළ අගය




ශුද්ධ ඉපයූ වාරිකය රු. මි. 25,331 + ආයෝජනය හා වෙනත් ආදායම රු. මි. 27,907 = එකතුකළ අගය රු. මි. 53,238

ක්ෂේත්‍රයේ වෙන් කිරීම



| | |
|---|---|
| ජීවිත රක්ෂණ අරමුදලේ වැඩිවීම | 50% |
| ඔප්පුහිමියන්ට ශුද්ධ හිමිකම් හා ප්‍රතිලාභ | 24% |
| අත්කරගැනීමේ පිරිවැය | 7% |
| සේවක වේතන | 6% |
| වෙනත් වියදම | 5% |
| සංචිත ලෙස රඳවා ගැනීම් | 5% |
| ආදායම් බදු | 3% |
| ක්ෂයකිරීම් ලෙස රඳවා ගැනීම් | 0% |

ජීවිත රක්ෂණ අරමුදලේ වැඩිවීම




ඔප්පුහිමියන්ට ශුද්ධ හිමිකම් හා ප්‍රතිලාභ




අත්කරගැනීමේ පිරිවැය




සේවක වේතන




වෙනත් වියදම




සංචිත ලෙස රඳවා ගැනීම්




ආදායම් බදු




ක්ෂයකිරීම් ලෙස රඳවා ගැනීම්



# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## SLICLL හි උපායමාර්ගික අවධානය වත්කම්වල ආයෝජනය කෙරෙහි වන අතර එය තිරසාර වටිනාකම උත්පාදනය කර ආර්ථික වර්ධනය හා දිගුකාලින ස්ථාවරත්වයට කැපවීමට සහය වේ.

### අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය හා එහි වටිනාකම නිර්මාණ ක්‍රියාවලිය

SLICLL හි නිෂ්පාදිත ප්‍රාග්ධනය සිය කාර්යාල (ශාඛා, පරිගණක හා උපාංග,ඩිජිටල් මාර්ග, සහ ශාඛා යටිතල පහසුකම්වලින් සමන්විත වේ. භෞතික ශාඛා ජාලය ශාඛා 142ක්, නියෝජිත ව්‍යාපාර සංවර්ධන ආයතන (ABDCs) 60ක් සහ සේවා මධ්‍යස්ථාන දක්වා විහිදෙන අතර එය ලංකා හොස්පිට්ල් කෝපරේෂන් පීඑල්සී පවත්වාගෙන යයි. අපගේ ජාලය ශ්‍රී ලංකාවේ පළාත් 09 දිස්ත්‍රික් 25 ආවරණය කරයි.

ජීවිත රක්ෂණ සේවා සපයන්නෙක් ලෙස, මුහුණට මුහුණලා සන්නිවේදනයේ වටිනාකම අපි සම්පූර්ණයෙන් අවබෝධ කර ගන්නා අතර අවශ්‍ය පරිදි සෑම විටම එහි නියැලීමට උත්සාහ ගනිමු. කෙසේ වෙතත්, අපි නිෂ්පාදන හා සේවා සඳහා අපගේ ගනුදෙනුකරුවන්ට පහසු පිවිසීම වෙනුවෙන් තත්‍ය සන්නිවේදන මාර්ග පිරිනමමු. අපගේ 24 පැය ඇමතුම් මධ්‍යස්ථානය ගනුදෙනුකාර සහය සඳහා ලබාගත හැකි අතර අපගේ ආයතනික වෙබ් අඩවිය ද 24/7 ලබාගත හැකි අතර අපගේ නිෂ්පාදන හා සේවා සඳහා තොරතුරු සහ පිවිසීම ලබා දේ.

ඊට අමතරව, අපගේ ගනුදෙනුකරුවන්ට අපගේ සේවා කරා පිවිසීම වඩාත් පහසු කිරීම සඳහා ජංගම ගෙවීම් විසඳුම් හා වෙනත් දෙමුහුන් මාර්ග අපි පිරිනමන අතර මේ සියල්ල තරඟකාරී වෙළෙඳපොලක් තුළ වඩා ආකර්ශනීය විකල්පයක අපව ස්ථානගත කරනු ඇත.

**මූලික සංඛ්‍යාලේඛණ සිදුවීම් 2024**

| 4 | 1 | 1 |
|---|---|---|
| විවෘතකළ ABDCs | නැවත ස්ථානගතකළ ශාඛා | නවීකරණය කළ ශාඛා |

### වටිනාකම නිර්මාණය කිරීමේ පරමාර්ථ සපුරාලීම

#### ශාඛා ව්‍යාප්තිය හා නැවත ස්ථානගත කිරීම

ව්‍යාපාර විභවතා කෙරෙහි අවධානය යොමු කරන ශාඛා ව්‍යාප්තීන් සඳහා SLICLL ට මනාව සැලසුම්කළ උපායමාර්ගයක් ඇත. ශාඛා ව්‍යාප්තිය සඳහා වේගවත් නාගරීකරණය සමඟ මතුවන සුළු හා මධ්‍ය පරිමාන ව්‍යාසායකයින් අපි ඉලක්ක කරමු. අපගේ ප්‍රවේශයට ප්‍රශස්ත ශාඛා විනිවිද යාමේ අනුපාතයක්, ප්‍රමාණවත් ජනගහන ඝනත්වයක් සහ ප්‍රමාණවත් ආදායම් මට්ටම් ඇති ප්‍රදේශවල නව ශාඛා හෝ නියෝජිතායතන ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම හා සම්බන්ධ වේ. මෙය පිරිවැය සහ නව ව්‍යාපාරික අවස්ථා සමතුලිත කිරීමට අපට උපකාරී වේ. එමෙන්ම අප විසින් 2024 වර්ෂයේදී නගර ශාඛා කාර්යාලය නැවත ස්ථානගත කිරීම ඉහත සඳහන් උපාය මාර්ග ක්‍රමවේදයන් මත පදනම්ව සිදු කරන ලදී.

#### ශාඛාවල කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය

අපගේ ශාඛා ජාලයේ ඵලදායිත්වය පුළුල් කිරීමේදී අප සිදුකරන උපායමාර්ගික තීරණවල පමණක් නොව අමුත්තන්ට ශාඛා ව්‍යාපාතියේ වාතාවරණය ද පිළිබිඹු කරයි. අප සමාගමට අයත් පුත්තලම ශාඛා කාර්යාල ගොඩනැගිල්ල 2024 වර්ෂයේදී ප්‍රතිසංස්කරණය සිදු කරන ලද අතර ශාඛාවට සම්පූර්ණයෙන් නව පෙනුමක් හා හැඟීමක් ලබා දී ඇත.



# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## ස්ථාවර වත්කම්වල ආයෝජන

| | 2024<br>රු. '000 |
|---|---|
| ස්ථාවර වත්කම්වලට එකතුකිරීම් | 85,509 |
| ස්ථාවර වත්කම්වල ශුද්ධ ගිණුම් පොත් අගය | 439,973 |

*ඉහත සඳහන් සියලුම සංඛ්‍යා වාර්ෂික කාර්යසාධනයේ සම්පූර්ණත්වය සහතික කරමින් ජීවිත ව්‍යාපාරය සඳහා මාස 12 සම්පූර්ණ කාලසීමාවට අනුරූප වේ.*

## ශාඛා ව්‍යාප්තිය හා ජනගහන සනත්වය

| පළාත | ශාඛා ව්‍යාප්තිය (ABDCs, සහ LHC කවුළුව ඇතුළුව ශාඛා ගණන) 2024 | ශාඛා ව්‍යාප්තිය (ABDCs, සහ LHC කවුළුව ඇතුළුව ශාඛා ගණන) 2023 | ශාඛා ව්‍යාප්තිය (CSCs ඇතුළුව ශාඛා ගණන) 2022 |
|---|---|---|---|
| බස්නාහිර | 64 | 65 | 69 |
| දකුණ | 32 | 32 | 32 |
| මධ්‍යම | 15 | 18 | 17 |
| උතුරු | 18 | 14 | 10 |
| උතුරු මැද | 15 | 13 | 12 |
| නැගෙනහිර | 11 | 11 | 10 |
| වයඹ | 25 | 25 | 25 |
| සබරගමුව | 12 | 13 | 13 |
| ඌව | 10 | 10 | 09 |

## 2024 දී අවසන්කළ ව්‍යාපෘති සහ 2025 වසර සඳහා සැලැස්ම




### 2024 දී නිමකළ ව්‍යාපෘති

- නව ABDCs – මුලන්කාවි, මනිපායි, පල්ලායි, සහ නයිවල
- නගර කාර්යාල ශාඛා නැවත ස්ථානගත කරන ලදී
- පුත්තලම ශාඛාව අලුත්වැඩියා කරන ලදී

### ඉදිරි දැක්ම – 2025 සඳහා සැලැස්ම

- නැවත ස්ථානගත කිරීම් – 5 (කඹුරුපිටිය, හම්බන්තොට, කලවාන, වත්තල, ගිරිඋල්ල)
- අලුත්වැඩියා කිරීම් – 2 (රිකිල්ලගස්කඩ - සමාගමට අයත්) බකමූණ - කුලී ගොඩනැගිල්ල)
- SLICLL අයත් දේපලවල නව ඉදිකිරීමේ ව්‍යාපෘති – 5 (නුවරඑළිය, බදුල්ල, නගර කාර්යාලය කොළඹ, කලුතර හා යාපනය)
- ABDCs වැඩිකිරීම – SLICLL හි දිවයින පුරා විනිවිදයාම වැඩි කිරීමට සුවිශේෂී ක්‍රමවේදයක් යොදා ගනිමින් හඳුනාගත් ප්‍රදේශවල නව නියෝජිතායතන සංවර්ධන මධ්‍යස්ථාන 29ක් ස්ථාපිත කරමින් තවදුරටත අපගේ ශාඛා ජාලය පුළුල් කිරීමට අපි සැලසුම් කරමු.

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## SLICLL ප්‍රාදේශීය සිතියම - 2024




### දකුණ 2

| | |
|---|---|
| ශාඛා– 12 | අකුරැස්ස, අම්බලන්තොට, බෙලිඅත්ත, දෙනියාය, දික්වැල්ල, හක්මන, හම්බන්තොට, මාතර, නෙලුව, තංගල්ල, තිස්සමහරාමය, වැලිගම |
| ABDCs – 8 | දෙයියන්දර, ඉමදුව, කඹුරුපිටිය, කැකනදුර, මිද්දෙනිය, මොරවක, ඌරුබොක්ක, වලස්මුල්ල |

### ඉහළ බස්නාහිර

| | |
|---|---|
| ශාඛා– 11 | ගම්පහ, ජා-ඇල, කඳාන, කොච්චිකඩේ, මාරවිල, මිනුවන්ගොඩ, මීගමුව, නිට්ටඹුව, වේයන්ගොඩ, වෙන්නප්පුව, යක්කල |
| ABDCs – 11 | දන්කොටුව, දිවුලපිටිය, ගනේමුල්ල, කිරිල්ලවල, කිරිදිවැල, මහබාගේ, මීරිගම, පූගොඩ, ඌරාපොල, වැලිවේරිය, නයිවල |

### ඌව

| | |
|---|---|
| ශාඛා– 10 | අම්පාර, බදුල්ල, බණ්ඩාරවෙල, බිබිල, හැටන්, මහියංගණය, මොනරාගල, නුවරඑළිය, වැලිමඩ, වැල්ලවාය |
| ABDCs – 3 | පස්සර, සියඹලාණ්ඩුව හෙට්ටිපොල |

### වයඹ 1

| | |
|---|---|
| ශාඛා – 10 | ගිරිඋල්ල, කුලියාපිටිය, කුරුණෑගල ප්‍රධාන, කුරුණෑගල නගරය, මැල්සිරිපුර, නාරම්මල, පොල්ගහවෙල, රඹුක්කන, රිදීගම, වරකාපොල |
| ABDCs – 5 | අලව්ව, හෙට්ටිපොල, කටුපොත, පන්නල, පොල්පිතිගම |

### වයඹ 2

| | |
|---|---|
| ශාඛා – 10 | ආනමඩුව, හලාවත, දඹුල්ල, ගලේවෙල, ගල්ගමුව, මහව, නිකවැරටිය, පුත්තලම, තඹුත්තේගම, වාරියපොල |
| ABDCs – 2 | අඹන්පොල, නොරොච්චෝලෙයි |

### බස්නාහිර 1

| | |
|---|---|
| ශාඛා – 8 | බත්තරමුල්ල, කොළඹ නගර කාර්යාලය, දෙහිවල, කිරුලපොන, මොරටුව, නුගේගොඩ, පිටකෝට්ටේ, රත්මලාන, |
| ABDCs – 0 | |
| කවුළු – 1 | ලංකා හොස්පිට්ල් කවුළුව |

### බස්නාහිර 2

| | |
|---|---|
| ශාඛා – 9 | කොළඹ මෙට්‍රෝ 1, කොළඹ මෙට්‍රෝ 2, කොළඹ මෙට්‍රෝ 3, කොළඹ මෙට්‍රෝ 4, කොළඹ මෙට්‍රෝ 6, කොළඹ මෙට්‍රෝ 10, කොළඹ මෙට්‍රෝ 11, කඩවත, කිරිබත්ගොඩ |
| ABDCs – 0 | |

### බස්නාහිර 3

| | |
|---|---|
| ශාඛා – 8 | මහරගම, අතුරුගිරිය, හෝමාගම, ඉංගිරිය, කඩුවෙල, කොට්ටාව, මාලඹේ, පිළියන්දල |
| ABDCs – 1 | පාදුක්ක |

### බස්නාහිර 4

| | |
|---|---|
| ශාඛා – 7 | බම්බලපිටිය, බොරැල්ල, කොටහේන, කොටිකාවත්ත, පිටකොටුව, රාගම, වත්තල |
| ABDCs – 1 | වැල්ලවත්ත |

### මධ්‍යම

| | |
|---|---|
| ශාඛා – 12 | දිගන, ගම්පොළ, නුවර නගරය, නුවර ප්‍රධාන, කටුගස්තොට, කෑගල්ල, මාතලේ, මාවනැල්ල, මාවතගම, නාවලපිටිය, පිළිමතලාව, රිකිල්ලගස්කඩ |
| ABDCs – 5 | අරණායක, බුලත්කොහුපිටිය, ගලගෙදර, පේරාදෙනිය, වත්තේගම |

### නැගෙනහිර

| | |
|---|---|
| ශාඛා – 5 | මඩකලපුව, අක්කරෙයිපත්තු, කල්මුනෙයි, කන්තලේ, ත්‍රිකුණාමලය |
| ABDCs – 3 | කලවන්චිකුඩි, මුතූර්, පොතුවිල් |

### උතුරු මැද

| | |
|---|---|
| ශාඛා – 10 | අනුරාධපුරය, අරලගන්විල, බකමූණ, දෙහිඅත්තකණ්ඩිය, හිඟුරක්ගොඩ, හොරොව්පතාන, කඳුරුවෙල, කැකිරාව, මැදවච්චිය, පදවි පරාක්‍රමපුර |
| ABDCs – 4 | හබරණ, මහඔය, මැදිරිගිරිය, ගලෙන්බිඳුණුවැව |

### උතුරු

| | |
|---|---|
| ශාඛා – 8 | චන්කනෙයි, චාවාකච්චේරි, යාපනය, කිලිනොච්චි, මන්නාරම, මුලතිව්, නෙල්ලිඅඩි, වවුනියාව |
| ABDCs – 10 | චුන්නාකම්, මල්ලවි, කයිතඩි, විසුවමඩු, කොඩිකාමම්, මතිපායි, පල්ලායි, මුලන්කාවි, පුදුකුඩුඉරුප්පු, පේදුරුතුඩුව |

### රත්නපුරය

| | |
|---|---|
| ශාඛා – 9 | අවිස්සාවේල්ල, බලංගොඩ, ඇහැලියගොඩ, ඇඹිලිපිටිය, කහවත්ත, කලවාන, පල්ලේබැද්ද, රත්නපුර, රුවන්වැල්ල |
| ABDCs – 2 | දූරණියගල, හංවැල්ල |

### දකුණ1

| | |
|---|---|
| ශාඛා – 12 | අලුත්ගම, අම්බලන්ගොඩ, බද්දේගම, බණ්ඩාරගම, ඇල්පිටිය, ගාල්ල, හොරණ, කලුතර, මතුගම, පානදුර, තල්ගස්වල, උඩුගම |
| ABDCs – 5 | හබරාදුව, කරාපිටිය, පිටිගල, තනිපොල්ගහ, ඌරගහ |

# බුද්ධිමය ප්‍රාග්ධනය

## තොරතුරු තීව්‍ර ජීවිත රක්ෂණ සේවා සපයන්නෙක් ලෙස, අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය යනු වෙළෙඳපොළ තුළ අපගේ අඛණ්ඩ ඵලදායිත්වයේ සාරය වේ.

SLIC ලයිෆ් හි බුද්ධිමය ප්‍රාග්ධනය දශක ගණනාවක පලපුරුද්ද සහ ඉගෙනුම්වල ප්‍රතිඵලයකි. එය තාක්ෂණය, ප්‍රතිපත්ති, පද්ධති හා ක්‍රියාවලි, සහ සන්නාම හිමිකම වැනි අස්පෘශ්‍ය වත්කම්වලින් සමන්විත වේ. මෙම දැනුම පදනම් ප්‍රාග්ධනය SLIC ලයිෆ් හි වටිනාකම වැඩි කරන අතර එයට තරඟකාරී වාසියක් ලබා දේ.

**ප්‍රධාන සංඛ්‍යාලේඛන වැදගත් සිදුවීම් 2024**

තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය — රු. මි. **109**

### SDGs වෙත දායකත්වය

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE — 2024 වසර සඳහා තොරතුරු තාක්‍ෂණ පද්ධති සංවර්ධනය සඳහා ආයෝජනය රු. මිලියන 109 කි

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION — අඛණ්ඩව 7 වැනි වරටත් වඩාත් ආදරණීය ජීවිත රක්ෂණ සන්නාමය

### සන්නාම හිමිකම

ජාතියේ රක්ෂකයා ලෙස විරුදාවලිය ලත් SLIC ලයිෆ් අභියෝගාත්මක ආර්ථික හා සමාජ තත්ත්වයන් හමුවේ වුවද සමාගමේ විශිෂ්ඨ සේවය හරහා එහි සන්නාම වටිනාකම වැඩි කර ගෙන ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ලයිෆ් සන්නාමය රු. බිලියන 213.2ක විශාලතම ජීවිත අරමුදල සහ රු. බිලියන 238.6ක වත්කම් පදනමක් සමඟ රු. බිලියන 2.7ට අගය කෙරේ. මෙම ජයග්‍රහනයන් ශ්‍රී ලංකාවේ විශාලතම සහ ශක්තිවන්තම රක්ෂකයා ලෙස ආයතනයේ ස්ථානය තහවුරු කරයි.

### සන්නාම ජයග්‍රහන

සන්නාමයක් ලෙස SLIC ලයිෆ් වටිනාකම අඛණ්ඩව වර්ධනය වී ඇති අතර සම්මාන සහ ජයග්‍රහණ ගණනාවක් දිනා ගනිමින් එය පෙන්වා දී ඇත. 2024 දී, LMD Brand Finance විසින් වසරේ "වඩාත් ආදරණීය ජීවිත රක්ෂණ සන්නාමය" ලෙස ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ලයිෆ් පිළිගෙන ඇත. එය අඛණ්ඩව 7වැනි වරටත් නැවත නැවතත් සිදු වූ පිළිගැනීමකි.

එහි ශක්තිමත් ගමන් මග, පසුගිය වසර ගණනාවක් පුරා ගොඩනගාගත් සන්නාම ප්‍රතිරූපය සහ ආයතනික දැනුම් සම්භාරය සමඟ, SLIC ලයිෆ් සියලු පාර්ශ්වකරුවන්ට සිය සන්නාම පොරොන්දුව ඉටුකරලීමට සැදී පැහැදී ඇත. අපගේ වෙළෙඳපොළ කොටස, දැනුම, හැකියාවන් සහ විශාලතම ජීවිත අරමුදල සහ වත්කම් පදනමේ ශක්තිය අනුව, විවිධ වටිනාකම් යෝජනා තුළින් අපගේ සේවාදායක පදනම පුළුල් කිරීමට අපට හැකි වී ඇත. SLIC ලයිෆ් වෙත එහි විවිධ සේවාදායක පදනමේ අවශ්‍යතා සපුරාලීමට ඉහළම සේවාවන්ගෙන් සහ ඩිජිටල් සවිබලගැන්වීමෙන් සහයවන පුළුල් සැලසුම් සමුදායක් ඇත.

SLIC ලයිෆ් විසින් ISO ප්‍රමිති සමඟ පෙළගැසුනු ගුණාත්මක ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවා ඇති අතර, එය දැඩිව ක්‍රියාත්මක කෙරේ. 2024 වසර සඳහා, SLIC ලයිෆ් වෙත ISO 9001:2015 තත්ත්ව ප්‍රමිතිය මෙන්ම ISO/IEC 27001:2013 ප්‍රමිති සහතික කිරීම ප්‍රදානය කරන ලද අතර එය තොරතුරු ආරක්ෂක කළමනාකරණ පද්ධති (ISMS) සඳහා ප්‍රමුඛ මංසලකුණකි. ඊට අමතරව, තිරසාරභාවය පදනම් කරගෙන ක්‍රියාත්මක වන වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස, SLIC ලයිෆ් වෙත ISO 14064-1:2018 ජාත්‍යන්තර ප්‍රමිතිය සමඟ අනුකූලවීම සඳහා හරිතාගාර වායු සත්‍යාපන විකල්පය ප්‍රදානය කරන ලදී.



## බුද්ධිමය ප්‍රාග්ධනය

මෙම ප්‍රතිපත්තිය මගින් “අප සිදුකරන සෑම දෙයකදීම ගනුදෙනුකරු ප්‍රමුඛය” යන සමාගමේ අරමුණ හුවා දක්වයි. මෙම දර්ශනය සියලූම කණ්ඩායම් විසින් සමාග්‍රහනය කර ගනිමින් ක්‍රියාත්මක කර ඇත. මෙම ප්‍රතිපත්තියෙන් සියලූම නිෂ්පාදන, සේවා සහ ක්‍රියාවලි සඳහා අවම මෙහෙයුම් ප්‍රමිති පැහැදිලි කරන අතර එම ප්‍රතිපත්තිය අපගේ ව්‍යාපාරයේ සෑම ස්ථානයකදීම එනම් ප්‍රධාන කාර්යාලය සහ ශාඛාවල ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ප්‍රමිතිවලින් ජීවිත ප්‍රතිරක්ෂණය, හිමිකම්, පියවීම් සහ අලෙවි කණ්ඩායම් සඳහා මෙහෙයුම් බලකායක් වීමට අමතරව සියලූම සහය සේවා ආවරණය කරයි.

## ICT උපායමාර්ගය හා ප්‍රතිපත්තිය

SLICLL හි ඩිජිටල් නායකත්වය පසුපස ගාමක බලවේගය වීමේ අපගේ අපේක්ෂාව තුළ තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපායමාර්ගය දැඩිව මුල්බැසගෙන ඇත. ආරක්ෂිත, ප්‍රමාණවත් හා බුද්ධිමය තාක්ෂණ පරිසර පද්ධතියක් ගොඩ නැගීම කෙරෙහි අපගේ අවධානය පවතින අතර එම පද්ධතිය වෙළෙඳපොල වෙත කාලය වේගවත්කර, ගනුදෙනුකාර සහභාගිත්වය වැඩිකර, ඩිජිටල් හැකියාවන් ශක්තිමත් කර, මෙහෙයුම් ප්‍රශස්ත කර, සහ ව්‍යවසාය අවදානම් අවම කරනු ඇත. මෙම උපායමාර්ගය අපගේ පරිවර්තනීය ගමන්මඟ හා පෙළ ගැසී ඇති අතර ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය ඩිජිටල් බලගැන්වූ අනාගතයක් කරා මෙහෙයවීමට අප ශක්තිමත් කරයි.

ගනුදෙනුකාර හැසිරීම, හිමිකම් රටා, සහ අවදානම් පැතිකඩ අවබෝධ කර ගැනීම සඳහා දත්ත බුද්ධිය සහ උසස් විශ්ලේෂණ කෙරෙහි අපි දැඩිව අවධානය යොමු කර ඇත. කෘතීම බුද්ධිය/ML සහ පුරෝකථ්‍ය ආදර්ශ භාවිතා කරමින්, පුද්ගලගත රක්ෂණ විසඳුම් සහ සක්‍රීය අවදානම් අවම කිරීම සඳහා අපගේ හැකියාව අපි වැඩිකරමු. වැඩිවන තරඟකාරී සහ වේගයෙන් වෙනස්වන ඩිජිටල් වාතාවරණයක් තුළ කඩිසරකම, ඔරොත්තුදීම හා නව්‍යකරණය සහතික කිරීමට අපි මතුවන තාක්ෂණයක් අඛණ්ඩව තක්සේරු කර ඒකාබද්ධ කරමු.

## අපගේ ප්‍රධාන අවධානිත ක්ෂෙත්‍ර සහ ජයග්‍රහනයන්

**ඩිජිටල් ගනුදෙනුකාර අත්දැකීම:** ජංගම යෙදුම්, වෙබ් අඩවි, සහ සමාජ මාධ්‍ය අවකාශ වැනි ඩිජිටල් සපර්ශක ස්ථාන පහසු, පිවිසියහැකි සහ පුද්ගලගත සේවා ලබාදීමේදී ප්‍රධාන කාර්යභාරයක් අඛණ්ඩව සිදුකරයි. ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ඔප්පු තොරතුරු කරා පහසුවෙන් පැමිණීමට, හිමිකම් ආරම්භ කිරීමට සහ, වඩා ඉහළ තෘප්තියට සහ විශ්වාසයට පෝෂණය කරමින් ඩිජිටල් මාර්ගවලින් තත්ත්වය පරීක්ෂා කර ගැනීමට හැකිය. වඩා පුළුල් පරාශයක නිෂ්පාදන ආවරණය කිරීමට ඩිජිටල් ඇතුළත් කර ගැනීමේ සහ සේවාකරණ හැකියාවන් අපි පුළුල් කර ඇත. එමෙන්ම අපි වේදිකා හරහා ගැටීම් රහිත ගෙවීම් අත්දැකීමක් සහතික කරමින් ප්‍රමුඛ බැංකු හා ඩිජිටල් ගෙවීම් සම්භාරයන් සමඟ ඒකාබද්ධතාව තුළින් අපගේ මාර්ගගත ගෙවීම පුළුල් කර ඇත.

**උරුම පද්ධති නවීකරණය සහ මේඝ යොදා ගැනීම:** උරුම යටිතලපහසුකම් නවීකරණය කිරීමේ අපගේ ගමන්මඟ තුළ, නවීන ප්‍රධාන පද්ධති ශිල්පක්‍රමයක් කරා අපි අදියරමය සංක්‍රාන්තියක් සිදු කරමු. වේදිකා හරහා අන්තර් ක්‍රියාත්මක හැකියාව වැඩි කිරීමට විවෘත APIs සහ ව්‍යවසාර සේවා Bus (ESB) භාවිතයෙන් ඒකාබද්ධ කිරීමේ ස්ථර ගොඩනැගීම හා මෙය සම්බන්ධ වේ. ප්‍රමාණ හැකියාව, කඩිසරකම සහ ව්‍යාපාර අඛණ්ඩතාව වැඩි කිරීමට, ව්‍යාපාර අවශ්‍යතා මත පදනම් රාජ්‍ය, පුද්ගලික හා දෙමුහුන් මේඝ ආදර්ශවල යෝග්‍යතාව ඇගයීමට ලක් කරමින් ප්‍රධාන වැඩතොග මේඝ වේදිකාවන්ට සංක්‍රමණය කිරීම අපි ආරම්භ කලෙමු. බාධාරහිත මෙහෙයුම් සහ පහසු පද්ධති සම්බන්ධතාව සහතික කිරීමට මෙම සංක්‍රාන්තිය තුළ පවත්නා වෙළෙඳ සහය රඳවා ගන්නා ලදී.

**ඩිජිටල් පරිනාමනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව:** අපි ව්‍යූහගත වෙනස කළමනාකරණය, ස්වයංක්‍රියකරණය යොදා ගැනීම සහ ක්‍රියාවලි ප්‍රශස්තකරණය තුළින් අපගේ ඩිජිටල් පරිනාමන වැඩසටහන අපි වේගවත් කළෙමු. උපායමාර්ගික තාක්ෂණික හවුල්කරුවන්, රක්ෂණ ශිල්පීන්, සහ පාලන තන්ත්‍ර ප්‍රවීනයින් සමඟ සහයෝගීවීම ඩිජිටල්කරණය තුළ මනා පරිචයක් ඉහළ නැංවීමට අපව ශක්තිමත් කර ඇත. අනුමැතින් සඳහා වැඩප්‍රවාහ, RPA ස්වයංක්‍රිය නැවත නැවත කරන කාර්යයන්, සහ ව්‍යවසාය ඩිජිටල් අත්සන් මෙවලම් වැනි ව්‍යවසාය ශ්‍රේණියේ විසඳුම් හඳුන්වාදීම සැලකියයුතු සන්ධිස්ථාන සලකුණු කර ඇති අතර ඉහළ මෙහෙයුම් අඛණ්ඩතාවයට සහ මැනියහැකි කාර්යක්ෂම ඉපයීම්වලට දායක විය.

**දත්ත විශ්ලේෂණ, තොරතුරු ආරක්ෂාව, පාලනය සහ අනුකූලතාව:** සම්ප්‍රදායික හා විචක්ෂණ තීරණ ගැනීමේ සංස්කෘතිය දත්ත පදනම් සංස්කෘතියකට පරිනාමනය කිරීමට අපි උත්සාහ කරමින් සිටින බැවින්, දත්ත දෘශ්‍යකරණය හා දත්ත ගබඩාකරණ පිළිබඳ නවතම තාක්ෂණය සමඟ අපගේ දත්ත විශ්ලේෂණ ප්‍රශස්ත කිරීම අපි අපේක්ෂා කරන්නෙමු. දත්ත සාක්ෂරතාව කෙරෙහි අපගේ මානව ප්‍රාග්ධනය අපි ශක්තිමත් කරමින් තබා ගන්නා බැවින්, පුරෝකථ්‍ය විශ්ලේෂණ භාවිතය ශක්තිමත් කරමින් යන්ත්‍ර ඉගෙනුම් මුලපිරීම් සමඟ දත්ත භාවිතය ප්‍රශස්ථ කිරීමට අපි අපේක්ෂා කරමු.

මෙවැනි සියලුම මුලපිරීම් සමඟ, කළමනාකරණය හා උපායමාර්ගික තීරණවලට වටිනාකම එකතු කිරීමට අපි අපේක්ෂා කරන අතර එය අපගේ ව්‍යාපාරය හා සන්නාමය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

සංවේදී තොරතුරු ආරක්ෂා කිරීම සහ ගනුදෙනුකාර විශ්වාසය පවත්වා ගැනීම සඳහා අපගේ නොනවතින කැපවීමේ කොටසක් ලෙස, ආරක්ෂක මෙහෙයම්, දත්ත පාලනය, සහ මේඝ වේදිකා අඛණ්ඩතාව යන ප්‍රධාන ක්ෂෙත්‍ර තුන හරහා අපගේ හැකියාවන් අපි ශක්තිමත් කළෙමු.

ආරක්ෂක මෙහෙයුම් ක්ෂෙත්‍රය තුළ, සෑම වේලාවකම විභව අවදානම් සොයාගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීමට අපට ඇති හැකියාව අපි වැඩි කළෙමු. බලයලත් පුද්ගලයින්ට පමණක් තිරණාත්මක පද්ධතිවලට පිවිසිය හැකි බව සහතික කිරීමට වඩා ශක්තිමත් පාලනයන් දැනට ක්‍රියාවට නංවා ඇති අතර අපගේ පරිසරය නියාමනය කර සුරක්ෂිත කිරීමට අඛණ්ඩ ක්‍රියාවලි අපි ක්‍රියාත්මක කර ඇත. මෙවැනි උත්සාහයන් මතුවන තර්ජනවලට පහසුවෙන් ප්‍රතිචාර දැක්වීමට හා මෙහෙයුම් ස්ථාවරත්වය පවත්වා ගැනීමට අපව ශක්තිමත් කරයි.

අපගේ දත්ත පාලනය අනුකූලතා උත්සාහයන් පුළුල් කරනු ලැබ ඇත. වර්ධනීය නියාමන අවශ්‍යතා සහ දත්තවල රහස්‍යතාව පිළිබඳ වැඩිකළ මහජන දැනුවත්කම සමඟ, අපගේ අභ්‍යන්තර ව්‍යවහාර සහ වගවීමේ ක්‍රියාමාර්ග අපි සවිබල ගන්වා ඇත. අප පුද්ගලික සහ ව්‍යාපාරික දත්ත මෙහෙයවන සහ ආරක්ෂා කරන ආකාරය පිළිබඳ ඉහළම ප්‍රමිති අපි විසින් සපුරාලන බව විශේෂිත කණ්ඩායමක් විසින් සහතික කරනු ලබයි. ගෝලීය වශයෙන් පිළිගත් ආරක්ෂාව සහතික කිරීමක් අපි මෑතදී සාක්ෂාත් කර ගැනීම මගින් මෙවැනි ක්‍රියාමාර්ගවල ඵලදායිත්වය පිළිබිඹු කරයි.

ඒ සමඟම, අපගේ මේඝ පදනම් වේදිකාවල ආරක්ෂාව සහ ඔරොත්තුදීම සඳහා ප්‍රධාන වර්ධනයන් අපි සිදුකර ඇත. අපගේ මාර්ගගත වේදිකාවල ආරක්ෂාව සවිබලගැන්වීම, සහ පරිශ්‍ර හා මේඝ පරිසරයන් තුළ අනුරූපතාව සහතික කිරීම මෙයට ඇතුළත්ය. අපගේ සේවා මතුවන ඩිජිටල් වාතාවරණයන්ට විශ්වාසී, ආරක්ෂිත හා ප්‍රතිචාරාත්මකව පවතින බව සහතික කිරීමට මෙය උපකාරී වේ.

# මානව ප්‍රාග්ධනය

## SLICLL හි මානව ප්‍රාග්ධනය එහි ඉහළම වත්කම වන අතර, ආයතනයේ කාර්යසාධනයේ ප්‍රධාන ධාවකයා ද වේ. අපගේ සේවකයින්ගේ කැපවීම සහ බැඳීම තුළින්, අපගේ නිෂ්පාදන දිවයිනේ සෑම කොටසකම ලඟාවී ඇත.

SLICLL හි මානව ප්‍රාග්ධනය සමාගමේ ඉහළම වත්කම වන අතර, ආයතනයේ කාර්යසාධනයේ ප්‍රධාන ධාවකයා වේ. අපගේ හැකියාවැති සහ වෘත්තීමය කණ්ඩායම ඉහළ තරඟකාරී සේවා කර්මාන්තයට අපගේ සමාන තරඟකරුවන්ට ඉහළින් සිටීමට අපට හැකියාව ලබා දී ඇත. අපගේ සේවකයින්ගේ කැපවීම හා බැඳිම තුළින්, අප පිරිනමන නිෂ්පාදන දිවයිනේ සෑම කොටසකටම ලඟා වී ඇත.

### ප්‍රධාන සංඛ්‍යාලේඛන වැදගත් සිදුවීම් 2024

පුහුණු වැඩසටහන් **69**

### SDGs වෙත දායකත්වය

**3 GOOD HEALTH AND WELL-BEING**
සේවක හෞතික යහපැවැත්ම, විශේෂ සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රතිපත්තිය

**4 QUALITY EDUCATION**
පවත්වන ලද සේවක පුහුණු වැඩසටහන්

**5 GENDER EQUALITY**
ස්ත්‍රීපුරුෂ තුළනය පවත්වා ගැනීම – 55% සිට 45%

**8 DECENT WORK AND ECONOMIC GROWTH**
විවිධත්වය සහ ඇතුළත් වර්ධනය

**10 REDUCED INEQUALITIES**
සේවක වයස් විවිධත්වය පවත්වා ගැනීම

ශ්‍රම බලකාය තුළ ශක්තිමත් නියෝජනය පවත්වා ගැනීම

බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ විනිවිදභාවය සහ අපක්ෂපාතීත්වය



# මානව ප්‍රාග්ධනය

## කාර්ය මණ්ඩල විශ්ලේෂණය

| | 2024 |
|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලය | 877 |
| කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය | 37 |
| **එකතුව** | 914 |

## වයස් විශ්ලේෂණය

| වයස් සීමාවන් | පිරිමි | කාන්තා | එකතුව | % |
|---|---|---|---|---|
| 18-24 | 7 | 14 | 21 | 2 |
| 25-29 | 28 | 39 | 67 | 7 |
| 30-34 | 45 | 88 | 133 | 15 |
| 35-39 | 72 | 79 | 151 | 17 |
| 40-44 | 70 | 39 | 109 | 12 |
| 45-49 | 59 | 36 | 95 | 10 |
| 50-54 | 105 | 111 | 216 | 24 |
| 55 සහ ඉහළ | 43 | 79 | 122 | 13 |
| **එකතුව** | 429 | 485 | 914 | |

## සේවා විශ්ලේෂණය

| SLIC හි සේවය කළ වසර ගණන | පිරිමි | කාන්තා | එකතුව | % |
|---|---|---|---|---|
| 0-5 | 109 | 68 | 177 | 19.37 |
| 6-10 | 63 | 83 | 146 | 15.97 |
| 11-15 | 87 | 90 | 177 | 19.37 |
| 16-20 | 81 | 36 | 117 | 12.80 |
| 21 සහ ඉහළ | 89 | 208 | 297 | 32.49 |
| **එකතුව** | 429 | 485 | 914 | |

# මානව ප්‍රාග්ධනය

## ශ්‍රේණිය සහ ස්ත්‍රීපුරුෂභාවය අනුව සේවා නියුක්තිය

| | ගණන | | | සංයුතිය % | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය | පිරිමි | කාන්තා | එකතුව | පිරිමි | කාන්තා |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ | 32 | 10 | 42 | 7 | 2 |
| කළමනාකරණ | 131 | 33 | 164 | 31 | 7 |
| සහය කළමනාකරු | 26 | 20 | 46 | 6 | 4 |
| විධායක | 74 | 214 | 288 | 17 | 44 |
| ලිපිකාර | 105 | 203 | 308 | 24 | 42 |
| තාක්ෂණික | 1 | | 1 | – | – |
| ලිපිකාර නොවන | 38 | 1 | 39 | 9 | – |
| සුළු සේවක | 22 | 4 | 26 | 5 | 1 |
| එකතුව | 429 | 485 | 914 | 47 | 53 |

### මානව සම්පත්වල මනා පරිචයන්

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූලික මූලධර්ම පිළිබඳ ප්‍රකාශය සහ එක්සත් ජාතීන්ගේ ගෝලීය සංක්ෂිප්තයට අනුකූලව සාධාරණ සේවා නියුක්ති ව්‍යවහාර SLICLL ක්‍රියාත්මක කරයි. මෙම සම්මුති දෙකම මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මත පදනම් වේ. ඉහත මූලධර්ම අනුගමනය කරමින්, අපගේ සේවකයින් වෙනුවෙන් උපකාරී සේවා පරිසරයක් අපි නිර්මාණය කරන අතර එහිදී ඔවුන් අභිප්‍රේරණය කර උපකාර කරනු ලබයි.

ඉහත කරුණු මත පදනම්ව, අපගේ මානව සම්පත් ප්‍රතිපත්ති හා ව්‍යවහාර පහත මූලධර්ම මගින් මෙහෙයවනු ලබයි.

#### ප්‍රතිපත්තිය

- වෙනස් ලෙස නොසැලකීම සහ සමාන රැකියා අවස්ථාව
- විවිධත්වය සහ ඇතුළත් වීම
- සේවකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව ප්‍රමුඛ කිරීම
- සදාචාරය සහ අවංකකම පවත්වා ගැනීම
- සේවක දුක්ගැනවිලි මෙහෙයවීම පිළිබඳ පැහැදිලි ක්‍රියාපටිපාටියක්
- බඳවාගැනීමේ උපායමාර්ගය
- රඳවාගැනීමේ උපායමාර්ගය

#### ක්‍රියාත්මක කිරීම

- අපි බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා, සේවක ජීවන චක්‍රයේ සෑම අදියරකදීම වෙනස්ව නොසැලකීමේ ආකල්පයක් පවත්වා ගන්නා අතර සමාන අවස්ථාව දිරිගන්වමු.
- SLICLL විවිධ හා ඇතුළත් සේවා ස්ථානයක් නිර්මාණය කිරීම අරමුණු කරන අතර එහි සියලුම සේවකයින්ට ජාතිය, සමාජ පසුබිම, ස්ත්‍රීපුරුෂභාවය ආගම, හෝ වෙනත් යම් නීතිමය ලෙස ආරක්ෂිත තත්ත්වයන් නොසලකා සාධාරණව හා සමානව සලකනු ලැබේ.
- අපි විවිධ ආබාධිත පුද්ගලයින් සඳහා හැකි සෑම අවස්ථාවකදීම වෘත්තීය අවස්ථාවන් ලබාදීමට උත්සාහ කරමු.
- SLICLL ට ළමා ශ්‍රමය, බලාත්කාර ශ්‍රමය හෝ අනිවාර්ය ශ්‍රමයට එරෙහිව දැඩි ප්‍රතිපත්තියක් ඇති අතර, වගකිම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස සමාගම මෙම ශ්‍රමය සේවයේ යෙදවීම සිදු නොකරයි.
- අපගේ ක්ෂේත්‍රයේ ස්වභාවය සලකා බලමින්, සේවකයින් ප්‍රධාන සෞඛ්‍ය හා ආරක්ෂක අවදානම්වලට නිරාවරණයවීම සිදු නොකරයි. එසේ වුවත්, අපගේ සේවකයින් ආරක්ෂිත හා සුරක්ෂිත පරිසරයක වැඩකරන බව සහතික කිරීමට අපි වග බලා ගනිමු.
- බොහෝ අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් අවදානම් තක්සේරු කිරීම් සිදු කෙරේ.
- SLICLL හි අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සෞඛ්‍ය සහ ආරක්ෂක අවදානම් පිළිබඳ නිරන්තරව තක්සේරු කිරීම් සිදුකරන අතර වැලැක්වීමේ සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය පරිදි ගනු ලැබේ. මානව සම්පත් දෙපාර්තමේන්තුව, වෙනත් දෙපාර්තමේන්තුවල සහ අදාළ බලධාරීන්ගේ සහය ඇතිව සේවකයින් අතර සෞඛ්‍ය සහ ආරක්ෂක දැනුවත්කම වැඩි කිරීමට අවශ්‍ය පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ලබා දේ.
- පුළුල් සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රතිපත්තියක් අපි ක්‍රියාවට නංවා ඇති අතර එය සේවා ස්ථාන සෞඛ්‍ය සහ ආරක්ෂාව පරිපාලනය සඳහා විධිමත් රාමුවක් ලබා දේ.
- අපගේ සේවකයින් ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේදී ඉහළම සදාචාර හා වෘත්තීමය ප්‍රමිති පිළිපැදිය යුතුබව අපි අපේක්ෂා කරමු. සියලුම අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කිරීමේදී ඔවුන් මේවාට අනුකූලවීම අපි අපේක්ෂා කරමු.
- අපි අචාරධර්ම සංග්‍රහයක් ක්‍රියාවට නංවා ඇති අතර සියලුම සේවකයින් ඒ පිළිබඳ දැනුවත්ව අවබෝධ කර ගත යුතුය. යම් කඩවීමක් ඇත්නම්, වරදේ බරපතලකම අනුව විනයානුකූල ක්‍රියාමාර්ග අදාළ සේවකයාට විරුද්ධව ගනු ලැබේ.
- සියලුම සේවකයින්ගෙන් ව්‍යතිරේක නොමැතිව ඔවුන්ගේ පත්වීම් ලිපියේ නියමයන් හා කොන්දේසිවලට අනුකූලවීම අපේක්ෂා කෙරේ.
- SLICLL සේවක දුක්ගැනවිලි සමඟ කටයුතු කිරීමට පැහැදිලි ක්‍රියාපටියක් ක්‍රියාවට නංවා ඇති අතර, හැකිතාක් දුරට මූලාශ්‍රයට ආසන්නව ඒවා විසඳීම, කල්පවත්නා ආරවුල් හෝ අර්බුදකාරී තත්ත්වයන් වළක්වා ගැනීම, චිත්ත ධෛර්යය, තෘප්තිය සහ කැපවීම වැඩි කිරීම සහ වඩා යහපත් අවබෝධයක් තුළින් සුහද සේවායෝජක-සේවක සබඳතා සහතික කිරීම මෙයින් අරමුණු කරයි.
- විස්තීර්ණ දුක්ගැනවිලි කළමනාකරණ යාන්ත්‍රණයක ක්‍රියාවට නංවා ඇති අතර ඒ තුළින් යම් SLICLL සේවකයෙකුට කිසිදු බියක් හෝ පලිගැනීමක් නොමැතිව සේවයට අදාළ පැමිණිලි සිදු කළ හැකිය.
- මෙම ප්‍රතිපත්තියට දුක්ගැනවිල්ලක් ගොනු කරන ආකාරය, මෙන්ම සේවකයෙක්ට සෘජුව හෝ වක්‍රව අධෛර්යට පත්කරන දුක්ගැනවිලි පිළිබඳ තොරතුරු ඇතුළත්ය.
- නිල දුක්ගැනවිලිවලට අමතරව, දුක්ගැනවිලිවලට පුද්ගලික ඒවාද ඇතුළත් කළ හැකිය.
- මෙම ප්‍රතිපත්තියෙන් දුක්ගැනවිලි නිරාකරණ පද්ධතියේ බොහෝ පියවර විස්තර කරන අතර එයට දුක්ගැනවිලි නිරාකරණ කමිටුවේ කාර්යයන්, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් අනු කමිටුවේ කාර්යභාරය, මෙන්ම දුක්ගැනවිලි විසඳීමේ කාලසීමාවන් ද ඇතුළත් වේ. තනි පුද්ගල හෝ කණ්ඩායම් ගැටළු සම්බන්ධයෙන් එය කටයුතු කිරීමේදී, අපි මෙම සම්මත ක්‍රියාපටිපාටිය අනුගමනය කරමු.
- බඳවාගන්නා සියලුම සේවකයින්ට අවශ්‍ය දැනුම, කුසලතා, පළපුරුද්ද, යෝග්‍යතා සහ ආකල්ප ඇති බව සහතික කිරීමට බඳවාගැනීමේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රමවත් කර ඇත.

# මානව ප්‍රාග්ධනය

- බඳවා ගැනීමේදී, පළමු වරණය අභ්‍යන්තර අයදුම්කරුවන්ට ලබා දේ. සුදුසු අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පමණක් සුදුසු-බාහිර අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.
- අලුතින් බඳවාගන්නා සියලුම අයට ඔහු සමාගම සඳහා මනාව යෝග්‍යබව පරීක්ෂා කිරීමට තෝරාගැනීමේ මට්ටම් කිහිපයක් පසුකළ යුතුව ඇත.
- SLICLL හි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවලට විෂය කරුණු පිළිබඳ ප්‍රවීනයින් හා ජ්‍යෙෂ්ඨ නායකත්ව කණ්ඩායමේ සාමාජිකයින් ඇතුළත් වේ. කෙසේවෙතත්, මණ්ඩලයේ සංයුතිය තනතුරු හා අවශ්‍යතාව මත රඳෙමින් වෙනස් වේ.
- බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ විනිවිදභාවය හා අපක්ෂපාතිත්වය පවත්වා ගැනීමට, සියලුම සම්මුඛ පරීක්ෂණවලදී මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අපගේ නියෝජිතයෙක් සිටීම අපගේ බඳවා ගැනීමේ ප්‍රතිපත්තියෙන් අවශ්‍ය කර ඇත. ඊට අමතරව, සියලුම මණ්ඩල ඇගයීම් පූර්ව නිශ්චිත ප්‍රමිති අනුගමනය කරයි.
- අලුතින් බඳවාගන්නා සියලුම අය සමාගම සමඟ හුරුවීමට හා SLICLL සංස්කෘතියට වඩා හොඳින් ඒකාබද්ධවීමට මූලික හා ප්‍රාරම්භක පුහුණුවක නියුක්ත වීම අනිවාර්යය.
- ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂෙත්‍රය වඩාත් තරඟකාරී වන බැවින්, SLICLL හි තරඟකාරිත්වය සහ සන්නාම පිළිගැනීම රඳවා ගැනීමට දක්ෂ පුද්ගලයින් රඳවා තබා ගැනීම තීරණාත්මක බවට පත්ව ඇත.
- දක්ෂ පිරිස් රඳවා තබා ගැනීම සඳහා අපගේ උපායමාර්ගය ක්‍රමානුකූල අනුප්‍රාප්තික සැලැස්මක් මත පදනම් වන අතර ඒ තුළින් හඳුනාගත් පුද්ගලයින් සමාගමේ අනාගත නායකයින් ලෙස සංවර්ධනය කිරීම අරමුණු කරමු.
- අපගේ කාර්යසාධන ඇගයීමේ ක්‍රමයේ ප්‍රතිඵල මත පදනම් වී "SLICLL හැකියා සංචිතය" තුළ ඇතුළත් කිරීම සඳහා විශිෂ්ඨ කාර්යසාධකයින් තෝරා ගනු ලබයි.
- SLICLL "හැකියා සංචිතයේ" අරමුණ වන්නේ සමාගම තුළ පළුල් අනුප්‍රාප්තික සැලැස්මක් නිර්මාණය කිරීම වන අතර ඒ මගින් විශේෂයෙන් ප්‍රධාන තනතුරුවල ඇතිවිය හැකි ඇබෑර්තු පිරවීමට සෑමවිටම සුදුසු පුද්ගලයින් සූදානම් කරන බවට සහතික කරයි.
- SLICLL "හැකියා සංචිතයේ" අපේක්ෂකයින්ට ඔවුන්ගේ මෘදු හා තාක්ෂණික නිපුනතා ශක්තිමත් කර ගැනීමට සහ සිය නායකත්ව හා කළමනාකරණ නිපුනතා වැඩි කර ගැනීමට අපගේ උපදේශන වැඩසටහන්වලින් ප්‍රතිලාභ ලබා ගැනීමට විවිධ සංවර්ධන වැඩසටහන්වලට සහභාගි විය හැකිය.

## සේවක තෘප්තිය වැඩි කිරීම ප්‍රතිලාභ

### සාධාරණ පාරිතෝෂිකයන්

දක්ෂ සේවකයින් රඳවා ගැනීමට, වෙළෙඳපොල හා බැඳුණු පාරිතෝෂිකය හා වෙනත් ප්‍රතිලාභ අපි ලබාදිය යුතුය. අපගේ සේවකයින්ට අදාළ වන සියලුම ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතා අපි පිළිපදිමු.

### ප්‍රතිලාභ යෝජනා ක්‍රම

තවද, අපි අපගේ සියලුම සේවකයින්ට පහත වරප්‍රසාද භුක්ති විඳීමට අපි ඉඩදෙන අතර "සතුටු සේවකයින් ගුණාත්මක නිෂ්පාදන හා සේවා ලබාදේ" යන මූලධර්මය මත පදනම් වී ඔවුන්ගේ ජීවිතවල තත්ත්වය වර්ධනය කරයි.

### වැඩ කිරීමේදී ප්‍රතිලාභ

**පවුල් නිවාඩුව:** සිය සේවකයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ව සහතික කිරීමේ නෛතික අවශ්‍යතාවන්ට අනුව සහ ඉක්මවා යමින් SLICLL සියලුම කම්කරු නීති දැඩිව අනුගමනය කරයි. මේ සම්බන්ධයෙන්, අපගේ සියලුම කාන්තා සේවිකාවන් මාතෘ ප්‍රතිලාභ ආඥාපනත යටතේ ප්‍රසූත නිවාඩුවලට හිමිකම් කියයි. මාතෘ ප්‍රතිලාභ ආඥාපනත යටතේ දක්වා ඇති විධිවිධානවලට අමතරව, SLICLL ගෙවීමක් නොමැති අමතර මාස දෙකක් දක්වා නිවාඩු ලබා ගැනීමේ විකල්පය සේවකයින්ට ප්‍රදානය කරයි. පීතෘ නිවාඩු සඳහා ඉල්ලීම් සම්බන්ධව හිතකර සලකා බැලීමක් සිදු කරයි.

**නම්‍යශීලී වැඩ පිළිවෙළ:** සමාගම පුද්ගලික අවශ්‍යතා සලකා බලමින් දුරස්ථ වැඩ පහසුකම් සහ නම්‍යශීලී විකල්ප වැඩකරන වේලාවන් ලබා දේ.

**ආහාර පාන:** අපගේ සේවක ආපන ශාලාව අඩු මිලගණන්වලට පුළුල් පරාශයක ආහාර පාන සපයයි

**සුභසාධනය:** අපි වෙනත් සුභසාධන කටයුතු සපයමින් විවිධ අඩුපිරිවැය යටතේ භාණ්ඩ අලෙවිකරණ සුභසාධන අලෙවිහලක් පවත්වාගෙන යන්නෙමු.

### සෞඛ්‍ය ප්‍රතිලාභ

**සුවතාව:** අපගේ සෞඛ්‍ය පහසුකම්වලට සුදුසුකම්ලත් උපදේශකයෙක් සහිත අංග සම්පූර්ණ ව්‍යායාම ශාලාවක් ඇතුළත් වන අතර ඔහු සිය කායික යෝග්‍යතාව පවත්වා ගැනීමට සේවකයින්ට සහය වේ.

සිය මානසික හා ආධ්‍යාත්මික යහපැවැත්ම පවත්වා ගැනීමට කැමති සේවකයින්ට සහයවීමට සතියේ දිනවල යෝග පන්තිය පවත්වනු ලැබේ.

**සෞඛ්‍යාරක්ෂාව:** සෞඛ්‍ය හා සුවතා වැඩසටහන්වලින් සෞඛ්‍ය කරුණු පිළිබඳව සේවකයින් දැනුවත් කරන අතර උපකාරී සේවා පරිසරයක් නිර්මාණය කරයි.

### මූල්‍ය ආරක්ෂාව සඳහා ප්‍රතිලාභ

**වෛද්‍ය ආවරණය:** SLICLL සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා සමාගමේ වෛද්‍ය රක්ෂණ ආවරණය

**අධ්‍යාපන දිරිදීමනා:** මානව සම්පත් ප්‍රතිපත්තිවලට අනුකූලව විභාග ගාස්තු ප්‍රතිපූරණය කෙරේ.

### ජීවන රටා ප්‍රතිලාභ

**වැඩ - ජීවිත සමබරතාව:** අපගේ සේවකයින්ට ප්‍රබන්ධ හා ප්‍රබන්ධ නොවන කථා පොත් 1,800ක් සහිත පුස්තකාලයක් භාවිතා කළ හැකිය.

ප්‍රබන්ධ නොවන ක්ෂෙත්‍රයට රක්ෂණය, කළමනාකරණය, මූල්‍ය, අලෙවිකරණය හා විකුණුම් සම්බන්ධ පොත් ඇත.

අපගේ කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් නිවාඩු හිමිකම් ඇති අතර වාර්ෂික සුභදහමු සංවිධානය කරනු ලබයි.

**සංචාර සහ නවාතැන්:** සෑම සේවකයෙක්ටම නුවරඑළිය, අනුරාධපුරය සහ කතරගම නිවාඩු නිකේතන තුනක් භාවිතයට අවස්ථාව ඇති අතර මෙම නිවාස නවීන පහසුකම්වලින් සමන්විත වන අතර මනාව පුහුණු කාර්ය මණ්ඩලයකින් යුක්තය.

සමාගම සේවකයින්ගේ ළමුන්ට අධ්‍යාපනික සහය ලබාදෙන අතර එයට 5 වසර ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත්වන සිසුන් සඳහා සම්මන්ත්‍රණ ඇතුළත්ය.

සේවකයින් සහ ඔවුන්ගේ පවුල් වෙත මරණ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි. "පියෙකු මෙන් මවකු මෙන්" වීමේ SLICLL හි ගිවිසුමේ කොටසක් ලෙස, අවශ්‍යතාව පරිදි සේවකයින් සහ ඔවුන්ගේ පවුල් වෙත අපි චිත්තවේගී සහ මානසික සහය ලබා දෙමු.

## සේවා ස්ථාන ඵලදායිතාව වැඩි කිරීමට වෘත්තීය සංවර්ධනය

අපගේ පුහුණු හා සංවර්ධන උපායමාර්ගය SLICLL හි වර්ධනයට සහයවන ආකාරයෙන් සේවක නිපුනතා සහ හැකියාවන් වර්ධනය කිරීමට ක්‍රියාත්මක වේ. කාර්යසාධන ඇගයීම් ක්‍රමය මගින් හඳුනාගත් පුහුණු අවශ්‍යතා ප්‍රශස්ත කිරීමට, අපි මනාව ව්‍යූහගත පුහුණු හා සංවර්ධන රාමුවක් ක්‍රියාත්මක කර ඇත. අවශ්‍ය නිපුනතා සහ හැකියාවන් සංවර්ධනය අනුව පුහුණු ආයෝජනය ලබා දෙන බව සහතික කිරීමට අපි නිරන්තරව සහභාගිත්වය හා ප්‍රගතිය තක්සේරු කරමු.

# මානව ප්‍රාග්ධනය

## පුහුණු හා සංවර්ධන තුළ ආයෝජනය

| වර්ගය | 2024 (රු.) |
|---|---|
| අභ්‍යන්තර පුහුණුව | 12,283,346.63 |
| බාහිර පුහුණුව | 3,935,704.93 |
| සම්මන්ත්‍රණ | 339,500.00 |
| විදේශීය පුහුණුව | 4,402,331.00 |
| රක්ෂණය සහ වෘත්තීය අධ්‍යාපනය | 9,610,707.77 |
| වෘත්තීය සාමාජිකත්ව | 2,861,036.67 |

*ඉහත සඳහන් සියලුම සංඛ්‍යා වාර්ෂික කාර්යසාධනයේ සම්පූර්ණත්වය සහතික කරමින් ජීවිත ව්‍යාපාරය සඳහා මාස 12 සම්පූර්ණ කාලසීමාවට අනුරූප වේ*

අපගේ අනුප්‍රාප්තික සැලැස්ම සහ හැකියා සංචිත කළමනාකරණ සැලැස්මේ කොටසක් ලෙස, සෑම දෙපාර්තමේන්තුවකින්ම විභව නායකයින්ගේ නායකත්ව කුසලතා වර්ධනය කිරීම සඳහා විශේෂ පුහුණු මොඩියුලයක් වර්තමානයේ අප සතුව ඇත. මෙය සංවිධානයේ උපායමාර්ගික ව්‍යාපාරික අරමුණු සඳහා දායක වන තවත් ව්‍යාපෘතියකි.

තමන්ට අදාළ වැඩ ක්ෂේත්‍රයට වටිනාකම එකතුකළ හැකි ආකාරයකින් වැඩිදුර අධ්‍යාපනික සුදුසුකම් ලබා ගැනීමට කැමැත්තක් දක්වන සේවකයින් සඳහා මූල්‍ය සහය ලබා දීමට වෘත්තිය සංවර්ධන ප්‍රතිපූරණ යෝජනා ක්‍රමයක් අපි හඳුන්වා දී ඇත. නිරන්තර පදනමක් මත සිය නිපුනතා උසස් කර ගැනීමට මින් ඔවුන්ට අවස්ථාව සලසන අතර සමාගමට ප්‍රතිලාභ ලබයි. SLICLL අඛණ්ඩ වෘත්තීය වර්ධනය දිරිමත් කිරීමට වෘත්තිය ආයතනවල සාමාජික වියදම් ප්‍රතිපූරණය කරයි.

## විභාග වියදම් ප්‍රතිපූරණය

| | 2024 |
|---|---|
| සේවකයින් මත මුළු ආයෝජනය | 1,316,046.59 |

## පුහුණු වැඩසටහන්

| | 2024 |
|---|---|
| වැඩසටහන් ගණන | 69 |

## ප්‍රාරම්භක වැඩසටහන්

| | 2024 |
|---|---|
| වැඩසටහන් ගණන | 2 |

## පිළිගැනීම් සහ ප්‍රදාන

ඉහළ තරඟකාරී ක්ෂේත්‍රයක සමාගමක් ලෙස, අපි කාර්යසාධනය මත පදනම් වීම අවශ්‍ය වන අතර අපගේ ඇගයීම් හා ප්‍රදාන ක්‍රමය ඒ අනුව පෙළ ගැස්වීම අවශ්‍යය. සාර්ථක කාර්යසාධන ඇගයීම් ක්‍රමයක් ආයතනික උපායමාර්ගික පරමාර්ථ මෙන්ම සේවක සංවර්ධනය ප්‍රවර්ධනය යන අරමුණු දෙකම සාක්ෂාත් කර ගැනීම සඳහා පදනමක් ලබා දෙන බව අපි විශ්වාස කරමු. "විශිෂ්ඨත්වය සඳහා උත්සාහ ගැනීම" යන දර්ශනය මත ගොඩ නැංවෙන SLICLL හි කාර්යසාධන ඇගයීම් ක්‍රමය මගින් අපගේ සේවකයින්ගේ කාර්යසාධනය සාධාරණ, විනිවිද සහ විශ්වාසී ආකාරයෙන් ඇගයීමට ලක් කරයි. සියලුම ස්ථිර සේවකයින් අර්ධ-වාර්ෂික ස්වයං ඇගයීමක් සම්පූර්ණ කිරීම අවශ්‍ය වන අතර, එහිදී මෙම ක්‍රියාවලිය අනුව මූල්‍ය වසර ආරම්භයේදී කලින් එකඟ වූ මූලික කාර්යසාධන දර්ශක අනුව තමාගේ කාර්යසාධනය ශ්‍රේණිගත කෙරේ.

මෙයට පසුව කාර්යසාධන ඇගයම් රැස්වීමක් පවත්වන අතර එහිදි සේවකයින්ට සිය රේඛීය කළමනාකරු සමඟ සිය කාර්යසාධනය, පුහුණු අවස්ථා, සහ දිගුකාලින වෘත්තීය අරමුණු පිළිබඳ සාකච්ඡා කළ හැකි වේ. 2ට අඩු ශ්‍රේණිගත කිරීමක් සහිත සේවකයින් වෙත ඔවුන්ගේ අධීක්ෂකයින සමඟ සහයෝගිත්වයෙන් මානව සම්පත් විසින් ස්ථාපිත ගලපන ලද පුද්ගල සංවර්ධනය තුළින් යම් බාධා ජයගැනීමට සහය ලබා දේ.

කාර්යසාධන ඇගයීම් ක්‍රමය අපගේ HRIS සමඟ සම්පූර්ණයෙන් සම්බන්ධ කරයි. ඉන් වසර පුරාම සේවකයින්ට සිය ප්‍රගතිය පරීක්ෂා කර ගැනීමට සහ රේඛිය කළමනාකරුවන්ට සිය කණ්ඩායමේ කාර්යසාධනය ඇගයිමට ඉඩ ලබා දෙන අතර සේවකයින් සහ රේඛීය කළමනාකරුවන් විශිෂ්ඨත්වය සඳහා හවුලේ උත්සාහ කිරීමට දිරි ගන්වයි.

**කැපී පෙනෙන සේවක සම්මානඃ** ප්‍රධාන කාර්යාලය හා ශාඛා නියෝජනය කරන විකුණුම් වර්ග හැර සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් සම්මාන යෝජනා ක්‍රමය සඳහා සැලකිල්ලට ගනු ලැබේ. මෙහි අරමුණ වන්නේ සමාගමේ වටිනාකම් දාමය තුළ සේවක දායකත්වයන් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ කැපවීම සඳහා ඔවුන් විධිමත්ව පිළිගෙන ප්‍රදාන ලබා දෙන බව සහතික කිරීමයි. මෙය නව්‍යකරණ සංස්කෘතියක්

# මානව ප්‍රාග්ධනය

සහ ශක්තිමත් අභිප්‍රේරකයෙක් පෝෂණය කරන අතර සමාගමෙ වටිනාකම දාමය වෙත සිය දායකත්වයන් තවදුරටත් වැඩි කරයි. මෙම කැපී පෙනෙන සේවක සම්මාන යෝජනා ක්‍රමය තුළින් සේවකයින් සිය දායකත්වයන් වෙනුවෙන් ඔවුන් ත්‍යාග ලබාදී පිළිගැනීමට ලක් කිරීම පමණක් නොව ඔවුන් ආයතනය තුළ නව්‍යකරණ සංස්කෘතියක් සහ තිරසාර වර්ධනය සඳහා අවස්ථාව අවබෝධ කර ගන්නා බැවින් ඔවුන් අභිප්‍රේරණය කරනු ලැබිමක් ද සිදු වේ.

## වෙනත් වැදගත් සංඛ්‍යාලේඛණ

### ප්‍රාදේශිකය අනුව සේවකයින්

| ප්‍රාදේශිකය | ගණන |
|---|---|
| මධ්‍යම | 49 |
| නැගෙනහිර | 12 |
| උතුරු මැද | 27 |
| උතුරු | 27 |
| රත්නපුර | 32 |
| දකුණු 1 | 50 |
| දකුණු 2 | 42 |
| බස්නාහිර ඉහළ | 37 |
| ඌව | 35 |
| වයඹ 1 | 41 |
| වයඹ 2 | 30 |
| බස්නාහිර 1 | 23 |
| බස්නාහිර 2 | 14 |
| බස්නාහිර 3 | 21 |
| බස්නාහිර 4 | 14 |
| ප්‍රධාන කාර්යාලය | 460 |

### සේවක බඳවාගැනීම

| වයස් කාණ්ඩය | පිරිමි | කාන්තා | එකතුව | % |
|---|---|---|---|---|
| 18-24 | 9 | 26 | 35 | 27 |
| 25-29 | 24 | 21 | 45 | 35 |
| 30-34 | 5 | 5 | 10 | 8 |
| 35-39 | 13 | 5 | 18 | 14 |
| 40-44 | 5 | 3 | 8 | 6 |
| 45-49 | 4 | 4 | 8 | 6 |
| 50-54 | 2 | | 2 | 2 |
| 55 සහ ඉහළ | 2 | 1 | 3 | 2 |
| එකතුව | 64 | 65 | 129 | |

### සේවක පිරිවැටුම

| වයස් කාණ්ඩය | පිරිමි | කාන්තා | එකතුව | % |
|---|---|---|---|---|
| 18-24 | 4 | 24 | 28 | 27.72 |
| 25-29 | 9 | 13 | 22 | 21.78 |
| 30-34 | 7 | 6 | 13 | 12.87 |
| 35-39 | 6 | 4 | 10 | 9.90 |
| 40-44 | 4 | 3 | 7 | 6.93 |
| 45-49 | 3 | 2 | 5 | 4.95 |
| 50-54 | 1 | | 1 | 0.99 |
| 55 සහ ඉහළ | 5 | 10 | 15 | 14.85 |
| එකතුව | 39 | 62 | 101 | |

### සේවක රඳවාගැනීමේ අනුපාතය

| | 2024 |
|---|---|
| සේවක සංඛ්‍යාව | 914 |
| සේවක රඳවාගැනීමේ අනුපාතය % | 93.4 |

## අනාගත දැක්ම

**කාර්යසාධනය පදනම් සංස්කතිය**

අපි කාර්යසාධනය පදනම් සංස්කෘතියක් සම්පූර්ණයෙන් ඇතුළත් කිරීමට අපේක්ෂා කරන අතර ඒ තුළ ආයතනික සාර්ථකත්වයන් ඉටු කිරීමට හා සාක්ෂාත් කර ගැනීමට නව්‍යකරණය විසින් සමස්ථ ආයතනයම මෙහෙයවනු ලබයි.

**අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවලිය වැඩි කිරීම**

ආයතනය තුළ තීරණාත්මක තනතුරු හඳුනා ගැනීමෙන් සහ විශ්‍රාම යන හෝ ඉවත් වන අයගේ පුරප්පාඩු පිරවීම සඳහා පුද්ගලයින් පුහුණු කිරීමෙන් හැකියා සංචිතයක් සංවර්ධනය කිරීමෙන් තවදුරටත් වැඩිදියුණු කිරීම් සිදු කිරීමට අපි අදහස් කරමු.

# සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

## SLICLL හි සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය විවිධ පාර්ශ්වකරුවන් සමඟ ශක්තිමත් ජාලයක් සකස් කරයි. සෑම කණ්ඩායමක් සමඟ විශ්වාසය හා අනෝන්‍ය ප්‍රතිලාභ සම්බන්ධතා ගොඩ නැගීමට අප උත්සාහ ගන්නා බැවින්, මෙම සම්බන්ධතා සමාගමට හා පාර්ශ්වකරුවන්ට වටිනාකම නිර්මාණය කරයි.

### SDGs වෙත දායකත්වය




ජීවිතයේ සෑම අදියරකදීම ශ්‍රී ලාංකිකයින් සඳහා මූල්‍ය ආරක්ෂක රැකවරණයන් ලබාදෙන විවිධාංගීකරණය කළ ජීවිත ආයෝජන විසඳුම්




පුද්ගලයාගේ අවශ්‍යතා මත පදනම් වී තෝරා ගත යුතු ගලපන ලද විකල්ප සමඟ සෞඛ්‍ය අවශ්‍යතා සඳහා සම්පූර්ණ ආවරණය




SLIC ලයිෆ් අධ්‍යාපන රක්ෂණ සැලසුම් දැකිය නොහැකි වාතාවරණයක් තුළ පවා ගුණාත්මක අධ්‍යාපනය සුරක්ෂිත කරන අතර “සුබපැතුම්” ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය තුළින් ළමුන්ගේ අධ්‍යාපන සිහිනවලට තවදුරටත් සහය වේ.

සමාගම ව්‍යුහගත සහ අඛණ්ඩ පුහුණු වැඩසටහන් සමඟ සිය කාර්ය මණ්ඩලය හා අලෙවි කණ්ඩායමේ සංවර්ධනය සහය වේ.

### ප්‍රධාන සංඛ්‍යාලේඛන වැදගත් සිදුවීම් 2024



SLIC ලයිෆ් වෙළෙඳපොළ කොටස්

**14.4%**




ආයතනය තුළ වැඩ කිරීමට යෝග්‍ය ස්ථාන සංස්කෘතිය ස්ථාපිත කිරීම සහ ක්‍රමානුකූලව මෙහෙයුම් නියෝජිත සංවර්ධන ආකෘතිය




සෑම සමාජ ආර්ථික පන්තියකම සියලූ අවශ්‍යතා සහ සියලූම ශ්‍රී ලාංකිකයින්ට නව්‍යකරණයට ගලපන ලද රක්ෂණ විසඳුම්, ජංගම කාර්යයන්, මාර්ගගත ගෙවීම් විසඳුම් සහ ඩිජිටල් ගනුදෙනුකාර පහසුකම් හා දෙමුහුන් මාර්ග තුළින් පහසුව, විනිවිදභාවය හා ආරක්ෂාව




“සැමට රක්ෂණය” යන සංකල්පය යටතේ සියලූම ශ්‍රී ලාංකිකයින්ට දැරිය හැකි මිලකට සහ සරලකළ රක්ෂණ විසඳුම් පිරිනැමීම



# සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය




## ගනුදෙනුකාර ප්‍රාග්ධනයට වටිනාකම එකතු කිරීම

### වටිනාකම නිර්මාණය කරා ගනුදෙනුකාර ප්‍රාග්ධනය මෙහෙයවීම

වටිනාකම නිර්මාණය කරා ගනුදෙනුකාර ප්‍රාග්ධනය මෙහෙයවීම සඳහා, SLIC ලයිෆ් වෙළෙඳපොල තුළ තරඟකාරීවීමට සහ සිය වෙළෙඳපොල කොටස වැඩි කර ගැනීමට සිය ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා, උවමනා, සහ මනාපයන් අවබෝධකර ගැනීම කෙරෙහි අවධානය යොමු කරයි. අපගේ ආදායම් ප්‍රවාහයන් වැඩි කිරීමට, අපගේ දැනට සිටින ගනුදෙනුකරුවන් රඳවා ගැනීමට අමතරව නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගත යුතුය. මෙය සාක්ෂාත් කර ගැනීමට, SLIC ලයිෆ් සියලු ශ්‍රී ලාංකිකයින්ට පුළුල් පරාසයක අසමසම සහ දැරියහැකි ජීවිත ආයෝජන සැලසුම් පිරිනමන්නෙමු.

"පියෙකු මෙන් - මවක මෙන්" යන තේමාව සමඟ සිටිමින්. අපගේ සැලසුම් සමූහය පුද්ගලයින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ක්ෂුද්‍ර - ව්‍යවසායකයින්, රජයේ ආයතන, සහ ප්‍රධාන සංස්ථාවල විවිධ අවශ්‍යතා ලබාදීමට සැලසුම් කෙරේ.

ජීවිත රක්ෂණ සැලසුම්වල සම්ප්‍රදායික ආරක්ෂක සහ ප්‍රතිඵලවලින් ඔබ්බට ගොස්, SLIC ලයිෆ් විසින් ඔප්පුවේ කාලය තුළ ඔප්පුහිමියන්ට වටිනාකම පිරිනමමින් සිය පක්ෂපාතී හවුල්කාර ජාලය තුළින් Loyalty Reward පිරිනමයි.

### විවිධ සහ විශේෂිත සැලසුම් කළඹක්

සැලසුම් පිරිනැමීම් ආරක්ෂාව/ආයෝජන සැලසුම්, විශ්‍රාම සැලසුම්, අධ්‍යාපන සැලසුම්, සෞඛ්‍ය සැලසුම්, ක්ෂුද්‍ර - රක්ෂණය සේවක ආශ්‍රිත ආවරණ, උකස් සහ මාර්ගගත විසඳුම් යන වර්ගීකරණවලට බෙදනු ලබයි. එක් එක් නිෂ්පාදනය එහි ඉලක්කගත ගනුදෙනුකරුවන්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලීමට සකස් කර ඇති අතර අතිවිශිෂ්ට ඊකවරණයන් සහ ප්‍රතිලාභ ලබා දේ. නිෂ්පාදන පිරිනැමීම් තුළින් සිය සේවාදායකයින්ට SLIC ලයිෆ් බැඳීම විශිෂ්ඨ ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීම සහ ගනුදෙනුකාර තෘප්තිය සහතික කිරීමට සැලසුම් කර ඇති අතර, සිය නිෂ්පාදන හා සේවා තුළින් සිය ගනුදෙනුකරුවන්ට වටිනාකම නිර්මාණය කෙරෙහි සමාගමේ අවධානය ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ විසඳුම්වල ප්‍රමුඛ රක්ෂණ සපයන්නා බවට පත්කරමින් සේවාදායකයින් ආකර්ශණය කර රඳවා ගැනීමට සහය වේ.



## සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

### ජීවිත රක්ෂණ සැලසුම් කළඹ

SLIC ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් LIFE

| ආරක්ෂන සැලසුම් | ආයෝජන සැලසුම් | සෞඛ්‍ය රක්ෂණ සැලසුම් | අධ්‍යාපන සැලසුම් | විශ්‍රාම රක්ෂණ සැලසුම් | මාර්ගගත විසඳුම් |
|---|---|---|---|---|---|
| Sri Lanka Insurance Life Divi Thilina Protection Plan | Sri Lanka Insurance Life Early Cash | SLIC Comprehensive Health Plus | Sri Lanka Insurance Life Mini Muthu Children's Plan | Sri Lanka Insurance Life Freedom Lifestyle Plus Retirement Plan | Sri Lanka Insurance Life Early Cash |
| Sri Lanka Insurance Life Janadiri Two year relief plan | Sri Lanka Insurance Life Speed Investment | Sri Lanka Insurance Life Comprehensive D+ The Health and Life Insurance Cover for Diabetics | Sri Lanka Insurance Life Mini Muthu Dayada | Sri Lanka Insurance Life Freedom Retirement Plan | |
| | Sri Lanka Insurance Life Wealth Plus Limited Premium Plan | Sri Lanka Insurance Life Medi Champ | Sri Lanka Insurance Life Mini Muthu Parithyaga | | |
| | Sri Lanka Insurance Life YASAS | | Sri Lanka Insurance Life Early Cash | | |
| | Sri Lanka Insurance Life Value Max | | Sri Lanka Insurance Life School Fee Protector | | |

| සැලසුම් වර්ගය | ඉලක්කගත ගනුදෙනුකරුවන් | සැලසුම් | විස්තරය |
|---|---|---|---|
| ආරක්ෂාව/ආයෝජනය | සිය ආවරණය තුළින් ආරක්ෂාව සහ ආයෝජන ප්‍රතිලාභ යන දෙකම භුක්තිවිඳීමට කැමති ගනුදෙනුකරුවන් | *දිවි තිළිණ ආරක්ෂණ සැලැස්ම,*<br>*ස්පීඩ් ඉන්වෙස්ට්මන්ට් සැලැස්ම, (Speed Investment Plan)*<br>*Early Cash අත්තිකාරම් ප්‍රතිලාභ සැලැස්ම,*<br>*ජන දිරි – වසර දෙකේ සහන සැලැස්ම,*<br>*වෙල්ත් ප්ලස් – සීමිත වාරික සැලැස්ම, Wealth Plus – Limited Premium Plan*<br>*Value Max – වසර 5හි සැලැස්ම* | ගනුදෙනුකරුවන්ට ක්ෂෙත්‍රයේ ඉහළම ප්‍රතිලාභ පිරිනමන මෙම සැලසුම් තෝරා ගත හැකි අතර, ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට අනුව ගැලපිය හැකිය. |
| විශ්‍රාම සැලසුම් | විශ්‍රාම අත්තිකාරම් සඳහා සූදානම් වීමට කැමති ගනුදෙනුකරුවන් | *ෆ්‍රීඩම් විශ්‍රාම සැලැස්ම*<br>*ෆ්‍රීඩම් තනි වාරික සැලැස්ම*<br>*ෆ්‍රීඩම් ලයිෆ් ස්ටයිල් ප්ලස් සැලැස්ම* | අතිරේක ප්‍රතිලාභ රාශියක් සමඟ සහතික කළ විශ්‍රාම අරමුදලක් ගොඩ නැගීමට සහය වීමට සැලසුම්කල අපගේ විශ්‍රාම සැලසුම් ගනුදෙනුකරුවන්ට තෝරා ගත හැකිය |

## සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

### ජීවිත රක්ෂණ නිෂ්පාදන කළඹ

| නිෂ්පාදන වර්ගය | ඉලක්කගත ගනුදෙනුකරුවන් | විසඳුම් | විස්තරය |
|---|---|---|---|
| අධ්‍යාපනික සැලැස්ම | අපගේ ගනුදෙනුකරුවන්ගේ ළමුන් සඳහා උපතේ සිට උසස් අධ්‍යාපනය අවසන්කිරීම දක්වා ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරයි | ***මිනිමුතු දායාද***<br>***මිනිමුතු ළමා සැලසුම***<br>***මිනිමුතු පරිත්‍යාග***<br>***ස්කූල් ෆී ප්‍රොටෙක්ටර්*** *(School Fee Protector)* | ගනුදෙනුකරුවන්ට ගැලපෙන අධ්‍යාපනික සැලැස්මක් තෝරාගත හැකි අතර, ඒ තුළින් ළමයාගේ අනාගත අධ්‍යාපනික සිහින ආරක්ෂා කරන අරමුදලක් ගොඩනැගීමට සහයවන අතර ළමයාගේ බාධාරහිත අධ්‍යාපනය සහතික කිරීමට පරිපූර්ණ ආරක්ෂාවක් ලබා දේ. |
| සෞඛ්‍ය | බරපතල ශල්‍යකර්මවලදී ආරක්ෂාව සොයන ජනතාව වෙනුවෙන් | **ස්ර්ජිකල් සැලසුම්** *(Surgical Plan)* | පූර්ව නිශ්චිත උපරිම සීමාවක් දක්වා සිය ශල්‍යකර්ම පිරිවැය ආවරණය කරන පුළුල් ආවරණයක් ගනුදෙනුකරුවන්ට තෝරා ගත හැකිය. |
| | ප්‍රධාන වශයෙන් පුද්ගලික සෞඛ්‍යාරක්ෂව සඳහා සෞඛ්‍ය වියදම පිළිබඳ උන්නදුවන පොදු ජනතාව | **කොම්ප්‍රිහෙන්සිව් හෙල්ත් ප්ලස්** *(Comprehensive Health Plus)* | ශ්‍රී ලංකාව තුළ සහ විදේශයක දී අතිරේක ප්‍රතිලාභ රාශියක් සමඟ ශල්‍යකර්ම, වෛද්‍ය, සහ රෝහල්ගත කිරීම් පිරිවැය ආවරණය කරන සැලැස්මක් ගනුදෙනුකරුවන්ට තෝරා ගත හැකිය |
| | මුළු පවුල සඳහා වැඩි දියුණු කල වෛද්‍ය ආවරණ අපේක්ෂා කරන පුද්ගලයින්ට | **මෙඩි චැම්ප්** *(Medi Champ)* | වැඩි දියුණු කළ වෛද්‍ය ආවරණය බාහිර රෝගී අංශය, ආයුර්වේද, මානසික සුවය, සහ කලත්‍රයාගේ දෙමව්පියන් ඇතුළුව පරම්පරා 3ක් සඳහා ප්‍රතිලාභ රාශියක් |
| | දියවැඩියාව සහිත පුද්ගලයින් | **කොම්ප්‍රිහෙන්සිව් D+ Plan** *(Comprehensive D+ Plan)* | දියවැඩියා රෝගයෙන් පෙලෙන ගනුදෙනුකරුවන්ට විශිෂ්ඨ රෝහල් සහ වෛද්‍ය ප්‍රතිකාර වෙත පිවිසීම ලබාදෙන ඔප්පුවක් තුළින් ඔවුන්ට මානසික සුවය හා මූල්‍ය ආධාර භුක්ති විඳිය හැකිය. |
| | රාජ්‍ය රෝහල් සම්බන්ධ සෞඛ්‍ය වියදම් පිළිබඳ සැලකිලිමත් ජනතාවට | දෛනික රෝහල් දීමනා සැලැස්ම *(Hospital Cash Plan)* | ගනුදෙනුකරුවන්ට සැබෑ වියදම නොසලකා රෝහලේ සිටින සෑම දිනයක් සඳහාම ස්ථිර මුදල් ආවරණයක් ලබාදෙන සැලැස්මක් තෝරාගත හැකිය. |
| ක්ෂුද්‍ර රක්ෂණය | ජීවිත රක්ෂණය අවශ්‍ය වුවත් අවශ්‍ය ආවරණ ලබාගැනීමට මූල්‍ය ශක්තිය සහ දැනුම නොමැති ප්‍රජාවන් | **ජීවන ශක්ති** – තේ වගාකරන සේවකයින් සඳහා | අවශ්‍ය ආවරණ ලබා ගැනීමට මූල්‍ය ශක්තිය සහ දැනුම නොමැති ප්‍රජාවන්ට, එක් එක් ප්‍රජාවට බලපාන විශේෂ ගැටළු සඳහා අමතර ආවරණ සමඟ වැදගත් ජීවිත හා සෞඛ්‍ය ආවරණයක් පිරිනැමීමට සැලසුම්කළ ක්ෂුද්‍ර රක්ෂණ ආවරණවලින් ප්‍රතිලාභ තෝරාගත හැකිය. |
| රැකියාවට අදාල | සමාගමේ කාර්ය මණ්ඩලය | සමූහ රක්ෂණ සැලසුම් (*Group Protect Term Policy)* | ගනුදෙනුකරුවන්ට ආරක්ෂාව පිළිබඳ වඩා ඉහළ හැඟීමක් නිර්මාණය කිරීමට එක් රක්ෂණ ආවරණයක් යටතේ ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය ආවරණය කරගත හැක. |
| උකස් ආරක්ෂණය | බැංකු/මූල්‍ය ආයතනවලින් ණය ලබා ගන්නා ණය ගැනුම්කරුවන් | *උකස් ආරක්ෂණ සැලැස්ම (Mortgage Protection Plan)* | ගනුදෙනුකරුවන්ට ඔප්පුවේ කාල සීමාව තුළ ණය ගැනුම්කරුගේ මරණය හෝ සම්පූර්ණ සහ ස්ථිර ආබාධිතභාවය පිළිබඳ අවදානම නිසා නිවාස ණයක් හෝ වෙනත් ණයක් සඳහා ඉටුකළ උකසක් ආරක්ෂා කරගත හැක. |
| මාර්ගගත විසඳුම් | පහසුව සහ විනිවිදභාවය සමඟ ජීවිත රක්ෂණය ලබාගැනීමට උත්සාහ කරන ඩිජිටල් දැනුවත් ගනුදෙනුකරුවන් | *අර්ලි කැෂ් ඔන්ලයින්* (Early Cash Online) | ගනුදෙනුකරුවන්ට සරලකළ ක්‍රියාවලි සහ වේගවත් ක්‍රියාත්මක කාලසීමා සහ ජීවිත රක්ෂණය පිළිබඳ සහතික කළ ආරක්ෂාව සමඟ මුල සිට අග දක්වා ඩිජිටල් අත්දැකීම පිරිනැමීමට නිර්මාණය කළ සැලසුම් සමඟ වර්ධිත පහසුව හා විනිවිදභාවය ඇත. |

## සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

### 2024 වසරේ වෙළෙඳපොළ දියත්කළ නව නිෂ්පාදන/සේවා

SLIC ලයිෆ් සිය සැලසුම් වඩා පුළුල් කිරීමට ඇති අඛණ්ඩ උත්සාහයේ කොටසක් ලෙස 2024 මූල්‍ය වසර තුළ වෙළෙඳපොලට නව නිෂ්පාදන හඳුන්වා දෙන ලදී. මේවාට පහත දෑ ඇතළත් වේ.

### මෙඩි චැම්ප් (Medi Champ)

SLIC ලයිෆ් පවත්නා සෞඛ්‍යාරක්ෂණ සැලසුම් වැඩි කිරීමට 2024 දී Medi Champ සෞඛ්‍ය රක්ෂණය හඳුන්වා දෙන ලදී. මෙම සැලසුමෙන් ඔප්පුහිමියා, කලත්‍රයා, ළමුන්, කලත්‍රයාගේ දෙමාපියන් ඇතුළුව පරම්පරා 3ක් සඳහා එක් ඔප්පුවකින් පුළුල් වෛද්‍ය ආවරණය පිරිනමයි. මින් බාහිර රෝගී අංශය, දන්ත, ආයුර්වේද ප්‍රතිකාර, මානසික සුවය හා ප්‍රතිලාභ රාශියක් ඇතුළුව වැඩිකළ රැකවරණයන් ලබා දේ.

### වැලිව් මැක්ස් රැකවරණයන් (Value Max)

වෙළෙඳපොලේ කෙටිකාලීන ආරක්ෂාව සහ ආයෝජන අවශ්‍යතාව සලකා බලමින්, SLIC ලයිෆ් 2024 දී කෙටි කාලීන ආයෝජන විසඳුමක් වන Value Max හඳුන්වා දෙන ලදී. සහතික කළ ප්‍රතිලාභයක් හා වාරික ගෙවීම වසර 5ක් පමණ කාලසීමාව සහිත ඔප්පුවක් සමඟ, Value Max ශ්‍රී ලාංකිකයින් කෙටි කාලීන රක්ෂණ විසඳුම්වල වර්ධනීය අවශ්‍යතා ඉටු කරයි.

### ප්‍රශස්ථ ගනුදෙනුකාර සේවාව

නව තාක්ෂණය සමාජ මාධ්‍යවල වැඩිවන භාවිතයට ගැලපෙන පරිදි ගනුදෙනුකරුවන්ගේ හැසිරීම වෙනස් වන බැවින් තරගය තුළ ඉදිරියෙන් සිටීමට නව්‍යකරණය වීමේ අවශ්‍යතාව අපි හඳුනා ගනිමු. මෙම වාතාවරණය තුළ, අපගේ ගනුදෙනුකරුවන්ට හැකි තරමින් පහසුව ලබා දෙන අසමසම අගය එකතුකළ සේවා ලබා දෙමින් අපව විශේෂි කරණය වීමට අපි උත්සාහ ගනිමු.

| | | |
|---|---|---|
| SLIC ලයිෆ් ගනුදෙනුකාර යෙදවුම් | | ඔප්පුවේ විස්තර බැලීමට<br>වාරික ගෙවීම සිදු කිරීමට<br>Google සිතියම් තුළ SLIC ලයිෆ් ශාඛා ස්ථානගත කිරීමට<br>ලයිෆ් ලෝයල්ටි රිවෝර්ඩ්ස් සොයා බැලීමට සහ හිමිකම් පෑමට |
| අපගේ ආයතනික වෙබ් අඩවිය (www.sliclife.com) | | SLIC ලයිෆ් ආයතනික වෙබ් අඩවිය සමාගම සහ පරිශීලකයන්ට සිය නිෂ්පාදන පිළිබඳව තොරතුරු රාශියක් පිරිනමමින් ජීවිත රක්ෂණය සම්බන්ධව විශේෂ වෙමින් දියත් කර ඇත. |
| 24 x 7 පාරිභෝගික ඇමතුම් | | අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට 24x7 සහය ලබාදීමට විශේෂිත ජීවිත රක්ෂණ ඇමතුම් මධ්‍යස්ථානය දියත් කරන ලදී. |
| මාර්ගගත ජීවිත රක්ෂණ සැලසුම් | | SLIC ලයිෆ් වෙබ් අඩවිය තුළින් පහසුව සහ විනිවිදභාවය සමඟ ඕනෑම ස්ථානය සිට ජීවිත රක්ෂණ ආවරණයක් ලබාගැනීමේ පහසුව |
| ජංගම සහ වෙනත් ගෙවීම් විසඳුම් | ජංගම ගෙවීම් හවුල්කරුවන් සමඟ හවුල්කාරත්වය | ජංගම විසඳුම් භාවිතයෙන් තම වාරික ගෙවීමට ගනුදෙනුකරුවන් සඳහා බාධා රහිත පහසු මාර්ගයක් ලබාදීම |
| | මහජන බැංකුව සමඟ හවුල්කාරත්වය | ශ්‍රී ලංකාව පුරා මහජන බැංකුවේ ATM's ජාලය සහ ස්වයං බැංකුකරණ මධ්‍යස්ථාන හරහා තම වාරික පියවීම |
| | ලංකා බැංකුව සමඟ හවුල්කාරත්වය | ලංකා බැංකුවේ ස්මාට් පේ භාවිතයෙන් QR - පදනම් ජීවිත රක්ෂණ වාරික ගෙවීම ශක්තිමත් කිරීම |
| | ලංකා හොස්පිටල්ස් හි සේවා කවුළුව | රක්ෂණ ඔප්පු මිලදීගැනීම, රක්ෂණ සැලසුම් හා වාරික පිළිබඳ තොරතුරු ලබාගැනීමට පහසුකම් සැපයීම |
| | මාර්ගගත ගෙවීම් විකල්ප රාශියක් | ඔප්පුහිමියන්ට මාර්ගගත හා බැංකු ගෙවීම් විකල්ප රාශියක් සමඟ පහසුව හා ආරක්ෂාව සැපයීම |

# සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

### වගකීම්සහගත අලෙවිකරණය සහ විනිවිද සන්නිවේදනය

අපගේ ගනුදෙනුකරුවන් මැදිහත්වීමේ උපායමාර්ගයෙන් ගනුදෙනුකරුවන්ට පහසුවෙන් සහ ඉක්මණින් තීරණ ගැනීමට ඔවුන්ට හැකි වන සේ පැහැදිලි සහ සංක්ෂිප්ත තොරතුරු ලබාදීම අරමුණු කරයි. විවිධ විකල්පවලට මුහුණදීමේදී ගනුදෙනුකරුවන්ගේ දුෂ්කරතා අපි අවම කරමු. මේ සම්බන්ධයෙන්, ප්‍රවර්ධන හා අලෙවිකරණ ද්‍රව්‍ය සැලසුම් කිරීමේදී, අපි සියලූම නියාමන අනාවරණ බැඳීම්වලට අනුකූල වෙමු. අපගේ ගනුදෙනුකරුවන්ට අවශ්‍ය සහ අදාළ සියලූම තොරතුරු ලබාදීමෙන් ක්ෂෙත්‍රයේ ප්‍රමිති රැකීමට අපි උත්සාහ ගනිමු. ඒ තුලින් ඔවුන් අපත් සමඟ ගනුදෙනු කිරීමේදී විචක්ෂණ තීරණ ගනීමට හැකි වනු ඇත.

අපගේ ගනුදෙනුකරුවන්ට විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ඇතුළුව මාර්ග ගණනාවක් තුළින් අපගේ නිෂ්පාදන හා සේවා පිළිබඳ තොරතුරු ලැබේ. තවද, සියලූම ශාඛා සේවකයින් වෘත්තීය ආකාරයකින් තොරතුරු සම්බන්ධ විමසීම්වලට ප්‍රතිචාර දක්වීමට, අපගේ නිෂ්පාදන හා සේවා හා බැඳුණු අවදානම් පැහැදිලි කිරීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට සුදුසු විසඳුම් පිළිබඳ ගනුදෙනුකරුවන්ට උපදෙස් ලබා දීමට ඔවුන් පුහුණු කෙරේ. මාර්ගගත නිෂ්පාදන හඳුන්වාදීම ගනුදෙනුකරුවන්ට පිරිනමන පහසුව සහ විනිවිදභාවය තවදුරටත් ශක්තිමත් කරයි.

### කඩිනම් සහ ඵලදායී ගනුදෙනුකාර පැමිණිලි මෙහෙයවීම

SLIC ලයිෆ් සේවාදායකයින්ගේ ප්‍රතිචාර අගය කරන අතර ගනුදෙනුකරුවන්ට සමාගම සමඟ සෘජුවම සන්නිවේදනය කළහැකි මාර්ග ගණනාවක් ලබා දී ඇත. මේවාට පැය 24 ඇමතුම් මධ්‍යස්ථානය. අපගේ ආයතනික වෙබ් අඩවිය, සහ සමාජ මධ්‍ය ඇතුළත්ය.

අපගේ සේවාවල තත්ත්වය පිළිබඳව සියලූම සේවාදායකයින්ගේ ගැටළු අපගේ සේවා ඉහළ නැංවීමට සහ පහසුව, විශ්වාසය සහ ව්‍යාපාරය කිරීමේ ප්‍රසාදය වර්ධනය කර ගැනීමට අවස්ථාවක් ලෙස අපි දකිමු.

අපගේ මනාව පුහුණුව ලත් සම්පතක් වන කාර්ය මණ්ඩලය විසින් ගනුදෙනුකාර ගැටළු ගොනුකර, විමර්ෂණය කර සහ වඩාත් වැදගත් ලෙස කඩිනමින් විසඳන බව සහතික කරයි. අපි ගනුදෙනුකාර පැමිණිලි කළමනාකරණ ක්‍රමයක් ක්‍රියාවට නංවා ඇති අතර, ගනුදෙනුකාර පැමිණිල්ලක් ලද අවස්ථාවේ සිට එය විසඳන තුරු සහ ක්‍රියාපටිපාටිය සමාගමේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කිරීම දක්වා මනාව නිශ්චිත ක්‍රියාවලියකින් සමන්විත වේ.

ගනුදෙනුකාර තෘප්තිය හා පක්ෂපාතිත්වය ඉහළ නැංවීමට වඩා සක්‍රිය ස්ථාවරයක් අරගනිමින්, SLIC ලයිෆ් ගනුදෙනුකාර ප්‍රසාදයට බලපෑම් කරන සෑම අඩුපාඩුවක්ම හඳුනාගැනීමේ සහ වර්ධනය කිරීමේ උත්සාහයක් තුළ ඔප්පු හිමියන් කෙරෙහි අවධානය යොමු කරමින් Net Promoter Score සහ ගනුදෙනුකාර තෘප්තිය පිළිබඳ අධ්‍යයනය වාර්ෂික පදනමක් මත පවත්වනු ලබයි.

### ලයිෆ් ලෝයල්ටි රිවෝර්ඩ්ස්

ජීවිත රක්ෂණය සම්බන්ධ පුළුල්ව පිළිගත් විශ්වාසයක් වන්නේ කාලසීමාව අවසානයේදී හෝ හිමිකමකදී පමණක් එහි ප්‍රතිඵල ලබාගත හැකිය යන්නයි. SLIC ලයිෆ්, අපි අවශ්‍යයෙන්ම හිමිකම්පෑමක් නොමැතිවම ඔප්පුවේ කාලය තුළ අපගේ ජීවිත ඔප්පුහිමියන්ට අඛණ්ඩ ප්‍රතිලාභ ලබාදීමට කැප වී සිටිමු.

මෙය මනසේ තබාගනිමින්, ලයිෆ් ලෝයල්ටි රිවෝර්ඩ්ස් ක්‍රමය ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ලයිෆ් ඔප්පුහිමියන් සඳහා අපගේ වෙළෙඳ හවුල්කරුවන් තුළින් පිරිනැමීම්, වට්ටම් සහ අගය එකතුකිරීම් සමූහයක් ඔවුන්ට ලබාගැනීමට හැකියාව ඇති කරමින් දියත් කරන ලදී. හෝටල්, අධ්‍යාපන ආයතන, අවන්හල්, සෞඛ්‍ය සහ වෙනත් බොහෝ ක්ෂෙත්‍ර ආවරණය වන නව හවුල්කරුවන් සහ පිරිනැමීම් එකතු කරමින් ලෝයල්ටි වැඩසටහන් තුළින් පිරිනමන ප්‍රතිලාභ අපි අඛණ්ඩව වැඩි කරමු.

අපගේ ගනුදෙනුකරුවන්ට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ලයිෆ් ජංගම යෙදුම තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි අතර විද්‍යුත් ලෝයල්ටි කාඩ්පත හරහා ප්‍රතිලාභ නිදහස් කර ගත හැකිය.

### රක්ෂණ උපදේශකයින්

අපගේ රක්ෂණ නියෝජිතයින් අපගේ සන්නාම තානාපතිවරුන් වෙති. එමනිසා SLIC ලයිෆ් සන්නාමය ලෙස සදාචාර සහ අවංකකම පිළිබඳ ඉහළම ප්‍රමිති ඔවුන් පිළිබිඹු කරන බව අපි සහතික කරමු. සියලූම නියෝජිතයින් SLIC ලයිෆ් අලෙවි ගිවිසුම තුළින් බඳවා ගන්නා අතර ඉන් සියලූම උපදේශකයින් අනුගමනය කළ යුතු නියමයන් සහ කොන්දේසි විස්තර කරයි.

අපගේ නියෝජිතයින් අභිප්‍රේරණය කිරීමේ අවශ්‍යතාව අපි හොඳින් අවබෝධ කර ගනිමු. SLIC ලයිෆ් නියෝජිත වෘත්තීය මඟ උපදේශකයින්ට ක්‍රමානුකූල දියුණුවක් ලබා දෙන අතර ආයතනය සමඟ වර්ධනය වීමට ඔවුන්ට ඉඩ ලබාදේ. අපි අපගේ සියලූම උපදේශකයින්ට අමතර සංවර්ධන අවස්ථා ලබා දෙන්නෙමු. අභිප්‍රේරණයේ එක් මාර්ගයක් වන්නේ SLIC ලයිෆ් අභ්‍යන්තර ප්‍රදාන අවස්ථාවන් වන අතර ඉන් නියෝජිත වෘත්තීය මඟ වැඩසටහන තුළින් හඳුනාගත් ඉහළ කාර්යසාධකයින් පිළිගනී. ඊට අමතරව, SLIC ලයිෆ් ඩිජිටල්කරණ මුලපිරීම් අපගේ නියොජිත පිරිස් වෙත තවදුරටත් ප්‍රතිලාභ ලබා දෙන බව අපි සහතික කරමු.

වඩා ඵලදායී සහ හිතකර සංවර්ධන වැඩසටහන් මෙන්ම SLIC ලයිෆ් හි නියෝජිත ගිවිසුම් සමඟ අලෙවි සේවකයින් සඳහා මෙහෙයුම් ව්‍යූහයක් ලබාදීමට නියෝජිත සංවර්ධන ආදර්ශය (ADM) ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යූහය මගින් නව බඳවා ගැනීම් සඳහා පැහැදිලි ප්‍රගතියක් ලබාදෙන බැවින් සහ දැනට සිටින කාර්යසාධකයින්ට විධිමත්ව ස්ථානගතවීමට මඟක් ක්‍රමවත් කර ලබාදෙන බැවින් සමාගමේ නියෝජිත බඳවාග ැනීමේ ධාවකය සඳහා සහයවන මෙවලක් වනු ඇත.

ඊට අමතරව, SLIC ලයිෆ් විසින් උපදේශක බලකාගේ සේවා තත්ත්වය ඉහළ නැංවීමට සිය අලෙවි බලකාය හා පුහුණු කණ්ඩයම සඳහා ජාත්‍යන්තර LIMRA සහතික කිරීමේ නිර්ණායකය හඳුන්වාදීමට පියවර ගෙන ඇත

### නියෝජිත බලකාය

2019 සිට 2024 දක්වා MDRT සාමාජිකයින්

| සංඛ්‍යා අත්කරගත් වසර | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|---|
| සාමාජිකත්ව වසර | 2025 | 2024 | 2023 | 2022 | 2021 | 2020 |
| මුළු සාමාජිකයින් | 319 | 209 | 168 | 187 | 93 | 64 |

# සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

## ආයතනික උත්සව හා දියත් කිරීම්

### 1 SLIC Super Women - කාන්තා දින වැඩසටහන

කාන්තා උපදේශක බලකාය සමාගම සහ SLIC ලයිෆ් හි උපායමාර්ගික සැලැස්ම තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන අතර, ආයතනයක් ලෙස, රක්ෂණ උපදේශිකාවන් ලෙස අගනා ප්‍රතිඵල ලබාදෙන වෘත්තීන් සමඟ මෙරට කාන්තාවන් ශක්තිමත් කිරීම සහ සවිබලගැන්වීම තුළ සක්‍රීය වී ඇත. 2023 දී සිය සාර්ථකත්වයෙන් පසු, කාන්තා දිනය සමරමින්, SLIC ලයිෆ් විසින් සමාගමේ කාන්තා උපදේශිකාවන් කෙරෙහි අවධානය යොමු කරමින් විශේෂ අලෙවි තරඟයක් හඳුන්වා දුන් අතර, මෙම වැඩසටහනට නවීන වෘත්තීය කාන්තාවන් සඳහා ආකර්ෂණීය ප්‍රදාන මෙන්ම ඔවුන්ගේ සැබෑ හැකියාවන් සාක්ෂාත් කර ගැනීමට සහයවන මගපෙන්වීම සහ පුහුණුව ඇතුළත්ය.



### 2 MDRT සම්මන්ත්‍රණය

2023 MDRT ජයග්‍රහකයින් 209ක් වෙත කොළඹ ෂැන්ග්‍රි-ලා හොටෙල්හි දී සංවිධානය කළ MDRT සම්මන්ත්‍රණයේදී අසමසම අත්දැකීමක් සමඟ සම්මාන පිළිගන්වන ලද අතර එහිදී ඔවුන්ට මුදල් ත්‍යාග සහ සමරුඵලක ලබා දෙන ලදී. ක්ෂේත්‍රයේ ප්‍රමුඛ වෘත්තිකයින් විසින් ඔවුන්ගේ ව්‍යාපාර දක්ෂතා සහ ජීවිත වර්ධනය කිරීමට සහයවන පුහුණු ලබාගැනීමට ඔවුන් සමත් විය.

### 3 ජීවිත සම්මේලනය

2023 හි පළමු මාස හය තුළ සුවිශේෂීව කටයුතු කළ පුද්ගලයින් 2024 ජීවිත සම්මේනයේදී සම්මානයට පාත්‍ර විය. මෙය නුවරඑළියේදී පවත්වන ලද දින 2ක නේවාසික වැඩසටහනක් විය. මෙම උත්සවයේදී ජයග්‍රාහකයින් වෙත සිය ජයග්‍රහන සහතිකපත් ලද අතර ඔවුන් වටිනා පුහුණුවකට සහ අභිප්‍රේරණ සැසියකට සහභාගි විය.



### 4 ප්‍රසාද දීමනා ප්‍රකාශ කිරීම

SLIC ලයිෆ් රු. බිලියන 11.2ක ප්‍රසාද දීමනා ප්‍රකාශකිරීමක් සමඟ ශ්‍රී ලංකා රක්ෂණ ක්ෂෙත්‍රයේ විශාලතම ප්‍රසාද දීමනා ප්‍රකාශකිරීම නිවේදනය කළේය. ප්‍රසාද දීමනා ප්‍රකාශකිරීම SLIC ලයිෆ් කළමනාකාරිත්වය සහ ඉහළම ජීවිත රක්ෂණ ඔප්පුහිමියන් ගේ සහභාගිත්වය ඇතිව ජීවිත සම්මේලනයේ දී නුවරඑළියේදී දියත් කරන ලදී. මෙම වැඩසටහනින් පසුව දිවයින පුරා ව්‍යාපාර සක්‍රියකරණ හා දොරින් දොර වැඩසටහන් සිදුකළ අතර එහිදී SLIC ලයිෆ් අලෙවි කණ්ඩායම රටේ සෑම කොටසකටම ජීවිත රක්ෂණයේ පණිවිඩය ගෙන ගියේය.




### 5 RDB හවුල්කාරත්වය

SLIC ලයිෆ් 2024 වසර තුළ නියෝජිත මාර්ග අනුපූරණය කිරීමට හා සමාගමේ සමස්ත ව්‍යාපාර ජයග්‍රහනයන්ට සහයවීම සඳහා බැංකු රක්ෂණ මාර්ග සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම උපායමාර්ග දැක්මේ කොටසක් ලෙස, 2024 වසර තුළ ණය ආරක්ෂණ ආවරණ සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ බැංකු රක්ෂණ හවුල්කාරිත්වයකට ඇතුළත් විය.




### 6 ගංවතුර පරිත්‍යාග

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සහයෝගයෙන් SLIC ලයිෆ් ගම්පහ, රත්නපුර හා මාතර දිස්ත්‍රික්කවල මැයි මාසයේදී ගංවතුරෙන් පීඩාවට පත් වූ පවුල් 1,100කට වියලි සලාක ඇසුරුම් බෙදා දෙන ලදී. මෙම වැඩසටහනින් අවශ්‍ය අවස්ථාවලදී ප්‍රජාව වෙත සහයවීමට සමාගමේ ඇති කැපවීම තහවුරු කරයි.

වියලි සලාක ඇසුරුම් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සහ ආගමික ආයතන හරහා බෙදා දෙන ලද අතර ඒ තුළින් ආධාර කාර්යක්ෂමව වඩාත් පීඩාවට පත් ප්‍රදේශවලට ලඟා වූ බව සහතික කරයි. ප්‍රජාවගේ වර්ධනය අරමුණු කරන මූලපිරිම්වල සමාගම ස්ථිරවම යෙදෙන බැවින්, මෙවැනි සේවා කටයුතුවලින් සමාජීය වගකීමට SLIC ලයිෆ් කැපවීම පෙන්නුම් කරයි.



# සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

## 7 2024 ලෝක ළමා දිනයේදී උපන් ළමුන්ගේ දෙමව්පියන් වෙත රු. මිලියන 1ක නොමිලේ රක්ෂණ ආවරණය

SLIC ලයිෆ් 2024 ඔක්තෝබර් 01 දින උපන් සැම ළමයෙකුගේම දෙමව්පියන් සඳහා රු. මිලියන 1ක් වටිනා නොමිලේ රක්ෂණ ආවරණයක් ලබා දෙමින් ලෝක ළමා දිනය සමරන ලදී.

මෙම වැඩසටහන් රටතුළ සියලුම රෝහල් ආවරණය කරමින් 2024 ඔක්තෝබර් 01 දින පවත්වන ලදී. මෙම විශේෂ ආයතන සමාජීය වගකීම් සහගත (CSR) වැඩසටහන 2022 දී දියත් කළ අතර රටේ ළමුන්ගේ අනාගතය ආරක්ෂා කිරීම එහි අරමුණ විය. මෙම වැඩසටහනින් රටට එකතු කර ඇති වටිනාකම අවබෝධ කරගනිමින්, SLIC ලයිෆ් අඛණ්ඩව තුන්වන වරටත් මෙය පැවැත්වීමට තීරණය කරන ලදී.




## 9 අනුරාධපුර පොසොන් වන්දනාකරුවන්ට සහයවීම

වසර 30කට වැඩි කාලයක සිට, SLIC ලයිෆ් පොසොන් පෝය සඳහා අනුරාධපුරයට පැමිණෙන වන්දනාකරුවන්ට හදිසි සහය ලබා දී ඇත. විශාල පිරිසක් පොසොන් කාලය තුළ අනුරාධපුරයට රැස්වන අතර SLIC ලයිෆ් අනුරාධපුරය පූජනීය නගරය තුළ සහ ඒ අවට නැති වූ පුද්ගලයින් සහ ඔවුන්ට අයත් දෑ සොයා දීමට සහ අසමසම සහය ලබා දේ. 2024 සිට, විශේෂ රෝද පුටු සේවාවක් ද සේවය අවශ්‍ය වන්දනාකරුවන්ට සහයවීම සඳහා හඳුන්වා දෙන ලදී.



## 10 සංස්කෘතිය වැඩසටහන් රැකගැනීමට දායකත්වය

SLIC ලයිෆ් රටතුළ වැදගත් සංස්කෘතික උත්සව සුරකිමින් හා ප්‍රවර්ධනය කිරීමට එහි ඇති බැඳීම අවධාරණය කරමින් රටතුළ සංස්කෘතික සිදුවීම් හා සම්ප්‍රදායික “පෙරහැර” උත්සව වලට සහය වේ. වසර තුළ, මහනුවර ඇසළ පෙරහැර, කොළඹ නවම් පෙරහැර, බෙල්ලන්විල පෙරහැර, ගැටබරුව පෙරහැර, කතරගම පෙරහැර සහ කෝට්ටේ පෙරහැරට සහය ලබා දී ඇත.

## 8 සුබ පැතුම් ශිෂ්‍යත්ව

SLIC ලයිෆ් සුබ පැතුම් ශිෂ්‍යත්ව වැඩසටහන රටතුළ සිය ජීවිත රක්ෂණ ඔප්පුහිමියන්ගේ ළමුන් සඳහා 2014 දී ආරම්භ කරන ලදී. මෙම යෝජනා ක්‍රමයෙන් මේ දක්වා රු.මිලියන 200ට වැඩි වටිනාකමකින් යුක්ත ශිෂ්‍යත්ව 2000කට වැඩිපුර පිරි නමා ඇත. මෙම මුලපිරීම ඉදිරියට ගෙන යමින්, 2024 දී 2022 දී 5 වසර ශිෂ්‍යත්වය, 2021/22 අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ 2022 අ.පො.ස. උසස් පෙළ විභාගවලදී ඉහළම දක්ෂතා පෙන්වන ලද සිසුන් 300කට මෙම යෝජනා ක්‍රමයෙන් ශිෂ්‍යත්ව පිරිනමා ඇත. මුළු ගණන 300ක් දක්වා විභාග තුනෙන්ම ඉහළම ශ්‍රේණිගත සිසුන් 75ක් තෝරා ගන්නා ලදී. 5 වසර ශිෂ්‍යත්වය, 2021/22 අ.පො.ස. සාමාන්‍ය පෙළ සුදුසුකම් ලැබූ අය දිස්ත්‍රික් ජයග්‍රහනය මත පදනම් වී තෝරා ගන්නා ලද අතර අ.පො.ස. උසස් පෙළ අයදුම්කරුවන් තෝරා ගැනීම ජාතික මට්ටමේ ජයග්‍රහනයන් මත පදනම් විය.

වසර පහක් සඳහා රු. 20,000 ශිෂ්‍යත්ව, වසර දෙකක් සඳහා රු. 40,000 ශිෂ්‍යත්ව සහ වසර තුනක් සඳහා රු. 50,000 ශිෂ්‍යත්ව සිසුන් වෙත පරිනමන ලද අතර එම සිසුන් පිළිවෙලින් 5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ අ.පො.ස. උසස් පෙළ මට්ටමේ විභාග සඳහා සුදුසුකම් ලස අය වෙති මුළු මුදල වන රු. මිලියන 30ක් 2021/22 සුබ පැතුම් ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා වෙන් කළ අතර එය ඉදිරි වසර පහ සඳහා ද ක්‍රියාත්මක කරනු ඇත.

ශිෂ්‍යත්ව පිරිනැමීමේ උත්සවය 2024 ජුනි 17 වන දින කොළඹ “නෙළුම් පොකුණ” මහින්ද රාජපක්ෂ රඟහලේදී අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම මෙන්ම සිසුන් සහ ඔවුන්ගේ දෙමාපියන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

### අනාගත දැක්ම

**2025 වසර සඳහා සැලසුම්කළ නව නිෂ්පාදන**

නව්‍යකරණය වන ආයතනයක් ලෙස, අපි වෙළඳපොලේ ගනුදෙනුකාර අවශ්‍යතා අඛණ්ඩව ඇගයීමට ලක් කරන අතර අපගේ රක්ෂණ ඔප්පු හිමියන්ට හොඳම විසඳුම් සහතික කිරීම සඳහා අපගේ නිෂ්පාදන පිරිනැමීම් ඒ අනුව සකස් කරමු. පසුගිය වසර කිහිපය තුළ ලද අදහස් සමඟ, SLIC ලයිෆ් 2025 වසර තුළ නව නිෂ්පාදන රාශියක් හඳුන්වාදීමට, පවතින නිෂ්පාදන උසස් කිරීමට සහ පහසු සහ නව සේවා හඳුන්වාදීමට සැලසුම් කර ඇත.

# ස්වභාවික ප්‍රාග්ධනය

## ජීවිත රක්ෂකයෙක් සහ සේවා ක්ෂේත්‍රයේ ආයතනයක් ලෙස, SLICLL හි ව්‍යාපාර මෙහෙයුම්වලින් මෙම සීමිත වුවත් වටිනා සම්පත් පාරිභෝජනයට දැඩි බලපෑමක් නොමැත. කෙසේවෙතත්, එහි වගකීම්සහගත භාවිතය අපගේ තිරසාර ව්‍යවහාරවල ප්‍රධාන සංරචකයකි.

### වගකීම්සහගත ප්‍රවාහයක්

තොරතුරු තීව්‍ර ව්‍යාපාර මෙහෙයුමක් ලෙස, අපගේ ස්වභාවික සම්පත් පරිභෝජනය ජලය, විදුලිය, ඉන්ධන, කඩදාසි සහ අපද්‍රව්‍ය බැහැර කිරීම (ආහාර, කඩදාසි සහ ඊ-අපද්‍රව්‍ය) භාවිතයට සීමා වේ. යම් මට්ටමකින්, අපගේ පරිභෝජනය හා අපද්‍රව්‍ය කළමනාකරණය ස්වභාවික ප්‍රාග්ධනය වැඩි කරමින් හෝ එහි සීමිත සම්පත් හායනය කරමින් පරිසරයට බලාපානු ඇති බවට අප දැනුවත්ය. එසේවුවද, "අපි පෘතුවියේ බුද්ධියට යටත් වුවහොත්, අපට ගස්මෙන් මුල්බැසගෙන නැගී සිටිය හැකිය": (රේනර් මේරියා රයික්), යන කියමන විශ්වාස කරමින්, එයට අවශ්‍ය ගෞරවය සමඟ මෙම සීමිත සම්පත්වල සෑම ක්ෂේත්‍රයකටම අපි සලකමු.

### ප්‍රධාන සංඛ්‍යාලේඛන වැදගත් අවස්ථා 2024

| විදුලි පරිභෝජනය | ජල පරිභෝජනය | කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය |
|---|---|---|
| 1,595,912 | 24,400 | 3.4 |
| කි.වොට්.පැ. | ඝන මීටර් | කි.ග්‍රෑ. 1000 |

### UN SDGs සඳහා දායකත්වයන්




**SDG නිර්වචනය**

වගකීම්සහගත පරිභෝජනය හා ආරක්ෂාව තිරසාර පරිභෝජනය හා නිෂ්පාදන රටා සහතික කිරීම

**අපගේ ප්‍රතිචාරය**

ගෘහස්ථ, ජනතාව සහ පුද්ගලික අංශය සමඟ වැඩකිරීමේදී අපගේ සක්‍රිය මැදිහත්වීම




**SDG නිර්වචනය**

කාලගුණ ක්‍රියාව
කාලගුණ වෙනස සහ එහි බලපෑම් වැලැක්වීමට හදිසි ක්‍රියාමාර්ග ගැනීම

**අපගේ ප්‍රතිචාරය**

ජාතික නීති හා පාරිසරික ප්‍රතිපත්තිවලට අනුකූලවීම



# ස්වභාවික ප්‍රාග්ධනය

## අවස්ථාවන්

තිරසාර ජීවන රටා යොදා ගැනීමට ඔප්පුහිමියන් දිරි ගන්වන පාරිසරික දැනුවත් ජීවිත රක්ෂණ ඔප්පු සංවර්ධනය.

වාරික සංරක්ෂණ ව්‍යාපෘති, නැවත වනවගාව සහ තිරසාර යටිතල පහසුකම් සංවර්ධනයට දායකවන රක්ෂණයට සම්බන්ධ හරිත ආයෝජන හඳුන්වාදීම.

පරිසර හායනයෙන් උවදුරට පත්වන ප්‍රජාවන් ආරක්ෂා කර ගැනීමට ආපදා සූදානම් ප්‍රතිලාභ ඒකාබද්ධ කරන ඔප්පු.

කාලගුණ වෙනස සහ පරිසර පද්ධති මාරුවීමෙන් ඇති වන අවදානම් අවම කිරීමට ගොවි ප්‍රජාවන් සහ ග්‍රාමීය ජනතාව දක්වා ක්ෂුද්‍ර රක්ෂණ නිෂ්පාදන පුළුල් කිරීම.

## අභියෝග

මර්ත්‍යතා අවදානම් වැඩි කරමින් ගංවතුර, නියඟය, සහ සුළිසුළං වැනි අතිශය කාලගුණ සිදුවීම් වැඩිවීම හා ඒතුලින් හිමිකම් ගෙවීම සහ මිලකරණ ආදර්ශ වැඩිවීම.

පරිසර පද්ධතියේ ඔරොත්තුදීමට බලපාන වන නාශනය හා ඉඩම් හායනය වඩා ඉහළ සෞඛ්‍ය අවදානම් හා අඩු ජීවිත අපේක්ෂාවන්ට හේතු වේ.

ස්වශන රෝග සහ ජලයෙහි ඇතිවන රෝගවලට දායක වෙමින් වායුව සහ ජල දූෂණය යම් තරමකින් මර්ත්‍යතා අනුපාත හා හිමිකම් ගෙවීම් වැඩි කරයි.




## ප්‍රාග්ධන සම්බන්ධතා

| මූල්‍ය ප්‍රාග්ධනය | නිෂ්පාදිත ප්‍රාග්ධනය | බුද්ධිමය ප්‍රාග්ධනය | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය | මානව ප්‍රාග්ධනය |
|---|---|---|---|---|
| ස්වභාවික ප්‍රාග්ධනයේ තිරසාර භාවිතය දිගුකාලීන පිරිවැය ඉතුරුම් හා ලාභදායිතාව, අවදානම් අඩුවීම සහතික කරන අතර වෙළෙඳපොළ අවස්ථා නිර්මාණය කරයි. | ස්වභාවික ප්‍රාග්ධනයේ සාධාරණ භාවිතය සම්පත් කාර්යක්ෂමතාව, යටිතල පහසුකම් චිර පැවැත්ම, නියාමන අනුකූලතාව, සහ නවෝත්පාදනය හා තිරසාරභාවය සහතික කරයි. | සන්නාම ගොඩනැගීම සහ සන්නාම කීර්තිනාමය, උපායමාර්ගික තීරණ ගැනීම, දැනුම් හුවමාරුව, නව්‍යකරණය හා පර්යේෂණයට උපකාරී වේ. | ප්‍රජා යහපැවැත්ම සහතික කර, විශ්වාසය සහ සහයෝගය ගොඩ නගයි, ආර්ථික සමානතාව කරා දායක වේ. | නිරෝගී පරිසරයක්, වඩා ශක්තිමත් ශ්‍රමබලකායක්, ප්‍රසන්න වැඩ වටපිටාවක්, සහ ආර්ථික වර්ධනයට දායක වේ. |

# ස්වභාවික ප්‍රාග්ධනය

## අපගේ ස්වභාවික ප්‍රාග්ධනය කළමනාකරණය

පද්ධති, ප්‍රතිපත්ති, සහ ක්‍රියාවලි ඇතුළත් අපගේ පාලන ව්‍යුහය ස්වභාවික ප්‍රාග්ධනය වගකීම් සහිත පරිභෝජනය කළමනාකරණය කිරීමට සැලසුම් කරන අතර එහි අරමුණ වන්නේ මානව යහපැවැත්ම සහ මිහිතලය සුරක්ෂිත කිරීමට අත්‍යවශ්‍ය තිරසාරභාවය රඳවා තබා ගැනීමයි. පාරිසරික සංරක්ෂණය කරා නිසි වගකීමෙක් අපගේ මෙහෙයුම් අපි පවත්වන අතර, අපගේ කාබන් පාසටහන් අඩු කිරීම තුළ අපි අඛණ්ඩව ආයෝජනය කරමු. තිරසාරභාවය සඳහා ප්‍රධාන නිර්ණායකයක් වන කඩදාසි පරිභෝජනය අඩු කිරීමට අපගේ පද්ධති හා ක්‍රියාවලි ඩිජිටල්කරණය හා ස්වයංක්‍රියකරණය කිරීමට අපි කැප වී සිටිමු.

ස්වභාවික ප්‍රාග්ධනය කළමනාකරණය සඳහා අපගේ උපායමාර්ගය ත්‍රිවිධාකාර සැලැස්මක් මත පදනම් වේ.

## පාරිසරික රෙගුලාසි සමඟ අනුකූලතාව

අපි ජාතික පාරිසරික ප්‍රතිපත්තියෙහි දක්වා ඇති පාරිසරික රෙගුලාසි ස්වේච්ඡාවෙන්ම පිළිපදින අතර සීමිත හා වටිනා සම්පතක් වන ස්වභාවික ප්‍රාග්ධනයේ වගකීම්සහගත භාවිතය තුල අපි පරීක්ෂාව ක්‍රියාත්මක කරමු. අපගේ කාබන් පාසටහන අඩු කිරීමට අපට හැකියාව ඇති කරමින් ජලය, බලශක්තිය, අපද්‍රව්‍ය බැහැර කිරීමට පසු විපරම් හා නියාමන යාන්ත්‍රණයක් ක්‍රියාවට නංවා ඇත. සමාගම විසින් යම් පාරිසරික නීතිවලට අනුකූල නොවීම පිළිබඳ අවස්ථා නොමැත.

## ඩිජිටල්කරණය, කඩදාසි රහිත මෙහෙයුම්වලට සංක්‍රමණය

### කඩදාසි පරිභෝජනය අඩු කිරීම

SLICLL හි ඩිජිටල් පරිනාමනය හා තිරසාර ව්‍යවහාර කඩදාසි රහිත මෙහෙයුම් කරා සංක්‍රමණය වීමට පියවර කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. ඉලෙක්ට්‍රොනික් ඔප්පු නිකුත් කිරීම, ඩිජිටල් හිමිකම් පිරිසැකසුම්කරණය, සහ ස්වයංක්‍රියකළ ලේඛණ කළමනාකරණ පද්ධතිය මේවාට ඇතුළත්ය. මාර්ගගත ඔප්පු කළමනාකරණය. ඉ-අත්සන යොදා ගැනීම, මේස පදනම් දත්ත යොදා ගැනීම, මේස පදනම් දත්ත ගබඩා කිරීම, සහ කෘතීම බුද්ධිය පදනම් සංවයංක්‍රියකරණය කඩදාසි පරිභෝජනය අඩු කිරීමට සැලකියයුතු ලෙස දායක වන අතර පිරිවැය ඵලදායී මෙහෙයුම් කාර්යක්ෂමතාවන් වැඩි කරයි. මෙම මුලපිරිම ස්වභාවිකවම ගනුදෙනුකාර අත්දැකීම වැඩිකරන අතර රටේ පුළුල් තිරසාර අරමුණු හා පෙළ ගැසේ. කඩදාසි නිෂ්පාදනය, ප්‍රවාහනය සහ බැහැර කිරීම තුළ ආවේනික විමෝචනවල අඩුවීම මෙහි වක්‍ර ප්‍රතිලාභය වේ.

### බලශක්ති කාර්යක්ෂමතාව

LED ආලෝකකරණය, ප්‍රශස්ත ආරක්ෂකය, සහ පුනර්ජනනිය බලශක්තිය (සූර්ය බලය) වැඩි කිරීම ඇතුළුව බලශක්ති කාර්යක්ෂම හරිත ගොඩනැගිලි ප්‍රමිති යොදා ගනිමින්, අපගේ බලශක්ති පරිභෝජනය තුළින් අපගේ ජාතික පද්ධතියට ඇතිවන බර අඩුකරන බව අපි සහතික කරමු. ඩිජිටල් පරිනාමනය බලශක්ති තීව්‍ර ක්‍රියාවලි සැලකියයුතු ලෙස අඩු කිරීමට දායක වන අතර සේවක සහභාගිත්වය දෛනික මෙහෙයුම්වලට බලශක්ති සුරක්ෂිත ව්‍යවහාර තවදුටත් ඇතුළත් කිරීමට උත්සාහ ගන්නා ලදී.

### පොසිල ඉන්ධන භාවිතය අඩු කිරීම

අපගේ ඩිජිටල් වේදිකා සහ ස්වයංක්‍රීයකරණය කළ සේවා ශ්‍රම බලකායට සිය කාර්යයන් දුරස්ථව කරගන යාමට ඉඩදෙන අතර මාර්ග සංචාරය සඳහා අවශ්‍යතාව අඩුකරමින් කාබන් විමෝචනය අඩුකිරීමට මග පාදමින් පාරිසරික දූෂණය වැලැක්වීමට දායක වේ.

කෙසේවෙතත්, ප්‍රාරක්ෂණයට ජීවිත තත්ත්වය තක්සේරු කිරීම සඳහා වැඩිදුර තොරතුරු අවශ්‍ය අවස්ථාවේදී ගනුදෙනුකාරු වෙත යාම සිදුකළ යුතු වේ.

සමස්තයක් වශයෙන්, රක්ෂණ ක්ෂෙත්‍රය තුළ ස්වයංක්‍රියකරණය හා ඩිජිටල්කරණයට කාර්යක්ෂමතාවන් හා අඩුකළ කඩදාසි භාවිතයන් තුළින් කාබන් පාසටහන් අඩුකිරීමේ විභවතාව ඇත. බලශක්ති භාවිතය ප්‍රශස්ත කිරීම, පුනර්ජනනිය බලශක්තිය යොදා ගැනීම, සහ තිරසාර ව්‍යවහාර ප්‍රවර්ධනය කිරීම තුළින් රක්ෂණය තුළ ස්වයංක්‍රියකරණය හා ඩිජිටල්කරණයේ ධනාත්මක පාරිසරික බලපෑම් තවදුරටත් වැඩිකළ හැකිය.

### කාබන් රහිත බව තුල ආයෝජනය

SLIC ලයිෆ් හි GHG විමෝචන තක්සේරුව 2021 දී ආරම්භකරමින් අඛණ්ඩව කරගෙන යන අතර, මෙහි ප්‍රතිඵලවලින්, කාබන් උදාසිනතාව ක්‍රමයෙන් ලඟාකර ගැනීමට අපි අපේක්ෂා කරමු,

2021, 2022 සහ 2023 දී ලද කාබන් පාසටහන් සහතික කිරීම අපි තවදුරටත් පවත්වා ගන්නා අතර හරිතාගාර වායු සත්‍යාපන විගණනයට අනුව, ISO 14064-1:2018 අවශ්‍යතාවයන්ට අනුකූලව සහ ISO-14064-3:2019 පිරිවිතරයන්ට අනුකූලව සාධාරණ මට්ටමේ සහතිකයකින් සත්‍යාපනය කර ඇති පරිදි, 2024 වර්ෂය සඳහා විගණන ක්‍රියාවලිය යටතේ පවතී.

GHG විමෝචනවලට අදාළ වන පරිදි තිරසාර ව්‍යවහාර ඇතුළත් කර ගැනීමට හා කාබන් රහිත බව සාක්ෂාත් කර ගැනීමට ඔවුන්ගේ සහභාගිත්වය ලබා ගැනීමට දැනුවත් කිරීමේ සැසි අපගේ සේවකයින් සඳහා පවත්වන ලදී.

## ප්‍රතිපත්ති රාමුව

අපගේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට, අපි ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් තුළ වැඩ කරන අතර ඒ තුළින් අපගේ මෙහෙයුම් හරහා සම්බන්ධවන ක්‍රියාපටිපාටිය, සහ ක්‍රියාවලි අර්ථ දක්වයි. මෙයට පහත දෑ ඇතුළත් වන අතර අදාළත්වය සහ අවශ්‍යතාව සඳහා නිරන්තරව සමාලෝචනය කර වර්තමාන අවශ්‍යතා සහ මෙහෙයුම් අවශ්‍යතා ඇතුළත් කර ගැනීමට සංශෝධනය කෙරේ

- ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි
- අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණය
- සුදුසු නිසි පරීක්ෂණ ක්‍රියාවලීන්
- වගකිවයුතු සැපයුම් දාම කළමනාකරණය
- විනිවිදභාවය සහ අවදානම් කළමනාකරණය
- ව්‍යාපාර සහ බදු උපාය මාර්ග පාලනය

## බලශක්ති කළමනාකරණය

අපි ශක්තිමත් ප්‍රතිපත්ති ව්‍යූහයන් තුළ කටයුතු කරන අතර ඉන් බලශක්ති පරිභෝජනය කළමනාකරණය කර පරිභෝජනය හා භාවිතය තුළ වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් වීමට අපට ඉඩ ලබා දේ.

ඉන්ධන භාවිතය

| ඉන්ධන වර්ගය | මුළු ලීටර් | GHG විමෝචන(tCO2e) | | | |
|---|---|---|---|---|---|
| | | $CO_2$ | $CH_4$ | $N_2O$ | එකතුව |
| පැට්‍රල් | 343,860.2 | 781.1791 | 11.0853 | 9.847592 | 802.112 |
| ඩීසල් | 26,794.352 | 71.71487 | 0.112479 | 0.158528 | 71.98587 |

# ස්වභාවික ප්‍රාග්ධනය

## විදුලි පාරිභෝජනය




### ජලය කළමනාකරණය

වගකීම් සහගත පාරිභෝජනය

අපගේ කාර්යාල පරිශ්‍රය තුළ ජල භාවිතය ප්‍රශස්ත කිරීම සහ ජල සම්පත රැකගැනීම සඳහා අපගේ දායකත්වය ලබා දෙන අතර ඒ තුළින් පාරිසරික තිරසාරභාවයට සහය වේ.

## ජල පරිභෝජනය




### ජලය හා අපජලය කළමනාකරණය

තොරතුරු තීව්‍ර සේවා ආයතනයක් ලෙස, කඩදාසි ඔප්පු නිකුත් කිරීම, ඩිජිටල් හිමිකම් පිරිසැකසුම, සහ හරිත වැඩ ස්ථාන ව්‍යවහාර අපද්‍රව්‍ය අඩුකිරීම සහ නිර්මාණය වන සුන්බුන් වගකීම්සහගතව බැහැර කිරීම තුළ ප්‍රමුඛත්වය ගනී. අපි සාර්ථකව කඩදාසි ප්‍රතිචක්‍රියකරණ ක්‍රියාවලියක් ක්‍රියාවට නංවා ඇති අතර ජාතික පාරිසරික රෙගුලාසි දැඩිව පිළිපදිමු. ආහාර සහ ජල අපද්‍රව්‍ය නියාමන ප්‍රමිති තුළ ආරක්ෂිත බැහැර කිරීම සහතික කරමින් නැවත කළමනාකරණය කරනු ලබයි. අපි ජීවිත ආරක්ෂා කිරීම සහ ජීවිතයට ඇතිවන අවදානම් අවම කිරීම කරා කටයුතු කරන බැවින්, පරිසර පද්ධති සුරක්ෂිත කිරීම අපගේ DNA තුළ පවතී.

## කඩදාසි ප්‍රතිචක්‍රියකරණය




### විමෝචන කළමනාකරණය

අපි ISO 14064-1:2018 ප්‍රමිතිවලට අනුකූලව හරිතාගාර වායු (GHG) විමෝචන කළමනාකරණය අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතර, පාරිසරික තිරසාරභාවය සඳහා සැලකියයුතු පියවර ගනිමු. සත්‍යාපන ක්‍රියාවලිය Sri Lanka Climate Fund (Pvt) Ltd. විසින් පවත්වන ලද අතර, විමෝචන වාර්තාකරණය තුළ අපක්ෂපාතිත්වය හා නිරවද්‍යතාව සහතික කරන ලදී. විමෝචන කළමනාකරණයේ මූලපිරීම්වලට පහත දෑ ඇතුළත් වේ:

සියලුම මෙහෙයුම් කටයුතුවලදී කාබන් පාසටහන තක්සේරු කිරීම

ප්‍රධාන විමෝචන මූලාශ්‍ර හඳුනා ගැනීම

සේවක සහභාගිත්ව ක්‍රියාවලිය තුළින්, විවිධ තිරසාර ව්‍යවහාර තුළින් විමෝචන අඩු කිරීමට කැපවීම

### ද්‍රව්‍ය කළමනාකරණය

සේවා ආයතනයක් ලෙස, වඩාත් භාවිතා කරන ද්‍රව්‍ය කඩදාසි වන අතර, අපි කඩදාසි රහිත මෙහෙයුමක් සාක්ෂාත් කර ගැනීමට අරමුණු කර ඇති බැවින් අපි සාර්ථකව එහි භාවිතය අඩුකර ඇත. කඩදාසි අපද්‍රව්‍ය දේශීය රෙගුලාසිවලට අනුකූලව වගකීම්සහගත ආකාරයෙන් බැහැර කෙරේ.

### අනාගත දැක්ම

දිගුකාලීන ඔප්පුහිමියාගේ යහ පැවැත්ම තිරසාර අවදානම් කළමනාකරණය හා මූල්‍ය ඔරොත්තුදීම සඳහා පාරිසරික සංරක්ෂණය සමඟ බැඳී පවතී, අපි අදාළ පරිසර දැනුවත් ප්‍රාරක්ෂණය සියුම් ලෙස පරීක්ෂාකාරීව යොදා ගන්නා අතර අවදානම් තක්සේරු රාමුව තවදුරටත් නව්‍යකරණය කරමු. ඒ තුළින් අපි ජීවිතයට ඇති අවදානම් අවම කිරීම පමණක් නොව මිහිතලය සුරක්ෂිත කිරීම හා ජීවිත රක්ෂණය සඳහා අප වෙත පැමිණෙන සියලුම දෙනාගේ සෞභාග්‍ය සහතික කරන බව අපි තහවුරු කරමු.

# 78.

# යහපාලනය සහ අවදානම් පාලනය


79 ආයතනික පාලන වාර්තාව

84 විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

86 ආයෝජන කමිටු වාර්තාව

87 අවදානම් කළමනාකරණ වාර්තාව

93 අනුකූලතා වාර්තාව

96 අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

# ආයතනික පාලන වාර්තාව

## සභාපතිතුමාගේ හැඳින්වීම

රජයට අයත් ව්‍යවසායක් ලෙස, ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් ඉක්මන් සහ කඩිසර තීරණ ගැනීමට පහසුකම් සැලකීමේ අරමුණින් ව්‍යාපාරය තුළ වගවීම, විනිවිදභාවය සහ සදාචාර කළමනාකරණය සහ සාධාරණත්වය මත ඉදිරිපත්කළ යහපත් පාලන ව්‍යවහාර යොදාගෙන ඇති අතර එයට පැහැදිලි චර්යා ධර්ම සහ ආචාර ධර්ම සංග්‍රහයන්, නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සහ ශක්තිමත් මූල්‍ය පාලනයක් ඇතුළත්ය.

ආයතනික පාලනයේ කුළුණු හතර එනම් වගකීම, වගවීම, විනිවිදභාවය සහ සාධාරණත්වය මත සමාගම මෙහෙයවන ආකාරය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හැඩය සහ හුවමාරු වටිනාකම් නියම කරයි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ 17 නියෝගය පරිදි, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ 2023 නොවැම්බර් වල සංශෝධිත "ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය - 2017" හි විධිවිධානවලට අපි අනුකූල වෙමු.

මුදල් අමාත්‍යංශය 2021 දී නිකුත්කළ රජයට අයත් ව්‍යවසාය සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සහ මෙහෙයුම් අත්පොත පිළිබඳ මාර්ගෝපදේශවල මූලධර්ම අපි වැළඳගෙන ඇත.

අපගේ ආයතනික පාලන ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් "අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන්කළ කරුණු පිළිබඳ උපලේඛනය" යොදා ගෙන ඇත. මෙය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් යටතේ පවත්නා කරුණු සහ පැවරිය යුතු කරුණු පැහැදිළිව දක්වයි. ඉන් පාර්ශ්වකරුවන්ට කරුණු පැහැදිලිතාව සඳහා සහයවන අතර උපායමාර්ගික ප්‍රමුඛතා සහ අවදානම් අඩු කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කරවයි.

සමාලෝචනය වෙමින් පවතින පසුගිය මූල්‍ය වසර තුළ, ආයතනික පාලනය කරා අපගේ ප්‍රවේශයට පහත කරුණු ඇතුළත් වේ:

සමාගම තුළ ශක්තිමත් පාලන ව්‍යවහාර පවත්වා ගැනීමට අපි කටයුතු කළෙමු. අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි විවිධ අනු කමිටු ඔවුන්ගේ ඒකාබද්ධ ප්‍රවීනතාව සමඟ, පාලනය උපායමාර්ගික මඟ පෙන්වීම අඛණ්ඩව ලබාදී ඇත. අපගේ පාලන රාමුව නගා සිටුවීම සඳහා ඔවුන් පැහැදිලි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නියම කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය කළමනාකාරිත්වයේ කාර්යසාධනය නියාමනය කිරීමට නිරතුරුව මාසයකට වරක් මුණ ගැසෙන අතර, අපි ඵලදායිව මෙහෙයවන බව සහතික කරයි. විධායක නොවන අධ්‍යක්ෂවරු සහයෝගී ප්‍රතිපෝෂණ ලබා දෙන අතර විශේෂ උපදෙස් පිරිනමයි.

අපගේ දිගුකාලීන ව්‍යාපාර සාර්ථකත්වය සඳහා ශක්තිමත් ආයතනික පාලනය අත්‍යවශ්‍ය බව අපි විශ්වාස කරමු. එබැවින්, ඉදිරි වසරවල අපගේ පාලනය වැඩි කිරීමට අපි අඛණ්ඩව කැපවී සිටින අතර පහත සඳහන් වාර්තාව තුළ ඔබට විස්තරාත්මකව දැකගත හැකි වනු ඇත



**නුසිත් කුමාරතුංග**
සභාපති

2025 ජූනි 03

# ආයතනික පාලන වාර්තාව

## පාලන රාමුව

සමාගම එහි අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු මගින් විධිමත් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, මාර්ගෝපදේශ සහ අදාළ කළමනාකරණ වාර්තාකරණය මාර්ග ඇතුළුව සිය මෙහෙයුම්වල සෑම ක්ෂේත්‍රයක් තුළම පාලන රාමුවක් පවත්වාගෙන යනු ලැබේ.




## අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

වාර්තා කරන දිනය වන විට අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් හත් (07) දෙනෙකුගෙන් සමන්විත විය. විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ අදාල ක්‍ෂෙත්‍රවල කීර්තිමත් වෘත්තිකයන් වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සමාගමේ ඵලදායී මෙහෙයුම් අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පුළුල් ව්‍යාපාරික අත්දැකීම් සපයන බවත් එක් එක් අධ්‍යක්ෂවරුන් විවිධ කුසලතා, දැනුම අත්දැකීම් රාශියකින් දායක වන බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ. රජයට අයත් ව්‍යවසායයක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන කොටස් හිමියා ලෙස රජය සහ සමාගම සහ එහි කළමනාකාරිත්වය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ථ භාරකාරත්වය සඳහා වගකීමට බැඳී සිටින අතර, පාර්ශ්වකරුවන්ට සෘජුව හා වක්‍රව නායකත්වය ලබා දේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ පාලනය සහ සැලසුම් කිරීමයි. සමාගමේ මූල්‍ය හා වාණිජ කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් තක්සේරු කරයි.

ඊට අමතරව, අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායිත්වය අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර ඇති බවට ඔවුන් සහතික වන අතර, එයට අදාළ වන්නේ මෙම මූල්‍ය ප්‍රකාශවලින් ආවරණය කරන කාලයේ සිට මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කාලසීමාවයි. සමාගමේ අභ්‍යන්තර පාලන රාමුවට ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, ක්‍රියාවලි, කාර්යයන්, සහ චර්යාවන් ඇතුළත් වේ.

## සමාගම් ලේකම්

රජයට අයත් ව්‍යවසායක සමාගම් ලේකම් සමාගමේ පාලන රාමුවේ අඛණ්ඩතාව සහතික කිරීම, උපායමාර්ගික උපදේශන සහ අනුකූලතා කාර්යයන් ඇතුළත් කිරීමට සම්ප්‍රදායික පරිපාලන රාජකාරිවලින් ඉදිරියට යාම සඳහා වගකිව යුතුය. සමාගම් ලේකම්ගේ බැඳීම් සහ වගකීම් 2007 අංක 07 දරන සමාගම් පනත හා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ විශේෂ නියෝග හා මාර්ගෝපදේශ සහ ආයතනික පාලන සංග්‍රහය මගින් මූලිකවම මෙහෙයවනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියා පටිපාටිවලට අනුකූලවීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල සහ කමිටු ක්‍රියාපටිපාටි

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සියලුම රාජකාරි ඵලදායීව මුදාහැර ඇති බව සහතික කිරීමට මාසයකට වරක් මුණ ගැසේ. ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් විශේෂ උපලේඛණගත රැස්වීම් සඳහා අවශ්‍යතාව පරිදි සහභාගීවේ. මූල්‍ය වසර තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන හා එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම පහත විස්තර කෙරේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ අනු කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රවීනතාව වැඩි කිරීමට, කාර්යක්ෂමතාව වැඩි කිරීමට, අධීක්ෂණය වර්ධනය කිරීමට, සහ අභ්‍යන්තර පාලන හා ක්‍රියාවලීන් තක්සේරු කිරීම ඇතුළුව වගවීම වැඩි කිරීමට අනුකණ්ඩායම් පිහිටුවා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ අනුකමිටු ආයතනයේ මෙහෙයුම්, උපායමාර්ගය, හා අධීක්ෂණය යන විශේෂ ක්‍ෂෙත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් ඵලදායි ආයතන පාලනය තුළ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඒවායේ මූලික වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට තමන්ට නියමිත ප්‍රඥප්ති තුළ කරුණු පිළිබඳව ගැඹුරු විශ්ලේෂණය, දැනුවත් නිර්දේශ සහ

# ආයතනික පාලන වාර්තාව

කඩිසර පාලනය ලබාදීමයි. මෙම පවරන ලද අධිකාරිය මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට සංකීර්ණ ගැටළු වඩාත් කාර්යක්ෂමව සහ පරිපූර්ණ ලෙස විසඳීමට ඉඩ සැලසෙන අතර, විගණනය සහ අනුකූලතාව, මානව සම්පත් සහ සන්නිවේදන සහ අවදානම් කළමනාකරණය වැනි තීරණාත්මක කාර්යයන් සඳහා විශේෂිත විශේෂඥතාව යොදන බව සහතික කරයි. නිසි කඩිසරකම පවත්වා ගැනීම, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම, අරමුණු වලට අනුව කාර්ය සාධනය නියාමනය කිරීම සහ ඔවුන්ගේ සොයාගැනීම් සහ නිර්දේශ නිතිපතා සම්පූර්ණයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම සඳහා අනුකමිටු වගකිව යුතුවන අතර ඒ තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ හැකියාවන් ශක්තිමත් කර, සමස්ත ආයතනයේ වගවීම සහ කාර්යසාධනය වැඩි කරයි.

මෙම කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රඥප්ති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටිවලින් පාලනය කෙරේ.

2024 වසර සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අනුකමිටුවල රැස්වීම් ඒවායේ ප්‍රඥප්තිවල දක්වා ඇති පරිදි කැඳවීමට හැකියාව නොලැබුණු අතර එයට සමාගම් නෛතිකව වෙන්කිරීමෙන් ඇති වූ නොවැලැක්විය හැකි පරිපාලන සහ ප්‍රායෝගික ප්‍රමාදයන් හේතු විය. එසේවුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය සියලුම අවශ්‍යතාවන්ට අනුකූලව සිටි අතර පහත විස්තර කර ඇති පරිදි සමාලෝචිත වසර තුළ අනුකමිටු රැස්වීම් පවත්වන ලදී.

### 01. අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව (BRMC)

මෙම කමිටුව ආයතනයේ අවදානම් කළමනාකරණ රාමුව අධීක්ෂණය කරයි. එය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම, යාවත්කිරීම, බලාත්මක කිරීම සහ නියාමනය කිරීම සඳහා වගකීමට බැඳෙන අතර අවදානම් අවම කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් අවදානම් තක්සේරුව තීරණ ගැනීම හා ඒකාබද්ධ කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අවදානම් රුචි මට්ටම් සහ පෙළ ගැසීම සිදු කරයි.

### 02 ආයෝජන කමිටුව (IC)

ආයෝජන කමිටුව අරමුණ වන්නේ අවදානම් හා නියාමන මාර්ගෝපදේශවලට දැඩිව අනුකූල වෙමින් ආයෝජන ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීමයි. ආයෝජන දැඩිව නිවාරණය කරමින්, ද්‍රවශීලතාව, ණය, මිල සහ සංකේන්ද්‍රණය වැනි විවිධ අවදානම් විශ්ලේෂණය කරමින් කාර්යක්ෂම හා ඵලදායී ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහතික කරයි.

### 03. විගණන හා අනුකූලතා කමිටුව (ACC)

මූලිකවම, විගණන කමිටුවේ කාර්යය වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාව සහතික කිරීමයි. එමෙන්ම එය සමාගම සදාචාර ප්‍රමිති, සහ අනෙකුත් සියලුම නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව මෙහෙයවන බව තහවුරු කරයි.

### 04. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (HR & Rem.Com)

SLIC ලයිෆ් (SLICLL) හි මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව ආයතනයේ මානව සම්පත් කාර්යයන් හී ඵලදායිත්වය සහතික කරයි, ක්ෂෙත්‍රයේ මනා පරිච හා දක්ෂ පදනම් පුද්ගල කේන්ද්‍රීය සංස්කෘතියක් මගින් මෙහෙයවමින්, මෙම කමිටුව බඳවාගැනීම, පුහුණුව, කාර්යසාධන කළමනාකරණය (මූලික කාර්යසාධන හා මූලික කාර්යසාධන දර්ශක) සේවක සහභාගිත්වය, වැටුප් ගෙවීම, සහ ප්‍රතිලාභ හා කාර්මික සම්බන්ධතා හා පරිපාලනය අධීක්ෂණය කරයි. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයට උපායමාර්ගික මානව සම්පත් නිර්දේශ සිදු කරයි.

මෙම කමිටුව අවම වශයෙන් සාමාජිකයින් හතර දෙනෙකුගෙන් එනම් විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු (එක් අයෙක් සභාපති ලෙස සේවය කරන), සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී, සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මානව සම්පත් යන අයගෙන් සමන්විත වේ. ප්‍රධාන මානව සම්පත් ප්‍රතිපත්ති සහ තීරණ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මාසිකව හෝ අවශ්‍ය පරිදි රැස්වීම් පවත්වනු ලැබේ. ජ්‍යෙෂ්ඨ කළමනාකරු මට්ටමට පහළින් සිටින කාර්ය මණ්ඩලය සඳහා මූල්‍යමය නොවන ප්‍රතිපත්ති වෙනස්කම්, ව්‍යුහාත්මක ගැලපීම් සහ විනය ක්‍රියාමාර්ග මෙම කමිටුව අනුමත කරන අතර ප්‍රධාන තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරයි. විනිවිදභාවය සහතික කිරීමට රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ වුවමාරු කර ගන්නා අතර කමිටුව සිය කාර්යසාධනය හා ප්‍රඥප්තිය පිළිබඳ වාර්ෂික සමාලෝචනයක් පවත්වනු ලබයි.

### 05. උපායමාර්ගික සමාලෝචන කමිටුව (SRC)

උපායමාර්ගික සමාලෝචන කමිටුව සමාගමේ උපායමාර්ගික සැලැස්ම නිර්මාණය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිර්දේශ හා මඟපෙන්වීම ලබා දෙමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. මෙයට සමාගමේ දිගුකාලීන පරමාර්ථ, ප්‍රධාන මුලපිරීම්, සහ උපායමාර්ගික දිශානතිය හා බැඳුණු අවදානම් සමාලෝචනය කිරීම ඇතුළත්ය.

### 06. ඩිජිටල් පරිනාමන කමිටුව (DTC)

ඩිජිටල් පරිනාමන කමිටුව සමාගමේ ඩිජිටල් උපායමාර්ගය සහ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය සහ සමස්ත සංවිධානය පුරා ඩිජිටල් තාක්ෂණයන් සහ ක්‍රියා පටිපාටි ඵලදායී ලෙස ඒකාබද්ධ කිරීමට පහසුකම් සපයන නව, නව්‍ය තාක්ෂණික විසඳුම් ක්‍රියාත්මක කිරීම, ඒවායේ පුළුල්ව පැතිරුණු භාවිතය සහ සාර්ථකත්වය සහතික කිරීම සඳහා උපදෙස් ලබා දේ, කමිටුව පිළිගත් තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙක් වන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් මෙහෙයවනු ලබයි.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් – 2024

2024 වර්ෂය තුළ දී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් එකොළහක් (11) පවත්වා ඇත.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| නුසිත් කුමාරතුංග මහතා 2024 ඔක්තෝබර් 23 දින සිට පත්කර ඇත | 03 |
| රොනල්ඩ් සී පෙරේරා මහතා ජනාධිපති නීතිඥ, 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 08 |
| අනිල් කොස්වත්ත මහතා, 2025 ජනවාරි 02 දින සිට ඉල්ලා අස්විය | 10 |
| නිශාන්ත දයානන්ද මහතා, 2024 දෙසැම්බර් 31 දින සිට ඉල්ලා අස්විය | 11 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා 2023 ඔක්තෝබර් 06 දින සිට පත්කර ඇත | 11 |
| ආචාර්ය කිත්සිරි මංචනායක මහතා, 2024 ඔක්තෝබර් 09 දින සිට ඉල්ලා අස්විය | 08 |
| නඩීමාල් පැල්පොල මහතා, 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 08 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, 2023 ඔක්තෝබර් 06 දින සිට පත්කර ඇත | 10 |

# ආයතනික පාලන වාර්තාව

## විගණන හා අනුකූලතා කමිටු රැස්වීම් (ACC) – 2024

2024 වර්ෂය තුළ දී විගණන හා අනුකූලතා කමිටු රැස්වීම් දෙකක් (02) පවත්වා ඇත.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| දුෂ්මන්ත තොටවත්ත මහතා, (කමිටුවේ සභාපති) | 02 |
| නිශාන්ත දයානන්ද මහතා, 2024 දෙසැම්බර් 31 දින සිට ඉල්ලා අස්විය | 02 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා | 02 |

වාර්ෂික වාර්තාවේ දිනයට, මෙම කමිටුවේ සාමාජිකයින්: දුෂ්මන්ත තොටවත්ත මහතා, (කමිටුවේ සභාපති), රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, රොහාන් ෆිලිප් බුල්ජන්ස් මහතා

## ආයෝජන කමිටු රැස්වීම් (IC) – 2024

2024 වර්ෂය තුළ දී රැස්වීම් හතක් (07) පවත්වා ඇත. විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් මෙහෙයවන ලදී.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, (කමිටුවේ සභාපති) | 07 |
| රොනල්ඩ් සී පෙරේරා මහතා ජනාධිපති නීතිඥ, 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 06 |
| ආචාර්ය කිත්සිරි මංචනායක මහතා, 2024 ඔක්තෝබර් 09 දින සිට ඉල්ලා අස්විය | 05 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා | 07 |
| නුසිත් කුමාරතුංග මහතා, 2024 ඔක්තෝබර් 23 දින සිට පත්කර ඇත | 01 |

වාර්ෂික වාර්තාවේ දිනයට, මෙම කමිටුවේ සාමාජිකයින්: රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, (කමිටුවේ සභාපති), නුසිත් කුමාරතුංග මහතා, දුෂ්මන්ත තොටවත්ත මහතා, රජීව් ධර්මේන්ද්‍ර මහතා

## අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් (BRMC)– 2024

2024 වර්ෂය තුළ දී අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (3) පවත්වා ඇත. කමිටුවට පුළුල් සාමාජිකත්වයක් ඇති අතර ඔවුන් මූල්‍ය, ආයෝජන, ආයුගණක, ප්‍රතිරක්ෂණ, අනුකූලතා, අභ්‍යන්තර විගණන, මානව සම්පත් කළමනාකරණ සහ ICT දෙපාර්තමේන්තුවල අවදානම් කළමනාකරුවන් විවිධ කණ්ඩායමක් නියෝජනය කරයි.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| නිඹමාල් පෙරේරා මහතා (කමිටුවේ සභාපති) 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 02 |
| ආචාර්ය කිත්සිරි මංචනායක මහතා, 2024 ඔක්තෝබර් 09 දින සිට ඉල්ලා අස්විය | 02 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා, (කමිටුවේ සභාපති) 2024 දෙසැම්බර් 03 පත් කර ඇත | 03 |
| නිශාන්ත දයානන්ද මහතා, 2024 දෙසැම්බර් 31 දින සිට ඉල්ලා අස්විය | 01 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, 2024 දෙසැම්බර් 13 පත් කර ඇත | 01 |

වාර්ෂික වාර්තාවේ දිනයට, මෙම කමිටුවේ සාමාජිකයින්: දුෂ්මන්ත තොටවත්ත මහතා (කමිටුවේ සභාපති), රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, රජීව් ධර්මේන්ද්‍ර මහතා

## මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් (HR & Rem.Com) – 2024

2024 වර්ෂය තුළ දී මෙම කමිටුව රැස්වීම් හතක් (07) පවත්වා ඇත.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| නිශාන්ත දයානන්ද මහතා, [කමිටුවේ සභාපති - (වි.නො.අ.)], 2024 දෙසැම්බර් 31 දින සිට ඉල්ලා අස්විය | 07 |
| රොනල්ඩ් සී පෙරේරා මහතා ජනාධිපති නීතිඥ, 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 06 |
| ආචාර්ය කිත්සිරි මංචනායක මහතා, 2024 ඔක්තෝබර් 09 දින සිට ඉල්ලා අස්විය | 06 |
| නුසිත් කුමාරතුංග මහතා, 2024 ඔක්තෝබර් 23 දින සිට පත්කර ඇත | 01 |

වාර්ෂික වාර්තාවේ දිනයට, මෙම කමිටුවේ සාමාජිකයින්: නීල්. ඩී. බී. උනන්බුව මහතා, (කමිටුවේ සභාපති), නුසිත් කුමාරතුංග මහතා, දුෂ්මන්ත තොටවත්ත මහතා

# ආයතනික පාලන වාර්තාව

## ඩිජිටල් පරිනාමන කමිටු රැස්වීම් (DTC)– 2024

2024 වර්ෂය තුළ දී එක් රැස්වීමක් පවත්වා ඇත.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| ආචාර්ය කිත්සිරි මංචනායක මහතා, 2024 ඔක්තෝබර් 09 දින සිට ඉල්ලා අස්විය | 1 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා | 1 |

වාර්ෂික වාර්තාවේ දිනයට, මෙම කමිටුවේ සාමාජිකයින්: රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, (කමිටුවේ සභාපති), දුෂ්මන්ත තොටවත්ත මහතා, රොහාන් ෆිලිප් බුල්ජන්ස් මහතා

## උපායාමාර්ගික සමාලෝචන කමිටු රැස්වීම් (SRC) – 2024

2024 වර්ෂය තුළ දී එක් රැස්වීමක් පවත්වා ඇත.

| අධ්‍යක්ෂගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| රොනල්ඩ් සී පෙරේරා මහතා ජනාධිපති නීතිඥ, 2024 ඔක්තෝබර් 08 දින සිට ඉල්ලා අස්විය | 1 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා | 1 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා | 1 |

වාර්ෂික වාර්තාවේ දිනයට, මෙම කමිටුවේ සාමාජිකයින්: දුෂ්මන්ත තොටවත්ත මහතා, (කමිටුවේ සභාපති), රජීව් ධර්මේන්ද්‍ර මහතා, නීල්. ඩී. බී. උනන්බුව මහතා, රොහාන් ෆිලිප් බුල්ජන්ස් මහතා.

## මෙහෙයුම් කළමනාකරණ කමිටු

ඉහත සඳහන් අනුකමිටුවලට අමතරව, සමූහයේ ප්‍රධාන විධායක නිලධාරීට සහයවීම පිණිස, අනෙකුත් මෙහෙයුම් කමිටුවලට විධායක කමිටුව, ප්‍රතිරක්ෂණ කමිටුව, විගණන පසු විපරම් කමිටුව, නිෂ්පාදන සංවර්ධන කමිටුව, නීති කමිටුව සහ විකුණුම් සහ අලෙවිකරණ සමාලෝචන කමිටුව ඇතුළත් වන අතර, මේ සියල්ල පාලන ව්‍යුහයේ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. සාමාජිකයින් ඔවුන්ට අදාළ ප්‍රවීන ක්ෂෙත්‍රයන්ට තෝරාගනු ලබන්නේ සමාගම තුල සිටම සහ ඔවුන්ගේ අදාල විශේෂඥතා ක්ෂෙත්‍රවලට අනුකූලවය. විධායක කමිටුව උපාය මාර්ගය, මෙහෙයුම් සැලසුම්, ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අයවැය ආදිය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ව්‍යාපාරයේ එදිනෙදා කටයුතු කළමනාකරණය කරයි. විධායක කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය හවුල්ව සමාගමේ උපායමාර්ගය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදුකරයි. කමිටුව මාසිකව සහ අවශ්‍යතාව පරිදි රැස්වේ. කමිටුවේ රැස්වීම් සමාගමේ සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී වන, කමිටුවේ සභාපති විසින් එහි විෂයපථය තුළට වැටෙන ඕනෑම කරුණක් සලකා බැලීමට ඕනෑම අවස්ථාවක කැඳවන ලැබේ.

## තොරතුරු ප්‍රවාහය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනු කමිටු රැස්වීම් වලදී දැනුවත් තීරණයක් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි වන පරිදි අවශ්‍ය තොරතුරු බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනු කමිටු රැස්වීම් වලට පෙර සවිස්තරාත්මක ලිපි ලේඛන සපයනු ලැබේ. විධායක කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින් සහ අනෙකුත් ප්‍රධාන සේවකයින් සුදුසු පරිදි නියෝජනය කරමින් රැස්වීම්වලදී සහභාගී වේ. අධ්‍යක්ෂවරුන් වශයෙන් තම රාජකාරි ඉටු කිරීමේදී සමාගමේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට බලය ඇත. ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටීන් නිරීක්ෂණය කිරීම සහතික කිරීම සහ ආයතනික පාලන කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සම්බන්ධයෙන් වගකිව යුතු සමාගම් ලේකම්ගේ සේවාවන්ට සියලුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය ඇත. සියලුම අධ්‍යක්ෂවරුන්ට ඉලෙක්ට්‍රොනික අවකාශයක් තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අදාළ අනුකමිටු පත්‍රිකා සඳහා ප්‍රවේශය ඇති අතර, ඒ මගින් අධ්‍යක්ෂවරුන්ට තොරතුරු කාලෝචිත සහ ආරක්ෂිතව ලබා දීම සහතික කරන අතරම අධ්‍යක්ෂ මණ්ඩල/කමිටු රැස්වීම්වල පාරිසරික බලපෑම අවම කරයි. සියලුම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් වාර්තා වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## මූල්‍ය වාර්තාකරණය

අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් වගකිව යුතු වේ.

# විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

විගණන සහ අනුකූලතා කමිටුව සමාගමේ මූල්‍ය තත්ත්වය නිවැරදිව නියෝජනය කරන බව සහතික කරමින් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාව අධීක්ෂණය කිරීම සඳහා මූලිකව වගකීමට බැඳී සිටී. ඊට අමතරව, මෙම කමිටුව සදාචාරාත්මක ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සමාගම ක්‍රියාත්මක වන බව සහතික කරයි. විගණන සහ අනුකූලතා කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් මෙහෙයවයනු ලබයි. සමාගම් ලේකම්වරයා රැස්වීම්වල ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි. අනුකූලතා සහ විගණන කාර්යයන් ද්විත්වයම විගණන සහ අනුකූලතා කමිටුව වෙත වාර්තා කරනු ලැබුව ද, ඒවායේ මෙහෙයුම් ස්වාධීනත්වය පැහැදිලි රාජකාරි වෙන් කිරීමක් තුළින් ආරක්ෂා කෙරේ.

විගණන හා අනුකූලතා කමිටුවට මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන්, අනුකූලතාව සහ බාහිර විගණන අධීක්ෂණය කිරීම ඇතුළුව සිය වගකීම් ඵලදායීව කරගෙන යාමට සමාගම ශක්තිමත් කරන මූල්‍යකරණය, විගණනය, සහ රක්ෂණයේ ප්‍රවීනත්වය සහිත ජ්‍යෙෂ්ඨ වෘත්තිකයින් සහය වේ.

## විෂය නිර්දේශය

SLICLL හී විගණන සහ අනුකූලතා කමිටුවේ (ACC) විෂය නිර්දේශය අධ්‍යක්ෂ මණ්ඩල විගණන සහ අනුකූලතා කමිටු ප්‍රඥප්තියේ පැහැදිලිව දක්වා ඇත. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය (2023) මගින් ඒකාබද්ධව නිකුත් කරන ලද "ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය" සහ "2021 දී නිකුත්කළ රජයට අයත් ව්‍යවසාය සමාගම් සම්බන්ධ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ" ඇතුළුව විගණන සඳහා මඟ පෙන්වන මූලධර්ම සහ මනා පරිචයන් සමඟ පෙළ ගැසේ.

ප්‍රඥප්තියේ විෂයපථයට මූල්‍ය, ගිණුම්කරණය, ප්‍රසම්පාදනය, නෛතික අනුකූලතාව සහ ආචාර ධර්ම වැනි ක්ෂෙත්‍ර හරහා සමාගමේ අනාවරණය කිරීමේ පද්ධති සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල වැඩිකළ අධීක්ෂණය ඇතුළත්ය. එය කළමනාකරණය හා අධ්‍යක්ෂ මණ්ඩලයට විසින් ස්ථාපිත ව්‍යාපාර අවදානම් කළමනාකරණය නියාමනය හා සම්බන්ධ වේ. මෙම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු අතර එහි කටයුතු පිළිබඳ නිරන්තර වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දේ.

## කමිටුවේ රැස්වීම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර තුළ, කමිටුවේ රැස්වීම් දෙකක් පවත්වන ලදී. කමිටු රැස්වීම්වල කටයුතු ප්‍රමාණවත් විස්තර සහිතව වාර්තා කරනු ලබන අතර එම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ද නිරතුරුව වාර්තා කරයි. ආරාධනය අනුව විගණකාධිපතිවරයාගේ නියෝජිතයින් මෙම රැස්වීමට සහභාගී වේ.

2024 දී රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත දක්වා ඇත:

| අධ්‍යක්ෂගේ නම | සහභාග වූ රැස්වීම් ගණන |
|---|---|
| දුෂ්මන්ත තොටවත්ත මහතා: 2024 සැප්තැම්බර් 19 දින සිට මේ දක්වා කමිටුවේ සභාපති ලෙස සේවය කර ඇත | 2 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා | 2 |
| * නිශාන්ත දයානන්ද මහතා | 2 |

* 2024 දෙසැම්බර් 31 දින සිට ඉල්ලා අස්විය.

## අභ්‍යන්තර විගණනය

විගණන කමිටුව අභ්‍යන්තර විගණන උපායමාර්ගය අනුමත කරන අතර, සිය ස්වාධීනත්වය සහතික කිරීමට සහ ඉහළ ප්‍රමිති පිළිපැදීමට අභ්‍යන්තර විගණන හා පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය නිරන්තරව තක්සේරු කර අධීක්ෂණය කරයි. දෙපාර්තමේන්තුවට සිය රාජකාරි ඵලදායීව ඉටු කිරීමට අවශ්‍ය බලය හා සම්පත් ලබා දෙන බව කමිටුව සහතික කරයි. උපලේඛනගත රැස්වීම්වලදී, අභ්‍යන්තර විගණක සැලැස්මේ ප්‍රගතිය නියාමනය කිරීමට සහ ප්‍රධාන සොයාගැනීම් ඇගයීමට අභ්‍යන්තර විගණන ප්‍රධානියාගේ වාර්තා කමිටුව සමාලෝචනය කරයි.

## බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා වශයෙන් පත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වාර්ෂික විගණනයේ දී විගණකාධිපතිවරයාට සහාය ලබා දීම සඳහා සුදුසුකම් ලත් විගණකයකු වශයෙන් Messrs BDO Partners යන සමාගම විගණකාධිපතිවරයා විසින් පත් කරන ලදී. ඊට අමතරව, බාහිර විගණක විසින් ලබාදෙන සොයා ගැනීම් සහ නිර්දේශයන්ට කළමනාකරණ ලිපිය සහ කළමනාකරණයේ ප්‍රතිචාරය කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබිය.

## විගණන හා අනුකූලතා කමිටුවට තොරතුරු ලැබීම

විගණන සහ අනුකූලතා කමිටුවට කළමනාකාරීත්වයෙන් සහ බාහිර විගණකයන්ගෙන් ප්‍රමාණවත්, විශ්වසනීය සහ කාලෝචිත තොරතුරු ලැබී ඇති බව කමිටුව සහතික වේ. මෙමගින් වගකීම් ඵලදායීව ඉටුකිරීමට විගණන සහ අනුකූලතා කමිටුව ශක්තිමත් කරයි.

## වත්කම් සහ වගකීම් තක්සේරු කිරීම සහ හානිකරණය

සාධාරණ අගය ගිණුම්කරණයේ වර්ධනීය විශ්වාසය සහ එහි සැලකියයුතු බලපෑම සලකා බලමින්, සාධාරණ අගයන් තීරණය කිරීමේ දී භාවිත කරනු ලබන වැදගත් උපකල්පන විනිවිදව අනාවරණය කරන බවත්, සම්පූර්ණයෙන් සමාලෝචනය කරන බවත් සහ අවශ්‍ය පරිදි ඒවා ප්‍රශ්න කරන බවත් විගණන කමිටුව සහතික කරයි. ඊට අමතරව, හානිකරණය තක්සේරු කිරීම සඳහා පවතින ක්‍රියාපටිපාටි සතුටුදායක බව කමිටුව තහවුරු කරයි.

## ජාත්‍යන්තර ගිණුම්කරණ වාර්තාකරණ ප්‍රමිත (IFRS) යොදා ගැනීම

විගණන කමිටුව විසින් ආයතනය තුළ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (IFRSs) යොදා ගැනීමේ ප්‍රගතිය අධීක්ෂණය කරයි. කමිටුව විසින් නිරන්තර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී මෙම ප්‍රමිත ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය සහ සංවර්ධනයන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වරින් වර දැනුවත් කිරීම් සිදු කරයි.

## ස්වාධීන බාහිර උපදෙස්

විගණන කමිටුවේ ප්‍රඥප්තිය මඟින් සුදුසු අවස්ථාවලදී ස්වාධීන බාහිර උපදෙස් ලබා ගැනීමට අවසර ලබා දී ඇත.

# විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

## අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියාට සහ අනුකූලතා අංශයේ ප්‍රධානියාට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු අවදානම් ට විගණන සහ අනුකූලතා කමිටු රැස්වීම්වලට ප්‍රවේශවීමට ඇති හැකියාව

අභ්‍යන්තර විගණන ප්‍රධානී, අනුකූලතා ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු අවදානම්ට විගණන හා අනුකූලතා කමිටුව වෙත ඍජු ප්‍රවේශයක් ඇති අතර, ඒ අනුව ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඍජුවම වගකිව යුතුය.

## විගණන නොවන සේවා

වසර තුළ, එවැනි සේවා ලබාදීම විගණකගේ ස්වාධිනත්වයට සහ විෂයමූලකත්වයට බලපෑමක් නොමැති බව සහතික කිරීමට බාහිර විගණක විසින් ලබා දෙන සියලුම විගණන නොවන සේවා කමිටුව ඇගයීමට ලක් කර ඇත.

## අනුකූලතා කාර්යය

ආයතනික අනුකූලතා කාර්යයට අනුකූලතා වැඩසටහන් මෙහෙයුම් සහ ආධාරක ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අධීක්ෂණය පවරා ඇත. අනුකූලතා ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ කළමනාකරු අවදානම් සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී එක් එක් දෙපාර්තමේන්තුවේ අනුකූලතා සම්බන්ධීකාරකවරුන්ගේ සහය ඇතිව අනුකූලතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අනුකූලතා නිලධාරි සහ විගණන සහ අනුකූලතා කමිටුව අතර වාර්තාකරණ ව්‍යූහය මගින් වසර තුළ ඇති විය හැකි සුවිශේෂී ගැටළු සහ අවදානම් ආමන්ත්‍රණය කරයි. වගකීම්සහගත නිලධාරීන් ලෙස නම්කළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සුවිශේෂී බැඳීම් සමඟ අනුකූලතාව තහවුරු කිරීම සඳහා වගවිය යුතුය.

පිරිවැය කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ අනුකූලතාව සඳහා සමාගම "ස්වාධීන ආදර්ශයක්" යොදා ගෙන ඇති අතර ශක්තිමත් ස්වාධීන අනුකූලතා කාර්යයන් පවත්වා ගනී. එක් එක් දෙපාර්තමේන්තුවේ අනුකූලතා සම්බන්ධීකාරකයින් ඵලදායී සහභාගිත්වය සහතික කිරීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටුකරයි. සමාලෝචිත වසර තුළ, ප්‍රධාන මෙහෙයුම් ක්ෂෙත්‍ර සඳහා මනා පරිචයන් යොදා ගැනීමට අනුකූලතා කාර්යය ශක්තිමත් කරන ලදී. අනුකූලතා කාර්යය අමතර බරක් ලෙස නොව සමාගමේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස දකින බව සහතික කිරීමට සමාගම අනුකූලතා සංස්කෘතිය ආයතනය පුරා පෝෂණය කර ඇත.

## අවදානම් කළමනාකරණය

අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණ කාර්යය නියාමනය කිරීමේ වගකීම වෙනම අනුකමිටුවක් වන අධ්‍යක්ෂක මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව (BRMC) වෙත වගකීම පවරා ඇත. අභ්‍යන්තර විගණන ප්‍රධානියා අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු වන අතර, ව්‍යවසාය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව 1998 දී නිකුත්කළ "බැංකු ආයතනවල අභ්‍යන්තර පාලන පද්ධති සඳහා රාමුවට" අනුකූලව සමාගමේ අභ්‍යන්තර පාලන රාමුව සමාලෝචනය කරයි. මෙහි අරමුණ වන්නේ අභ්‍යන්තර පාලන පද්ධතිය අවදානම් කළමනාකරණ රාමුවට ගැලපෙන බව සහ බාසල් රාමුවේ මූලධර්මවලට අනුකූල බව සහතික කිරීමයි. මෙම රාමුවට කළමනාකරණ අධීක්ෂණය, අවදානම තක්සේරු කිරීම, පාලන කටයුතු, රාජකාරි බෙදීම, තොරතුරු සහ සන්නිවේදනය, නියාමන කටයුතු සහ අධීක්ෂණ බලධාරීන් විසින් අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීම ඇතුළත්ය. BRMC එම පාලන පිළිබඳ නිරන්තර සමාලෝචන සිදුකරන අතර ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි මෙහි ඵලදායිත්වය සහතික කිරීමට ක්‍රියාවට නංවා ඇත.

## නිගමනය

පසුගිය වසර තුළ අභ්‍යන්තර විගණන අංශයේ සහ බාහිර විගණකයින්ගේ ඵලදායීත්වය හා ස්වාධීනත්වය සමඟ කමිටුව සෑහීමකට පත් වෙයි. එමෙන්ම, ඔවුන් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම අනුමත කරන අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන විශ්වසනීය බව සලකා බලයි. ඊට අමතරව, බාහිර විගණකයින්ගේ වාර්තාවේ අනාවරණය කළ පරිදි අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලවීම සහතික කරමින් සමාගමේ අනුකූලතා රාමුව සම්බන්ධයෙන් කමිටුව සෑහීමට පත් වේ. සමාලෝචිත වසර තුළ හඳුනාගත් අනුකූල නොවීමේ සිදුවීම් සඳහා නිවැරදි කිරීමේ සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත.



**දුෂ්මන්ත තොටවත්ත**
සභාපති – විගණන හා අනුකූලතා කමිටුව

2025 ජූනි 03

# ආයෝජන කමිටු වාර්තාව

## ආයෝජන කමිටුවේ අරමුණ

ආයෝජන කමිටුවේ අරමුණුවලට දැඩි අවදානම් සහ නියාමන පරාමිති තුළ ආයෝජන ප්‍රතිඵල ප්‍රශස්ථ කිරීම, ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ ආයෝජන කටයුතු කාර්යක්ෂම සහ කාලීනව සිදු කිරීම, සහ ක්ෂේත්‍රයේ මනා පරිචයන් පිළිපැදීම ඇතුළත් වේ.

ආයෝජන කමිටුව ක්‍රියාත්මක කිරීමට පෙර සියලු ආයෝජන නිවාරණය කරයි. ආයෝජන කමිටුව ද්‍රවශීලතා අවදානම්, ණය අවදානම්, මිල අවදානම්, සහ සංකේන්ද්‍රණ අවදානම් වැනි අවදානම්වලට නිසි අවධානය යොමු කරයි.

## ආයෝජන උපායමාර්ග

2024 දී ශ්‍රී ලංකාවේ ආර්ථික වාතාවරණය ප්‍රධාන දර්ශක කිහිපයකින් සැලකියයුතු පුනරුත්ථාපනයයක් සලකුණු කරන ලද අතර තියුණු ආර්ථික ආපදා කාලසීමාවකින් පසු සැලකියයුතු ඉහළ යාමක් පෙන්වන ලදී. දළ දේශීය නිෂ්පාදිතයේ 5%ක ප්‍රසංසනිය වර්ධනයක් ජාතියට දැකගත හැකි වූ අතර එය පසුගිය හැකිලීම්වලට මුළුමනින්ම ප්‍රතිවිරුද්ධ වේ. මූල්‍ය විනයේ ප්‍රතිඵල ලබා ගැනීම රජයේ ආදායම් වැඩිවීමේ ස්ථාවරත්වය හා IMF ඉලක්කවලින් ඔබ්බට මූලික ශේෂයේ අතිරික්තයක් සාක්ෂාත්කර ගැනීම සමග ආරම්භ විය. උපකාරී මූල්‍ය ප්‍රතිපත්ති, පොලී අනුපාතවල ක්‍රමානුකූල අඩුවීමකට හේතු වූ අතර ණය ප්‍රසාරණයේ මුල් සංඥා පෝෂණය කර ඇත. තවද, බාහිර අංශය වර්ධනීය සංචිත, වැඩිවූ ප්‍රේෂණ, සහ සංචාරක ඉපයීම් සහ ශ්‍රී ලංකා රුපියල ශක්තිමත්වීම සමඟ ශක්තිය පෙන්වන ලදී. ආර්ථික ප්‍රගතියේ මෙම කාලසීමාව ජනාධිපතිවරණය නිමවීම සමඟ එකට සිදු වූ අතර ඉන් නව පරිපාලනයක් බලයට ගෙන එන ලදී. මෙම අත්‍යවශ්‍ය සංවර්ධනයන්ට අනුගත වෙමින්, ශ්‍රී ලංකාව බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණයේ සැලකියයුතු නිමකිරීම සමඟ සිය ආර්ථික ප්‍රතිසාදන ගමන් මගේ තීරණාත්මක සන්ධිස්ථානයක් සාක්ෂාත් කර ගෙන ඇති අතර එය ඉහළ මූල්‍ය ස්ථාවරත්වයට හා අලුත්කළ ආයෝජන විශ්වාසයට මඟ පාදන ලදී. 2024 දී බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණයේ නිමකිරීම ආයෝජකයින්ට ශක්තිමත් විශ්වාසයක් ලබා දුන් අතර, රටේ ස්වෛරී ශ්‍රේණිගතකිරීම එහි පැහැර හැරීමේ තත්ත්වයේ සිට CCC+ (ෆිට්ච් ශ්‍රේණිගතකිරීම) දක්වා ඉහළ දැමීමක් සිදු විය. මෙය 2025 සිට ඉදිරියට ස්වෛරී බැඳුම්කර හිමියන්ට පොලිය සහ මුල්මුදල ගෙවීම් ආපසු ආරම්භ කිරීම සමග සිදුවනු ඇත.

ආයෝජන කමිටුවේ සාමාජිකයින්ගේ දැනුම, පලපුරුද්ද සහ ප්‍රවීනතාව SLIC ලයිෆ් සඳහා අපේක්ෂිත ආයෝජන ආදායමට වඩා ඉහළ ආදායමක් ඉපයීමට ක්‍රියාවට නංවන ලදී. ආයෝජන කමිටුව ගන්නා කඩිසර තීරණ ස්ථිර ආදායම උපකරණවල ආකර්ෂනිය ප්‍රතිඵල සහතික කිරීමට පහසුකම් සලසන ලදී. වත්කම්වල පවත්නා කාලය මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ප්‍රතිලාභ ලබා ගැනීමට දීර්ඝ කරන ලදී. ස්කන්ධ වෙළෙඳපොලේ ශක්තිමත් නැවත නැගිටීම ආයෝජන ආදායම තුළ ස්ථිර වර්ධනයට හේතු විය.

## නියාමනය සහ පාලනය

ආයෝජන කාර්යසාධනයන් නිරන්තරව නියාමනය කෙරේ. කමිටුව බාහිර සාධකවල සංවර්ධනයන් පිළිබඳ උනන්දුවෙන් සිටින අතර අවදානම් මාර්ගෝපදේශ තුළ ආයෝජන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ඒවා භාවිතා කිරීම කෙරෙහි අවධානයෙන් සිටී. ආයෝජන ඉදිරිපෙළ කාර්යාලය, මැදපෙළ කාර්යාලය සහ පසුපෙළ කාර්යාලය විසින් කාර්යක්ෂම ආයෝජන ක්‍රියාවලියට පහසුකම් සැපයීමට විචක්ෂණව සම්බන්ධීකරණය කරයි.

සමාලෝචනයට යටත් වසර - ආයෝජන කටයුතුවල සාරාංශය

2024 අවසානයේ දී දිගු කාලීන රක්ෂණ අරමුදල රු. බිලියන 213.2ක් විය.

## ආයෝජනයේ සුරක්ෂිතබව සහ ස්ථාවරත්වය

ක්‍රමානුකූල නොවන අවදානම් අවම කිරීම සඳහා කළඹ විවිධාංගීකරණය ආයෝජන කමිටුවේ ප්‍රධාන තේමාවකි.

පහත සඳහන් ප්‍රස්ථාරවලින් 2024 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන රක්ෂණ අරමුදලේ ආයෝජන වත්කම් වෙන් කිරීම පැහැදිලි කරයි. (වටිනාකම් වෙළෙඳපොළ වටිනාකම් මත පදනම් වේ)

## දිගු කාලීන රක්ෂණ අරමුදල

### අංශමය වෙන් කිරීම - ලැයිස්තුගත ස්කන්ධ ජීවිත අරමුදල




## ආයෝජන ආදායම

වර්ෂය සඳහා මුළු ආයෝජන ආදායම ජීවිත රක්ෂණය සඳහා රු. බිලියන 25.7 ක් විය. වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ ආයෝජන ආදායම ජීවිත රක්ෂණය සඳහා වන මුළු ආදායමෙන් 51% ට වැඩි ය.

## වත්කම් හා වගකීම් කළමනාකරණ ප්‍රතිෂ්ඨාවන්

ආයෝජන කමිටුව වත්කම් හා වගකීම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරයි. අරමුදලට හිතකර නොගැලපීම් සිදුවීම ප්‍රධාන අවධානයක්ව පවතී. ආයෝජන කමිටුව පොලී අනුපාත 2024 දී පහත යමින් පැවති බැවින් දිගුකාලීන වත්කම්වල ආයෝජනය කිරීමට දැනුවත්ව තීරණය කරන ලදී. ස්කන්ධය හා ස්ථිර ආදායම ආයෝජන ආදායම සඳහා යහපත් ප්‍රතිඵල ලබාදෙමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ස්ථාවර වනු ඇති බවට සහ ශක්තිමත් ප්‍රතිසාධනයක් පෙන්වනු ඇති බවට අපි අපේක්ෂා කරමු.

ආයෝජන කමිටුව ඉදිරි වසරවල ඉහළම මට්ටමේ සාක්ෂාත් කර ගැනීම් ලබාගැනීමට උත්සාහ කරනු ඇත.



**රවීන්ද්‍ර පත්මප්‍රිය**
සභාපති – ආයෝජන කමිටුව

2025 ජූනි 03

# අවදානම් කළමනාකරණ වාර්තාව

## හැඳින්වීම

SLICLL හි මෙහෙයුම් 2024 පෙබරවාරි ආරම්භ කිරීමේදී, කළමනාකරණය විසින් සරල මූල්‍ය අධීක්ෂණයෙන් ඔබ්බට යන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් පවත්වා ගැනීමේ වැදගත්කම අවධාරණය කරන ලදී. ඒ අනුව SLICLL විසින් අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කර ඇති අතර, ඒ තුළින් දත්ත ආරක්ෂාව, තොරතුරු තාක්ෂණය, තෙවන පාර්ශවීය සබඳතා, පාලන අවදානම, අනුකූලතා අවදානම සහ දේශගුණික විපර්යාස ඇතුළු පුළුල් පරාසයක අවදානම් ක්ෂෙත්‍ර ආමන්ත්‍රණය කරයි. දිගුකාලීන වටිනාකම් නිර්මාණය වැඩි දියුණු කරමින් එහි උපායමාර්ගික, මෙහෙයුම් සහ ව්‍යාපාරික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට සක්‍රිය අවදානම් කළමනාකරණය මුල්වන බව ආයතනය සලකයි. මෙය සාක්ෂාත් කරගැනීම සඳහා, SLICLL විසින් ISO 31000 අවදානම් රාමුවට අනුකූලවන ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් සංවර්ධනය කර ඇති අතර, එය එහි මූලික ව්‍යාපාර හා උපායමාර්ගික අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම හා අවම කිරීම සඳහා උපකාරි වේ.




තක්සේරු අදියර තුළ, අවදානම සිදුවීමේ විභවතාව/හැකියාව සහ බලපෑම සමස්ථ අවදානම් වර්ගය තීරණය කිරීමට තක්සේරු කරනු ලැබේ. අවදානම සිදුවීමේ හැකියාව සහ එහි විභව බලපෑම සමස්ථ අවදානම් මට්ටමට අදාළ වන ආකාරය පෙන්වන අවදානම් අනුකෘතියක් භාවිතයෙන් මෙය විස්තර කළ හැකිය.

## අවදානම් පාලනය

SLICLL හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණය අධීක්ෂණයේදී අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ අනු කමිටුවේ සහය ලැබේ. අවදානම් කළමනාකරණය SLICLL හි ආයතනික උපායමාර්ගයේ අත්‍යවශ්‍ය කොටසක් බව සහතික කිරීමේදී මෙම අනු කමිටුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙම අනු කමිටුවේ වගකීම්වලට අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි SLICLL හි උපායමාර්ගය සහ අවදානම් රුචිය සහ දරා ගැනීම සමඟ පෙළ ගැසී ඇති බව සහතික කිරීම ඇතුළත්ය. අවදානම් කළමනාකරණ අනු කමිටුවට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලය විගණන සහ අනුකූලතා කමිටුව සහ ආයෝජන කමිටුව ඇතුළුව විශේෂ ක්ෂෙත්‍රවල අවදානම් අධීක්ෂණය ක්‍රියාත්මක කිරීමේදී සහයවීම සඳහා වෙනත් අනු කමිටු පත් කර ඇත.

## පාලන ව්‍යූහය

පහත දක්වා ඇති පරිදි වෙනස් සහ පැහැදිලිව හඳුනාගත් ව්‍යාපාර මාර්ග හතරක් පවත්නා අවස්ථාවල අවදානම් කළමනාකරණය ශක්තිමත් අදියරයක පවති:

- අ පළමු ආරක්ෂක මාර්ගය ලෙස “සැබෑ අවදානම් හිමිකරුවන් විසින් මෙහෙයුම් කළමනාකරණය” (අවදානම හිමි සහ කළමනාකරණය කරන)
- ආ දෙවන ආරක්ෂක මාර්ගය ලෙස “මූල්‍ය පාලනය, අවදානම් පාලනයන්, සහ අනුකූලතාව” (අවදානම අධීක්ෂණය)
- ඇ තෙවැනි ආරක්ෂක මාර්ගය ලෙස “අභ්‍යන්තර විගණනය” (ස්වාධීන සහතිකය)
- ඈ සිව්වන ආරක්ෂක මාර්ගය ලෙස “බාහිර විගණනකවරු සහ නියාමකයින්” (විධිමත් සන්නිවේදනය)

සිව්වන ආරක්ෂක මාර්ග සම්බන්ධය අභ්‍යන්තර විගණනකවරු, බාහිර විගණකවරු සහ අධීක්ෂකයින් අතර සමීප මැදිහත්වීමක් ඇති කරයි. රක්ෂණ ක්ෂෙත්‍රයේ ප්‍රධාන නියාමක ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වේ.

විගණන කමිටුවට වාර්තා කිරීම මඟින් ස්වාධීනත්වය සහතික කරන අතර අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කිරීම මගින් අවදානම් න්‍යාය පත්‍රය විගණන න්‍යාය පත්‍රයට යටත් නොවන බව සහතික කරයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව




## අභ්‍යන්තර පාලන රාමුවේ අවදානම් තක්සේරුව

සමාගම ඵලදායී අවදානම් කළමනාකරණ ව්‍යවහාර ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව ප්‍රවර්ධනය කරමින් සහය වී ඇත. මෙම අරමුණ අත්කර ගැනීම සඳහා, සමාගම අභ්‍යන්තර පාලන රාමුවක් යොදා ගෙන ඇති අතර එය බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුවේ මූලධර්ම 13 අනුගමනය කරයි.

## නුබුන්වත් තත්ත්වය

SLICLL හි ශක්තිමත් අවදානම් කළමනාකරණ පදනම් 2024 දී අවදානම් කළමනාකරණය සඳහා ශක්තිමත් අවකාශයක් ලබා දී ඇත. SLICLL විසින් 2024 දී අවශ්‍ය මට්ටමට වඩා ඉහළින් අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය අඛණ්ඩව පවත්වා ගෙන ඇත. ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 2023 මූල්‍ය වසර තුළ පැවති 425%ට සාපේක්ෂව 2024 මූල්‍ය වසරේ 565%ක් විය.

## වර්තමාන ආර්ථික අංගවල බලපෑම

වර්තමාන ආර්ථික අංග රක්ෂණ ව්‍යාපාරය කෙරෙහි ප්‍රධාන බලපෑමක් ඇති කර ඇත. එමනිසා, සෑම අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවකදීම ශීර්ෂ උද්ධමනය, ආහාර උද්ධමනය, රුපියාවේ වෙනස්වීම්, මූල්‍ය ප්‍රතිපත්තිය, වෙළෙඳපොල පොළී අනුපාත සහ රජයේ සුරැකුම්පත් මත ඉපයීම, මූල්‍ය හිඟය, රජයේ ණය සහ ණය සේවා ගෙවීම්, රුපියල අවප්‍රමාණය සහ ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට අනුව අවප්‍රමාණය, සංචාරක ඉපයීම්, සේවක ප්‍රේෂණ, සහ වෙනත් එවැනි අංග කෙරෙහි විශේෂ අවධානයක් සමඟ, වර්තමාන ආර්ථික අංගවල බලපෑම සාකච්ඡා කර ඇත. තවද, අවදානම් කළමනාකරණ දෘෂ්ටිකෝණයකින්, අපි ප්‍රධාන ක්ෂෙත්‍ර එනම් මූල්‍ය, ආයෝජනය, ජීවිත, අනුකූලතාව, සහ වෙනත් අංශ සමඟ එවැනි අවදානම් අංග ආමන්ත්‍රණය කිරීමට උපායමාර්ග සකස් කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කරන්නෙමු. අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව මූල්‍ය ප්‍රතිපත්තිය සහ මූල්‍ය කොන්දේසිවල ක්‍රමික ලිහිල්වීම සහ ශ්‍රී ලංකා ආර්ථික වර්ධනයට සහයවීමට බාහිර අංශය තුළ උන්නතිය මඟින් සහයවී ආර්ථිකයේ පුනරුත්ථාපනය සලකා ලබයි.

# අවදානම් කලමනාකරණ වාර්තාව

## ජීවිත රක්ෂණ අවදානම

ජීවිත රක්ෂණය හා සම්බන්ධ බොහෝ අවදානම් ඇත. ඊට පහත දේ ඇතුළත්ය:

| අවදානම් වර්ගය | විස්තරය | අවදානම් රුචිය |
|---|---|---|
| මරණීය අවදානම | ජීවිත රක්‍ෂණ ඔප්පු ලබාගෙන ඇති සැබෑ ඔප්පු හිමියාගේ මරණ අවදානම අපේක්‍ෂිත ප්‍රමාණයට වඩා වැඩිවන අවදානම. | අඩු අවදානමකි |
| දීර්ඝායුෂ අවදානම | වාර්ෂිකලාභීන් බලාපොරොත්තු වූවාට වඩා දිගු කාලයක් ජීවත් වීමේ අවදානම. | අඩු අවදානමකි |
| රෝගාබාධ අවදානම | සැබෑ රක්ෂණ ඔප්පුහිමියන්ගේ සෞඛ්‍යය/අහඹු සම්බන්ධ හිමිකම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩිවන අවදානම | අඩු අවදානමකි |
| ඔප්පුහිමියන්ගේ හැසිරීමේ අවදානම | දායක මුදල් අත්හිටවීම සහ අඩුකිරීම හෝ ගිවිසුම කල් පිරීමට පෙර ප්‍රතිලාභ ආපසු ගැනීම ඔප්පු හිමියාගේ හැසිරීම අපේක්‍ෂිත ප්‍රමාණයට වඩා නරක අතට හැරීමේ අවදානම. දුර්වල අනවර්ත අනුපාත, අනාගත ස්ථාවර වියදම් දැරීමට පොත්වල රක්‍ෂණ ඔප්පු ඉතා අඩු ප්‍රමාණයක් පැවතීමට සහ ලේඛණගත ව්‍යාපාර වලට විලම්භිත අත්කර ගැනීමේ වියදම් අයකර ගැනීමට ඇති හැකියාව මත සැබැවින්ම බලපාන එම ව්‍යාපාරවලින් ලැබෙන අනාගත ධනාත්මක මුදල් ප්‍රවාහ අඩු කිරීමට මුල්විය හැකිය | අඩු අවදානමකි |
| වියදම් අවදානම | රක්‍ෂණ ඔප්පු අත්කර ගැනීමේදී සහ පරිපාලනය කිරීමේදී කරනු ලබන වියදම් අපේක්‍ෂිත ප්‍රමාණයට වඩා වැඩිවීමේ අවදානම | අඩු අවදානමකි |

නිසි පරිදි පාලනය හා කළමනාකරණය නොකළහොත් සමාගමේ මෙහෙයුම්වලට බලපෑ හැකි ඉහත සඳහන් අවදානම් ඇගයීම සඳහා සමාගම විසින් ක්‍රියාපරිපාටි සහ ක්‍රියාවලි ස්ථාපනය කර ඇත. මෙම ක්‍රියාපරිපාටි නිෂ්පාදන සංවර්ධනය කිරීමේ සිට ප්‍රතිලාභ පරිපාලනය දක්වා සියලුම තීරණාත්මක අදියර ආවරණය කරමින් සකස් කර ඇත.

ඊට අමතරව, සියලුම ජීවිත මූල්‍ය ප්‍රවාහ ආදර්ශ අනුව සකස් කරනු ලබන අතර නිෂ්පාදන සැලසුම සහ මිල නියම කිරීමේ අවදානම අඩු කිරීම සඳහා ආයුගණක විසින් ලාභ පරීක්‍ෂාවක් සිදුකරනු ලබයි. එමෙන්ම, SLICLL ලබාගතහැකිනම්, ඇතැම් වගකීම්වලට (ALM) අනුබලදීම සඳහා ගැලපුම් උපකරණ භාවිතා කරන ලබයි.

අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන (RBC) රාමුව යටතේ, SLICLL විසින් "දළ වාරික තක්සේරුකරණ" යාන්ත්‍රණය (GPV) යොදා ගෙන ඇත. වෙළෙඳපොළ ස්ථාවර ආකාරයකින් වගකීම් ගණනය කරනු ලබන වගකීම් තක්සේරුකරණ අරමුණු සඳහා මෙය අවශ්‍ය වේ. මෙයින් අදහස් වන්නේ දළ වාරික තක්සේරුකරණ යාන්ත්‍රණය පදනම් වී ඇත්තේ මරණ, රෝගාබාධ, වියදම්, අවලංගු වීම් යනාදිය සඳහා වන පැහැදිලි ඇස්තමේන්තු මත වන අතර අවදානම් රහිත පොලී අනුපාත ව්‍යුහය මෙහිදී වට්ටම් අරමුණු සඳහා යොදා ගනී. අනාගත අපේක්ෂිත මට්ටමේ ප්‍රසාද දීමනා සඳහා වගකීම් පැහැදිළි ආන්තිකයක්ද දරන අතර එය මුළු ප්‍රතිලාභ වගකීම (TBL) ලෙසින් හඳුන්වනු ලබයි. එහෙයින් අනාගත ප්‍රසාද දීමනා හොඳම ඇස්තමේන්තු උපකල්පන යටතේ සුරක්‍ෂිත කරනු ලබයි. කලින් කලට සිදුකරනු ලබන අභ්‍යන්තර අත්දැකීම් අධ්‍යයන මත පදනම්ව වගකීම ඇගයීම සඳහා හොඳම ඇස්තමේන්තු උපකල්පන සකස් කිරීමෙහි ලා SLICLL දිරිමත් කරනු ලැබ ඇත. මෙය SLICLL වෙත වසර ගණනාවක් පුරා ඔප්පුහිමිකරු වගකීම් ස්ථාවර අකාරයකට කළමනාකරණය කර ගැනීමට හැකියාව සලසා ඇත.

මීට අමතරව, මුළු ප්‍රතිලාභ වගකීම ගණනය කිරීම සඳහා සලකා බලනු ලබන හොඳම ඇස්තමේන්තුගත පරාමිතීන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුව අවදානම් ආන්තිකය (RM) යෙදීම ලෙසින් තවදුරටත් අවධාරණය කරනු ලබන අතර මුළු ප්‍රතිලාභ වගකීම හි හොඳම ඇස්තමේන්තු වලින් අහිතකර අපගමනය සඳහා ආන්තිකයක් සමඟ ගණනය කෙරේ. අවදානම් ආන්තිකය භාවිතා කිරීම මගින් ඔප්පු වගකීම්වල සංඛ්‍යාත්මක විශ්වාසය ඉහළ දමනු ලබන අතර එමගින් ඔප්පුහිමියන්ගේ ප්‍රතිලාභ සඳහා සපයන ආරක්ෂාව වැඩි වී ඔප්පු වගකීම් වැඩි වනු ඇත. SLICLL විසින් භාවිතා කරන අවදානම් කළමනාකරණය අවදානම් පාදක ගණනය කිරීමේ රාමුවෙහි නිශ්චය කර ඇති සාධක සමග අනුගතවන වන අතර එය වගකීම් ගණනය කිරීම යටතේ පැවතිය හැකි පාදක බෙදාහැරීම සම්බන්ධයෙන් සංඛ්‍යාත්මකව 75% ක විශ්වාස අන්තරයක් නියෝජනය කරයි.

එබැවින්, ජීවිත රක්‍ෂණ ගිවිසුමේ වගකීම් නිශ්චය කිරීමේදී යොදා ගනු ලබන ප්‍රධාන උපකල්පන පහත වගුගත කර ඇත:

| උපකල්පනය | විස්තරය |
|---|---|
| මරණ අනුපාතය | හොඳම නිමාන අත්දැකීම් අනුපාතයට ඉඩදීමට වාර්ෂික නොවන ව්‍යාපාර සඳහා වයස 67-70 කාණ්ඩ වලට වෙන්කරන ලදී - වාර්ෂිකයන්ගේ මරණ අනුපාතය ආසන්න වශයෙන් 1%කින් වර්ධනය කිරීමට ඉඩදීම සඳහා වයස වසරකින් අවහිර කිරීමෙන් පිරිමියෙකුගේ (90) ක බර තබන ලද සාමාන්‍යය සහ ගැහැණියකගේ (90)ක බර තබන ලද සාමාන්‍යයක් පවතී |
| වියදම් | සමාගමේ සහභාගි සහ සහභාගි නොවන ව්‍යාපාරවලට බෙදන ලද 2024 අභ්‍යන්තර වියදම් අධ්‍යයන සහ වියදම් මත පදනම් වේ. |
| අවලංගුවීම්/පවාරණ | 2024 දෙසැම්බර් 31 සඳහා පවත්වන ලද අත්දැකිම් අධ්‍යයනය මත පදනම්ව, පසුගිය විමර්ෂණ වසර තුන සඳහා අත්දැකිම ආවණය වන ඇගයීම |
| රෝගාතුරවීම | සමාගමේ අභ්‍යන්තර පළපුරුද්ද සහ අපේක්ෂිත විශ්ලේෂණය සහ සැබෑ ගණන මත පදනම් වේ. අපේක්ෂිත අනුපාත ප්‍රතිරක්ෂණ අනුපාත වගුව මත පදනම් වේ |
| ප්‍රතිරක්ෂණය | ප්‍රතිරක්ෂණය සම්බන්ධයෙන් සමාගමේ අභ්‍යන්තර පළපුරුදු අධ්‍යයන මත පදනම් වේ |
| ආයෝජන ප්‍රතිඵල | 2024 දෙසැම්බර් 31ට ශ්‍රී ලංකා රක්‍ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් යෝජිත අවදානම් රහිත අනුපාත ව්‍යුහය |

# අවදානම් කලමනාකරණ වාර්තාව

## අවදානම් රහිත අනුපාතය




SLICLL එහි ජීවිත රක්‍ෂණ ව්‍යාපාරය සඳහා 2024 වර්ෂය පුරා ස්ථාවර සහ ශක්තිමත් නුඹුන්වත් අනුපාතයක් පවත්වාගෙන ගිය අතර 2024.12.31 දිනට අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 565% වන අතර, එය 2023.12.31 දිනට 425% ක් විය. මෙය අවම නියාමන අවශ්‍යතාවයක් වන 120%ට වඩා ඉහළ අගයක් ගනී.

## ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය




### ජීවිත රක්ෂණ අවදානම සඳහා සංවේදිතා විශ්ලේෂණ

| උපකල්පනය | උපකල්පනයේ වෙනස | හොඳම ඇස්තමේන්තු වගකීමේ බලපෑම (රු. මිලියන) |
|---|---|---|
| මරණ අනුපාතය | +10% | 886 |
| | -10% | (890) |
| වියදම | +10% | 2,638 |
| පැවැත්ම | +20% | (2,265) |
| | -20% | 2,002 |
| වට්ටම් අනුපාතය | අවදානම පදනම් ප්‍රාග්ධනය යටතේ ඉහළ කම්පන වාතාවරණය | (21,023) |
| | අවදානම පදනම් ප්‍රාග්ධනය යටතේ පහළ කම්පන වාතාවරණය | 27,595 |

### නිෂ්පාදන කාණ්ඩය මත පදනම් වී රක්ෂණ ඔප්පු වගකීම වෙන් කිරීම

| 2023 දෙසැම්බර් 31 දිනට | රක්ෂණ වගකීම් (ලාභ සහිත) රු. '000 | රක්ෂණ වගකීම් (ලාභ රහිත) රු. '000 | Total Benefit Liabilities Rs. '000 |
|---|---|---|---|
| පූර්ණ ජීවිත | 15,753 | 4,010 | 19,763 |
| දායාද රක්ෂණය | 95,304,980 | 7,884,963 | 103,189,943 |
| කාල රක්ෂණය | – | 2,919,583 | 2,919,583 |
| වාර්ෂික | 16,752,827 | 4,046,401 | 20,799,227 |
| රයිඩර් ප්‍රතිලාභ | 90,329 | 3,713,075 | 3,803,404 |
| එකතුව | 112,163,889 | 18,568,031 | 130,731,920 |

පහත දැක්වෙන වගුවෙන් සමාගමේ සහභාගිත්ව සහ සහභාගී නොවන අරමුදල් තත්ත්වය පෙන්නුම් කරයි.

| | සහභාගිත්ව රු. '000 | සහභාගිත්ව නොවන රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|
| 2024 | 194,546,922 | 18,681,308 | 213,228,229 |
| ප්‍රතිශතය | 91.24% | 8.76% | |

## ආයෝජන අවදානම් කළමනාකරණය

රට ආර්ථික අර්බුදයෙන් අඛණ්ඩව යථාතත්වයට පත් වෙමින් තිබූ බැවින්, එළදා වක්‍රය අඛණ්ඩව පහළට බැස යන විට ප්‍රතිආයෝජන අවදානම කළමනාකරණය කිරීම ආයෝජන කමිටුවේ අවධානය යොමු විය. 2024 දී බාහිර ණය ප්‍රතිව්‍යහගතකරණය සහ ප්‍රධාන මට්ටමේ මැතිවරණ දෙකක් පැවතීම විභව වෙළෙඳපොල වෙනස්වන සිදුවීම් දෙකක් ලෙස හඳුනා ගන්නා ලදී. වෙළෙඳපොල වෙනස්වනු ඇතැයි අපේක්ෂා කළ බැවින්, ආයෝජන කමිටුව දැරියහැකි අවදානම් පරිමිති තුළ ආයෝජනය මත ප්‍රතිලාභ උපරිම කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ආර්ථික ස්ථාවර ඇති වී බැවින්, වසරේ දෙවන අර්ධය තුළ යහපත් වර්ධනය පෙන්වා ඇති බැවින්, ආර්ථිකයේ දිශානතිය පිළිබඳ පැහැදිලිතාවක් තිබුණි.

ආයෝජන කමිටුව වඩා දිගුකාලයක් පුරා ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස දිගුකාලීනව කල්පිරීමේ ණය උපකරණවල ආයෝජනය කරමින් වත්කම්වල කාලයදීර්ඝ කිරීම කෙරෙහි දැනුවත්ව අවධානය යොමුකර ඇත. එබැවින්, වෙළෙඳපොල තුළ පොලී අනුපාත පහත වැටීමේදී ස්ථිර ආදායම් කළඹ පරමාදර්ශීව තබා ඇත. කමිටුව ස්කන්ධ කවුළුවල තබා ගැනීමට හෝ තවදුරටත් ආයෝජනය කිරීමට

## අවදානම් කළමනාකරණ වාර්තාව

තීරණය කරන ලද අතර, වෙළෙඳපොළ යථා තත්ත්වයට පත්වීමත් සමඟ එය ඉහළ යාමේ විභවයක් තිබුණි. ආයෝජන අවදානම් කළමනාකරණය අඛණ්ඩව සිදු කරන ලද අතර උපරිම සැලකිල්ල සහ විචක්ෂණභාවය ක්‍රියාත්මක කරන ලදී.

ක්‍රමානුකූල නොවන අවදානම් අවම කිරීම සඳහා ආයෝජන කළඹ අඛණ්ඩව විවිධාංගීකරණය කරමින් පැවතුණි. ද්‍රවශීලතාව, ණය, සංකේන්ද්‍රණය සහ ප්‍රතිආයෝජන අවදානම්වලට ආයෝජන කම්ටුවේ විධිමත් සලකා බැලීම ලැබී තිබුණි.

ආයෝජන තීරණ ගැනීම ඉක්මන් සහ කාර්යක්ෂමව අඛණ්ඩව පවතින බැවින් ආයෝජන ආදායම ඉහළ අගයන් වාර්තා කළේය. අවදානම් කළමනාකරණ මූලධර්ම සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අදාළ මාර්ගෝපදේශවලට දැඩි අනුකූලතාව නියාමන අවදානම් අවම කිරීමට සහය විය.

### වෙළෙඳපොළ අවදානම

#### පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු පොලී අනුපාත වෙනස්වීම් හෝ ඵලදා වක්‍රයේ හැඩය ආයෝජනයක වටිනාකම හෝ මූල්‍ය තත්ත්වයක් කෙරෙහි ඍණාත්මකව බලපෑමයි. එය විශේෂයන්ම බැඳුම්කර සහ වෙනත් ස්ථිර ආදායම් සුරැකුම්පත් සඳහා අදාළ වේ. නමුත් ණය, ඉතුරුම්, සහ යම් ප්‍රමාණයකින් කොටස්වලට පවා බලපෑම් කළ හැකිය. හැකි අවස්ථාවලදී, පහත වැටෙන පොලී අනුපාත සහ වගකීම්වල දිගුකාලීන ස්වභාවය සැලකිල්ලට ගනිමින් ආයෝජන කම්ටුව දිගුකාලීන වත්කම්වල දැනුවත්ව ආයෝජනය කළේය.

#### ප්‍රතිආයෝජන අවදානම

ප්‍රතිආයෝජන අවදානම යනු අනාගත මුදල් ප්‍රවාහයන්, බැඳුම්කරයකින් ලැබෙන කූපන් ගෙවීම් හෝ ප්‍රධාන ආපසු ගෙවීම් වැනි, මුල් ආයෝජනයට වඩා අඩු පොලී අනුපාතයකට නැවත ආයෝජනය කිරීමට සිදුවීමේ අවදානමයි, වසර තුළ පොලී අනුපාත පහත වැටුන බැවින් හා දැකියහැකි අනාගතයක් තුළ අඩු මට්ටම්වල පවතින බැවින්, ප්‍රතිආයෝජන අවදානම ඉහළින් පැවතුණි.

#### විනිමය අනුපාත අවදානම

මුදල් අවදානම හෝ විදේශ විනිමය අවදානම ලෙස ප්‍රසිද්ධ විනිමය අනුපාත අවදානම යනු විදේශ විනිමය හුවමාරුව තුළ වෙනස්වීම ආයෝජනයක, වත්කමක, හෝ වගකීමක වටිනාකම කෙරෙහි ඍණාත්මකව බලපෑමේ අවදානමයි.

2024 තුළ, එක්සත් ජනපද ඩොලරය ශ්‍රී ලංකාවේ රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය විය. 2025 වසර තුලදී එක්සත් ජනපද ඩොලරය ස්ථාවරව පවතින බවට ශ්‍රී ලංකා ආර්ථිකය යථාතත්වයට පත්වීම. විදේශීය ආයෝජන හා විදේශීය සංචාරකයින් තුලින් ආදායම ඉහළ යාම සහ වාහන ආනයනය ඉහළ යාම අපේක්ෂා කරයි.

#### කොටස් අවදානම

කොටස් අවදානම යනු ස්කන්ධවල වටිනාකම පහතට යන බැවින් මුදල් අහිමිවීමේ අවදානමයි.

පූර්ව මැතිවරණ අවිනිශ්චිතතා තිරවුල් වී ඇති බැවින් හා ආර්ථිකය ප්‍රතිසාධන ගමන්මගට ඇතුළත් වී ඇති බැවින්, ශ්‍රී ලංකාවේ දර්ශක සැලකියයුතු ලාභ වාර්තා කර ඇත.

SLICLL පහත දක්වා ඇති පරිදි විවිධාංගීකරණය තුළින් ක්‍රමානුකූල නොවන අවදානම් අඩුකර තිබුනද, ස්කන්ධ ආවේනිකව ක්‍රමානුකූල අවදානමට නිරාවරණය වන අතර එය සමස්ත වෙළෙඳපොලට ආවේනික අවිනිශ්චිතතාවය වේ.

**අංශමය වෙන් කිරීම**
**ලැයිස්තුගත ජීවිත අරමුදල**




#### ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මිල කෙරෙහි ඉක්මන් සැලකියයුතු බලපෑමක් නොමැතිව යම් වත්කමක් විකිණීමට හෝ මිලදී ගැනීමට හැකියාවක් නොමැති වීමේ අවදානමයි.

SLICLL හි වත්කම් සමූහයේ කොටසක් භාණ්ඩාගාර බිල්පත් වැනි ඉහළ ද්‍රවශීල වත්කම්වල ආයෝජනය කර ඇත.

**කල්පිරීමේ පැතිකඩ**
2024 දෙසැම්බර් 31 දිනට ජීවිත අරමුදල




#### ණය අවදානම

ණය අවදානම යනු පොලීයක් හෝ මුල් මුදලක් ගෙවීමට බැඳීම ඇතිවන අවස්ථාවේදී ණය ආපසු ගෙවීමක් මත ණයකරු පැහැර හැරීමේ අවදානමයි. දැඩිව අභ්‍යන්තරව සංවර්ධනය කළ ණය ශ්‍රේණිගත නිර්ණායක SLICLL හි ආයෝජනය පාලනය කරයි.

#### සංකේන්ද්‍රණ අවදානම

සංකේන්ද්‍රණ අවදානම යනු තනි ආයෝජනයක්, ක්ෂේත්‍රයක්, ණයකරුවෙක් හෝ භූගෝලීය ප්‍රදේශයක් කරා වඩා වැඩි නිරාවරණය හේතුවෙන් අලාභ ඇති වීමේ අවදානමයි. සංකේන්ද්‍රණ අවදානම අවම කිරීම පිණිස ආයෝජන ප්‍රමාණවත් ලෙස කණ්ඩනය කර ඇති බව ආයෝජන කම්ටුව සහතික කරයි.

#### මෙහෙයුම් අවදානම

මානව දෝෂ සහ වංචා කටයුතු ඇතුළු වියහැකි ආයතනයේ මෙහෙයුම් ක්‍රියා පටිපාටිවල අඩුපාඩු හේතුවෙන් මූල්‍ය අලාභ දැරීමේ අවදානම මෙහෙයුම් අවදානම යන්නෙන් අදහස් වේ. මෙහෙයුම් අවදානම අවම කිරීම සඳහා, රාජකාරි වෙන් කිරීම, ද්විත්ව පාලනය, දැඩි ප්‍රතිපත්ති සහ අත්පොත් සමඟ නිතිපතා විගණනය වැනි ක්‍රියාමාර්ග ආයතනය ක්‍රියාත්මක කරයි.

#### තොරතුරු තාක්ෂණ සන්නිවේදන අවදානම් කළමනාකරණය

තොරතුරු තාක්ෂණ සන්නිවේදන අවදානම් කළමනාකරණය තොරතුරු තාක්ෂණ පද්ධති සහ ක්‍රියාවලි හා බැඳුණු අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ අවම කිරීම හා සම්බන්ධවේ. මූල්‍ය හා පුද්ගල දත්තවල සහ ගනුදෙනුවල තීරණාත්මක ස්වභාවය සලකා බලමින්, තොරතුරු තාක්ෂණය තුළ ඵලදායී අවදානම්

# අවදානම් කළමනාකරණ වාර්තාව

කළමනාකරණය දත්තවල අඛණ්ඩතාව, විශ්වාසනීයත්වය, ලබාගතහැකිවීම, සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූලතාව සහතික කිරීමට තීරණාත්මක වේ. අපි වෙනස්වන තර්ජන, තාක්ෂණයන්, සහ ව්‍යාපාර අවශ්‍යතා මත පදනම්ව නිරන්තරයෙන් අවදානම් කළමනාකරණ උපායමාර්ග, ප්‍රතිපත්ති, සහ පාලනයන් සමාලෝචනය කර යාවත් කරමු.

ගනුදෙනුකාර විශ්වාසය සුරක්ෂිත කිරීමේදී සහ අපගේ මෙහෙයුම්වල අඛණ්ඩතාව පවත්වාගෙන යාමේදී අපගේ අඛණ්ඩ කැපවීමේ කොටසක් ලෙස, අපගේ තොරතුරු ආරක්ෂණ රාමුව සහ තාක්ෂණයින් හි අපි ආයෝජනය කර එය ශක්තිමත් කර ඇත. රක්ෂණ ක්ෂේත්‍රය තුළ ඩිජිටල් පරිනාමනයේ ඉහළයාම සංවේදී ගනුදෙනුකාර දත්ත, මූල්‍ය වාර්තා, හිමිකම ඇති ව්‍යාපාරික තොරතුරු මතුවන සයිබර් තර්ජනවලින් ආරක්ෂා කර ගැනීමට අපට ඇති වගකීම වැඩි කර ඇත. වාර්තාකරණ වසර තුළ, අපගේ සයිබර් ආරක්ෂක ව්‍යායාමය වැඩි කිරීමට හා අවදානම් අවම කිරීමට අපි මූලික පියවර රාශියක් ගෙන ඇත.

### තොරතුරු ආරක්ෂණ රාමුව හා දත්තවල රහස්‍යතාව

SLICLL සිය අවදානම-පදනම්, අනුවර්තක හා ආරක්ෂක ආකල්පයක් කරා සිය බැඳීම ශක්තිමත් කරමින් ISO/IEC 27001:2022 තොරතුරු ආරක්ෂණ කළමනාකරණ ක්‍රමයට (ISMS) සාර්ථකව සංක්‍රමණය විය. දත්ත ආරක්ෂාව, මේඝ පරිසනක මෙහෙයුම් සහ මතුවන තර්ජන කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානය සමඟ අපගේ පවත්නා තොරතුරු ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමේදී මෙය වැදගත් සන්ධිස්ථානයක් සලකුණු කරයි. දේශීය නියාමන අවශ්‍යතා සපුරාලීමට හා විශ්වාසනීයත්වය, අඛණ්ඩතාව සහ ගනුදෙනුකරුවන්ගේ තොරතුරු ලබාගැනීම සහතික කිරීමට, SLICLL දත්ත රහස්‍යතා බැඳීම් සමඟ පෙළ ගැසීමට හා සිය මෙහෙයුම්වලට ක්ෂේත්‍රයේ මනා පරිචයන් ඇතුළත් කිරීමට උපායමාර්ගික මූලපිරීමක් ආරම්භ කළේය.

### තොරතුරු ආරක්ෂණ තාක්ෂණය

උසස් අවසන් ස්ථාන ආරක්ෂාව, කෘතීම බුද්ධිය/ ML පදනම් තර්ජන නියාමනය, දත්ත වර්ගීකරණ මෙවලම් වෙබ් යෙදුම් Firewalls (WAF), සහ පුළුල් උවදුරු තක්සේරු කිරීම හා විනිවිදයාමේ පරීක්ෂණ (VAPT) විසඳුම් සංවර්ධනය කරමින් අපි අපගේ පවත්නා තාක්ෂණ සමූහය වැඩි කළෙමු. ඒ සමගම, දත්ත ආරක්ෂාව, යටිතලපහසුකම් ආරක්ෂාව, සහ අවදානම අඩු කිරීම කෙරෙහි ශක්තිමත් අවධාරණයක් සමඟ අපගේ මේඝ ආරක්ෂක සමූහය අපි අඛණ්ඩව ශක්තිමත් කරමු. - මෙය තවදුරටත් ශූන්‍ය විශ්වාස ශිල්පයක් සාක්ෂාත් කර ගැනීම මගින් අපගේ ගමන උසස් කර ඇත

## මානව සම්පත් අවදානම

SLICLL විවිධ උපායමාර්ග හා ව්‍යවහාර ක්‍රියාත්මක කරමින් මානව සම්පත් අවදානම් කළමනාකරණය කරඇති අතර, ඒවායින් සමහරක් පහත දැක්වේ.

පසුබිම් පරීක්ෂාවන්, යොමු පරීක්ෂාවන් සහ කුසලතා තක්සේරු කිරීම් ඇතුළත් පිරික්සුම් ක්‍රියාවලියක් හරහා නිවැරදි පුද්ගලයින් බඳවා ගැනීම; මානව සම්පත් ආශ්‍රිත සියලුම ක්‍රියාකාරකම් පාලනය කරන පැහැදිලි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම, සේවක හැසිරීම, විනය ක්‍රියා පටිපාටි, වෙනස් ලෙස සැලකීම, හිරිහැර කිරීම සහ රහස්‍යභාවය වැනි ගැටළු විසඳීම; නිතිපතා පුහුණුව සහ සංවර්ධනය; නිතිපතා ප්‍රතිපෝෂණ සහ පුහුණු කිරීම ඇතුළුව ඵලදායී කාර්ය සාධන කළමනාකරණ පිළිවෙත් අනුග මනය කිරීම; අදාළ නීතිවලට අනුකූල වීම සහ සේවකයින් සමඟ නිතිපතා සන්නිවේදනය කිරීම.

## වංචා සහ විෂමාචාර කළමනාකරණය

පහත දී ඇති පරිදි අපට අදාළ විවිධ නීති සහ රෙගුලාසි විශාල රාමුවක් අපගේ වංචා සහ විෂමාචාර විරෝධී උත්සාහයන්ට එකතු කර ගැනීමට නිර්ණායක සමූහයක් ලබා දේ:

- අ. මුදල් විශුද්ධිකරණ විරෝධී සහ ත්‍රස්ත මූල්‍ය විරෝධී රෙගුලාසිය: 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනත (PMLA), සංශෝධිත 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තාකරණ පනත (FTRA), 2019 අංක 01 දරන රක්ෂණ (ගනුදෙනුකාර නිසි සම්ප්‍රජන්‍ය) නියමය, එක්සත් ජාතීන්ගේ සම්බාධක ලැයිස්තු, මූල්‍ය තොරතුරු ඒකකය විසින් සිදුකළ නියමයන් සහ රෙගුලාසි, සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දෙනලද මාර්ගෝපදේශ, SLICLL හි මුදල් විශුද්ධිකරණ විරෝධී රාමුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත මුදල් විශුද්ධිකරණ විරෝධී ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවන අතර අපි ශක්තිමත් මුදල් විශුද්ධිකරණ විරෝධී රාමුවක් ක්‍රියාත්මත කර ඇත.
- ආ. 1975 අංක 01 දරන වත්කම් හා වගකීම් ප්‍රකාශන පනත: අදාළ නිලධාරීන් මෙම පනත යටතේ අවශ්‍ය කරන පරිදි වාර්ෂිකව තම වත්කම් හා වගකීම් ප්‍රකාශ කර ඇත.
- ඇ. 1954 අංක 11 දරන අල්ලස් පනත: පනතේ අධීක්ෂණය යටතේ පවත්වනු ලබන පරීක්ෂණ සඳහා අපි අපගේ සම්පූර්ණ සහය ලබා දෙමු.
- ඈ. ආයතනික යහපාලන සංග්‍රහ: වංචා වැළැක්වීමේදී එවැනි සංග්‍රහ මගින් අවශ්‍ය වන මූලධර්ම අපි වැළඳගෙන ඇති අතර වංචා කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවා ඇත.

## දත්ත ආරක්ෂක දත්ත කළමනාකරණ රාමුව

පුද්ගල දත්ත රැස්කිරීම, පිරිසැකසුම, ගබඩා කිරීම සහ බැහැර කිරීම හා අදාළ අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා 2022 අංක 09 දරන දත්ත ආරක්ෂක පනතට අනුකූලව දත්ත ආරක්ෂාව කළමනාකරණය සඳහා ශක්තිමත් රාමුවක් සමාගම ක්‍රියාත්මක කර ඇත. රෙගුලාසියට අනුකූලතාව සහතික කිරීම සඳහා, සමාගම විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියක් සංවර්ධනය කර, දත්ත ආරක්ෂණ නිලධාරියෙක් පත්කර, සිය වෙබ් අඩවියේ රහස්‍යතා ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කර ඇත. පුද්ගලික දත්ත රඳවාගෙන පිරිසැකසුම් කිරීම සඳහා ඔප්පුහිමියන්ගේ කැමැත්ත ලබා ගැනීමට සමාගම කටයුතු කරමින් සිටී. කාර්ය මණ්ඩලයට මෙම නීතියට අනුකූලවීම සඳහා අදාළ පුහුණු ලබා දී ඇත. ඊට අමතරව, සමාගම "Triple-A" ප්‍රවේශය භාවිතා කරන අතර එයට එහි සමස්ථ දත්ත ආරක්ෂණ අවදානම් කළමනාකරණ රාමුවේ කොටසක් ලෙස සහතික කිරීම, බලය ලබාදීම සහ විගණනය ඇතුළත්ය.

## සමාජ මාධ්‍ය අවදානම් කළමනාකරණය

2024 දී, SLICLL සක්‍රිය නියාමනය, පැහැදිලි වැඩි කිරීමේ ලේඛණ හා ශක්තිමත් අනුකූලතා ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කරමින් සමාජ මධ්‍ය අවදානම කළමනාකරණය සඳහා පුළුල් ප්‍රවේශයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම මූලපිරීම් සමාගමේ කීර්තිනාමය ආරක්ෂා කිරීමට, නියාමන අනුකූලතාව සහතික කිරීමට හා පාර්ශ්වකාර විශ්වාසය පෝෂණය කිරීමට සැලසුම් කරන ලදී.

- සමාජ සවන්දීම හා වැඩි කිරීමේ ලේඛණ

  බහු වේදිකා හරහා වෙළෙඳ නාම සඳහන් කිරීම්, හැඟීම් සහ ප්‍රවණතා සංවාද හඹායාමට, විභව කීර්තිනාම ගැටළු හෝ පාරිභෝගික අදහස් කලින් හඳුනා ගැනීමට සමාජ ඉගෙනුම් මෙවලම් භාවිතා කිරීම.

  සන්නාම කීර්තිනාමයට බලපෑ හැකි සමාජ මාධ්‍ය සිදුවීම් ඉක්මණින් වැඩි කිරීම සහතික කිරීමට පැහැදිලි අර්බුද ප්‍රතිචාර ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීම

- අනුකූලතා ක්‍රියාමාර්ග

  නව රෙගුලාසි හා මනා පරිචයන් සපුරාලීමට සමාජ මාධ්‍ය ප්‍රතිපත්ති යාවත් කාලීන කිරීම හා අභ්‍යන්තර හා බාහිර ප්‍රමිතිවලට සම්පූර්ණ අනුකූලතාව සහතික කිරීමට නිරන්තර විගණන සිදු කිරීම



**දුෂ්මන්ත තොටවත්ත**
සභාපති- අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ අනු කමිටුව

2025 ජූනි 03

# අනුකූලතා වාර්තාව

## අනුකූලතා කළමනාකරණ රාමුව

### අනුකූලතාවයට ප්‍රවේශය

රක්ෂණ ක්ෂේත්‍රය තුළ, වෙනස්වන නියාමන විධි නියෝග සහ ව්‍යාපාර පරිසරය තුළ වෙනස්වීම් හේතුවෙන් සක්‍රිය අනුකූලතා අවදානම් කළමනාකරණය වැඩිවන තීරණාත්මක බවට පත්ව ඇත. මෙයට ගනුදෙනුකාර සහ දත්ත ආරක්ෂාව, රහස්‍යතාව සහ වෙනත් නෛතික බැඳීම් කෙරෙහි වැඩිවූ අවධාරණයක් ඇතුළත්ය. රක්ෂණ සපයන්නන් ස්ථාපිත අනුකූලතා ප්‍රමිතිවලට දැඩිව පිළිපැදීම තුළින් විනිවිදභාවය නගා සිටුවීම අවශ්‍ය වේ. SLICLL, අපි අපගේ දෛනික ව්‍යාපාර මෙහෙයුම් තුළට අනුකූලතා අවශ්‍යතා ඇතුළත් කරනු ලබයි. නියාමන සංවර්ධනයන් හී වේගය සහ සංකීර්ණතාව රක්ෂකයින් මත අඛණ්ඩ අභියෝග මතු කරන අතර නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය වන IFRS 17 හඳුන්වාදීම රක්ෂණ ගිණුම්කරණ ව්‍යවහාරවල ප්‍රධාන වෙනසක් පෙන්නුම් කරයි. SLICLL, රජය සතු ආයතනයක් ලෙස, සීමිත වගකීම් සමාගම්, රක්ෂණ සමාගම් සහ රජය සතු ව්‍යවසාය සඳහා අදාළ වන විවිධ නීති, රීති සහ රෙගුලාසි රාමුවකට අනුකූල විය.

SLICLL අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලවීමට බැඳී සිටින අතර, හඳුනාගැනීම, නියාමනය, වාර්තාකරණය සහ අනුකූලතාව සහතික කිරීම ඇතුළත් විධිමත් අනුකූලතා රාමුවක් ක්‍රියාත්මක කර ඇත. අනුකූලතා විධිනියෝගයෙන් ආයතනික අනුකූලතා කාර්ය ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම ලබා දෙන අතර එය අනුකූලතා ප්‍රධානියාගේ අධීක්ෂණය යටතේ පවතී. ඔහු විගණන හා අනුකූලතා කමිටුවට, අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට නිරන්තර වාර්තා ලබා දේ. විධායක කමිටුව "ඉහළම ස්වරූපය" ආයතනය තුළ ශක්තිමත් අනුකූලතා සංස්කෘතියක් කරා ඵලදායීව පරිවර්තනය කරන බවට සහතික වෙමින් අනුකූලතා කාර්යයන්ට සහය වේ.

අදාළ නීති, රෙගුලාසි, අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ මූලධර්ම සමඟ අනුකූල නොවීම තුළින් ඇතිවන අනුකූලතා අවදානම SLICLL හි අඛණ්ඩතාවයට වන අවදානම හෝ හානිය ලෙස නිර්වචනය කෙරේ. අනුකූලතා අවදානම කළමනාකරණය කිරීමට අසමත්වීම SLICLL වෙත දඩමුදල් මෙන්ම සිවිල් හා සාපරාධී දණ්ඩන වෙත එදායිව නිරාවරණය විය හැකිය. SLICLL හි ව්‍යාපාර මූලධර්ම නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට පමණක් නොව අඛණ්ඩතාව හා වගවීම සඳහා සෑම මට්ටමකම සියලුම සේවකයින්ට අවශ්‍ය වේ. ඵලදායී අනුකූලතා අවදානම් කළමනාකරණය ගනුදෙනුකරුවන්ගේ හා වෙනත් පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම හා සම්බන්ධවන බව සමාගම හඳුනාගනී.

## අනුකූලතා රාමුව

අධ්‍යක්ෂ මණ්ඩලය SLICLL හි අනුකූලතා අවදානම් රුචිය නිශ්චය කිරීම, නියාමන අවශ්‍යතා සහ කර්මාන්ත සංග්‍රහ වැනි අනිවාර්ය අවදානම් සහ ව්‍යාපාර උපායමාර්ග, අරමුණු සහ අභ්‍යන්තර ආයතනික ප්‍රතිපත්ති ඇතුළු අභිමත අවදානම් අතර සමතුලිතතාවයක් ඇති කර ගැනීම සඳහා වගකීම දරයි. අනුකූලතා අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, නෛතික සහ මානව සම්පත් ඇතුළුව ආයතනය තුළ සියලුම පාලන කාර්යයන් ඒකාබද්ධ කරමින් සම්බන්ධීකරණ ප්‍රවේශයක් අවශ්‍ය වේ.

අනුකූලතා අවදානම සඳහා, SLICLL ආරක්ෂක මාර්ග හතරක ආකෘතියක් අනුගමනය කරනු ලබයි:

- අවදානම් හිමිකාරත්වයේ පළමු ආරක්ෂක මාර්ගය ලෙස දෙපාර්තමේන්තු.
- දෙවැනි ආරක්ෂක මාර්ගය ලෙස අවදානම් කළමනාකරණ කමිටුව සහ විගණන හා අනුකූලතා කමිටුව.
- තෙවැනි ආරක්ෂක මාර්ගය ලෙස, විශේෂයෙන් මුදල් විශුද්ධීකරණ කාර්යයක් සඳහා අභ්‍යන්තර විගණනය.
- සිවුවැනි ආරක්ෂක මාර්ගය ලෙස, නියාමක, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ බාහිර විගණකවරු.

අනුකූලතා අවදානමේ වැදගත්කම සහතික කිරීම සඳහා, අනුකූලතා දෙපාර්තමේන්තුව විගණන හා අනුකූලතා කමිටුවට සහ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරයි.

අනුකූලතා දෙපාර්තමේන්තුව අදාළ නීති, රීති හා රෙගුලාසි සඳහා වගකිවයුතු අංශ හඳුනාගෙන ඇති අතර, අනුකූලතා අවශ්‍යතා සපුරාලන බව සහතික කිරීමට සහයෝගී ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරයි. සක්‍රිය ප්‍රවේශයේ කොටසක් ලෙස, අනුකූලතා දෙපාර්තමේන්තුව අපේක්ෂිත අනාගත රෙගුලාසි කළමනාකරණයට මඟපෙන්වීම ලබා දේ. මෙම සක්‍රීය ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ උපායමාර්ගය පිරිවැය ඵලදායී ආකාරයකින් නව නියාමන අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය මෙවලම්වලින් සමාගම සන්නද්ධ කරයි.

## මුදල් විශුද්ධිකරණ (AML) පාලනය

සමාගමේ ප්‍රතිපත්තියෙන් මුදල් විශුද්ධීකරණය සහ මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදී මූල්‍යකරණයට පහසුකම් සලසන යම් කටයුතු දැඩිව තහනම් කරන අතර වැළැක්වීමට සක්‍රියව උත්සාහ ගනී. SLICLL අදාළ නීතිවලට අනුකූලව මුදල් විශුද්ධිකරණය විරෝධී අනුකූලතාවයට අනුකූල වීමට කැපවී සිටින අතර මුදල් විශුද්ධිකරණ අරමුණු සඳහා එහි නිෂ්පාදන සහ සේවාවන් අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා එහි කළමනාකාරිත්වය, කාර්ය මණ්ඩලය සහ පත් කරන ලද නියෝජිතයන් මෙම ප්‍රමිතීන් අනුගමනය කරන බවට නියෝග කරයි.

## මුදල් විශුද්ධිකරණ පුහුණුව

ඊට අමතරව, මුදල් විශුද්ධිකරණය, එහි ක්‍රම සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබඳ පුළුල් අවබෝධයක් සේවකයින්ට ලබාදීමට අභ්‍යන්තර ඉ-ඉගෙනුම් මොඩියුලයක් SLICLL සංවර්ධනය කර ඇත. සේවකයින් සිය කාර්යසාධන ඇගයීම්වලට සම්බන්ධ වන විභාගය සමත්වීම අවශ්‍ය වේ.

## උසස් නිසි පරීක්ෂාව

මුදල් විශුද්ධිකරණ අනුකූලතා රාමුව ශක්තිමත් කිරීමට, SLICLL World-Check Refinitiv දත්ත පද්ධතියක් තුළ ආයෝජනය කර ඇති අතර එය ඇතුළත් කිරීමේ නිවාරණය සඳහා ඔබේ ගනුදෙනුකරු හඳුනා ගැනීම (KYC) සහ නිසි පරීක්ෂාව සඳහා තහවුරු කරන අවදානම්-බුද්ධි මෙවලමකි. පද්ධතියේ ප්‍රධාන ලක්ෂණවලට පහත දෑ ඇතුළත් වේ:

- දේශපාලනිකව නිරාවරණය වූ පුද්ගලයින් (PEP) නියාමනය
- සම්බාධක සහ මුර ලැයිස්තු ආයතන සහ/හෝ පුද්ගලයින් පරීක්ෂාව
- අහිතකර මාධ්‍ය නිවාරණය
- තෙවැනි පාර්ශ්ව නිසි පරීක්ෂාව

වසර පුරා, අනුකූලතා දෙපාර්තමේන්තුව විශේෂයෙන් ශාඛා කළමනාකරුවන් හා කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉලක්ක කරමින් මුදල් විශුද්ධිකරණ විරෝධය සහ ත්‍රස්තවාදයට මුදල්කරණය වැළැක්වීම (AML/CFT) කෙරෙහි අවධානය යොමු කරන පුහුණු සැසි හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට ව්‍යවසාය අනුකූලතා දෙපාර්තමේන්තුව සමඟ සමීපව කටයුතු කර ඇත.

## තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය (Whistleblowe Policy)

SLICLL තොරතුරු දැනුම්දීමේ නිලධාරී සහිතව තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇති අතර තොරතුරු දැනුම්දීමේ නිලධාරී එය ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

## ව්‍යාපාර චර්යා හා සදාචාර සංග්‍රහය

ආයතනයේ සාමාජිකයින් ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී මූලධර්ම, නීති, වටිනාකම්, ප්‍රමිති හා නීතිමය අනුකූලතාව පිළිබඳින බව සහතික කිරීමට අධ්‍යක්ෂවරු, ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ අනෙකුත් සියලුම සේවකයින් සඳහා "ව්‍යාපාර චර්යා හා සදාචාර සංග්‍රහය" සැලසුම් කර ඇත.

අනුකූලතාව සහ අනුකූලතා නියාමනය, විවෘත හා විනිවිද වාර්තාකරණය ප්‍රවර්ධනය, සහ ශක්තිමත් පාර්ශ්වකාර සම්බන්ධතා සංවර්ධනය ඒකාබද්ධ කිරීම තුළින් අනුකූලතා අවදානම සිදුවීම අවම කරගනී.

# අනුකූලතා වාර්තාව

අනුකූලතා ගැටළු සහ සිදුවීම් නිවැරදි කිරීමේ හා වැලැක්වීමේ ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට හා එහි අනු කමිටුවලට දැනුම් දෙන අතර ඒතුළින් අනුකූලතා රාමුව, සදාචාර, සහ මනා පරිචයන් තවදුරටත් ශක්තිමත් කරයි.

## පාරිභෝගික දත්ත ආරක්ෂාව

අදාළ රෙගුලාසිවලට අනුකූලව සිය දත්ත ආරක්ෂක රාමුව ශක්තිමත් කිරීම කරා සමාගම සැලකියයුතු පියවර ගෙන ඇති අතර එයට ආයතනය අතර දත්ත ආරක්ෂක ව්‍යවහාර ශක්තිමත් කිරීම සඳහා කාර්ය මණ්ඩල පුහුණු මගින් දැනුවත් කම වැඩිකිරීම ඇතුළත් වේ. ප්‍රධාන ප්‍රතිපත්ති ලියවිලි සංවර්ධනය කර ඇති අතර අභ්‍යන්තර අනුමත ක්‍රියාවලිය තුළින් පිරිසැකසුම් කෙරේ.

ආරක්ෂක නිලධාරීන් නම්කර ඇති අතර මේ සම්බන්ධයෙන් මෙහෙයුම් කරුණු ආමන්ත්‍රණය කරමින් සිටී. විනිවිදභාවය වැඩි කිරීමට හා ඔප්පුහිමියන්ගේ කැමැත්ත ලබාගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර ආයතනික වෙබ් අඩවියේ පෞද්ගලික ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කිරීම ඇතුළුව සම්පූර්ණ අනුකූලතාව සහතික කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

සමාලෝචිත වසර තුළ, බාහිර විගණක වාර්තාව, මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සහ ආයතනික පාලන වාර්තාවේ හෙළිදරව් කර ඇති ඒවා හැර, සමාගම සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා, නීති සහ රෙගුලාසිවලට අනුකූල විය. තවද, ඇතැම් නියාමන වාර්තා ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් සමාගමට දීර්ඝ කිරීමක් ලැබී ඇත.

| නියාමන/ව්‍යවස්ථාපිත අවශ්‍යතාව | වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ වාරගණන | ඉදිරිපත් කිරීම/ගෙවීම කළ දිනය | සිදුකළ දිනය | අනුකූලතාව සහ විශේෂ කරුණු |
|---|---|---|---|---|
| **කාල පරිච්ඡේදය තුළදී ගෙවීමට නියමිත වන නියාමන/ව්‍යවස්ථාපිත වාර්ථා/ගෙවීම්** | | | | |
| **ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව** | | | | |
| **තොරතුරු දැනගැනීමේ පනතේ 49 (අ) වගන්තියය ටතේ දක්වා ඇති ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිපත් කළ යුතු වන කාර්තුමය වාර්තා** | | | | |
| **2012 අප්‍රේල් 01 වන දින සිට බලපවත්වනු ලබන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 49 (ආ) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතු ප්‍රතිශෝධිත කාර්තුමය වාර්තා (ආකෘතිය 49)** | | | | |
| ආකාති තීරණය කිරීම - ජීවිත | කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුලත කාර්තු වශයෙන් | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 30<br>2 වන කාර්තුව (24) – ජූලි 30<br>3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 30 | 2024 ජූනි 10<br>2024 ජූලි 30<br>2024 ඔක්තෝබර් 30 | වෙන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් |
| අවදානම් පදනම් ප්‍රාග්ධනය (ආකෘති) - ජීවිත | කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුලත කාර්තු වශයෙන් | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 30<br>2 වන කාර්තුව (24) – ජූලි 30<br>1 වන කාර්තුව (24) – ඔක්තෝබර් 30 | 2024 ජූනි 10<br>2024 ජූලි 30<br>2024 ඔක්තෝබර් 30 | වෙන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් |
| ශේෂ පත්‍රය හා ලාභා අලාභ ගිණුම (ආකෘති) | කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුලත කාර්තු වශයෙන් | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 30<br>2 වන කාර්තුව (24) – ජූලි 30<br>3 වන කාර්තුව – ඔක්තෝබර් 30 | 2024 ජූනි 10<br>2024 ජූලි 30<br>2024 ඔක්තෝබර් 30 | වෙන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් |
| ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කෝමිසන් සභාවේ අංක12 චක්‍ර ලේඛය යටතේ ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ ප්‍රධාන නිලධාරියා විසින් සිදු කරනු ලබන කාර්තුමය සහතික කිරීම් (අ) සහතික කිරීම | කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුලත කාර්තු වශයෙන් | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 30<br>2 වන කාර්තුව (24) – ජූලි 30<br>3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 30 | 2024 ජූනි 10<br>2024 ජූලි 30<br>2024 ඔක්තෝබර් 30 | වෙන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් |
| ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කෝමිසන් සභාවේ අංක 12 චක්‍ර ලේඛය යටතේ ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ ප්‍රධාන නිලධාරියා විසින් සිදු කරනු ලබන කාර්තුමය සහතික කිරීම් (අ) සහතික කිරීම) | කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුලත කාර්තු වශයෙන් | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 30<br>2 වන කාර්තුව (24) – ජූලි 30<br>3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 30 | 2024 ජූනි 10<br>2024 ජූලි 30<br>2024 ඔක්තෝබර් 30 | වෙන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් |
| **ගෙවීම්** | | | | |
| ශුද්ධ වාරිකයෙන් 0.2ක සෙස් ජීවිත | කාර්තුමය | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 30<br>1 වන කාර්තුව (24) – ජූලි 31<br>1 වන කාර්තුව (24) – ඔක්තෝබර් 31 | 2024 අප්‍රේල් 30<br>2024 ජූලි 31<br>2024 ඔක්තෝබර් 30 | |
| වාර්ෂික ගාස්තු | වාර්ෂිකව | 2024 අප්‍රේල් 30 | 2024 අප්‍රේල් 30 | |

# අනුකූලතා වාර්තාව

| නියාමන/ව්‍යාවස්ථාපිත අවශ්‍යතාව | වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ වාරගණන | ඉදිරිපත් කිරීම/ගෙවීම කළ දිනය | සිදුකළ දිනය | අනුකූලතාව සහ විශේෂ කරුණු |
|---|---|---|---|---|
| **දේශීය අදායම් දෙපාර්තමේන්තුව** | | | | |
| **වාර්තා** | | | | |
| මුද්දර ගාස්තු | කාර්තුමය | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 15<br>2 වන කාර්තුව (24) – ජුලි 15<br>3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 15 | 2024 අප්‍රේල් 11<br>2024 ජුලි 15<br>2024 ඔක්තෝබර් 15 | |
| AIT | වාර්ෂිකව | 2023 – 2024 අප්‍රේල් 30 | 2024 අප්‍රේල් 29 | |
| APPIT ආදායම | වාර්ෂිකව | 2023 – 2024 අප්‍රේල් 30 | 2024 අප්‍රේල් 30 | |
| බෝග රක්ෂණ බද්ද | කාර්තුමය | 1 වන කාර්තුව (24) – ජුලි 30<br>2 වන කාර්තුව (24) – ඔක්තෝබර් 30 | 2024 ජුලි 30<br>2024 ඔක්තෝබර් 30 | |
| **ගෙවීම්** | | | | |
| APIT | මාසික | ඉදිරිමස 15 දින | නියමිත දිනයේදී ක්‍රියාත්මක කළ | |
| අදායම් බදු | කාර්තුමය | අගෝස්තු 15 හෝ එදිනට පෙර<br>නොවැම්බර් 15 හෝ එදිනට පෙර | 2024 අගෝස්තු 15<br>2024 නොවැම්බර් 14 | |
| මුද්දර ගාස්තු | කාර්තුමය | 1 වන කාර්තුව (24) – අප්‍රේල් 15<br>2 වන කාර්තුව (24) – ජුලි 15<br>3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 15 | 2024 අප්‍රේල් 10<br>2024 ජුලි 15<br>2024 ඔක්තෝබර් 15 | |
| බෝග රක්ෂණ බද්ද | කාර්තුමය | 1 වන කාර්තුව (24) – ජුලි 30<br>3 වන කාර්තුව (24) – ඔක්තෝබර් 30 | 2024 ජුලි 30<br>2024 ඔක්තෝබර් 30 | |
| AIT | මාසික | ඉදිරිමස 15 දින | නියමිත දිනයේදී ක්‍රියාත්මක කළ | |
| **ශ්‍රී ලංකා මහ බැංකුව** | | | | |
| සේවක අර්ථසාධක අරමුදලේ වාර්තා | අර්ධ වාර්ෂිකව | ජනවාරි 31 සහ ජුලි 31 | නියමිත දිනයේදී ක්‍රියාත්මක කළ | |
| **මුදල් විශුද්ධිකරණ වාර්තා** | | | | |
| 1. මුදල් විශුද්ධිකරණ වාර්තා | මාසික | ඉදිරිමස 15 දින | නියමිත දිනයේදී ක්‍රියාත්මක කළ | |
| සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල | මාසික | ඊළඟ මාසයේ අවසාන වැඩ කරන දිනට දිනකට පෙර | නියමිත දිනයේදී ක්‍රියාත්මක කළ | |
| **සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය** | | | | |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් වාර්තා | අර්ධ වාර්ෂිකව | ජනවාරි 31 සහ ජුලි 31 | නියමිත දිනයේදී ක්‍රියාත්මක කළ | |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායක මුදල | මාසික | ඊළඟ මාසයේ අවසාන වැඩ කරන දිනට දිනකට පෙර | නියමිත දිනයේදී ක්‍රියාත්මක කළ | |
| **සමාගම් රෙජිස්ටාර්** | | | | |
| මූල්‍ය ප්‍රකාශන ලියා පදිංචි කිරීම | වාර්ෂිකව | සමාගමේ මූල්‍ය ප්‍රකාශවලින් පසු වැඩකරන දින 20 ඇතුළත | නියමිත දිනයේදී ක්‍රියාත්මක කළ | |

# අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කිරීම හා පවත්වා ගැනීම සහතික කිරීමට අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසාන අධීක්ෂණය සහ උපායමාර්ගික දිශානතිය සපයයි. පාර්ශ්වකරුවන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීමේදී මෙම පද්ධතිවල ඵලදායීතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් කළමනාකරණය සහ පාලනයෙහි සංවර්ධනයන් පිළිබඳ දැනුවත්ව සිටී.

ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ ව්‍යවහාර සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුවේ අත්‍යවශ්‍ය සංරචක බව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. අපේක්ෂිත ප්‍රතිඵල සහ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස සියලුම අසාර්ථකවීමේ අවදානම් තුරන් කිරීමට වඩා පිළිගතහැකි මට්ටමකට අවදානම කළමනාකරණය කිරීමට අභ්‍යන්තර පාලන ක්‍රමය සැලසුම් කරනු ලබයි.

මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රධාන අධ්‍යක්ෂක මණ්ඩල අනු කමිටු හයක් පිහිටුවා ඇති අතර, වගවීම සහ පවරන ලද බලය පිළිබඳ සඳහන් කරන ලද ආයතනික ව්‍යුහය මනාව පැහැදිලි කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු හය නම්; විගණන හා අනුකූලතා කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව, මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, ආයෝජන කමිටුව, උපායමාර්ගික සමාලෝචන කමිටුව සහ ඩිජිටල් පරිනාමන කමිටුව වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රඥප්ති මගින් මෙම කමිටු පාලනය කරනු ලබන අතර, ඒවා යහපාලනයේ මූලික මූලධර්මවලට අනුකූල වේ.

මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අවදානම් කළමනාකරණ පද්ධති සහ අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් වැනි අංශවල අධීක්ෂණ වගකීම් ඉටු කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමේදී විගණන හා අනුකූලතා කමිටුව අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සමඟ මෙහෙයුම්වල අනුකූලතාවය සත්‍යාපනය කිරීමට මෙන්ම අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය ඇගයීම සඳහා වගකීමට බැඳී සිටී. යම් අනනුකූල නොවීම්වලට අදාළ සැලකිය යුතු සොයාගැනීම් විධිමත්ව ඉස්මතු කොට දක්වයි. තක්සේරුකළ අවදානම් මට්ටම මත පදනම් වී තීරණය කළ වාරගණන සමග සියළුම ඒකක සහ ශාඛා පිළිබඳව විගණන සිදු කරනු ලබන අතර, මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු පිළිබඳ ස්වාධීන හා විෂය මූලික ඇගයීම්වල විධිවිධාන සහතික කරයි.

වාර්ෂික විගණන සැලැස්ම විගණන හා අනුකූලතා කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලබන අතර, විගණනයේ සොයා ගැනීම් සිය කාලීන රැස්වීම්වලදී සමාලෝචනය සඳහා කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ. ඊට අමතරව, ශාඛා විගණනයේදී මතුවන සොයා ගැනීම් සාකච්ඡා කිරීම සඳහා විශේෂ අනුකමිටුවක් පිහිටුවා ඇත.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ශක්තිමත් අභ්‍යන්තර පාලනය සමාගමේ පාලන රාමුවේ අත්‍යවශ්‍ය සංරචකයකි. විගණන හා අනුකූලතා කමිටුව මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය අධීක්ෂණය කිරීම සඳහා මූලික වගකීම දරයි. ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම කළමනාකරණයට පවරන අතර, මෙවැනි පාලනයන් අධීක්ෂණය කිරීමට සහ පද්ධතියේ සමස්ත ඵලදායිත්වය සමාලෝචනය කිරීමට විගණන හා අනුකූලතා කමිටුව වගකීමට බැඳී සිටී.

අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යසාධනය අඛණ්ඩ නියාමන කටයුතු, අභ්‍යන්තර විගණන සහ හඳුනාගත් පාලනයන්හී යෝග්‍යතාවය හා ඵලදායීතාවය නියාමනය කිරීමට ආයතනයේ මෙහෙයුම් තුළ අන්තර්ගත ක්‍රියාපටිපාටි වැනි වෙනත් ඇගයීම් තුළින් තක්සේරු කරනු ලබයි.

ආයතනයේ සමස්ත අවදානම් කළමනාකරණ උපාය මාර්ගය හා ඒකාත්මික වූ ශක්තිමත් අනුකූලතා කළමනාකරණ පද්ධතියක් ආයතනය ස්ථාපිත කර ඇති අතර, මෙය අනුකූලතා අවදානම් කළමනාකරණ ප්‍රඥප්තිය තුළ විස්තර කර ඇත. අනුකූලතා වැඩසටහනින් සමාගම් පනත යටතේ සීමිත වගකීම් සහිත සමාගමක්, රක්ෂණ කර්මාන්ත නියාමන පනත යටතේ ලියාපදිංචි රක්ෂණ සමාගමකට අදාළවන නෛතික හා රෙගුලාසිමය අවශ්‍යතා සහ රජයට අයත් සීමිත වගකීම් සමාගම් පාලනය කරන වෙනත් නෛතික රාමු ආවරණය කරයි.

මෙහෙයුම් රාමුවේ අඛණ්ඩතාව සහ ස්ථායිතාව සුරක්ෂිත කිරීම සඳහා, පුළුල් මුදල් විශුද්ධිකරණ රාමුවක් ක්‍රියාත්මක කර ඇත. මෙම රාමුවට නිශ්චිත දත්ත පදනම් අනුව ගනුදෙනුකරුවන් පරීක්ෂා කිරීම, ගනුදෙනුකරුවන්ගේ නිසි සම්ප්‍රජන්‍ය ක්‍රියාවලිය, සේවකයින්ගේ කාර්ය සාධනය ඇගයීම් සඳහා ඇතුළත් කර ඇති ඉ-ඉගෙනුම් මොඩියුලයක්, වාර්ෂික අභ්‍යන්තර විගණන සහ නිරන්තර ප්‍රති මුදල් විශුද්ධිකරණ අවදානම් තක්සේරු කිරීම් ඇතුළත්ය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණ කාර්යය විශේෂ අවදානම් කළමනාකරණ කමිටුවකට පවරා ඇති අතර, එමගින් සමාගමේ වඩාත්ම තීරණාත්මක අවදානම් සහ අවදානම් කළමනාකරණ හැකියාවන් අධීක්ෂණය කෙරෙහි අවධානය යොමු කෙරේ. සමාගම විසින් ස්ථාපිත කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමාගමේ සමස්ත උපාය මාර්ග හා අවදානම් රුචියට ගැලපෙන බවට අවදානම් දැනුවත්කිරීම් පිළිබඳ පුළුල් ව්‍යවසාය සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන බවට අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත්වේ.

අවදානම් දෙපාර්තමේන්තුව අවදානම් කළමනාකරණ කමිටුව සහ ආයෝජන කමිටුව මෙන්ම විධායක කමිටුව, විගණන පසු විපරම් කමිටුව සහ නිෂ්පාදන සංවර්ධන කමිටුව යනාදිය ඇතුළත් කළමනාකරණ මට්ටමේ කමිටු කිහිපයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද අනු කමිටුවලට නියෝජනයන් ලබා දේ. මෙම ක්‍රියාවලිය තුළින්, ව්‍යවසාය අවදානම් කළමනාකාරිත්වය අවදානම් දෘෂ්ටි කෝණයකින් ස්වාධීන මතයන් සපයන අතර එමඟින් වියහැකි අවදානම් බලපෑම සැලකිල්ලට ගනිමින් කළමනාකාරීත්වයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුවත් තීරණ ගැනීමට හැකියාව ඇති කරයි.



**නුසිත් කුමාරතුංග**
සභාපති



**දුෂ්මන්ත තොටවත්ත**
සභාපති – විගණන සහ අනුකූලතා කමිටුව

2025 ජූනි 03

# 97.

# මූල්‍ය වාර්තා

98 සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව
101 අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය
102 ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම් ප්‍රකාශය
103 දිගුකාලින රක්ෂකයාගේ ආයුගණක සහතිකය
104 වගකීම් ප්‍රමාණාත්මතා පරික්ෂණය
105 ස්වාධින විගණක වාර්තාව
108 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
109 ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
111 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය
112 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
114 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

# සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව

සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය, සමාගමේ 2024 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂය සඳහා සිය 02 වැනි වාර්ෂික වාර්තාව, සමඟ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සතුටින් ඉදිරිපත් කර සිටි.

මෙම වාර්තාවේ අන්තර්ගතයෙන් 2007 අංක 07 දරණ සමාගම් පනතේ, 2000 (සංශෝධිත) අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ හා එහි සංශෝධන සහ ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන්හි අවශ්‍යතාවයන් සලකා බලා ඇත.

සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය, 2024 දෙසැම්බර් 31න් අවසන්වූ වර්ෂය සඳහා ඔවුන්ගේ වාර්ෂික වාර්තාව සමඟ සමාගමේ සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ, 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ හා එහි සංශෝධන සහ ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන්හි අවශ්‍යතාවයන් මූල්‍ය ප්‍රකාශනවලින් සපුරා ඇති බවට විගණකාධිපතිගේ වාර්තාව සිය සමාජිකයින්ට සතුටින් ඉදිරිපත් කර සිටී.

## සමාගමේ ආයතනික පසුබිම

2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ (සංශෝධිත) පනතේ දක්වා ඇති විධානය යටතේ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් දිගුකාලීන ජීවිත සහ සාමාන්‍ය රක්ෂණය ලෙස වෙන් කිරීමට අවශ්‍ය විය. ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි තනි කොටස්හිමිකරු සමඟ 2023 ඔක්තෝබර් 11 දින සංස්ථාපිත කරන ලදී.

එහි පළමු වාර්ෂික මහ සභා රැස්වීම එහි එකම කොටස්හිමියා විසින් තීරණය කළ පරිදි 2007 අංක 07 දරන සමාගම් පනතේ 144 (3) වගන්තියේ දක්වා ඇති පරිදි සිය සංස්ථාපනයෙන් මාස දහඅටක් තුළ පවත්වන ලදී.

2011 දී, 2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ (සංශෝධිත) පනතට අනුකූලව අංක 23/0431/604/046 හා 2023 මාර්තු 17 දිනැති කැබිනට් තීරණයට අනුව, ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙනම නෛතික ආයතන දෙකකට නීත්‍යානුකූලව වෙන් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගම සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගම් දෙකක් සමඟ පරිපාලක සමාගමක ආදර්ශයක් යටතේ සිය මෙහෙයුම් වෙන් කරන ලදී. ඒවානම්:

ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වේ. 2024 පෙබරවාරි 01 සිට බලාත්මකව, ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වර්තමානයේ පරිපාලක සමාගමක් ලෙස කටයුතු කරයි.

## කොටස් හිමිකාරත්වය පිළිබඳ තොරතුරු

සමාගමේ කොටස්හිමියා ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වන අතර ඉන් 99.98%ක කොටස් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම් වෙත පවරනු ලැබ ඇත.

## ලියාපදිංචි කාර්යාලය

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21, රක්‍ෂණ මන්දිරයෙහි පිහිටා ඇත.

## සමාගමේ ප්‍රධාන කටයුතු

2024 පෙබරවාරි 01 සිට බලපවත්නා පරිදි ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් මූලික කාර්යය වන්නේ දිගු කාලීන (ජීවිත) රක්‍ෂණ ව්‍යාපාරය පවත්වා ගෙන යාමයි. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කටයුතුවල විශාල වෙනස්වීම් සිදුකර නොමැත.

## මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ පිළිබිඹුවක් නිරූපනය වන පරිදි සමාගමේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්‍ෂවරුන් වගකීමට බැඳි සිටී. වංචා හෝ දෝෂ හේතුවෙන් සැලකියයුතු අවප්‍රකාශවලින් තොර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා අදාළ අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වා ගැනීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීම සහ වාතාවරණය තුළ සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු සිදු කිරීම අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම්වලට ඇතුළත් වේ.

වාර්ෂික වාර්තාව තුළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2000 අංක 43 දරන රක්‍ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව සකස්කර තිබෙන බව අධ්‍යක්‍ෂවරුන්ගේ අදහස වේ.

## මූල්‍ය ප්‍රකාශ හා විගණකගේ වාර්තාව

2024 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මත පදනම්ව සකස් කරනු ලබයි. ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් තබන ලද සමාගමේ මුල්‍ය ප්‍රකාශයන් වාර්ෂික වාර්තාවේ දක්වා ඇත. මෙම මුල්‍ය ප්‍රකාශ සහ සටහන් මගින් 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුල්‍ය තත්ත්වය සහ එම දිනයෙන් අවසන් වන වසර සදහා එහි කාර්ය සාධනයන් පිලිබද සත්‍ය හා සධාරණ දැක්මක් ඉදිරිපත් කරනු ලබයි.

## විගණකගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණක වශයෙන් පත්කරන ලදී. 2024 දෙසැම්බර් 31න් අවසන්වූ වර්ෂයේ සමාගමේ මුල්‍ය ප්‍රකාශ වාර්ෂික විගණනයේදී සුදුසුකම් ලත් විගණකවරයෙකු ලෙස විගණකාධිපතිට සහයවීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍ර සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති විසින් වරලත් ගණකාධිකාරී සමාගමක් වන Messrs BDO Partners පත්කරනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් වන මුල්‍ය ප්‍රකාශ පිලිබද විගණකගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

## විගණන හා අනෙකුත් අදාළ සේවා ගාස්තු

සමාලෝචිත වසර තුළ විගණන ගාස්තු ලෙස සහ අනෙකුත් අදාළ සේවා සඳහා ගෙවන ලද ප්‍රමාණ පහත දක්වේ. මෙම ඡේදයෙන් අනාවරණය කෙරෙන කරුණු හැර විගණකවරුන්ට සමාගම සමඟ වෙනත් කිසිදු සම්බන්ධතාවයක් නොමැති බව අධ්‍යක්ෂවරු දැන සිටිති.

| | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|
| ව්‍යවස්ථාපිත විගණන ගාස්තු | 4,949 | – |
| විගණන නොවන සේවා | – | – |

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මුල්‍ය ප්‍රකාශ සකස්කිරීම සඳහා යොදාගත් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

# සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව

## අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධති

සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සමාගමේ අවදානම් කළමනාකරණ කාර්යය ක්‍රියාත්මක කර පාලනය කර ඇත.

සමාගම මනා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපරිපාටි ක්‍රියාත්මක කර ඇති අතර, එවැනි ප්‍රතිපත්ති හා ක්‍රියාපරිපාටි සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් නියාමනය කරනු ලබයි. විගණන හා අනුකූලතා කමිටුව විසින් සමාගමේ අභ්‍යන්තර පාලන කාර්යය අධීක්ෂණය කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණ කාර්යයේ සඵලත්වය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්ව සිටී.

## අඛණ්ඩතා පැවැත්ම

මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය, මුදල් ප්‍රවාහය සහ නියාමක හා ව්‍යුහාත්මක සාධක සැලකිල්ලට ගනිමින් දැකියහැකි අනාගතය සඳහා සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට සමාගම සතුව ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වේ. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම යොදා ගන්නා ලදී.

## පිරිවැටුම/දළ ලිඛිත වාරිකය (GWP)

2024 වසර සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් මුළු පිරිවැටුම රු. මිලියන 49,730ක් වූ අතර, මුළු දළ ලිඛිත වාරිකය රු. මිලියන 24,531ක් විය. සමාගම විසින් අත්කරගත් මුළු දළ ලිඛිත වාරික පිළිබඳ සවිස්තර විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශවල සඳහන් කර ඇත.

## ලාභාංශ

2024 මූල්‍ය වසර සඳහා සමාගමේ කොටසකට රුපියල් 0.20 (එකතුව රුපියල් 250,000,000) ක අවසන් ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශ කිරීමට යෝජනා කර ඇත.

එකී ප්‍රකාශිත අවසන් ලාභාංශ සඳහා 2007 අංක 07 දරණ සමාගම් පනතේ දරණ 56 වන වගන්තිය යටතේ නුබුන්වත් බව පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය සමාගම විසින් සපුරාලනු ලැබ ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබ ඇත. විගණකවරුන්ගෙන් නුබුන්වත් සහතික ලබා ගන්නා ලදී.

## පරිත්‍යාග

2024 වර්ෂය තුළ දී, සමාගම විසින් රු. 2,127,076ක පරිත්‍යාගයක් සිදු කර ඇත.

## බදුකරණය සඳහා වෙන් කිරීම

සමාගමේ බදු තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කෙරේ.

## සංචිත

වර්ෂය තුළදී සංචිතවල වෙනස්වීම ස්කන්ධය වෙනස්වීම ප්‍රකාශයේ දක්වා ඇත.

## රක්ෂණ වගකීම් සහ වෙන් කිරීම්

සියලුම දැනුවත් වගකීම් හා බැඳීම් සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් සිදුකරන ලද බව තහවුරු කිරීමෙහිලා සියලු සාධාරණ පියවර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබ ඇත.

පාරිතෝෂික වගකීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 19 සේවක ප්‍රතිලාභ අනුව අවශ්‍ය වන පරිදි ස්වාධීන ආයුගණකවරයෙකු මගින් අගයන ලදී.

## මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජන

| | 2024<br>රු. '000 |
|---|---|
| බදු ගෙවීමට පෙර ලාභය (PBT) | 4,376,604 |
| අදායම් බදු වියදම් | 1,734,756 |
| බදු ගෙවීමට පසු ලාභය | 2,641,849 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | (156,265) |
| ඉදිරියට ගෙන ආ විසර්ජනය නොවන ලාභ | – |
| විසර්ජන සඳහා ලබාගත හැකි ලාභ | 2,485,584 |
| ගෙවූ ලාභාංශ | – |
| ඉදිරියට ගෙන යන විසර්ජනය නොවන ලාභ | 2,485,584 |

මෙම වාර්තාවේ දිනට මූල්‍ය ප්‍රකාශවල සිදුකළ ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා නොදුන් බවට දක්වෙන කිසියම් හෝ අවස්ථාවක් ගැන අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නැත.

## ආයෝජන

2024 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් දරන ආයොජන ප්‍රමාණය රු. මිලියන 230,577 ක් විය. ආයෝජනවල සවිස්තර විග්‍රහයක් මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කෙරේ.

## දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර විග්‍රහයක් වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

## සින්නක්කර දේපලවල වෙළෙඳපොල වටිනාකම

දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳව වාර්තාකිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස සමාගම පිරිවැය ක්‍රමය භාවිතා කරයි. වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා සමාගමේ ප්‍රතිපත්තිය වන්නේ සෑම වසර තුනකටම එක් වරකි. ඒ අනුව, දේපල ඇගයීම පිළිබඳ සුදුසු පළපුරුද්ද සහිත ස්වාධීන වරලත් තක්සේරුකරුවෙක් වන, ඒ. ඒ. එම්. ෆාතිහු මහතා (MRICS) විසින් 2024 මූල්‍ය වසර තුළ මෝටර් රථ ප්‍රත්‍යාගණනය කරන ලදී. එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල ඒවා බල පවත්වන දිනය වන 2024 දෙසැම්බර් 31 දින සිට මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කරන ලදී.

## වාර්තාකරණ දිනයෙන් පසු සිදුවූ සිදුවීම්

වාර්තාකරන දිනයෙන් පසු සිදුවන සිදුවීම් මූල්‍ය ප්‍රකාශවලට සටහන් අංක 40 හි අනාවරණය කර ඇත.

## සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී යොදා ගත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 24 අනුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු, සහ සම්බන්ධිත පාර්ශ්ව අනාවරණ මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

# සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව

## අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව 2007 අක 07 දරන සමාගම් පනතට අනුකූලව සමාගමේ ප්‍රධාන කොටස්හිමියා වන භාණ්ඩාගාරයේ ලේකම් විසින් සිදුකරනු ලබන නාමයෝජනා මත පදනම් වී සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරු ලෙස පත් කර ඇත.

2024 දෙසැම්බර් 31 දිනට තනතුර දැරූ සමාගමේ අධ්‍යක්ෂවරු පහත පරිදි වේ:

**රොනල්ඩ් සී. පෙරේරා මහතා -**
(2023 ඔක්තෝබර් 06 පත්කරන ලදී - 2024 ඔක්තෝබර් 08 දින ඉල්ලා අස්විය)

**නඹිමාල් එම්. පැල්පොල මහතා -**
(2023 ඔක්තෝබර් 06 පත්කරන ලදී - 2024 ඔක්තෝබර් 08 දින ඉල්ලා අස්විය)

**ආචාර්ය එස්. එම්. පී. කීත්සිරි මංචනායක මහතා -**
(2023 ඔක්තෝබර් 06 පත්කරන ලදී -2024 ඔක්තෝබර් 09 දින ඉල්ලා අස්විය)

**එස්. නිශාන්ත දයානන්ද මහතා -**
(2023 ඔක්තෝබර් 06 පත්කරන ලදී -2024 දෙසැම්බර් 31 දින ඉල්ලා අස්විය

**අනිල් කොස්වත්ත මහතා -**
(2023 ඔක්තෝබර් 06 පත්කරන ලදී -2025 ජනවාරි 02 දින ඉල්ලා අස්විය)

**කේ. රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා -**
(2023 ඔක්තෝබර් 06 පත්කරන ලදී)

**දුෂ්මන්ත තොටවත්ත මහතා -**
(2023 ඔක්තෝබර් 06 පත්කරන ලදී)

**පී. නුසිත් කුමාරතුංග මහතා -**
(2024 ඔක්තෝබර් 23 පත්කරන ලදී)

මෙම වාර්තාවේ දිනයට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

1. පී. නුසිත් කුමාරතුංග මහතා (2024 ඔක්තෝබර් 18 දින සිට පත්කරන ලදී)
2. දුෂ්මන්ත තොටවත්ත මහතා
3. කේ. රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා
4. රොහාන් ෆිලිප් බුල්ජන්ස් මහතා (2025 ජනවාරි 01 දින සිට පත්කරන ලදී)
5. කේ. රජීව් ධර්මේන්ද්‍ර මහතා (2025 ජනවාරි 01 දින සිට පත්කරන ලදී)
6. එන්. ඩී. බී. උනන්බුව මහතා, ජනාධිපති නීතිඥ, (2025 ජනවාරි 01 දින සිට පත්කරන ලදී)

වටමාරුව හෝ වෙනත් ආකාරයෙන් විශ්‍රාම යාම සහ ඔවුන් නැවත පත් කිරීම

1. සාමාන්‍ය යෝජනාව

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 6 වගන්තිය යටතේ නීල් ධනුනායක බණ්ඩාර උනන්බුව මහතා විශ්‍රාම යන අතර නැවත පත් කිරීම සඳහා සුදුසුය.

2. විශේෂ යෝජනාව – 01

සෝමදාස පලිහවඩන මහතා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම (වයස අවුරුදු හැත්තෑවට (70)ට වැඩිය).

2007 අක 07 දරන සමාගම පනතේ 212 වගන්තිය යටතේ සෝමදාස පලිහවඩන මහතාගෙන් ඔහුට වයස අවුරුදු 71ක් වන බවටත් 2025 ජූනි 07 දින 72ට ලඟා වෙන බවටත් සමාගමට විධිමත් දැනුම්දීමක් ලැබී ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලය දැන්වීමේ දක්වා ඇති ආකාරයට සිය කොටස්හිමියන්ගේ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලයට ඔහු පත් කිරීමට යෝජනා කරමි.

## සමාගම් සමඟ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

කොන්ත්‍රාත්වල අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර ඇත. මෙම බැඳියාවන් අධ්‍යක්ෂ රැස්වීම්වලදී ද විධිමත් පරිදි අනාවරණය කරනු ලැබ ඇත. අධ්‍යක්ෂවරු සමාගමේ කිසිදු කොටසක හිමිකාරත්වය නොදරයි.

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

වසර තුළ දී ගෙවන ලද අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු සහ පාරිශ්‍රමිකය රු. 3,094,250 ක් විය.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව 2024 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 12,500 කි. 2024 දෙසැම්බර් 31 දිනට කොටස් වලින් 100% ක් ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙත පවරන ලදී.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂකවරුන්ගේ උපරිම දැනුවත්භාවය සහ විශ්වාස කරන පරිදි රජයට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සහ සේවකයින්ට අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවා ඇති බවට අධ්‍යක්ෂවරු සැහීමකට පත් වෙති.

## අස්පෘශ්‍ය වත්කම්

2024 දෙසැම්බර් 31 දිනට අස්පෘශ්‍ය වත්කම් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇත.

## පරිසරය

අදාළ පාරිසරික නීති හා රෙගුලාසි සමඟ සමාගමේ මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන අතර යම් හානිකර කටයුතුවල නිරත නොවේ.

## නීති හා රෙගුලාසිවලට අනුකූලතාව

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවෙන් අනාවරණය කර ඇති පරිදි මූල්‍ය වර්ෂය තුළ සමාගම අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලට අනුකූල වී ඇත. අනුකූලතා දෙපාර්තමේන්තුව සමාගමේ අනුකූලතා කාර්යය නියාමනය කරන අතර විගණන සහ අනුකූලතා කමිටුවට සහ අවදානම් කළමනාකරණ කමිටුවට ඒ පිළිබඳ වාර්තා කරයි. තවද, කලින් කළ අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරපත් කරනු ලබයි.

## මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 අප්‍රේල් 28 දින අනුමත කරන ලදී,

## වාර්ෂික මහ සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2025 ජූනි 30 වන දින පෙරවරු 11.00ට කොළඹ 02 වොක්ෂෝල් වීදියේ අංක 21 හි රක්ෂණ මන්දිරයේ ලියාපදිංචි කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩල ශාලාවේදී පවත්වනු ලැබේ.

## වාර්තාවේ අන්තර්ගත කරුණු පිළිගැනීම

2007 අංක 07 දරණ සමාගම් පනතේ 168(1)(ඕ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි මෙම වාර්තාවේ අන්තර්ගත කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය මෙහි ලා පිළිගනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



**ශිරෝමි කෝදාගොඩ**
සමාගම් ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්



**නුසිත් කුමාරතුංග**
සභාපති/අධ්‍යක්ෂ



**දුෂ්මන්ත තොටවත්ත**
අධ්‍යක්ෂ

2025 ජූනි 03

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පහත ප්‍රකාශයේ විස්තර කෙරේ.

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව, සෑම මූල්‍ය වසරක් සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට හා මහා සභා රැස්වීමක් ඉදිරියේ ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂවරු වගකිව යුතුය. මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකවරුන්ගේ වගකීම් වාර්ෂික වාර්තාවේ ඇතුළත් විගණකවරුන්ගේ වාර්තාවේ පැහැදිළි කරයි.

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් ශේෂ පත්‍රයේ දිනයට සහ එම දිනයෙන් අවසන් වන ගිණුම්කරණ කාල සීමාව සඳහා සමාගමේ ලාභය, අලාභය හෝ ආදායම සහ වියදම් ඇතුලත් සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන බව සහතික කිරීම සඳහා සමාගමේ අධ්‍යක්ෂවරුන් වගකීමට බැඳී සිටී. එමෙන්ම මූල්‍ය ප්‍රකාශනවලින් සමාගමේ සමස්ථ කටයුතුවල තත්ත්වය පිළිබඳව සාධාරණ නියෝජනයක් ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS සහ LKAS), 2007 අංක 07 දරණ සමාගම් පනත, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සහ 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති බවට අධ්‍යක්ෂවරුන් සහතික විය යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරන්තරයෙන් භාවිතා කර ඇති බවත් යහපත් විනිශ්චය සහ ඇස්තමේන්තු ක්‍රියාත්මක කර ඇති බවත් අධ්‍යක්ෂවරු තහවුරු කරති. ඊට අමතරව, දැකියහැකි අනාගතය සඳහා සිය මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා සමාගමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සාධාරණ අපේක්ෂාවක් අධ්‍යක්ෂවරුන්ට ඇති අතර, එමනිසාම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඔවුන් අඛණ්ඩතා පැවැත්ම පිළිබඳ පදනම යොදා ගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

**ශිරෝමි කෝදාගොඩ**
සමාගම් ලේකම්

**ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්**

2025 ජූනි 03

# ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම් ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (සමාගම) මූල්‍ය ප්‍රකාශ පහත සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරන ලදී.

i. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS/LKASs)

ii. 2007 අංක 07 දරණ සමාගම් පනත

iii. සංශෝධිත 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත.

මූල්‍ය ප්‍රකාශ සහ එහි සිදුකළ අනාවරණ සකස් කිරීමේදී භාවිතා කළ ආකෘති අදාළ නියාමකයන් විසින් නියම කරන ලද ආකෘතීන් සමග අනුකූල වන අතර, ඒවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්හි අනාවරණය කිරීමේ අවශ්‍යතාවන්ට ද අනුකූල වේ. අපගේ උපරිම දැනුමට අනුව, මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් මූල්‍ය ප්‍රකාශ, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් මූල්‍ය තොරතුරු සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහය, සාධාරණව නියෝජනය කරන බව අපි සහතික කරමු. ඊට අමතරව, සමාගමට සිය මෙහෙයුම් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බව අපි තහවුරු කරන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම අපි යොදා ගෙන ඇත. කළමනාකරණය, සිය මූල්‍ය වාර්තාකරණ වගකීම් සපුරාලනු ලබන බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. ප්‍රධාන මූල්‍ය නිලධාරි ලෙස, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, ක්‍රියාපාටිපාටි සහ අභ්‍යන්තරව පාලනයන් ස්ථාපිත කර පවත්වාගෙන යාම මගේ වගකීමකි. මූල්‍ය ප්‍රකාශ සියලුම වැදගත් ආකාරයෙන් නිවැරදි හා සම්පූර්ණ බවට සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා සැලසුම්කළ අභ්‍යන්තර පාලන ක්‍රමයක් කළමනාකරණය සතුය. මූල්‍ය වාර්තා විශ්වාසනීය බවට සහ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමෙහිලා ,මනා පදනමක් සකස් කර දෙන බවට සහ වත්කම් නිසි පරිදි ගණන් බලන බවට සහ ආරක්ෂා කරන බවට සාධාරණ සහතිකයක් අභ්‍යන්තර පාලනයන් ලබාදෙන බව කළමනාකරණය විශ්වාස කරයි. අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාපටිපාටි ස්ථිරව අනුගමනය කරන බව සහතික කිරීමට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් අභ්‍යන්තර විගණකවරු විසින් ද කාලීන සමාලෝචනයන් සිදු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන සහ අනුකූලතා කමිටුවක් පත්කර ඇති අතර ස්වාධීන අධ්‍යක්ෂවරයකු එහි ප්‍රධානියා ලෙස කටයුතු කරයි. විගණන හා අනුකූලතා කමිටුව විසින් අභ්‍යන්තර විගණන කටයුතු, විගණන පසුවිපරම් කමිටු වාර්තා සහ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව කොටස්හිමියන් වෙනුවෙන් විගණකාධිපති විසින් මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇත. ස්වාධීන විගණකවරයාට කළමනාකරණය සිටියදී හෝ නොසිටියදී හෝ විගණන සහ අනුකූලතා කමිටුව වෙත සම්පූර්ණ හා නිදහස් ප්‍රවේශය ඇති අතර, එම කමිටුව හමුවීමට ද හැකිය. අපගේ උපරිම දැනුම අනුව -

i. සමාගම අදාළ සියළුම නීති, රීති සහ රෙගුලාසි සහ මූල්‍ය ප්‍රකාශවලට සටහන්වල වෙනත් ආකාරයෙන් විස්තර කර ඇති මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කර ඇති බවට,

ii. මූල්‍ය ප්‍රකාශ සටහන්වල වෙනත් ආකාරයෙන් විස්තර කර ඇති පරිදි හැර කිසිදු සැලකියයුතු වෙනස්වීම් නොමැති අතර විගණකාධිපතිවරයා වෙනස් කර නොමැති බවට,

iii. සමාගම විසින් ගෙවිය යුතු සියලුම බදු ගාස්තු හා සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සමාගමේ සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම දායක මුදල් හා බදු වාර්තාකරණ දිනට ගෙවා ඇති බව හෝ අවශ්‍ය වන පරිදි වෙන්කර ඇති බවට,

iv. සංචිතකරණ සහ නුබුන්වත් මාර්ගෝපදේශ වලට අනුකූල වී ඇති බව සහ පිළිගත හැකි වත්කම් ගැළපීම මගින් සියලුම සංචිත වලට පිටුබලයක් ඇති බවට,

v. අදාළ රෙගුලාසිවලට අනුකූලව ස්කන්ධ ප්‍රාග්ධනය අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලන බවට සහතික කර සිටිමු.



**ශ්‍රියානි කුලසිංහ**
ප්‍රධාන මූල්‍ය නිලධාරී

2025 ජූනි 03

# දිගුකාලීන රක්ෂකයාගේ ආයුගණක සහතිකය

wtw

පුද්ගලිකයි සහ රහසිගතයි

2025 අප්‍රේල් 23

අධ්‍යක්ෂ මණ්ඩලය
ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්
අංක 21, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02 ශ්‍රී ලංකාව

**2024 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ ආයුගණක ඇගයීම**

2019 අප්‍රේල් 26 දිනැති ගිවිසුම් ලිපිය සහ 2021 අගෝස්තු 12 දිනැති අතිරේකය අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් දිගු කාලීන රක්‍ෂණ ව්‍යාපාරයේ, 2024 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන රක්‍ෂණ වගකීම් ඇගයීමේ ආයුගණක සමාලෝචනයක් සීමාසහිත විලිස් ටවර්ස් වොට්සන් ඉන්දියා පුද්ගලික සමාගම (විලිස් ටවර්ස් වොට්සන්, අපි, අපගේ හෝ අප) විසින් සිදුකරනු ලැබ ඇත.

අපි පහත දෑ මෙයින් සනාථ කරන්නෙමු:

1. දිගු කාලීන රක්‍ෂණ අරමුදලේ බැදීම්වල ආයුගණක ඇගයීම සඳහා භාවිතා කරන ලද දත්ත සම්පූර්ණ සහ නිරවද්‍ය බව තහවුරු කිරීමට සමාගම විසින් සාධාරණ පියවර ගෙන තිබෙන බව.
2. දිගු කාලීනව රක්‍ෂණ අරමුදලට අදාළව සියලුම වගකීම් සඳහා 2024 දෙසැම්බර් 31 දිනට සියලුම පවත්නා සහ අසම්භව්‍ය වගකීම් සැලකිල්ලට ගනිමින්, එදිනට ප්‍රමාණවත් සහ විධිමත් සංචිත ලබාදී තිබෙන බව.
3. බෙදාහැරීමේ පදනම මත ජීවිත අරමුදල පවත්වාගෙන යනු ලබන, මුළු දිගු කාලීන රක්‍ෂණ ප්‍රතිපාදන ප්‍රමාණය ශ්‍රී ලංකා රු. මිලියන 130,732කි. ජීවිත අරමුදල තුළ පවතින වත්කම්වල වටිනාකම IRCSL පදනම මත ශ්‍රී ලංකා රු. මිලියන 219,318 ක් වන අතර SLFRS පදනම මත ශ්‍රී ලංකා රු. මිලියන 214,632කි. 2024 වසර තුළදී ජීවිත අරමුදලින් කොටස් හිමියන්ගේ අරමුදල වෙත මාරු කරන ලද දළ අතිරික්තය ශ්‍රී ලංකා රු. මිලියන 1,387කි. සහභාගි අරමුදලෙන් 2024 වසර තුළදී ඔප්පු හිමියන් වෙත ප්‍රසාද දීමනා ප්‍රකාශය සඳහා වෙන් කරන ලද අතිරික්තය ශ්‍රී ලංකා රු. මිලියන 3,008කි. කොටස්හිමියන්ට මාරු කිරීම් සහ පසු බදු වලින් අනතුරුව ජීවිත අරමුදල 2024 දෙසැම්බර් 31 වන දිනට IRCSL පදනම මත ශ්‍රී ලංකා රු. මිලියන 217,914ක් වන අතර SLFRS පදනම මත එය ශ්‍රී ලංකා රු. මිලියන 213,228කි.

**කුන්ජ් බිහාරි මහේෂ්වරී,** FIA, FIAI
අධ්‍යක්ෂ, ඉන්ෂුවරන්ස් කන්සල්ටිං ඇන්ඩ් ටෙක්නොලොජි, ඉන්දියාව
විලිස් ටවර්ස් වොට්සන්
විද්‍යුත් ලිපිනය kunj.maheshwari@wtwco.com

අත්සන:

ස්ථානය: ඉන්දියාව
දිනය: 2025 අප්‍රේල් 23
විලිස් ටවර්ස් වොට්සන් ඉන්දියා පුද්ගලික සමාගම
ලියාපදිංචි කාර්යාලය
ඉමාර් කැපිටල් කුලුනු 02
මෙහ්රාවුලි - ගුර්ගෝන් පාර, අංශය 26
ගුරුග්‍රෑම් 122002
ඉන්දියාව

දුරකථනය +91 124 432 2800
ෆැක්ස් +91 124 432 2801
විද්‍යුත් ලිපිනය TW.Fin.India@wtwco.com
වෙබ් අඩවිය wtwco.com

# වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණය

wtw

පුද්ගලිකයි සහ රහසිගතයි

2025 අප්‍රේල් 23

අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්

අංක 21, වොක්ෂෝල් වීදිය,

කොළඹ 02 ශ්‍රී ලංකාව

**වගකීම්වල ප්‍රමාණාත්මතාව පරීක්ෂා කිරීම**

1. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිතිය, (SLFRS) 4, රක්ෂණ ගිවිසුම්, යම් රක්ෂණකරුවකු විසින්ම එහි රක්ෂණ ගිවිසුම යටතේ ඉදිරි මුදල් ප්‍රවාහයේ වර්තමාන තක්සේරු භාවිතයට ගනිමින්, සෑම වාර්තාකරණ කාල සීමාවක් අවසානයේදීම එහි පිළිගත් රක්ෂණ වගකීම් ප්‍රමාණවත්ද, නැද්ද යන්න තක්සේරු කරනු ලැබිය යුතු බවට නියම කරයි. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 4 අදහස් කරන පරිදි ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් ජීවිත අරමුදල තුළ පවත්වාගෙන යනු ලබන දිගුකාලීන රක්ෂණ ප්‍රතිපාදන සඳහා වගකීම්වල ප්‍රමාණවත් බව පරීක්ෂා කිරීමේ පරීක්ෂාවක් විලිස් ටවර්ස් වොට්සන් විසින් සිදු කරනු ලැබ ඇත.
2. වගකීම්වල ප්‍රමාණාත්මතා පරීක්ෂාවක් සිදු කරමින්, ආයුගණක වගකීම් සමග විගණනය කරන ලද ගිණුම් අනුව දරන ප්‍රතිපාදන, අප විසින් සන්සන්දනය කරනු ලැබ ඇත. මේ අරමුණ සඳහා, ආයුගණක වගකීම්වල වටිනාකම, ශ්‍රී ලං.ර.නි.කො. (පෙර ශ්‍රී ලං.බැ.ආ) (2015 නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රෙගුලාසි අනුව ගණනය කරනු ලබයි. ඒ මගින් බලාත්මක රක්ෂණ ගිවිසුම්වලට අදාළ වගකීම් පියවීමට අවශ්‍ය වන සහ මුදල් ප්‍රවාහවල මුළු ජීව කාලය ආවරණය කරමින් වට්ටම් කරන ලද මුදල් ප්‍රවේශයක් භාවිතා කරමින් වගකීම් අගයනු ලබයි.
3. 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රක්ෂේපණ සහ අනුප්‍රකාශ බලාත්මක ප්‍රතිපත්ති මත පදනම් වේ.
4. සිදුකරන ලද පරීක්ෂා පදනම් කර ගෙන,

- ආයුගණක වගකීම් ඇගයීම ජාත්‍යන්තරව පිළිගත් ආයුගණක ක්‍රම මත පදනම් වන බව සහ ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 4 යටතේ වන අවශ්‍යතා පිළිපදින බව,
- එම ඇගයීම සඳහා භාවිතා කළ උපලේඛන පවත්නා අත්විඳි අධ්‍යයන මත පදනම් වූ සහ අහිතකර අපගමන සඳහා සුදුසු අන්තරවලට ඉඩ හැරීමෙන් පසු සැලකිය යුතු තක්සේරු වන බව, සහ
- 2024 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද ගිණුම් අනුව, ශ්‍රී ලංකා ඉන්ෂූරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් ජීවිත අරමුදල තුළ පවත්වාගෙන යනු ලබන දිගු කාලීන රක්ෂණ ප්‍රතිපාදන ඉහත සඳහන් ආකාරයට ගණනය කරන ලද වගකීම්වලට වඩා වැඩි බව මම සහතික කරමි.

**කුන්ජ් බිහාරි මහේෂ්වරී** FIA, FIAI

අධ්‍යක්ෂ, ඉන්ෂුවරන්ස් කන්සල්ටිං ඇන්ඩ් ටෙක්නොලොජි, ඉන්දියාව

WTW



අත්සන:

ස්ථානය: ඉන්දියාව

දිනය: 2025 අප්‍රේල් 23

විලිස් ටවර්ස් වොට්සන් ඉන්දියා පුද්ගලික සමාගම

ලියාපදිංචි කාර්යාලය:
ඉමාර් කැපිටල් කුලුනු 02
මෙහ්රාවුලි - ගුර්ගෝන් පාර, අංශය 26
ගුරුග්‍රෑම් 122002
ඉන්දියාව

දුරකථනය +91 124 432 2800

ෆැක්ස් TW.Fin.India@wtwco.com

වෙබ් අඩවිය wtwco.com

# ස්වාධීන විගණක වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } INF/A/0I/SLIC-Life/AR/2024 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2025 අප්‍රේල් 30

සභාපති

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්

**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ පිටු අංක 07 සිට 63 දක්වා මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (සමාගම) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ සිදු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සිදු කිරීමේදී රාජ්‍ය විගණනය සිදු කරන වරලත් ගණකාධිකාරී සමාගමක් මා හට සහය විය.

මගේ මතය තුළ, මෙම මූල්‍ය ප්‍රකාශවලින් 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය හා එහි මූල්‍ය කාර්යසාධනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණු අවධාරණය කිරීම

මූල්‍ය ප්‍රකාශවලට සටහන් 39 කෙරෙහි මම අවධානය යොමු කරවන අතර, ඉන් 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 53 වගන්තිය පරිදි ක්‍රියාත්මක කළ වෙන් කිරීමේ තත්ත්වය සහ 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්ත (සංශෝධිත) පනතේ 30 වගන්තිය සම්බන්ධයෙන් පරිපාලන ක්‍රියාවලියේ තත්ත්වය විස්තර කරයි. මගේ මතය මෙම කරුණ සම්බන්ධයෙන් වෙනස් කරනු නොලබයි.

### 1.4 සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති තොරතුරුවලින් අනෙකුත් තොරතුරු සමන්විත වේ. නමුත් මූල්‍ය ප්‍රකාශනවල සහ මෙම විගණන වාර්තාවේ දිනයට පසු මා වෙත ලබාගැනීමට සැලැස්වීම අපේක්ෂා කරන තොරතුරු එහි ඇති මාගේ විගණන වාර්තාව තුළ ඇතුළත් නොවේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර එහි අන්තර්ගතය පිළිබඳව කිසිදු සහතික කරන අදහසක් මම ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන්, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබාගැනීමට හැකි අවස්ථාවේදී හඳුනාගනු ලබන තොරතුරු කියවීම වන අතර, එසේ කරමින් අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකියයුතු ලෙස නොගැලපේද යන්න සහ විගණනය තුළ හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම සැලකියයුතු ලෙස වැරදියට සඳහන් කර ඇති බව පෙන්නුම් කරන්නේද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2024 වාර්ෂික වාර්තාව මම කියවීමේදී, එහි වැදගත් අවප්‍රකාශ ඇති බව මම පවසන්නේනම්, නිවැරදි කිරීම සඳහා පාලනය සඳහා වගකියන පුද්ගලයින්ට එම කරුණු දැනුම් දීම අවශ්‍ය වේ. තවදුරටත් වැදගත් නිවැරදි නොකළ අවප්‍රකාශ පවතීනම්, යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථා තුළ විධිවිධානවලට අනුව මගේ වාර්තාවට ඒවා ඇතුළත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ස්වාධීන විගණක වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයයි කළමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයන් සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව තක්සේරු කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකිමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය සඳහා වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගම විසින් සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක කොටසක් ලෙස, මා විසින් විගණනය තුළ වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තීය සැක මුසු බව පවත්වා ගනු ලැබිය. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගෙන හා තක්සේරු කර, එම අවදානම්වලට ප්‍රතිචාරාත්මකව විගණන පටිපාටි සැලසුම් කර ඉටු කරමින් මගේ විගණනය සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගනිමි. වංචාවකින් ඇතිවන වැදගත් සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සොයා නොගැනීමේ අවදානම දෝෂයෙන් සිදුවන බලපෑමට වඩා ඉහළ වන අතර, වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, වංචාව දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට සම්බන්ධවන බැවිනි.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබගන්නා ලද නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරමි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ අදාළ හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගැයීමට ලක් කළෙමු.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමනයන් මගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගෙන ඇති විගණන සාක්ෂිය මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළු මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර එයට පාදක වූ සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

# ස්වාධීන විගණක වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2. වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

**2.1.1** 2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියට සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

**2.1.2** 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවන්ට සමාගමේ මූල්‍ය ප්‍රකාශ අනුකූල වේ.

**2.1.3** 2018 අංක 19 දරණ විගණන පනතෙහි 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

**2.1.4** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සදහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලුම නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.2.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව, සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට සමාගම සම්බන්ධ වූ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව සඳහන් කිරීම.

**2.2.2** ඉහත දැ හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව සඳහන් කිරීම:

2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 53 වගන්තියට අනුකූලව, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සහ ජීවිත රක්ෂණ ව්‍යාපාරය ("සමාගම") ලෙස 2024 පෙබරවාරි 01 දින සිට සිය ව්‍යාපාර මෙහෙයුම් වෙන් කර ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි වත්කම් වෙන් කිරීමේ මාර්ගෝපදේශ පරිදි සමාගමට මාරු කර ඇති අතර ඉහළ උසාවිය විසින් අනුමත කළ යෝජනා ක්‍රමය සහ මාරු කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 256 වගන්තිය පරිදි බලාත්මක කරන ලදී. කෙසේවෙතත්, තෙවැනි පාර්ශ්ව සමඟ පරිපාලන නමේ වෙනස්වීම ඇතුළු නියමයන් තවදුරටත් සිදුවෙමින් පවතී.

තවද, සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් දීර්ඝ කිරීමක් ඉල්ලා ඇති අතර එයට හේතුව වෙන් කිරීමට අදාළව පරිපාලන නමේ වෙනස්වීම ඇතුළුව යම් පරිපාලන කරුණු තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතින බැවින් හා වඩා පුළුල්ව පශ්චාත් වෙන් කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස ආමන්ත්‍රණය කරන බැවින් හා සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලිඛිත ප්‍රතිචාරයක් ලැබීමේ ක්‍රියාවලියක සිටින බැවින්ය.

ඒ අනුව, දැනට සිදුවෙමින් පවතින මෙහෙයුම් හා පරිපාලන වෙනස්වීම් හේතුවෙන්, 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධිත) පනතේ 30 වගන්තිය යටතේ පරිපාලන ක්‍රියාපටිපාටිවලට අදාළව අනුකූල නොවීම සඳහන් කර ඇත.

**2.2.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්‍යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව සඳහන් කිරීම.

**2.2.4** 2018 අංක 19 දරණ විගණන පනතෙහි 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සමාගමේ සම්පත්, සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව සඳහන් කිරීම.

**ජී. එච්. ඩී. ධර්මපාල**
විගණකාධිපති (වැඩබලන)

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 5 | 439,973 | – |
| අස්පෘශ්‍ය වත්කම් | 6 | 76,859 | – |
| මූල්‍ය ආයෝජන | 7 | 219,921,456 | – |
| අය වියයුතු ප්‍රතිරක්ෂණ | 8 | 1,288,471 | – |
| ඔප්පු හිමිකරුවන්ගේ ණය | 9 | 2,288,852 | – |
| අය විය යුතු රක්ෂණ වාරික | 10 | 789,230 | – |
| අනෙකුත් වත්කම් | 11 | 1,875,074 | 50 |
| මුදල් සහ මුදලට සමාන දෑ | 12 | 11,945,357 | 500,000 |
| **මුළු වත්කම්** | | 238,625,272 | 500,050 |
| ස්කන්ධය හා වගකීම | | | |
| **ස්කන්ධය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 13 | 12,500,000 | 500,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 14 | 223,243 | – |
| එකොචිත අතිරික්තයෙන් සීමාකළ නියාමන සංචිතය | 15 | 98,237 | – |
| විකිණීම සඳහා පවතින සංචිත | 16 | (34,415) | – |
| ආදායම් සංචිත | 17 | 2,484,993 | (590) |
| **මුළු ස්කන්ධය** | | 15,272,058 | 499,410 |
| **වගකීම්** | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම් | 18 | 216,783,321 | – |
| සේවක ප්‍රතිලාභ බැඳීම | 19 | 898,426 | – |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | | 1,488,094 | – |
| ප්‍රවර්තන බදු වගකීම් | 20 | 559,691 | – |
| අනෙකුත් වගකීම් | 21 | 3,368,757 | 640 |
| මූල්‍ය වගකීම් | 22 | 254,925 | – |
| **මුළු වගකීම්** | | 223,353,214 | 640 |
| **මුළු වගකීම් සහ ස්කන්ධය** | | 238,625,272 | 500,050 |

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.
පිටු අංක 114 සිට 163 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තින් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.
2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

**ශ්‍රියානි කුලසිංහ**
ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී

**නුසිත් කුමාරතුංග**
සභාපති

**ආර්. පී. බුල්ජන්ස්**
අධ්‍යක්ෂ

කොළඹ
2025 අප්‍රේල් 28

# ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|---|
| **දළ ලිඛිත වාරිකය** | 23 | 24,530,862 | – |
| ප්‍රතිරක්‍ෂකයන්ට පවරා දෙන ලද වාරික | 24 | (962,342) | – |
| **ශුද්ධ ලිඛිත වාරිකය** | | 23,568,520 | – |
| අනෙකුත් ආදායම | | | |
| ආයෝජන ආදායම | 25 | 25,770,499 | – |
| ගාස්තු සහ කොමිස් ආදායම | 26 | 75,727 | – |
| ශුද්ධ උපලබ්ධි අලාභ | 27 | (122,425) | – |
| අනෙකුත් ආදායම | 28 | 437,213 | – |
| | | 26,161,014 | – |
| **මුළු ශුද්ධ ආදායම** | | 49,729,534 | – |
| ශුද්ධ ප්‍රතිලාභ, හිමිකම් සහ වියදම් | | | |
| දළ ප්‍රතිලාභ සහ ගෙවූ හිමිකම් | 29 | (12,675,584) | – |
| ප්‍රතිරක්ෂකයින්ට පවරා දුන් හිමිකම් | | 658,988 | – |
| ගිවිසුම් වගකීම්වල වෙනස - ජීවිත අරමුදල | | (24,574,741) | – |
| ප්‍රාරක්ෂණය හා ශුද්ධ අත්කර ගැනීමේ පිරිවැය | 30 | (3,260,446) | – |
| අනෙකුත් මෙහෙයුම් හා පරිපාලන වියදම් | | (5,501,145) | (590) |
| **ශුද්ධ ප්‍රතිලාභ, හිමිකම් සහ වියදම්** | | (45,352,930) | (590) |
| **බදු පෙර ලාභය/(අලාභය)** | 31 | 4,376,604 | (590) |
| ආදායම් බදු වියදම | 32 | (1,734,756) | – |
| **වසර සඳහා ලාභය බෙදාහැරීම:** | | | |
| **සමාගමේ කොටස් හිමියන්** | | 2,641,849 | (590) |

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි
පිටු අංක 114 සිට 163 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ
2025 අප්‍රේල් 28

# ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|---|
| වසර සඳහා ලාභය | | 2,641,849 | (590) |
| අනෙකුත් විස්තීරණ ආදායම | | | |
| **ලාභයට හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය කරන හෝ කළහැකි අයිතම** | | | |
| අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම | 16,18 | 11,037,679 | – |
| අලෙවිය සඳහා තබා ඇති සංචිතවල සාධාරණ අගය මත විලම්භිත බදු බලපෑම | | – | – |
| **ලාභයට හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය කළ නොහැකි අයිතම** | | | |
| දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන මත ශුද්ධ ඉපයීම | 14.1 | 223,243 | – |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලැබීම් | 19.1 | (156,265) | – |
| **වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම** | | 11,104,657 | – |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | 13,746,505 | (590) |
| කොටසක මූලික/තනුක ඉපයීම් (රු.) | 33 | 2.30 | – |
| කොටසක ලාභාංශය (රු.) | 34 | 0.20 | – |

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.
පිටු අංක 114 සිට 163 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි

කොළඹ
2025 අප්‍රේල් 28

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය<br>රු. '000 | ප්‍රත්‍යාගණන සංචිතය<br>රු. '000 | අලෙවිය සඳහා පවතින සංචිතය<br>රු. '000 | ජීවිත රක්ෂණයෙන් අතිරික්තය<br>රු. '000 | සීමාකළ නියාමන සංචිතය<br>රු. '000 | පොදු සංචිතය හා ආදායම් සංචිතය<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | – | – | – | – | – | – | – |
| කොටස්හිමියන්ට ආරෝපිත අතිරික්තය | – | – | – | – | – | – | – |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම | – | – | – | – | – | – | – |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | – | – | – | – | – | – | – |
| කොටස් නිකුතුව | 500,000 | – | – | – | – | – | 500,000 |
| කොටස්හිමියන්ට ආරෝපිත අලාභය | – | – | – | – | – | (590) | (590) |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | 500,000 | – | – | – | – | (590) | 499,410 |
| සීමාකළ නියාමන සංචිතය | – | – | – | – | 98,237 | – | 98,237 |
| කොටස් නිකුතුව | 12,000,000 | – | – | – | – | – | 12,000,000 |
| කොටස්හිමියන්ට ආරෝපිත අතිරික්තය | – | – | – | – | – | 2,641,849 | 2,641,849 |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම | – | 223,243 | 11,037,679 | – | – | (156,265) | 11,104,657 |
| වර්ෂය සඳහා මුළු විස්තීණ ආදායම | – | 223,243 | 11,037,679 | – | – | 2,485,584 | 13,746,505 |
| කොටස්හිමියන්ට ආරෝපිත අතිරික්තය | – | – | – | 2,641,849 | – | (2,641,849) | – |
| අලෙවිය සඳහා පවතින සංචිත මාරු කිරීම - ජීවිත අරමුදල | – | – | (11,072,094) | – | – | – | (11,072,094) |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **12,500,000** | **223,243** | **(34,415)** | **2,641,849** | **98,237** | **(156,855)** | **15,173,821** |

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.
පිටු අංක 114 සිට 163 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ
2025 අප්‍රේල් 28

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | සමාගම | |
|---|---|---|---|
| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද/(භාවිතා කළ) මුදල් ප්‍රවාහ | | | |
| ගනුදෙනුකරුවන්ගෙන් ලද වාරිකය | | 24,426,367 | – |
| ගෙවන ලද ප්‍රතිරක්ෂණ වාරිකය | | (49,660) | – |
| ගෙවන ලද රක්ෂණ ප්‍රතිලාභ හා හිමිකම් | | (12,535,983) | – |
| හිමිකම් සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ලැබීම | | 46,614 | – |
| සැපයුම්කරුවන් සඳහා ගෙවන ලද අතිරික්කය | | (672,903) | – |
| සේවකයින් වෙනුවෙන් ගෙවන ලද මුදල | | (2,959,181) | – |
| ලද පොලිය | | 14,777,762 | – |
| ලද ලාභාංශ | | 684,372 | – |
| අනෙකුත් මෙහෙයුම් මුදල් ගෙවීම් | | (4,733,193) | – |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | A | 18,984,195 | – |
| ගෙවන ලද පාරිතෝෂික | 19.1 | (68,379) | – |
| ගෙවන ලද ආදායම් බදු | 20 | (1,175,065) | – |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 17,740,751 | – |
| ආයෝජන කාර්යයන්ගෙන් ලද මුදල් ප්‍රවාහ | | | |
| මූල්‍ය ආයෝජන අත්පත් කර ගැනීම | 7.6 | (36,094,796) | – |
| මූල්‍ය ආයෝජනවලින් ලද මුදල | | 27,021,330 | – |
| දේපළ පිරියත උපකරණ විකිණීමෙන් ලද මුදල | | 39,806 | – |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | 5.1 | (85,509) | – |
| අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම | 6.1 | (10,997) | – |
| දෙන ලද සේවක හා නියෝජිත ණය | 7.6 | (293,352) | – |
| සේවක හා නියෝජිත ණය අය කිරීම | | 627,353 | – |
| ඔප්පුහිමියන්ට දෙනලද ණය | 9.1 | (1,978,047) | – |
| ඔප්පුහිමියන් විසින් ණය නිරවුල් කිරීම | 9.1 | 2,245,807 | – |
| **ආයෝජන කටයුතු සඳහා භාවිතා කළ ශුද්ධ මුදල** | | (8,528,405) | – |
| මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ | | | |
| වෙන් කිරීම මත ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිඩට් වෙතින් ලද මුදල | | 2,100,512 | – |
| ගෙවන ලද ලාභාංශ | | – | – |
| **මූල්‍ය කටයුතු සඳහා භාවිතා කල ශුද්ධ මුදල** | | 2,100,512 | 500,000 |
| මුදල් හා මුදලට සමාන දෑ මත විනිමය අනුපාත වෙනසේ බලපෑම | | (122,426) | – |
| මුදල් හා මුදලට සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | | 11,190,432 | 500,000 |
| වසර ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ | | 500,000 | – |
| | 12 | 11,690,432 | 500,000 |
| බැංකුවේ සහ අතැති මුදල | | 500,000 | – |
| **වසර ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ** | | 500,000 | – |

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.
පිටු අංක 114 සිට 163 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | සමාගම | |
|---|---|---|---|
| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
| බැංකුවේ සහ අතැති මුදල | | 1,289,870 | 500,000 |
| කෙටිකාලීන ආයෝජන | | 10,655,487 | – |
| බැංකු අයිරාව | | (254,925) | – |
| **වසර අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ** | | 11,690,432 | 500,000 |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ සමඟ මෙහෙයුම් ලාභය සැසඳීම** | | | |
| දිගු කාලීන රක්‍ෂණ අරමුදලේ වැඩිවීම් | | 28,951,345 | – |
| බදු පෙර ලාභය | | – | (590) |
| ක්‍ෂයවීම් ගාස්තු | | 99,086 | – |
| ඔප්පු ණය මත පොළී ආදායම | | (443,858) | – |
| පාරිතෝෂික වෙන් කිරීම | | 113,335 | – |
| දේපළ, පිරියත සහ උපකරණ අලෙවිය මත ලාභ | | (29,797) | – |
| සේවක හා ක්‍ෂෙත්‍ර නිලධාරී ක්‍රමක්ෂය පිරිවැය | | 116,763 | – |
| ආයෝජන ආදායම - උපලබ්ධි (ලාභය/අලාභය) | | (4,404,088) | – |
| විනිමය ගනුදෙනු මත ලාභය/(අලාභය) | | 122,425 | – |
| ණයගැතියන්ගේ වැඩිවීම/(අඩුවීම) | | (7,450,018) | (50) |
| හිමිකම් ප්‍රතිපාදනවල වැඩිවීම/(අඩුවීම) | | 139,601 | – |
| ණය හිමියන්ගේ වැඩිවීම/(අඩුවීම) | | 1,651,447 | 640 |
| ඔප්පුහිමියන්ට අත්තිකාරම් ගෙවීම්වල වැඩිවීම/(අඩුවීම) | | 117,953 | – |
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | 18,984,195 | – |

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.
පිටු අංක 114 සිට 163 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තින් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ
2025 අප්‍රේල් 28

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තාකරණ ආයතනය

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (සමාගම) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත හා පවත්වාගෙන යන සීමිත වගකීම් සහිත රාජ්‍ය සමාගමකි. 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම 2023 ඔක්තෝබර් 11 දින විධිමත්ව සංස්ථාපනය කරන ලදී. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21 දරන රක්ෂණ මන්දිරයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් (SLIC), වෙන් කිරීමත් සමඟ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ජීවිත රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව රක්ෂණ බලපත්‍රය ලබා දී ඇති අතර SLIC බලපත්‍රය ඒ අනුව අවසන් කරන ලදී. (වෙන් කිරීම පිළිබඳ විස්තර සඳහා සටහන 39 බලන්න)

### 1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව පුද්ගලයින් හා ආයතන ගනුදෙනුකරුවන් සමඟ ජීවිත රක්ෂණ ව්‍යාපාරය පවත්වා ගෙන යාමයි.

### 1.3 මව් සමාගම

සමාගමේ මව් සමාගම කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21 දරන රක්ෂණ මන්දිරයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් (SLIC) වන අතර එය සමාගමේ කොටස්වලින් 100%ක් දරයි.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා සාධාරණව ඉදිරිපත් කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

### 1.5 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2025 අප්‍රේල් 28 දින අනුමත කර අවසර ලබා දෙන ලදී.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS/SLFRS) සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ හා සංශෝධිත 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා 2025 අප්‍රේල් 28 දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවසර දෙන ලදී.

### 2.2 මැනීමේ පදනම

සමාගමේ මූල්‍ය ප්‍රකාශ, උපචිත පදනමක් මත සහ විකල්ප පදනමක් මත මනිනු ලබන පහත දක්වෙන ප්‍රමාණාත්මක අයිතමු හැර ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

- රක්ෂණ ඔප්පු හිමියන්ගේ වගකීම් ආයුගණකව නිශ්චය කරන අගයන්ට මනිනු ලැබ ඇත
- නිශ්චිත ප්‍රතිලාභ සඳහා වන වගකීම ආයුගණකව අගයන අතර නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන වටිනාකම ලෙස පිළිගනු ලබයි.
- විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් සාධාරණ අගයට මනිනු ලබයි.
- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම්කළ මූල්‍ය වත්කම් සාධාරණ අගයෙන් මනිනු ලබයි.
- අලෙවිය සඳහා වන මූල්‍ය වත්කම් සාධාරණ අගයට මනිනු ලබයි.

සමාගම එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ද්‍රවශීලතා අනුපිළිවෙලට පුළුල් ලෙස ඉදිරිපත් කරයි.

### 2.3 මූල්‍ය කාලසීමාව

මූල්‍ය ප්‍රකාශන 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සකස් කරනු ලබයි.

### 2.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

අතිරේක තොරතුරු ඇතුළු මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් මුදලින් ඉදිරිපත් කර ඇති අතර, ශ්‍රී ලංකා රුපියල් සමාගමේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වේ. සියලු වටිනාකම් වෙනත් ආකාරයකින් දක්වා නොමැතිනම් ආසන්නතම රුපියල් දහසට වටයා ඇත.

### 2.5 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතයි

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම්, සහ වියදම් යොදා ගැනීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකරණය විසින් සිදු කර ඇත. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක කරගත් උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ප්‍රතිශෝධනයන් අනාගතයේදී බලාපොරොත්තු විය හැකි පරිදි හඳුනාගනු ලබයි.

මූල්‍ය ප්‍රකාශවල හඳුනාගන්නා ප්‍රමාණ මත බලපෑම් කරන උපකල්පන කිරීමේ සහ ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු පහත සඳහන් සටහන් යටතේ ඇතුළත් කර ඇත:

**සටහන 19** – නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මැනීම: ප්‍රධාන ආයුගණක උපකල්පන

**සටහන් 5, 6, 7, 8, 9 සහ 10** – මූල්‍ය නොවන වත්කම් සහ මූල්‍යමය වත්කම් සඳහා හානිකරණ වෙන් කිරීම: ප්‍රධාන උපකල්පනයන්

**සටහන 18** – දිගු කාලීන රක්ෂණවල ආයුගණක ඇගයීමත ප්‍රධාන ආයුගණක උපකල්පන

**සටහන 07** – ලැයිස්තුගත නොකළ සාධන පත්‍රවල සාධාරණ අගය මැනීම සහ මූල්‍ය අයෝජනයන් හි ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය මැනීම

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 2. සකස් කිරීමේ පදනම (ඉතිරි කොටස)

## 2.5 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය (ඉතිරි කොටස)

### සාධාරණ අගය මැනීම

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනාවරණ ගණනාවකට මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් සඳහා සාධාරණ අගය මැනීම අවශ්‍ය වේ.

සමාගමට සාධාරණ අගය මැනීම සඳහා ස්ථාපිත පාලන රාමුවක් ඇත. මෙයට සාධාරණ අගයේ 3 මට්ටම ඇතුළුව සියලුම සැලකියයුතු සාධාරණ අගය මැනීම් අධීක්ෂණය කරයි.

වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මැනීමේදී සමාගම හැකි තරම් නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපළ දත්ත භාවිතා කරයි. ඇගයීමේ ශිල්පීය ක්‍රම භාවිතයේදී යෙදවුම් මත පදනම් වන ධූරාවලියක් විවිධ මට්ටම්වලට සාධාරණ අගයන් පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කරනු ලැබේ:

- **අදියර 1** – අනන්‍ය වත්කම් හා වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපළෙහි නියම කරන ලද මිල (වෙනස් නොකල)
- **අදියර 2** – ඉහත මට්ටම් 1 හි ඇතුළත් නියම කරන ලද මිල හැර අනෙකුත් යෙදවුම් සෘජුව හෝ වක්‍රව වත්කම් සහ වගකීම් සඳහා නිරීක්ෂණය කළ හැකිය.
- **අදියර 3** – නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපළ දත්ත මත පදනම් නොවන වත්කම් සමඟ වගකීම් සඳහා යෙදවුම් (නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්)

සාධාරණ අගයන් මැනීම සඳහා සිදු කරන ලද උපකල්පන පිළිබඳ වැඩිදුර තොරතුරු මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් තුළ ඇතුළත් කර ඇත.

## 2.6 ප්‍රමාණාත්මකතාව සහ සමාහරණය

සමාන අයිතමවල සෑම ප්‍රමාණවත් වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශවල වෙනම ඉදිරිපත් කරනු ලබයි. LKAS 1 – "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අවසර දී ඇති පරිදි වැදගත්නම් මිස සමාන ස්වභාවයේ හෝ වර්ගයේ අයිතම වෙනම ඉදිරිපත් කරනු ලබයි.

## 2.7 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු වඩා හොඳින් ඉදිරිපත් කිරීමට සහ වර්තමාන වසර සමඟ ගැලපීමට අවශ්‍ය වන අවස්ථාවලදී නැවත වර්ගීකරණය කර ඇත.

සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් බලපත්‍රය ලබා දීමෙන් පසු 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව රක්ෂණ ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලදී. පෙර වසරවල යම් රක්ෂණයට අදාළ කටයුතු සමාගම සිදු කර නොමැත. වැඩිදුර තෙතාරතුරු සඳහා සටහන 39 බලන්න.

## 2.8 අඛණ්ඩතා පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් අඛණ්ඩව ඉදිරියට යාමට සමාගමේ හැකියාව ගැන තක්සේරුවක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සිදු කර තිබෙන අතර දැකියහැකි අනාගතයේදී ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමට පත්ව සිටියි. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වාගෙන යාමට සමාගමේ ඇති හැකියාව ගැන අවිශ්වාසයක් ඇති කළ හැකියැයි සැලකිය හැකි අවිනිශ්චිතතා පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් නැත.

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී, ආර්ථික තත්ත්වයන් හී බලපෑම, ජීවිත හා සාමාන්‍ය ව්‍යාපාරය සඳහා වෙනම ආයතන දෙකකට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙන්කිරීම සහ සකස් කිරීමේ අඛණ්ඩ පැවැත්ම පදනම කළමනාකරණය තක්සේරු කර ඇත. ලාභදායිතාව, ආදායම් මූලාශ්‍ර, කාරක ප්‍රාග්ධන කළමනාකරණය, ප්‍රාග්ධන වියදම, මුදල් සංචිත සහ සමාගම විසින් ක්‍රියාත්මක කළ පිරිවැය කළමනාකරණ වැඩසටහන් වැනි පුළුල් සාධක රාශියක් සලකා බලමින් සිය ව්‍යාපාරයේ ඔරොත්තුදීම සහ පවත්නා ගෝලීය ආර්ථික තත්ත්වයන් යටතේ ව්‍යාපාර ගෙන යාම සමාගම තක්සේරු කර ඇත. ලබාගතහැකි තොරතුරු මත පදනම වී විශ්ලේෂණය හා අනාගත දැක්ම මත පදනම් වී, අඛණ්ඩ පැවැත්ම පදනම මත සමාගමට ක්‍රියාත්මක වීමට ඇති හැකියාවට සැලකියයුතු සැකයක් ඇති කරන යම් වැදගත් අවිනිශ්චිතතාවන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නැත. එම නිසා අඛණ්ඩ පැවැත්ම පදනම මත මූල්‍ය ප්‍රකාශ දිගටම පිළියෙළ වනු ඇත.

## 2.9 විදේශ මුදල් ගනුදෙනු

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු එම ගනුදෙනුවේ දිනවල පවතින විනිමය අනුපාත අනුව සමාගම යොදාගන්නා ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල්වලට නම්කළ මූල්‍ය වත්කම් හා වගකීම්, වාර්තාකරණ දිනයට පවතින විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරී මුදල්වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදල්වල සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන වත්කම් හා වගකීම්, සාධාරණ අගය තීරණය කරන විට පැවති විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරී මුදල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල්වල ඓතිහාසික පිරිවැය මත පදනම්ව මනිනු ලබන මූල්‍ය නොවන අයිතම ගනුදෙනුවේ දිනයට ඇති විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කරනු ලබයි.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු

### 3.1 තනි සටහන් තුළ අනාවරණය කරන ප්‍රතිපත්ති

සමාගමේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තනි සටහන් සමඟ අනාවරණය කර ඇත. සටහන් තුළ දක්වා ඇති එක් එක් ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුරූපව යොදා ගෙන ඇත.

### 3.2 තනි සටහන් තුළ ආවරණය නොකළ ප්‍රතිපත්ති

සමාගම විසින් අනුරූපව යොදා ගෙන ඇති පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති වැදගත් ලෙස සලකනු ලැබුවද තනි සටහන් තුළ ඇතුළත් නොකෙරේ.

#### (i) මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය "සෘජු ක්‍රමය" භාවිතා කරමින් සකස් කර ඇති අතර, ප්‍රාග්ධන කටයුතුවලින් මුදල් ප්‍රවාහ වඩා පහසු සංසන්දනය සඳහා "වක්‍ර ක්‍රමය" භාවිතා කරමින් ඉදිරිපත් කෙරේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 4. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

### 4.1 2024 ජනවාරි 01 දින සිට යොදා ගත් නව ප්‍රමිති, අර්ථ කථන, සහ සංශෝධන

2024 ජනවාරි 01 දින හෝ එදිනට පසු ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා සමාගම විසින් පළමු වරට යොදාගත් සමහර ප්‍රමිති සහ සංශෝධන

| ගිණුම්කරණ ප්‍රමිතිය | විස්තරය | බලාත්මක දිනය |
|---|---|---|
| LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට සංශෝධන | ගිවිසුම් සමඟ ජංගම හෝ ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය | 2024 ජනවාරි 01 |
| IFRS 16 කල්බදුවලට සංශෝධන | විකුණුම් හා කල්බදුවල කල්බදු වගකීම | 2024 ජනවාරි 01 |
| LKAS 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ SLFRS 7 මූල්‍ය උපකරණඃ අනාවරණයට සංශෝධන | සැපයුම්කාර මූල්‍ය වැඩපිළිවෙල | 2024 ජනවාරි 01 |
| LKAS 12 ට සංශෝධන | ජාත්‍යන්තර බදු ප්‍රතිසංස්කරණ - ස්ථර 2 ආදර්ශ නියමය | 2024 ජනවාරි 01 |

### 4.2 නිකුත් කලද බලපෑමක් ඇති වියහැකි බලාත්මක නොකළ ප්‍රමිති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය පහත සඳහන් නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් නිකුත් කර ඇති අතර, ඒවා 2025 ජනවාරි 01 වන දින හෝ ඉන් පසුව හෝ පසු දිනක ආරම්භ වන මූල්‍ය කාල පරිච්ඡේද සඳහා අදාළ වනු ඇත.

නිකුත් කරන ලද නමුත් මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනයේදී තවමත් ක්‍රියාත්මක නොවන නව සහ සංශෝධිත ප්‍රමිතීන් පහත දැක්වේඃ

| ගිණුම්කරණ ප්‍රමිතිය | විස්තරය | බලාත්මක දිනය |
|---|---|---|
| විදේශ විනිමය අනුපාතවල වෙනස්වීම්වල බලපෑම් සඳහා SLFRS 21 ප්‍රමිතියට සංශෝධන. | හුවමාරු කිරීමේ හැකියාව නොමැතිකම | 2025 ජනවාරි 01 |
| SLFRS S1 – තිරසාරභාවයට අදාළ මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීම සඳහා වන සාමාන්‍ය අවශ්‍යතා | තීරණ ගැනීමේදී පොදු කාර්ය මූල්‍ය වාර්තා භාවිතා කරන්නන්ට ප්‍රයෝජනවත් වන එහි තිරසාරභාවයට අදාළ අවදානම් සහ අවස්ථා පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම. | 2025 ජනවාරි 01 |
| SLFRS S2 – දේශගුණයට අදාළ හෙළිදරව් කිරීම් | තීරණ ගැනීමේදී පොදු අරමුණු සහිත මූල්‍ය වාර්තා පරිශීලකයින්ට ප්‍රයෝජනවත් වන දේශගුණික අවදානම් සහ අවස්ථාවන් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම. | 2025 ජනවාරි 01 |
| SLFRS 17 – රක්ෂණ ගිවිසුම් | රක්ෂණ ගිවිසුම් වගකීම වත්මන් ඉටුකිරීමේ වටිනාකමකින් මැනීම සහ සියලුම රක්ෂණ ගිවිසුම් සඳහා වඩාත් ඒකාකාරී මිනුම් සහ ඉදිරිපත් කිරීමේ ප්‍රවේශයක් සැපයීම. | 2026 ජනවාරි 01 |
| SLFRS 9 සහ SLFRS 7 ට සංශෝධන | මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මිනුම් කිරීම | 2026 ජනවාරි 01 |
| SLFRS 18 ට සංශෝධන | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම | 2027 ජනවාරි 01 |
| SLFRS 19 ට සංශෝධන | මහජන වගවීමක් නොමැති පරිපාලන සමාගම්ඃ හෙළිදරව් කිරීම් | 2027 ජනවාරි 01 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

4. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් (ඉතිරි කොටස)

4.2 නිකුත් කලද බලපෑමක් ඇති වියහැකි බලාත්මක නොකළ ප්‍රමිති (ඉතිරි කොටස)

### SLFRS 09 වෙතින් තාවකාලික නිදහස්වීම

SLFRS 09 – "මූල්‍ය උපකරණ"

මෙම ප්‍රමිතිය LKAS 39 – "මූල්‍ය උපකරණ: හඳුනා ගැනීම සහ මැනීම" හි පවතින මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කරයි. SLFRS 9 හි මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මැනීම පිළිබඳ සංශෝධිත මාර්ගෝපදේශ, මූල්‍ය වත්කම්වල හානිකරණය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය අලාභ ආකෘතියක් සහ නව සාමාන්‍ය වැටයිමේ ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළත් වේ. SLFRS 9 කලින් යොදා ගැනීමට අවසරය සමඟ 2018 ජනවාරි 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේද සඳහා බලාත්මක වේ.

සමාගම ප්‍රධාන වශයෙන් SLFRS 4 "රක්ෂණ ගිවිසුම්" සඳහා යෝජිත සංශෝධන මත පදනම් වන අතර, එමගින් රක්ෂණ ගිවිසුම් නිකුත් කරන ප්‍රමුඛ ක්‍රියාකාරකම් ඇති ආයතනවලට 2022 දී ආරම්භ වූ සංශෝධිත SLFRS 4 යොදා ගන්නා තෙක් SLFRS 9 හි සම්පූර්ණ යොදාගැනීම කල් දැමීමට අවසර දෙනු ලැබේ. 2026 ජනවාරි 01 වන දින සිට බලාත්මක වන IFRS 17 - " රක්ෂණ ගිවිසුම" ගෝලීය වශයෙන් කල් දැමීමේ ප්‍රතිඵලයක් ලෙස, තාවකාලික නිදහස් කිරීම 2026 ජනවාරි දක්වා කල් දැමීමට සමාගම අපේක්ෂා කරයි.

රක්ෂණකරුවෙකුට SLFRS 9 වෙතින් තාවකාලික නිදහස් කිරීම පහත සඳහන් අවස්ථාවලදී පමණක් හැකි වේ:

අ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම් කර ඇති මූල්‍ය වගකීම් මත ලාභ සහ අලාභ ඉදිරිපත් කිරීම සඳහා වන අවශ්‍යතා පමණක් හැර, එය SLFRS 9 හි කිසිදු පිටපතක් මීට පෙර අදාළ කර නොමැති වීම.

ආ 2016 අප්‍රේල් 01 දිනට පෙර වාර්ෂික වාර්තාකරණ දිනයකදී හෝ ඊට පසු වාර්ෂික වාර්තාකරණ දිනයකදී එහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වීම.

SLFRS 4 - රක්ෂණ ගිවිසුමට කරන ලද සංශෝධනවලට අනුකූලව, රක්ෂණකරුවෙකුගේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වන්නේ, පහත සඳහන් පරිදි නම් පමණි:

අ රක්ෂණ ගිවිසුම් වලින් වෙන් කරන ලද ඕනෑම තැන්පතු සංරචක හෝ අන්තර්ගත ව්‍යුත්පන්නයන් ඇතුළත් වන මෙම SLFRS හි විෂය පථය තුළ ඇති ගිවිසුම්වලින් පැන නගින එහි වගකීම්වල ධාරණ මුදල, එහි සියලුම වගකීම්වල මුළු ධාරණ මුදලට සාපේක්ෂව සැලකිය යුතු වේ, සහ

ආ එහි සියලු වගකීම්වල මුළු ධාරණ මුදලට සාපේක්ෂව රක්ෂණයට සම්බන්ධ වගකීම්වල මුළු ධාරණ මුදලේ ප්‍රතිශතය:

I. සියයට 90ට වඩා වැඩිවීම, හෝ

II. සියයට 90 ට අඩු හෝ සමාන නමුත් සියයට 80 ට වැඩි, සහ රක්ෂණකරු රක්ෂණයට සම්බන්ධ නොවන සැලකිය යුතු ක්‍රියාකාරකමක නිරත නොවීම.

SLFRS 9 වෙතින් තාවකාලික නිදහස් කිරීම, එහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වී ඇත්දැයි ඊළඟ වාර්ෂික වාර්තාකරණ දිනයකදී නැවත තක්සේරු කරනු ලබන්නේ, එම දිනයේ අවසන් වූ වාර්ෂික කාල සීමාව තුළ ආයතනයේ ක්‍රියාකාරකම්වල වෙනසක් සිදුවී ඇත්නම් පමණි.

සංශෝධිත SLFRS 4 යොදා ගැනීමට ආසන්නව, සමාගම SLFRS 9 යටතේ තම ආයෝජන සුදුසු ලෙස වර්ගීකරණය කිරීමට තීරණය කරනු ඇති අතර, එම නිසා වාර්තා කරන දිනයේදී එහි මූල්‍ය ප්‍රකාශන මත SLFRS 9 යොදා ගැනීමේ බලපෑම සම්පූර්ණයෙන්ම ප්‍රමාණනය කිරීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත්, එය සමාගමේ මුළු ස්කන්ධය සැලකිය යුතු ලෙස වෙනස් නොකළ හැකි බව අපේක්ෂා කෙරේ.

SLFRS 17 – රක්ෂණ ගිවිසුම්

SSLFRS 17 රක්ෂණ ගිවිසුම් 2026 ජනවාරි 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා ක්‍රියාත්මක වේ. SLFRS 9 සහ SLFRS 15 යොදා ගැනීමත් සමඟ කලින් යොදා ගැනීමට අවසර ඇත. SLFRS 17 මගින් SLFRS 4 රක්ෂණ ගිවිසුම් අවලංගු කරයි. සමාගම එහි අනිවාර්ය බලාත්මක දිනයේදී නව ප්‍රමිතිය යොදා ගැනීමට අදහස් කරයි.

SLFRS 4 මගින් රක්ෂණකරුවන්ට 2005 ජනවාරි මාසයට පෙර තම බල ප්‍රදේශය තුළ පැවති රක්ෂණ වත්කම් සහ වගකීම් සඳහා ගිණුම්කරණයේ ව්‍යවස්ථාපිත පදනම දිගටම භාවිතා කිරීමට අවසර ලබා දී ඇත. SLFRS 17 සියලුම රක්ෂණ ගිවිසුම් සඳහා නව මිනුම් ආකෘතියක් සමඟ ප්‍රතිස්ථාපනය කරයි.

SLFRS 17 මගින් රක්ෂණ ගිවිසුම් සඳහා වගකීම් අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම ලෙස හඳුනා ගැනීමට අවශ්‍ය වන අතර, වත්මන් තත්ත්වයන් පිළිබිඹු කිරීම සඳහා සෑම වාර්තාකරණ දිනකම යාවත්කාලීන කරන ලද පැහැදිලි අවදානම් ගැලපීමක් සහ ඕනෑම දිනයකට - මූලික හඳුනාගැනීම මත පැන නගින එක් ලාභයකට සමාන සහ ප්‍රතිවිරුද්ධ ගිවිසුම්ගත සේවා ආන්තිකයක් ඇතුළත් වේ. අලාභ සෘජුවම ආදායම් ප්‍රකාශයට හඳුනා ගනී. ඇගයීමේ අරමුණ සඳහා, ගිවිසුම් අවදානම් ලාභදායිතා පැතිකඩ සහ නිකුත් කළ වර්ෂයට සමාන ගිවිසුම් ලෙස වෙන වෙනම කළමනාකරණය කරනු ලබන ගිවිසුම් සඳහා තවදුරටත් බෙදීම් සමඟ කාණ්ඩගත කර ඇත. SLFRS 17 යටතේ රක්ෂණ ගිවිසුම් සඳහා ලාභය රක්ෂණ ඔප්පු හිමියන්ට සපයනු ලබන සේවාව පිළිගැනීම (CSM මුදා හැරීම), ආර්ථික නොවන අවදානමෙන් නිදහස් කිරීම (අවදානම් ගැලපුම් මුදා හැරීම) සහ ආයෝජන ලාභය මගින් නියෝජනය වේ.

රක්ෂණ ඔප්පුහිමියාට සේවා සැපයීම පිළිබිඹු කරමින්, රක්ෂණ ගිවිසුමේ ආවරණ කාලය පුරාවට ලාභයක් ලෙස CSM නිකුත් කරනු ලබයි. සහභාගීත්ව ලක්ෂණ සහිත ඇතැම් ගිවිසුම් සඳහා (අදාළ ආයෝජනවල සාධාරණ වටිනාකමෙන් සැලකිය යුතු කොටසක් සහ අනෙකුත් පාදක අයිතම රක්ෂණ ඔප්පු හිමියන්ට ගෙවනු ලබන අවස්ථාව) CSM මගින් කොටස් හිමියන්ට විචල්‍ය ගාස්තුව පිළිබිඹු කරයි. මෙම ගිවිසුම් සඳහා, ආර්ථික අත්දැකීම් සහ උපකල්පනවල වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා CSM ගලපා ඇත. අනෙකුත් සියලුම ගිවිසුම් සඳහා ආර්ථික නොවන උපකල්පන සඳහා පමණක් CSM ගලපා ඇත.

රක්ෂණ ඔප්පු හිමියන්ට සේවා සැපයීම මත පදනම්ව සහ ඔප්පුවල ආයෝජන අංගවලට අදාළ ඕනෑම වාරිකයක් බැහැර කරමින් SLFRS 17 රක්ෂණ ආදායම පිළිබඳ නව මිනුමක් හඳුන්වා දෙන අතර එය ආදායම් ප්‍රකාශනයේ දැනට වාර්තා කර ඇති පවතින වාරික ආදායම් මිනුම්වලට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වනු ඇත. SLFRS 17 වෙත සංක්‍රමණය වීම සඳහා, සංක්‍රාන්ති දිනයේ CSM මත කල් දැමූ ලාභ ප්‍රමාණය තීරණය කිරීම අවශ්‍යය.

SLFRS 17 මගින් ප්‍රමිති අතීතානුයෝගීව යොදා ගෙන තිබුනේනම්, CSM ගණනය කිරීම අවශ්‍ය වේ. මෙය ප්‍රායෝගික නොවේනම්, යම් ආයතනයක් සරලකළ අතීතානුයෝගී ප්‍රවේශයක් තෝරා ගැනීම හෝ සංක්‍රාන්ති දිනයට වගකීම්වල සාධාරණ අගයට යොමුව මගින් CSM තීරණය කිරීම අවශ්‍යය. CSM තීරණය කිරීම සඳහා ප්‍රවේශය කොටස්හිමියන්ගේ ස්කන්ධය මත හෝ අනාගත වර්තාකරණ කාලසීමාවන්වල බලාත්මක ව්‍යාපාරය මත ලාභයේ ප්‍රමාණය මත සැලකියයුතු බලපෑමක් ඇතිවිය හැකිය.

SLFRS 17 මගින් මූල්‍ය ප්‍රකාශ සහ අනාවරණ ඉදිරිපත් කිරීමේදී සැලකියයුතු වෙනසක් ඇතිවිය හැකි බවට අපේක්ෂා කරන අතර එයට හේතුව නව ප්‍රමිතියේ අවශ්‍යතා සංකීර්ණ වීම සහ රක්ෂණ ගිවිසුම් සඳහා ගිණුම්කරණය මෙන්ම සැලකියයුතු විනිශ්චය හා නව තක්සේරු ශිල්ප යොදා ගැනීමට මූලික වෙනසක් අවශ්‍ය වීමයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

4. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් (ඉතිරි කොටස)

4.2 නිකුත් කලද බලපෑමක් ඇති වියහැකි බලාත්මක නොකළ ප්‍රමිති (ඉතිරි කොටස)

මෙවැනි ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අවශ්‍ය වෙනස්වීමේ බලපෑම දැනට අවිනිශ්චිත නමුත් වෙනත් කරුණු අතර ලාභ හඳුනා ගැනීමේ කාලය වෙනස්වීම වැනි වෙනස්වීම් අපේක්ෂා කළ හැකිය.

SLFRS 17 ක්‍රියාත්මක කිරීමත් සමඟ, රක්ෂණයට අදාළ වත්කම් හා වගකීමට ඡායා ගිණුම්කරණය අදාළ කරනු නොලැබේ.

SLFRS 17 ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක වැඩසටහනක් සමාගමට ඇත. මෙම වැඩසටහන ගිණුම්කරණ ප්‍රතිපත්ති සකස් කිරීම සහ යොදා ගැනීමේ ක්‍රම සංවර්ධනය, සුදුසු ක්‍රියාවලි හා පාලනයන් ස්ථාපිත කිරීම, සුදුසු දිනය නියම කිරීම සහ ආයුගණක හා මූල්‍ය පද්ධතියේ වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතුය.

## 5. දේපල, පිරියත හා උපකරණ (PPE)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

දේපල, පිරියත හා උපකරණ යනු ස්පෘශ්‍ය වත්කම් වන අතර භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හෝ සැපයීම, අන්අයට කුලියටදීම, හෝ පරිපාලන අරමුණු සඳහා භාවිතා කිරීමට තබාගන්නා අතර, එක් වරකට වැඩිකාලයක් භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

### හඳුනාගැනීමේ පදනම

දේපල, පිරියත හා උපකරණ වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ප්‍රවාහය වන සහ LKAS 16 – “දේපල, පිරියත හා උපකරණ” අනුව වත්කමේ පිරිවැය පහසුවෙන් මැනිය හැකි අවස්ථාවේදී හඳුනා ගනී.

### මූලික හඳුනා ගැනීම හා මැනීම

දේපල, පිරියත හා උපකරණවල යන අයිතම සමුච්චිත ක්ෂයකිරීම සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට මනිනු ලැබේ. දේපල, පිරියත හා උපකරණවල පිරිවැය යනු එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට වත්කම ගෙනඒමට දරන ලද යම් වියදම් සමඟ අත්කරගැනීම හෝ ඉදිකිරීම සඳහා වූ පිරිවැයයි.

බැහැරකිරීම මත යම් ලාභ හෝ අලාභ ලාභය හෝ අලාභය තුළ වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනාගනී.

### පසුකාලීන වියදම හා ප්‍රතිස්ථාපනය

දේපල, පිරියත හා උපකරණ යන අයිතමයක් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය අයිතමය හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ප්‍රවාහය වන සහ වත්කමේ පිරිවැය පහසුවෙන් මැනිය හැකි අවස්ථාවේදී ධාරණ අගයට හඳුනාග නී. ප්‍රතිෂ්ඨාපනය කළ කොටසේ ධාරණ අගය බැහැර කෙරේ. දේපල, පිරියත හා උපකරණවල දෛනික සේවා පිරිවැය දරන ලද පරිදි ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

### දේපල, පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගණනය

සාධාරණ අගය පහසුවෙන් මැනිය හැකි වත්කමක් හඳුනාගැනීමෙන් පසු, එය පසුකාලීන සමුච්චිත ක්ෂයකිරීම සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ ප්‍රත්‍යාගණන දිනයේදී ප්‍රත්‍යාගණන ප්‍රමාණයට ගෙන යනු ලැබේ. ප්‍රත්‍යාගණන වත්කමේ සාධාරණ අගය වාර්තාකරණ දිනයට එහි ධාරණ අගයෙන් සැලකියයුතු ලෙස වෙනස් නොවන බව සහතික කිරීමට ඇගයීම් සිදු කරනු ලැබේ. වත්කම්වල ඇගයීම අවම වශයෙන් වසර තුනකට වෘත්තීමය වශයෙන් සුදුසුකම් සහිත තක්සේරුකරුවෙක් මගින් සිදු කරන අතර සාධාරණ අගයේ වෙනස්වීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය එය ඇති වූ වසරේ අනෙකුත් විස්තරාත්මක ආදායමට ඇතුළත් කෙරේ.

ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස ධාරණ අගයේ යම් වැඩිවීමක් අනෙකුත් විස්තරාත්මක ආදායමේ හඳුනාගෙන ප්‍රත්‍යාගණන සංචිතයේ ශීර්ෂය යටතේ ස්කන්ධය තුළ එකතු කෙරේ. කෙසේවෙතත්, ලාභ හෝ අලාභයෙන් කලින් හඳුනාගත් එම වත්කමේ ප්‍රත්‍යාගණන අඩුවීමක් ආපසු හරවන ප්‍රමාණයට වැඩිවීම ලාභ හෝ අලාභයෙන් හඳුනා ගනී.

ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස ධාරණ අගයේ යම් අඩුවීමක් ලාභ හෝ අලාභය තුළ හඳුනා ගනී. කෙසේවෙතත්, එම වත්කම සම්බන්ධ ප්‍රත්‍යාග ණන අතිරික්තය තුළ පවතින යම් ණය ශේෂයේ ප්‍රමාණයට අඩුවීම අනෙකුත් විස්තරාත්මක ආදායමේ හඳුනා ගනී.

ඊට අමතරව, ප්‍රත්‍යාගණනයේ දිනයට සමුච්චිත ක්ෂයකිරීම වත්කමේ දළ ධාරණ අගයට අනුව ඉවත් කරන අතර, ශුද්ධ ප්‍රමාණය වත්කමේ ප්‍රත්‍යාගණන ප්‍රමාණයට නැවත සඳහන් කෙරේ. බැහැර කිරීම මත, විකිණීමට අදාළ ශේෂ වත්කමට අදාළ යම් ප්‍රත්‍යාගණන සංචිත රඳවාගත් ඉපයීම්වලට සෘජුවම මාරු කෙරේ.

### ක්ෂයකිරීම

ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය පුරා සරල මාර්ගික ක්‍රමය භාවිතා කරමින් ඒවායේ ඇස්තමේන්තුගත සුන්බුන් අගයන් අඩු කළ දේපල, පිරියත සහ උපකරණ අයිතමවල පිරිවැය කපාහැරීම සඳහා ක්ෂයවීම ගණනය කරනු ලබන අතර එය සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභය තුළ හඳුනා ගනී.

මෙය වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව වඩාත් සමීපව පිළිබිඹු කරයි.

| වත්කම් පන්තිය | වසරට ක්ෂයකිරීමේ පිරිවැය | ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය වසර | සුන්බුන් වටිනාකම |
|---|---|---|---|
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 15% | 6 2/3 | නැත |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 15% | 6 2/3 | නැත |
| මෝටර් වාහන | 20% | 5 | නැත |
| පරිගණන හා පරිගණක උපකරණ | 20% | 5 | නැත |
| වෙනත් ස්ථාවර වත්කම් | 25% | 4 | නැත |

ක්ෂයකිරීමේ ක්‍රම, ඵලදායී ජීවකාල, සහ සුන්බුන් වටිනාකම් එක් එක් වාර්තාකරණ දිනයට සමාලෝචනය කරන අතර සුදුසු පරිදි ගලපනු ලැබේ

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

5. දේපල, පිරියත හා උපකරණ (ඉතිරි කොටස)

හඳුනා නොගැනීම

බැහැර කිරීම මත හෝ භාවිතා කිරීම හෝ බැහැර කිරීම තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකිවීම මත හෝ දේපල, පිරියත හා උපකරණවල යම් අයිතමක ධාරණ අගය හඳුනා නොගනී. දේපල, පිරියත හා උපකරණවල යම් අයිතමයක් හඳුනා නොගැනීම මත ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය බැහැර කරන අවස්ථාවේදී ලාභය හෝ අලාභයට ඇතුළත් කෙරේ.

හානිකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය 2024 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණවල විභව හානිකරණ අලාභ තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම් වී, දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වාර්තාකරණ දිනයට මූල්‍ය ප්‍රකාශවල හානිකරණ වෙන් කිරීම් සිදුකළ යුතුව ඇත.

### 5.1 දේපල, පිරියත හා උපකරණවල දළ ධාරණ අගයේ වෙනස්වීම

| පිරිවැය/ප්‍රත්‍යාගණනය | උපකරණ<br>රු. '000 | ගෘහභාණ්ඩ හා සවිකිරීම්<br>රු. '000 | මෝටර් රථ<br>රු. '000 | වෙනත්<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | – | – | – | – | **–** |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙතින් මාරු කිරීම | 287,164 | 79,891 | 236,170 | – | **603,226** |
| වසර තුළ එකතු කිරීම් | 73,941 | 11,183 | – | 385 | **85,509** |
| ප්‍රත්‍යාගණන සංචිත | – | – | 223,242 | – | **223,242** |
| ප්‍රත්‍යාගණනය හේතුවෙන් මාරු කිරීම | – | – | (159,353) | – | **(159,353)** |
| වසර තුළ බැහැර කිරීම | (117) | – | (48,000) | – | **(48,117)** |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 360,988 | 91,074 | 252,060 | 385 | **704,508** |
| **ක්ෂය කිරීම** | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | – | – | – | – | **–** |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙතින් මාරු කිරීම | 166,686 | 52,581 | 162,993 | – | **382,260** |
| වසර සඳහා ක්ෂය කිරීමේ වෙනස | 40,660 | 4,679 | 34,350 | 46 | **79,735** |
| ප්‍රත්‍යාගණනය හේතුවෙන් මාරු කිරීම | – | – | (159,353) | – | **(159,353)** |
| වසර තුළ බැහැර කිරීම | (117) | – | (37,991) | – | **(38,108)** |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 207,229 | 57,260 | – | 46 | **264,535** |
| 2024 දෙසැම්බර් 31 ධාරණ අගය | 153,759 | 33,814 | 252,060 | 339 | **439,973** |
| 2023 දෙසැම්බර් 31 ධාරණ අගය | – | – | – | – | **–** |

### 5.2 වසර තුළ දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීම

මූල්‍ය වසර තුළ, රු. මිලියන 85.5ක් (2023 - නැත) වටිනා දේපල, පිරියත හා උපකරණ සමාගම අත්කරගෙන ඇත.

### 5.3 වසර තුළ දේපල, පිරියත හා උපකරණ හානිකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය 2024 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණවල විභව හානිකරණ අලාභ තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම් වී, දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වාර්තාකරණ දිනයට මූල්‍ය ප්‍රකාශවල හානිකරණ වෙන් කිරීම් සිදුකළ යුතුව ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

5. දේපල, පිරියත හා උපකරණ (ඉතිරි කොටස)

## 5.4 භාවිතයේ ඇති සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපල, පිරියත හා උපකරණ

වාර්තාකාරණ දිනයට භාවිතයේ ඇති සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපල, පිරියත හා උපකරණවල මූලික පිරිවැය පහත පරිදි වේ:

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| ගෘහභාණ්ඩ හා උපකරණ | 42,256 | – |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 856 | – |
| පරිගණක හා පරිගණක උපකරණ | 98,970 | – |
| **එකතුව** | 142,082 | – |

## 5.5 දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

2024 මූල්‍ය වසර තුළ, දේපල තක්සේරු කිරීමේ සුදුසු පළපුරුද්ද සහිත ස්වාධීන වරලත් තක්සේරු කරුවෙක් වන ඒ ඒ එම් ෆාතිහු (MRICS) විසින් මෝටර් රථ ප්‍රත්‍යාගණනය කර ඇත.

ඉදිරි තක්සේරු දිනය 2027 දෙසැම්බර් 31 වනු ඇත.

## 6. අසපෘශ්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමාගමේ අස්පෘශ්‍ය වත්කම්වලට පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුළත්ය.

### මූලික හඳුනා ගැනීම සහ මැනීම

වත්කමට ආරෝපනය වන අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ප්‍රවාහය වන සහ වත්කමේ පිරිවැය පහසුවෙන් මැනිය හැකි අවස්ථාවේදී අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනී. අස්පෘශ්‍ය වත්කමක් මූලිකවම පිරිවැයට හඳුනාග නී. සමාගම විසින් අත්කරගත් නිශ්චිත ඵලදායී ජීව කාලයක් ඇති පරිගණක මෘදුකාංග සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට මනිනු ලැබේ.

### පසුකාලීන වියදම

මෘදුකාංගයක පසුකාලීන වියදම එයට සම්බන්ධ විශේෂ වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි වන අවස්ථාවේ දී පමණක් ප්‍රාග ්ධනනීයකරණය කෙරේ. අනෙකුත් සියලුම වියදම් දරා ඇති පරිදි ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

### ක්‍රමක්ෂය

ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරා සරල මාර්ගික ක්‍රමය භාවිතා කරමින් ඒවායේ ඇස්තමේන්තුගත සුන්බුන් අගයන් අඩු කළ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය කපාහැරීම සඳහා ක්‍රමක්ෂය ගණනය කරනු ලබන අතර එය ලාභ හෝ අලාභය තුළ හඳුනා ගනී. මෘදුකාංග යක ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය වසර පහකි. ක්‍රමක්ෂය ක්‍රම, ඵලදායී ජීව කාල, සහ සුන්බුන් වටිනාකම එක් එක් වාර්තාකරණ දිනයට සමාලෝචනය කරන අතර සුදුසු පරිදි ගලපනු ලැබේ

### නිශ්චිත ඵලදායී ජීවකාල සහිත අස්පෘශ්‍ය වත්කම්

නිශ්චිත ඵලදායී ජීවකාල සහිත අස්පෘශ්‍ය වත්කම් ඵලදායී ආර්ථික කාලය පුරා ක්‍රමක්ෂය කරන අතර, අස්පෘශ්‍ය වත්කම හානිකරණය වියහැකි බවට හැඟවීමක් ඇත්නම් හානිකරණය සඳහා තක්සේරු කෙරේ. නිශ්චිත ඵලදායී ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක ක්‍රමක්ෂය කාලසීමාව හා ක්‍රමක්ෂය ක්‍රමය අවම වශයෙන් එක් එක් මූල්‍ය වසර අවසානයේ දී සමාලෝචනය කෙරේ. අපේක්ෂිත ඵලදායී ජීවකාලයේ හෝ වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාවේ වෙනස්වීම සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව හා ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කරමින් ගණනය කරන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙස සලකනු ලැබේ. නිශ්චිත ඵලදායී ජීවකාල සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය අස්පෘශ්‍ය වත්කමේ කාර්යයට අනුකූලවන වියදම් වර්ගය තුළ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

### ඵලදායී ආර්ථික ජීවකාලය හා ක්‍රමක්ෂය

| අස්පෘශ්‍ය වත්කම් | ඵලදායී ජීවකාලය | සුන්බුන් වටිනාකම | ක්‍රමක්ෂය පිරිවැය |
|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | වසර 5 | නැත | සරල මාර්ගික පදනම |

### අවිනිශ්චිත ඵලදායී ජීවකාල සහිත අස්පෘශ්‍ය වත්කම්

අවිනිශ්චිත ඵලදායී ජීවකාල සහිත අස්පෘශ්‍ය වත්කම් හානිකරණය සඳහා හැඟවීමක් තිබේද යන්න නොසලකා හානිකරණය සඳහා වාර්ෂිකව තනි තනිව හෝ මුදල් උත්පාදනය කරන ඒකක මට්ටමින් පරීක්ෂා කරනු ලැබේ. එවැනි අස්පෘශ්‍ය දේ ක්‍රමක්ෂය නොකෙරේ. අවිනිශ්චිත ඵලදායී ජීවකාල සහිත අස්පෘශ්‍ය වත්කමක ප්‍රයෝජනවත් ආයු කාලය අවිනිශ්චිත ජීවකාල තක්සේරුව අඛණ්ඩව සහාය දැක්විය හැකිද යන්න තීරණය කිරීම සඳහා වාර්ෂිකව සමාලෝචනය කරනු ලබයි. එසේ නොමැති නම්, ඵලදායී ජීවකාල තක්සේරුව අවිනිශ්චිත සිට නිශ්චිත දක්වා වෙනස් කිරීම අනාගත පදනමක් මත සිදු කෙරේ.

### අස්පෘශ්‍ය වත්කම් හානිකරණය

2024 දෙසැම්බර් 31 වන දිනට සමාගම අස්පෘශ්‍ය වත්කම්වල විභව හානිකරණ දර්ශක තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම්ව, කිසිදු හානිකරණ දර්ශක හඳුනාගෙන නොමැත.

### හඳුනා නොගැනීම

බැහැර කිරීම මත හෝ භාවිතා කිරීම හෝ බැහැර කිරීම තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකිවීම මත හෝ අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගනී. එවැනි අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගැනීම මත ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය බැහැර කරන අවස්ථාවේදී ලාභය හෝ අලාභයට ඇතුළත් කෙරේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

6. අස්පෘශ්‍ය වත්කම් (ඉතිරි කොටස)

### 6.1 අස්පෘශ්‍ය වත්කම්වල ධාරණ අගයන්හී වෙනස්වීම

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|
| **පරිගණක මෘදුකාංග** | | |
| **පිරිවැය** | | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙතින් මාරු කිරීම | 204,451 | – |
| වසර සඳහා එකතුකිරීම | 10,997 | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 215,448 | – |
| **සමුච්චිත ක්‍රමක්ෂය හා හානිකරණය** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙතින් මාරු කිරීම | 119,239 | – |
| වසර සඳහා ක්ෂය කිරීමේ වෙනස | 19,351 | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 138,590 | – |
| **දෙසැම්බර් 31 දිනට ධාරන අගය** | 76,859 | – |

### 6.2 වසර තුළ අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම

මූල්‍ය වසර තුළ, රු. මිලියන 10.9ක අස්පෘශ්‍ය වත්කම් සමාගම අත්කරගෙන ඇත.

### 6.3 භාවිතය තුළ සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කළ අස්පෘශ්‍ය වත්කම්

වාර්තාකරන දිනයට සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කළ අස්පෘශ්‍ය වත්කම් රු. මිලියන 43ක්විය.

### 6.4 අස්පෘශ්‍ය වත්කම් මත අයිතිය සීමා කිරීම

වාර්තාකරන දිනයට සමාගමේ අස්පෘශ්‍ය වත්කම්වල අයිතිය පිළිබඳ පැවති සීමා කිරීම් නොමැත.

### 6.5 අස්පෘශ්‍ය වත්කම්වල හානිකරණය තක්සේරු කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය 2024 දෙසැම්බර් 31 දිනට අස්පෘශ්‍ය වත්කම්වල විභව හානිකරණ දර්ශක තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම් වී, කිසිදු හානිකරණ දර්ශක හඳුනා ගෙන නොමැත.

### 6.6 සුරැකුම් ලෙස භාවිතාකළ අස්පෘශ්‍ය වත්කම්

වාර්තාකරන දිනයට වගකීම් සඳහා සුරැකුම් ලෙස භාවිතා කරන ලද කිසිදු අස්පෘශ්‍ය වත්කමක් නොමැත.

### 6.7 ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනනීයකරණය

වසර තුළ, අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීමට අදාළ ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනනීයකරණය කර නොමැත.

### 6.8 අස්පෘශ්‍ය වත්කම්වලට වෙනත් වෙනස්වීම්

සටහන අංක 6.1 හි අනාවරණය කර ඇති පරිදි හැර, සමාලෝචිත වසර තුළ අස්පෘශ්‍ය වත්කම්වලට වෙනත් වෙනස්වීම් නොමැත.

### 6.9 තනි තනිව ප්‍රමාණවත්/වැදගත් අස්පෘශ්‍ය වත්කම්

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට වැදගත් වන තනි තනි අස්පෘශ්‍ය වත්කම් නොමැත.

### 6.10 අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම සඳහා ගිවිසුම්ගත බැඳීමේ ප්‍රමාණය

වාර්තාකරන දිනයට අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම සඳහා කිසිදු ගිවිසුම්ගත බැඳීමක් නොමත.

### 6.11 අස්පෘශ්‍ය වත්කම් ප්‍රත්‍යාගණනය

පිරිවැය ආදර්ශය අනුගමනය කර ඇති බැවින්, අස්පෘශ්‍ය වත්කම් සඳහා ප්‍රත්‍යාගණන ගැලපීම් නොමැත.

## 7. මූල්‍ය ආයෝජන හා මූල්‍ය ආයෝජනවල සාධාරණ වටිනාකම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය උපකරණයන් යනු එක් ආයතනයකට මූල්‍ය වත්කමක් ඇති කරන හා වෙනත් ආයතනයකට මූල්‍ය වගකීම හෝ ස්කන්ධ උපකරණයක් ඇති කරන ගිවිසුමකි.

මූල්‍ය වත්කම් වර්ගීකරණය

මූල්‍ය වත්කම් වර්ගීකරණය

සමාගම ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් පහත සඳහන් වර්ගීකරණයන්ට වර්ග කරයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVTPL)

කල්පිරීමට තබා ඇති (HTM)

ණය හා ලැබීම් (L&R) සහ

විකිණීම සඳහා පවතින (AFS) මූල්‍ය වත්කම්

2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මකව SLFRS 9 – මූල්‍ය උපකරණ මගින් LKAS 39 ප්‍රතිෂ්ඨාපනය කරන ලදී. කෙසේවෙතත්, SLFRS 9 න් තාවකාලිව නිදහස්වීමේ යෝග්‍යතා නිර්ණායකය සමාගම සපුරා ඇති අතර, 2026 ජනවාරි 01 දක්වා එය යොදා ගැනීම කල්දැම්මට අපේක්ෂා කරයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 7. මූල්‍ය ආයෝජන හා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගය (ඉතිරි කොටස)

### මූලික මැනීම

සමාගම උත්පාදනය කරන දිනයට නිකුත් කළ ණය ලැබීම් හා ණය සුරැකුම්පත් මූලිකව හඳුනා ගනී. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම්කළ වත්කම් ඇතුළුව) උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශ්වයක් බවට සමාගම පත්වන වෙළෙඳ දිනයට මූලිකව හඳුනා ගනී.

මූල්‍ය වත්කමක් සාධාරණ අගයට හා ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයක් නොමැති වත්කමක් සඳහා, එහි අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය සමග මූලිකව මනිනු ලැබේ.

මූල්‍ය වත්කම්වල එක් එක් පන්තිවල පසුකාලීන මැනීම අදාළ උපසටහන්වල අනාවරණය කෙරේ.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ආයෝජන හා විකිණීම සඳහා පවතින ආයෝජන සාධාරණ අගයට මනිනු ලැබේ. කල්පිරීමට තබා ඇති ආයෝජන සහ ණය හා ලැබීම් ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගය කෙරේ.

### මූල්‍ය වත්කම් හානිකරණයි

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට වර්ගීකරණය නොකළ මූල්‍ය වත්කම් හානිකරණය පිළිබඳ විෂයමූලික සාක්ෂියක් තිබේද යන්න තීරණය කිරීමට එක් එක් වාර්තාකරන දිනයට තක්සේරු කෙරේ.

මූල්‍ය වත්කම හානිකරණය වන බවට විෂයමූලික සාක්ෂියට පහත දෑ අතුළත්ය:

- ණයගැතියෙකු විසින් පැහැර හැරීම හෝ යුතුකම පැහැර හැරීම
- ණයගැතියෙකු හෝ නිකුත් කරන්නෙකු බුන්වත්භාවයට පත්වන බවට හැඟවීම්
- ණය ගැතියන්ගේ හෝ නිකුත් කරන්නන්ගේ ගෙවීම් තත්ත්වයේ අහිතකර වෙනස්කම්
- මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සුරැකුමක් සඳහා සක්‍රීය වෙළෙඳපොළක් නොමැති වීම; හෝ මූල්‍ය වත්කම් සමූහයකින් අපේක්ෂිත මුදල් ප්‍රවාහවල මැනිය හැකි අඩුවීමක් ඇති බව පෙන්නුම් කරන නිරීක්ෂණය කළ හැකි දත්ත

### හිලව් කිරීම

සමාගමට දැනට එම ප්‍රමාණය හිලව් කිරීමට නීතියෙන් බලාත්මක අයිතියක් ඇත්නම් හා වගකීම ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ එකවර වත්කම මුදාහැර වගකීම නිරවුල් කිරීමට අදහස් කරන්නේනම් පමණක් මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව්කර ශුද්ධ ප්‍රමාණය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ඉදිරිපත් කරනු ලබයි.

### මූල්‍ය වත්කම් හඳුනා නොගැනීම

වත්කමෙන් මුදල් ප්‍රවාහවලට ඇති ගිවිසුම්ගත අයිතිය කල්පිරෙන හෝ ගනුදෙනුවක් තුළ මූල්‍ය වත්කම මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය මාරුකරන සහ එහිදී මූල්‍ය වත්කමක හිමිකාරත්වයේ සියලුම අවදානම් හා ප්‍රදාන සැලකියයුතු ලෙස මාරු කරන්නේනම් පමණක් සමාගම මූල්‍ය වත්කම් හඳුනා නොගනී. සමාගම විසින් නිර්මාණය කරන හෝ රඳවාගන්නා මාරුකළ මූල්‍ය වත්කම තුළ යම් පොලිය වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී.

මූල්‍ය උපකරණයක සාධාරණ අගයන් ඒවායේ මුළු ධාරණ අගයට පහත වගුවෙන් සංසන්දනය කරයි.

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 ධාරණ අගය රු. '000 | 2024 සාධාරණ අගය රු. '000 | 2023 ධාරණ අගය රු. '000 | 2023 සාධාරණ අගය රු. '000 |
|---|---|---|---|---|---|
| කල්පිරීමට තබා ඇති (HTM) | 7.1 | 79,756,987 | 80,035,528 | – | – |
| ණය හා ලැබීම් (L&R) | 7.2 | 35,573,902 | 35,573,902 | – | – |
| විකිණීම සඳහා පවතින (AFS) | 7.3 | 89,306,808 | 89,306,808 | – | – |
| ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVTPL) | 7.4 | 15,283,759 | 15,283,759 | – | – |
| **මුළු මූල්‍ය උපකරණ** | | 219,921,456 | 220,199,997 | – | – |

## 7.1 කල්පිරීමට තබා ඇති මූල්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

### මූලික මැනීම

මේවා ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර, ස්ථාවර කල්පිරීම් සමාගමට කල්පිරෙන තෙක් තබා ගැනීමේ අභිප්‍රාය සහ හැකියාව යන දෙකම ඇති විට කල්පිරීමට තබා ඇති ලෙස වර්ගීකරණය කෙරේ. මෙම වත්කම් සාධාරණ වටිනාකමට සහ සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයට මූලිකව හඳුනාගනී.

කල්පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් සමාගම විසින් දරන භාණ්ඩාගාර බිල්පත්, ලැයිස්තුගත ණයකර,සහ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජවලින් සමන්විතය.

### පසුකාලීන මැනීම

මූලිකව හඳුනාගැනීමෙන් පසු, ඒවා ඵලදායී පොලී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 7. මූල්‍ය ආයෝජන හා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගය (ඉතිරි කොටස)

### 7.1 කල්පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් (ඉතිරි කොටස)

#### ක්‍රමක්ෂය පිරිවැය

මූල්‍ය වත්කමක ක්‍රමක්ෂය පිරිවැය යනු මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කම මනිනු ලබන මුදලින්, ප්‍රධාන ආපසු ගෙවීම් අඩු කර, හඳුනාගත් ආරම්භක මුදල සහ කල්පිරීමේ මුදල අතර ඇති යම් වෙනසක ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් සමුච්චිත ක්‍රමක්ෂය එකතු කර හෝ අඩුකර, හානිකරණය සඳහා වන යම් අඩු කිරීමක් අඩු කරන ලද ප්‍රමාණයයි. හානිකරණයෙන් ඇතිවන අලාභ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනාගනී.

#### හානිකරණය

වත්කමක හානිකරණය තනි තනිව හා සාමූහික මට්ටම්වලින් තක්සේරු කෙරේ. තනි තනිව සැලකියයුතු වත්කම් වෙන වෙන තක්සේරු කරන අතර, තනි තනිව වැදගත් නොවන වත්කම් සාමූහික තක්සේරුව සඳහා අවදානම් ලක්ෂණ අනුව කාණ්ඩ කෙරේ. හානිකරණ අලාභය වත්කමේ ධාරණ අගය හා මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම්කළ එහි අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස ගණනය කෙරේ. හානිකරණය හඳුනාග න්නේනම්, එය ලාභය හෝ අලාභය තුල වාර්තා කෙරේ. හානිකරණ අලාභය හඳුනාගැනීමෙන් පසු සිදුවීමක් හේතුවෙන් පසුව අඩු වන්නේනම්, අලාභය ලාභය හෝ අලාභය තුළින් ආපසු හැරවිය හැකිය.

#### හඳුනා නොගැනීම

කල්පිරීමට තබා ඇති ආයෝජනයක් හඳුනා නොගැනීමෙන් ඇති වන යම් ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

| දෙසැම්බර් 31 දිනට | 2024 | | 2023 | |
|---|---|---|---|---|
| | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | සාධාරණ අගය රු. '000 | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | සාධාරණ අගය රු. '000 |
| භාණ්ඩාගාර බිල්පත් | 61,048,349 | 61,326,890 | – | – |
| ලැයිස්තුගත ණයකර | 18,708,638 | 18,708,638 | – | – |
| **එකතුව** | 79,756,987 | 80,035,528 | – | – |

#### 7.1.1 කල්පිරීමට තබා ඇති මූල්‍ය වත්කම්වල හානිකරණය

සමාගම කල්පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හානිකරණය සඳහා යම් හැඟවීමකට මුහුණ දී නොමැත.

#### 7.1.2 ප්‍රතිවර්ගීකරණය

වසර තුළ, සමාගම මෙම වර්ගීකරණය යටතේ යම් මූල්‍ය වත්කම් වර්ගීකරණය කර නොමැත.

#### 7.1.3 සාධාරණ අගය මැනීම

සමාගම සටහන 7.5.1 හි විස්තර කර ඇති පරිදි සාධාරණ අගය මැනීම සිදු කිරීමේදී භාවිතා කරන යෙදවුම් මට්ටම්වල වැදගත්කමට බලපාන සාධාරණ අගයේ ධූරාවලිය භාවිතයෙන් සාධාරණ අගය මනිනු ලබයි.

### 7.2 ණය හා ලැබීම් (L&R)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

#### මූලික හඳුනා ගැනීම

ණය හා ලැබීම් යනු සක්‍රීය වෙළෙඳපොලක ලැයිස්තුගත නොකළ ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. මෙම වත්කම් සාධාරණ අගයට හා සෘජුවම ආරෝපනය වන ගනුදෙනු පිරිවැයට මූලිකව හඳුනා ගනී.

ණය හා ලැබීම් ලැයිස්තුගත නොකළ ආයතනික ණයවල ආයෝජන, කාලීන තැන්පතු, වත්කම් පාදක සුරැකුම්පත්, සංවර්ධන බැඳුම්කර, වාණිජ පත්‍රිකා, වෙනත් ණය හා ලැබීම්, මුදල් හා මුදලට සමාන දෑවලින් සමන්ත වේ.

#### පසුකාලීන මැනීම

මූලිකව හඳුනාගැනීමෙන් පසු, ණය හා ලැබීම් ඵලදායී පොලී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

#### හානිකරණය

හානිකරණයෙන් ඇතිවන අලාභ ණය සඳහා මූල්‍ය පිරිවැය තුළ හා ලැබීම් සඳහා වෙනත් මෙහෙයුම් වියදම් තුළ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනී.

#### හඳුනා නොගැනීම

ණය හා ලැබීම් හඳුනා නොගැනීමෙන් ඇතිවන යම් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ ප්‍රකාශයේ හඳුනාගනී.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

7. මූල්‍ය ආයෝජන හා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගය (ඉතිරි කොටස)

7.2 ණය හා ලැබීම් (ඉතිරි කොටස)

| දෙසැම්බර් 31 දිනට | 2024 | | 2023 | |
|---|---|---|---|---|
| | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | සාධාරණ අගය රු. '000 | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | සාධාරණ අගය රු. '000 |
| ලැයිස්තුගත නොකල | 26,974,644 | 26,974,644 | – | – |
| කාලීන තැන්පතු, | 7,394,005 | 7,394,005 | – | – |
| සේවක ණය | 726,586 | 726,586 | – | – |
| නියෝජිත ණය | 478,667 | 478,667 | – | – |
| **එකතුව** | 35,573,902 | 35,573,902 | – | – |

### 7.2.1 මූල්‍ය ආයෝජන හා ණය හා ලැබීම් හානිකරණය

සමාගම ණය හා ලැබීම් ඇති මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හානිකරණය සඳහා යම් හැඟවීමකට මුහුණ දී නොමැත.

### 7.2.2 ප්‍රතිවර්ගීකරණය

වසර තුළ, සමාගම මෙම වර්ගීකරණය යටතේ යම් මූල්‍ය වත්කම් වර්ගීකරණය කර නොමැත.

### 7.2.3 සාධාරණ අගය මැනීම

සමාගම සටහන 7.5.1 හි විස්තර කර ඇති පරිදි සාධාරණ අගය මැනීම සිදු කිරීමේදී භාවිතා කරන යෙදවුම් මට්ටම්වල වැදගත්කමට බලපාන සාධාරණ අගයේ ධූරාවලිය භාවිතයෙන් සාධාරණ අගය මනිනු ලබයි.

### 7.3 විකිණීම සඳහා පවතින (AFS)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

#### මූලික හඳුනා ගැනීම

විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්වලට ණය සුරැකුම්පත් ඇතුළත්ය. මෙම වර්ගයේ සුරැකුම්පත් කල්පිරෙන තෙක් රඳවා ගැනීමට අදහස් කරන ඒවා වන අතර, ද්‍රවශීලතාව සඳහා අවශ්‍යතාවට ප්‍රතිචාරාත්මකව හෝ වෙළෙඳපොල තත්ත්වයන් හී වෙනස්වීම්වලට ප්‍රතිචාරාත්මකව විකිණිය හැකිය.

සමාගමේ විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් ස්කන්ධය හා ණයසුරැකුම්පත්වලින් සමන්විත වන අතර, ඒවා විකිණීම සඳහා පවතින ලෙස වර්ගීකරණය නොකරන අතරම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම් කර නොමැත.

#### පසුකාලීන මැනීම

මූලිකව හඳුනාගැනීමෙන් පසු, ඒවා සාධාරණ අගයට මනිනු ලබන අතර, එහි වෙනස්වීම් විකිණීම සඳහා පවතින ස්කන්ධ උපකරණවල හානිකරණ අලාභ හැර, අනෙකුත් විස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගන්නා අතර විකිණීම සඳහා පවතින සංචිතවල සක්න්ධය තුළ ඉදිරිපත් කෙරේ. ඔප්පුහිමියන්ගේ අරමුදලේ වත්කම්වල සාධාරණ අගයේ වෙනස්වීම් රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත යටතේ හඳුනා ගනී.

විකිණීම සඳහා පවතින ආයෝජන දරමින් උපයන පොලිය ඵලදායී පොලී අනුපාතය භාවිතයෙන් “පොලී ආදායම” ලෙස වාර්තා කෙරේ. විකිණීම සඳහා පවතින ආයෝජන දරමින් උපයන ලාභාංශ ගෙවීමේ අයිතිය ස්ථාපිත කිරීමෙන් පසු “ලාභාංශ ආදායම” ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනී.

#### හානිකරණය

ආයෝජනයක් හෝ ආයෝජන සමූහයක් හානිකරණය වන බවට විෂයමූලික සාක්ෂිය තිබෙන්නේද යන්න වර්තාකරණ දිනයේදී සමාගම තක්සේරු කරයි.

#### හඳුනා නොගැනීම

ආයෝජනයක් හඳුනා නොගන්නා අවස්ථාවක, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ සමුච්චිත ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කෙරේ.

| දෙසැම්බර් 31 දිනට | 2024 | | 2023 | |
|---|---|---|---|---|
| | ධාරණ අගය රු. '000 | සාධාරණ අගය රු. '000 | ධාරණ අගය රු. '000 | සාධාරණ අගය රු. '000 |
| ලැයිස්තුගත කොටස් | 12,777,644 | 12,777,644 | – | – |
| ඒකක භාර | 1,250,376 | 1,250,376 | – | – |
| ලැයිස්තුගත ණයකර | 19,431,017 | 19,431,017 | – | – |
| භාණ්ඩාගාර බැඳුම්කර | 34,260,232 | 34,260,232 | – | – |
| වාණිජ පත්‍රිකා | 21,587,539 | 21,587,539 | – | – |
| එකතුව | 89,306,808 | 89,306,808 | – | – |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 7. මූල්‍ය ආයෝජන හා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගය (ඉතිරි කොටස)

## 7.3 විකිණීම සඳහා පවතින (AFS) (ඉතිරි කොටස)

### 7.3.1 විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන හානිකරණය

විකිණීම සඳහා පවතින වත්කම් සම්බන්ධයෙන් හානිකරණය සඳහා යම් හැඟවීමකට සමාගම මුහුණ දී නොමැත.

### 7.3.2 ප්‍රතිවර්ගීකරණය

වසර තුළ, සමාගම මෙම වර්ගීකරණය යටතේ යම් මූල්‍ය වත්කම් වර්ගීකරණය කර නොමැත.

### 7.3.3 සාධාරණ අගය මැනීම

සමාගම සටහන 7.5.1 හි විස්තර කර ඇති පරිදි සාධාරණ අගය මැනීම සිදු කිරීමේදී භාවිතා කරන යෙදවුම් මට්ටම්වල වැදගත්කමට බලපාන සාධාරණ අගයේ ධූරාවලිය භාවිතයෙන් සාධාරණ අගය මනිනු ලබයි.

## 7.4 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**මූලික හඳුනා ගැනීම**

මූල්‍ය වත්කමක් එය විකිණීමට තබා ගන්නේනම් හෝ මූලික හඳුනා ගැනීම මත එසේ නම්කරන්නේනම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ලෙස වර්ගීකරණය කෙරේ. සමාගම එවැනි ආයෝජන කළමනාකරණය කරයිනම් සහ සමාගමේ ආයෝජන උපයාමාර්ගයට අනුව ඒවායේ සාධාරණ අගය මත පදනම් වී මිලදී ගැනීමේ හා විකිණීමේ තීරණ ගනිනම්, මූල්‍ය වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම් කෙරේ. ආරෝපනය කළහැකි ගනුදෙනු පිරිවැය දරන ලද පරිදි ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනී.

**පසුකාලීන මැනීම**

මූලිකව හඳුනාගැනීමෙන් පසු, මෙවැනි ආයෝජන සාධාරණ අගයට නැවත වර්ගීකරණය කෙරේ. සාධාරණ අගයේ වෙනස්වීම් ආදායම් ප්‍රකාශයේ "සාධාරණ අගයේ ලාභ සහ අලාභ" වාර්තා කෙරේ.

| දෙසැම්බර් 31 දිනට | 2024 | | 2023 | |
|---|---|---|---|---|
| | ධාරණ අගය රු. '000 | සාධාරණ අගය රු. '000 | ධාරණ අගය රු. '000 | සාධාරණ අගය රු. '000 |
| ඒකක භාර | 2,455,658 | 2,455,658 | – | – |
| ලැයිස්තුගත කොටස් | 12,828,101 | 12,828,101 | – | – |
| **එකතුව** | 15,283,759 | 15,283,759 | – | – |

### 7.4.1 ප්‍රතිවර්ගීකරණය

වසර තුළ, සමාගම මෙම වර්ගීකරණය යටතේ යම් මූල්‍ය වත්කම් වර්ගීකරණය කර නොමැත.

### 7.4.2 සාධාරණ අගය මැනීම

සමාගම සටහන 7.5.1 හි විස්තර කර ඇති පරිදි සාධාරණ අගය මැනීම සිදු කිරීමේදී භාවිතා කරන යෙදවුම් මට්ටම්වල වැදගත්කමට බලපාන සාධාරණ අගයේ ධූරාවලිය භාවිතයෙන් සාධාරණ අගය මනිනු ලබයි.

## 7.5 සාධාරණ අගය සහ සාධාරණ අගයේ ධූරාවලිය තීරණය කිරීම

සාධාරණ අගය යනු මැනීමේ දිනයට වෙළෙඳපොල සහභාගිවන්නන් අතර ක්‍රමවත් ගනුදෙනුවක් තුළ වත්කමක් විකිණීමකදී ලැබෙන හෝ වගකීමක් මාරු කිරීමට ගෙවන මිලය. මැනීමේ සාධාරණ අගය පහත පරිදි වත්කමක් විකිණීමට හෝ වගකීමක් මාරු කිරීමට අදාළ ගනුදෙනුව සිදුවන බවට උපකල්පනය මත පදනම් වේ:

- වත්කම හෝ වගකීම සඳහා මූලික වෙළෙඳපොල තුළ හෝ,
- මූලික වෙළෙඳපොල නොමැතිවීම තුළ, වත්කම හෝ වගකීම සඳහා වඩාත් වාසිදායක වෙළෙඳපොල තුළ

මූල්‍ය වත්කම්වල සාධාරණ අගය තීරණය කිරීමේදී සහ අනාවරණය කිරීමේදී සමාගම සාධාරණ අගයේ ධූරාවලිය භාවිතා කරයි. පහත සටහනින් සාධාරණ අගයේ ධූරාවලියේ මට්ටම් අනුව සාධාරණ අගයට වාර්තා කළ මූල්‍ය ආයෝජන පිළිබඳ විශ්ලේෂණයක් පෙන්නුම් කරයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 7. මූල්‍ය ආයෝජන හා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගය (ඉතිරි කොටස)

### 7.5 සාධාරණ අගය සහ සාධාරණ අගයේ ධූරාවලිය තීරණය කිරීම (ඉතිරි කොටස)

| මට්ටම | සාධාරණ අගය මැනීමේ ක්‍රම |
|---|---|
| මට්ටම 1 | සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොල තුළ ලැයිස්තුගත (නොගලපනලද) මිල ගණන් |
| මට්ටම 2 | වාර්තාකළ සාධාරණ අගය මත සැලකියයුතු බලපෑමක් ඇති සියලුම යෙදවුම් සඳහා ශිල්ප ඍජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකිය. |
| මට්ටම 3 | වාර්තාකළ සාධාරණ අගය මත සැලකියයුතු බලපෑමක් ඇති සියලුම යෙදවුම් භාවිතා කරන ශිල්ප නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල දත්ත මත පදනම් නොවේ. |

**7.5.1** පහත වගුවෙන් සාධාරණ අගයේ ධූරාවලියේ මට්ටම් අනුව සාධාරණ අගයට වාර්තා කළ වත්කම් පිළිබඳ විශ්ලේෂණයක් පෙන්නුම් කරයිඃ

| දෙසැම්බර් 31 දිනට | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මට්ටම 1<br>රු. '000 | මට්ටම 2<br>රු. '000 | මට්ටම 3<br>රු. '000 | මුළු සාධාරණ අගය<br>රු. '000 | මට්ටම 1<br>රු. '000 | මට්ටම 2<br>රු. '000 | මට්ටම 3<br>රු. '000 | මුළු සාධාරණ අගය<br>රු. '000 |
| **විකිණීම සඳහා පවතින (AFS) මූල්‍ය වත්කම්** | | | | | | | | |
| ලැයිස්තුගත කොටස් | 12,777,644 | – | – | 12,777,644 | – | – | – | – |
| ඒකක භාර | 1,250,376 | – | – | 1,250,376 | – | – | – | – |
| ලැයිස්තුගත ණයකර | 7,092,358 | 12,338,659 | – | 19,431,017 | – | – | – | – |
| භාණ්ඩාගාර බැඳුම්කර | 34,260,232 | – | – | 34,260,232 | – | – | – | – |
| වාණිජ පත්‍රිකා | – | – | 21,587,539 | 21,587,539 | – | – | – | – |
| එකතුව | 55,380,611 | 12,338,659 | 21,587,539 | 89,306,808 | – | – | – | – |
| **ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVTPL) මූල්‍ය වත්කම්** | | | | | | | | |
| ලැයිස්තුගත කොටස් | 12,828,101 | – | – | 12,828,101 | – | – | – | – |
| ඒකක භාර | 2,455,658 | – | – | 2,455,658 | – | – | – | – |
| එකතුව | 15,283,759 | – | – | 15,283,759 | – | – | – | – |
| **කල්පිරීමට තබා ඇති (HTM) මූල්‍ය වත්කම්** | | | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 61,048,349 | – | – | 61,048,349 | – | – | – | – |
| ලැයිස්තුගත ණයකර | 18,708,638 | | | 18,708,638 | – | | | – |
| එකතුව | 79,756,987 | – | – | 79,756,987 | – | – | – | – |
| **ණය හා ලැබීම්(L&R) මූල්‍ය වත්කම්** | | | | | | | | |
| ලැයිස්තුගත නොකල ණයකර | – | 26,974,644 | – | 26,974,644 | – | – | – | – |
| කාලීන තැන්පතු | – | 7,394,005 | – | 7,394,005 | – | – | – | – |
| සේවක ණය | – | – | 726,586 | 726,586 | – | – | – | – |
| නියෝජිත ණය | – | – | 478,667 | 478,667 | – | – | – | – |
| එකතුව | – | 34,368,649 | 1,205,253 | 35,573,902 | – | – | – | – |
| මුළු මූල්‍ය වත්කම් | 150,421,357 | 46,707,308 | 22,792,792 | 219,921,456 | – | – | – | – |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

7. මූල්‍ය ආයෝජන හා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගය (ඉතිරි කොටස)

7.5 සාධාරණ අගය සහ සාධාරණ අගයේ ධූරාවලිය තීරණය කිරීම(ඉතිරි කොටස)

### 7.5.2 සාධාරණ අගය තීරණය කිරීමේදී භාවිතාකළ තක්සේරු ශිල්ප

1. ලැයිස්තුගත කොටස්, භාණ්ඩාගාර බිල්පත්, සහ භාණ්ඩාගාර බැඳුම්කරවල සාධාරණ අගය ඒවා සක්‍රීය වෙළෙඳපොළ තුළ අලෙවි කරන්නේනම් ඒවායේ වෙළෙඳපොල මිල මත පදනම් වේ.
2. ලැයිස්තුගත නොකළ පාවෙන අනුපාත ණයකරවල සාධාරණ අගය ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට සමානවීමට ඇස්තමේන්තු කෙරේ.
3. කාලීන තැන්පතුවල සාධාරණ අගය කල්පිරීම් එක් වසරක් නොඉක්මවන බැවින් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට සමානවීමට ඇස්තමේන්තු කෙරේ.
4. ලැයිස්තුගත නොකළ ස්ථිර අනුපාත ණයකරවල සාධාරණ අගයන් සමාන කල්පිරීම් සහ ණය ශ්‍රේණිගතකිරීම් සහිත තුළනය කළ හැකි අලුතින් නිකුත් කළ ආයතනික ණය උපකරණවල වෙළෙඳපොල ආදායමට අනාගත මුදල් ප්‍රවාහ මට්ටම් කරමින් අගය කෙරේ.
5. සක්‍රීය වෙළෙඳපොල තුළ අලෙවි කරන ලැයිස්තුගත ණයකරවල සාධාරණ අගයන් ඒවායේ වෙළෙඳපොල මිල මත පදනම් වේ.
6. සක්‍රීය වෙළෙඳපොල තුළ අලෙවි නොකරන ලැයිස්තුගත ණයකරවල සාධාරණ අගයන් සමාන කල්පිරීම් සහ ණය ශ්‍රේණිගතකිරීම් සහිත තුලනය කළ හැකි අලුතින් නිකුත් කළ ආයතනික ණය උපකරණවල වෙළෙඳපොල ආදායමට අනාගත මුදල් ප්‍රවාහ මට්ටම් කරමින් අගය කෙරේ.
7. ඒකක භාරවල සාධාරණ අගයන් ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් ලැයිස්තුගත කරන ඒවායේ ලංසු මිල මත පදනම් වේ.
8. සමාගම නිරන්තරව ලාභාංශ ගෙවනු ලබන ලැයිස්තුගත නොකළ කොටස්වල සාධාරණ අගයන් වට්ටම්කළ මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතයෙන් ව්‍යුත්පන්න කරනු ලබයි. අනෙක් අතට, සාධාරණ අගය ශුද්ධ වත්කම් වටිනාකම මත පදනම් වේ.

### 7.6 මූල්‍ය ආයෝජනවල ධාරණ අගයන් හී වෙනස්වීම

| | විකිණීම සඳහා පවතින<br>රු. '000 | ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය<br>රු. '000 | කල්පිරීමට තබා ඇති<br>රු. '000 | ණය හා ලැබීම්<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | – | – | – | – | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙතින් මාරු කිරීම | 74,411,927 | 11,342,065 | 65,974,145 | 42,557,180 | 194,285,316 |
| මිලදී ගැනීම් | 13,623,679 | 961,181 | 15,023,597 | 6,779,691 | 36,388,148 |
| කල්පිරීම් | (999,974) | – | (1,900,018) | (12,283,406) | (15,183,398) |
| තැන්පතු | (7,009,127) | 1,618,713 | – | – | (5,390,414) |
| අනෙකුත් විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් සාධාරණ අගයේ ලාභය | 6,232,547 | – | – | – | 6,232,547 |
| උපලබ්ධි ප්‍රාග්ධන ලාභ/(අලාභ) | 14,761 | 92,433 | – | – | 107,194 |
| උපලබ්ධි ලාභ/(අලාභ) | 25,770 | 1,269,365 | – | – | 1,295,135 |
| වසර තුළ වත්කම් හානිකරණය | – | – | – | – | – |
| ආදායම් ප්‍රකාශයට හඳුනාගත් පොලී ආදායම | 8,370,288 | – | 7,428,081 | 4,821,613 | 20,619,982 |
| විදේශ විනිමය ගනුදෙනු ගැලපීම් | (37,901) | – | – | (86,147) | (124,048) |
| පොලිය/කූපන් ලැබීම් | (5,325,160) | – | (6,768,818) | (6,215,028) | (18,309,006) |
| 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය | 89,306,808 | 15,283,759 | 79,756,987 | 35,573,902 | 219,921,456 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 7. මූල්‍ය ආයෝජන හා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගය (ඉතිරි කොටස)

### 7.7 වත්කම් පන්ති මත පදනම් ශේෂ පත්‍රයේ දිනයට ධාරණ වටිනාකම් (රු.'000)

මෙම වාර්ෂික වාර්තාවේ පරිශීලකයින්ට වැදගත් වන රජයට අදාළ ආයතන සමඟ හිඟ ශේෂ පහත ලැයිස්තු ගත කර ඇත:

| ගනුදෙනුවේ ස්වභාවය/ සමාගමේ නම/ආයතනය | 2024 | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ලංකා බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | මහජන බැංකුව | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී | HDFC බැංකුව |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම | – | – | – | – | – | – | – |
| ලැයිස්තුගත ණයකර | 8,738,611 | 4,034,411 | – | – | – | 2,051,699 | 156,901 |
| ලැයිස්තුගත නොකළ ණයකර | 6,052,065 | – | 16,206,888 | 2,858,630 | – | – | – |
| ස්ථිර තැන්පතු | 2,389,315 | – | 690,277 | – | 2,423,361 | – | – |
| **එකතුව** | 17,179,991 | 4,034,411 | 16,897,165 | 2,858,630 | 2,423,361 | 2,051,699 | 156,901 |

### 7.8 ගිණුම්කරණ වර්ගීකරණය හා සාධාරණ අගයන්

| 2024 දෙසැම්බර් 31 දිනට | ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය රු. '000 | විකිණීම සඳහා පවතින රු. '000 | කල්පිරීමට තබා ඇති රු. '000 | ණය හා ලැබීම් රු. '000 | මුළු ධාරණ අගය රු. '000 | සාධාරණ අගය රු. '000 |
|---|---|---|---|---|---|---|
| සාධාරණ අගයට මනිනලද මූල්‍ය වත්කම | | | | | | |
| ලැයිස්තුගත කොටස් | 12,828,101 | 12,777,644 | – | – | 25,605,746 | 25,605,746 |
| ඒකක භාර | 2,455,658 | 1,250,376 | – | – | 3,706,034 | 3,706,034 |
| ලැයිස්තුගත ණයකර | – | 19,431,017 | – | – | 19,431,017 | 19,431,017 |
| වාණිජ පත්‍රිකා | – | 21,587,539 | – | – | 21,587,539 | 21,587,539 |
| භාණ්ඩාගාර බැඳුම්කර | – | 34,260,232 | – | – | 34,260,232 | 34,260,232 |
| සාධාරණ අගයට මැනීම නොකළ මූල්‍ය වත්කම | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර | – | – | 61,048,349 | – | 61,048,349 | 61,326,890 |
| ලැයිස්තුගත ණයකර | – | – | 18,708,638 | – | 18,708,638 | 18,708,638 |
| ලැයිස්තුගත නොකළ ණයකර | – | – | – | 26,974,644 | 26,974,644 | 26,974,644 |
| කාලීන තැන්පතු | – | – | – | 7,394,005 | 7,394,005 | 7,394,005 |
| සේවක ණය | – | – | – | 726,586 | 726,586 | 726,586 |
| නියෝජිත ණය | – | – | – | 478,667 | 478,667 | 478,667 |
| ජීවිත ඔප්පුහිමියන්ට ණය | – | – | – | 2,288,853 | 2,288,853 | 2,288,853 |
| ප්‍රතිරක්ෂණ ලැබීම් | – | – | – | 1,288,471 | 1,288,471 | 1,288,471 |
| වාරික ලැබීම් | – | – | – | 789,230 | 789,230 | 789,230 |
| වෙනත් ලැබීම් | – | – | – | 1,610,497 | 1,610,497 | 1,610,497 |
| මුදල් හා මුදලට සමාන දෑ | – | – | – | 1,289,870 | 1,289,870 | 1,289,870 |
| **මුළු මූල්‍ය වත්කම්** | 15,283,759 | 89,306,808 | 79,756,987 | 42,840,822 | 227,188,377 | 227,466,917 |
| සාධාරණ අගයට මැනීම නොකළ මූල්‍ය වගකීම් | | | | | | |
| ප්‍රතිරක්ෂණ ගෙවීම් | – | – | – | 1,488,094 | 1,488,094 | 1,488,094 |
| බැංකු අයිරාව | | | | 254,925 | 254,925 | 254,925 |
| **මුළු මූල්‍ය වගකීම්** | – | – | – | 1,743,019 | 1,743,019 | 1,743,019 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
| කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම | පාරිශ්‍රමික ගෙවීම | 80,603 | – |
| | මුදල් නිරවුල් කිරීම | 80,603 | – |
| කැනොවින් හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | අලෙවිකරණ වැඩසටහන | 1,210 | – |
| | මුදල් නිරවුල් කිරීම | 1,210 | – |
| ලංකා හොස්පිට්ල් ඩයග්නොස්ටික් (පුද්ගලික) සමාගම | රක්ෂණ වාරිකය | 709 | – |
| | වාරිකය සඳහා ගෙවූ ප්‍රමාණය | 709 | – |
| | ගෙවූ හිමිකම් | 1,000 | – |
| | හිමිකම් සඳහා ගෙවූ ප්‍රමාණය | 500 | – |
| | ලබාදෙන ලද රසායනාගාර සේවා | 9,319 | – |
| | ගෙවූ ප්‍රමාණ | 4,032 | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් | රක්ෂණ වාරිකය | 5,945 | – |
| | වාරිකය සඳහා ගෙවූ ප්‍රමාණය | 5,945 | – |
| | වියදම් | 6,868,079 | – |
| | ආයෝජනයට අදාළ | 2,025,829 | – |
| | වත්කම් උපයෝගිතා ගාස්තු | 2,798 | – |
| | මුදල් නිරවුල් කිරීම | 8,364,129 | – |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

35. සම්බන්ධිත පාර්ශ්ව අනාවරණ (ඉතිරි කොටස)

### 35.3 සම්බන්ධිත පාර්ශ්වවලින් ලැබියයුතු ප්‍රමාණ

| දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් | 1,059,406 | – |
| ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | 240,544 | – |

### 35.4 සම්බන්ධිත පාර්ශ්වවලට ගෙවිය යුතු ප්‍රමාණ

| දෙසැම්බර් 31 දිනට | 2024<br>රු. '000 | 2023<br>රු. '000 |
|---|---|---|
| ලංකා හොස්පිට්ල් කෝර්පරේෂන් පීඑල්සී | 5,631 | – |
| ලංකා හොස්පිට්ල් ඩයග්නොස්ටික් (පුද්ගලික) සමාගම | 5,787 | – |

## 36. අවදානම් කළමනාකරණ රාමුව

### 36. (අ) පාලන රාමුව

සමාගමේ මූල්‍ය අවදානම් කළමනාකරණයේ මූලික පරමාර්ථය වන්නේ එහි අවදානම් රුචිය තුළ මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීම සහ මූල්‍ය පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිළිබඳ සාධාරණ සහතිකය ලබාදීමයි.

මූල්‍ය අවදානම් කළමනාකරණය සමාග මේ පුළුල් අවදානම් කළමනාකරණ රාමුවට ඇතුළත් කර ඇති අතර එක් එක් මට්ටමට දක්වා ඇති පැහැදිලි පරමාර්ථ, රාජකාරි සහ වගකීම් සමඟ සමාගම පුරා විහිදේ. සමාගමේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය සඳහා සමස්ත වගකීම සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඇත. සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාගම මුහුණපාන අවදානම් හඳුනාගැනීම සහ විශ්ලේෂණය කිරීම සඳහා, උචිත අවදානම් සීමාවන් සහ පාලනයන් ඇතිකිරීම සහ අවදානම නියාමනය කිරීම සඳහා සහ සීමා පිළිපැදීම සඳහා ස්ථාපනය කර ඇත. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධති වෙළෙඳපොළ තත්ත්වයන් සහ සමාගමේ කටයුතුවල වෙනස්වීම් පිළිබිඹු කිරීමට නිරන්තරව සමාලෝචනය කරනු ලබයි.

### 36. (ආ) නියාමන රාමුව

ඔප්පුහිමියන්ගේ විශිෂ්ඨ බැඳියාවන් සමඟ පෙළ ගැසෙන බව සහතික කිරීමට සමාගමේ ව්‍යාපාර ව්‍යවහාර සම්පව නියාමනය කරමින් ඔප්පුහිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි නියාමකයින් අවධානය යොමු කරයි. ඊට අමතරව, ආර්ථික බඳවැටීම් හෝ ස්වභාවික ආපදා මගින් ඇතිකළ අනපේක්ෂිත වගකීම් විසඳීමට ප්‍රමාණවත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සමාගම විසින් පවත්වා ගන්නා බව සහතික කිරීමට නියාමකයින් අරමුණු කරයි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව කොටස්හිමියන් සහ ඔප්පුහිමියන් ආරක්ෂා කිරීමේ අරමුණ සමඟ සමාගම අධීක්ෂණය කරයි.

සමාගම ප්‍රමාණවත් නුබුන්වත්කම සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන සංචිත පවත්වා ගන්නා බව සහතික කරමින් අපේක්ෂිත ප්‍රමිති සපුරාලීමට විවිධ රෙගුලාසි සහ නියෝග සමඟ අනුකූලවීම අවශ්‍ය වේ.

අවදානම පදනම් ප්‍රාග්ධන (RBC) රාමුව නුබුන්වත් ආන්තික නියමයන් පිළිපැදීම පිළිබඳ අවදානම් කළමනාකරණය ප්‍රමුඛ කරයි. මෙම නම්‍යශීලී රාමුව එක් එක් රක්ෂණ සමාගමේ අවදානම් පැතිකඩ පිළිබඳව පදනම් වී අවම ප්‍රාග්ධන අවශ්‍යතා ස්ථාපිත කරයි. ණය අවදානම, සංකේන්ද්‍රණ අවදානම, වෙළෙඳපොළ අවදානම, මෙහෙයුම් අවදානම සහ වගකීම් අවදානම වැනි අවදානම් සාධක සමඟ වත්කම් සහ වගකීම් සඳහා අනුරූප ප්‍රාග්ධන අයකිරීම් හා තක්සේරු ක්‍රම එයට ඇතුළත් කරයි.

අවදානම පදනම් ප්‍රාග්ධන (RBC) රාමුව තුළින් විනිවිදභාවය වැඩි කිරීමට හා ශක්තිමත් අවදානම් කළමනාකරණ පද්ධති පෝෂණය කිරීම අරමුණු කරන අතර වඩාත් සවිර රක්ෂණ කර්මාන්තයක් හා වැඩි වූ ජනතා විශ්වාසයක් කරා එය දායක වේ. ඊට අමතරව, අවදානම් දැනුවත් සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන අතර ශක්තිමත් අවදානම් කළමනාකරණ ව්‍යවහාර සමඟ සමාගම්වලට වාසියක් ලබාදෙමින් අවදානම් නිරාවරණයට අදාළ ප්‍රතිඵල වැඩි කිරීමට කාර්යක්ෂම ප්‍රාග්ධන උපයෝජනය දිරිමත් කරයි.

සමාගමේ මෙහෙයුම් එය ක්‍රියාත්මක බලප්‍රදේශය තුළ නියාමන අවශ්‍යතා මගින් පාලනය කෙරේ. මෙම රෙගුලාසිවලට කටයුතු අනුමැතිය හා අධීක්ෂණය මෙන්ම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අවශ්‍යතා වැනි සීමාකළ විධිවිධාන ඇතුළත්ය. එවැනි ක්‍රියාමාර්ග නුබුන්වත් අවදානම අඩු කිරීමට හා රක්ෂණ සමාගම්වලට ඔවුන්ට මතුවන අනපේක්ෂිත වගකීම් විසඳීමට හැකි බව සහතික කිරීමට සැලසුම් කර ඇත.

සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නියම කළ රෙගුලාසි පරිදි, ප්‍රාග්ධනය, ආයෝජනය හා නුබුන්වත්බව පවත්වා ගනී. රෙගුලාසිවල නව වෙනස්වීම් කාලීනව යොදා ගන්නා අතර අවශ්‍ය වෙනස්වීම් අභ්‍යන්තර ක්‍රියාවලිවලට සිදු කෙරේ.

### 36. (ඇ) වත්කම් වගකීම් කළමනාකරණ (ALM) රාමුව

වත්කම් වගකීම් කළමනාකරණ (ALM) රාමුව වත්කම් හා වගකීම් මුදල් ප්‍රවාහ අතර නොගැලපීම් මගින් ඇතිකරන අවදානම් විසඳීමට යොදවනු ලැබේ. එය අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර වත්කම් හා වගකීම් ඵලදායීව කළමනාකරණය කිරීමට උපායමාර්ග සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම, නියාමනය හා ගැලපීම හා සම්බන්ධ වේ. මෙහි පරමාර්ථය වන්නේ ආයතනයේ මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීම වන අතර එහිදී සිය අවදානම් දැරීමට ඇති කැමැත්ත, ඉවසීම සහ වෙනත් සංරෝධක සලකා ලබයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 37. රක්ෂණය හා මූල්‍ය අවදානම

### 37. (අ) රක්ෂණ අවදානම

සමාගම මුහුණ දෙන ප්‍රධාන රක්ෂණ අවදානම වන්නේ සැබෑ හිමිකම් සහ ප්‍රතිලාභ ගෙවීම් හෝ අපේක්ෂාවන්ගෙන් වෙනස් වන ඒවායේ කාලයයි. මෙය හිමිකම්වල වාරගණන, හිමිකම්වල බරපතල බව ගෙවන ලද සැබෑ ප්‍රතිලාභ සහ දිගු කාලීන හිමිකම්වල පසුකාලීන සංවර්ධනයන්ට බලපෑම් කරයි. එමනිසා, සමාගමේ පරමාර්ථය වන්නේ ප්‍රමාණවත් මූල්‍ය හා ප්‍රතිරක්ෂණ ආරක්ෂාව මෙවැනි වගකීම් ආවරණය කිරීමට ලබාගත හැකි බව සහතික කිරීමයි.

ප්‍රාරක්ෂණ උපායමාර්ග මාර්ගෝපදේශ මෙන්ම ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙල භාවිතය පරිස්සමින් තෝරා ගැනීම හා ක්‍රියාත්මක කිරීම මගින් මෙම අවදානම අඩු කරනු ලබයි.

සමාගම සිය අවදානම් අවම කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස ලොව ප්‍රමුඛ ප්‍රතිරක්ෂකයින් සමඟ දිගුකාලීන ප්‍රතිරක්ෂණ ගිවිසුම්වලට ඇතුළත් වී ඇත. ප්‍රතිරක්ෂණ වැඩසටහන තනි හිමිකමක් මෙන්ම විපත්තිකාර අලාභවලට සමාගමේ නිරාවරණය අවම කිරීමට සැලසුම් කෙරේ.

### 37. (අ 1) ප්‍රතිරක්ෂකයින්ගේ ණය ශ්‍රේණිගතකරණ

2024 දෙසැම්බර් 31 දිනට සමාගම ඇතුළත් වී ඇති ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙල සහිත ප්‍රතිරක්ෂණ සමාගම්වල ණය ශ්‍රේණිගතකරණ පහත වගුවෙන් පෙන්නුම් කරයි.

| ප්‍රතිරක්ෂකයාගේ නම | දිගුකාලීන රක්ෂක පැහැරහැරීමේ ශ්‍රේණිගතකරණ | ශ්‍රේණිගත කරන ආයතනයේ මූල්‍ය ශක්තිය | ශ්‍රේණිගත කරන ආයතනයේ නම |
|---|---|---|---|
| මුනිච් ප්‍රතිරක්ෂණ සමාගම (Munich RE) | AA- | AA | Fitch Rating |

### 37. (අ 2) ජීවිත රක්ෂණ ගිවිසුම්

පහත පරිච්ඡේදයෙන් ගිවිසුමේ ස්වභාවය මත පදනම් වී ජීවිත් රක්ෂණයේ සංකේන්ද්‍රණය විස්තර කරයි.

සංකේන්ද්‍රණය අවදානම

සංකේන්ද්‍රණ අවදානම යනු වත්කම් හෝ බැඳීම්වල ප්‍රමාණවත් නොවන විවිධාකාර කළඹ හා බැඳුණු වැඩිවී ඇති ආලාභයන් සඳහා නිරාවරණය වීමේ අවදානමයි. ජීවිත රක්ෂකයෙකු සඳහා සංකේන්ද්‍රණ අවදානම භූගෝලීය කලාපයක, ආර්ථික අංශයක, හෝ තනිපුද්ගල රක්ෂකයෙකුගේ ආයෝජන සම්බන්ධයෙන් හෝ භූගෝලීය කලාපයක, ඔප්පු වර්ගයක හෝ ආවරණය කරන පාදක අවදානම්වල ව්‍යාපාර භූගෝලීය කලාපයක් තුළින් පැනනැගිය හැකිය.

1. වෙළෙඳපොළ අවදානම පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් බලන කළ, අප සැලකියයුතු ලෙස මූල්‍ය අංශය තුළ මුදල් ආයෝජනය කර තිබුණද, අපගේ කලඹ විවිධාංගිකරණය කර ඇති අතර එය විශාල ආන්තිකයන්ගෙන් සමන්විත වේ.
2. රක්ෂණ අවදානම පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් බලන කළ, සංකේන්ද්‍රණ අවදානම බලාපන ප්‍රධාන සාධකවලට මර්ත්‍යතා අවදානම, රෝගාතුර අවදානම, දීර්ඝායුෂ අවදානම, ඔප්පු හිමියාගේ හැසිරීම් අවදානම (අවසන් කිරීම, ප්‍රති වරණය) සහ වියදම් අවදානම යන කරුණු අන්තර්ගත වේ. භූගෝලීය ප්‍රදේශ, ව්‍යාපාර මාර්ග මෙන්ම රක්ෂණ අවදානමෙහි සුවිශේෂී සංකේන්ද්‍රණ සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ලයිෆ් ලිමිටඩ් අනාවරණය නොවීම වැනි විවිධ රක්ෂණ අවදානම් සාධක තුළ විවිධාංගීකරණයක් ඇත.

ජීවිත රක්ෂණය ආශ්‍රිත අවදානම් සඳහා පහත දෑ ඇතුළත් වේ.

- මර්ත්‍යතා අවදානම යනු ජීවිත රක්ෂණ ඔප්පුවල සැබෑ ඔප්පු හිමියන්ගේ මරණ සංඛ්‍යාව අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩිවීමේ අවදානමයි.
- දීර්ඝායුෂ අවදානම යනු වාර්ෂික ලාභීන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ජීවත්වීමේ අවදානමයි
- රෝගාතුරවීමේ අවදානම යනු ඔප්පු හිමියන්ගේ සෞඛ්‍ය සම්බන්ධ හිමිකම්පෑම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩිවීමේ අවදනාමයි.
- ඔප්පු හිමියන්ගේ හැසිරීම් පිළිබඳ අවදානම යනු ඔප්පු හිමියන්ගේ දායකත්වය අඩුවීම සහ අත්හිටුවීම හෝ ගිවිසුම කල්පිරීමට පෙර ප්‍රතිලාභ ඉවත්කරගැනීම පිළිබඳ ඔප්පු හිමියන්ගේ හැසිරීම අපේක්ෂිත පරිමාවට වඩා දරුණු වීමේ අවදානමයි. අනාගත ස්ථාවර වියදම් පියවීම සඳහා සහ ලිඛිත ව්‍යාපාර තුළින් අනාගත ධනාත්මක මූල්‍ය ගලා ඒම අඩුකිරීම සඳහා පොත් තුළ ඉතිරිවී ඇති ඔප්පු වෙත යොමුකිරීමක් දුර්වල ස්ථාවර අනුපාතයක් මගින් සිදුකළ හැක. එය ප්‍රමාදවූ වියදම් අත්පත්කර ගැනීමක් ආපසු ලබාගැනීමට ඇති හැකියාවට විභව ලෙස බලපෑම් කිරීමයි.
- වියදම් අවදානම යනු ඔප්පු අත්පත් කරගැනීමේදී සහ පරිපාලනය කිරීමේදී දරන්නාවූ වියදම් අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවීමේ අවදානමයි.
- වෙළෙඳපොළ අවදානම යනු අවදානම් සමාලෝචනයේ “වෙළෙඳපොළ අවදානම්” යන කොටස තුළ විශ්ලේෂණය කරන මූල්‍ය වෙළෙඳපොළ මත වටිනාකම හෝ මුදල් ප්‍රවාහ රඳා රඳාපවතින්නාවූ සමාගමේ ශේෂ පත්‍රයේ තත්ත්වය හා බැඳී පවතින්නාවූ අවදානමයි.
- ණය අවදානම යනු අවදානම් සමාලෝචනයේ “ණය අවදානම” යන කොටස තුළ විශ්ලේෂණය කරන ප්‍රතිපාර්ශ්වයන්ට ඔවුන්ගේ මූල්‍යමය බැදියාවන් ඉටුකිරීමට නොහැකිවීම හෝ නොහැකිවීමට ඇති විභවය හා බැඳුණු අවදානමයි.

නිසිලෙස පාලනය සහ කළමනාකරණය නොකොළහොත් සමාගමේ මෙහෙයුම්වලට බලපෑම් කළ හැකි ඉහත අවදානම් ඇගයීම සඳහා සමාගම විසින් ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලි ස්ථාපනය කොට ඇත. නිෂ්පාදන වර්ධනයේ සිට ප්‍රතිලාභ පරිපාලනය දක්වා වූ සියලු තීරණාත්මක අදියර ආවරණය කිරීම සඳහා මෙම ක්‍රියාපටිපාටි ක්‍රියාවට නංවා ඇත.

මෙයට අමතරව, සියලුම ජීවිත මූල්‍ය ප්‍රවාහ නවීකරණය කරන අතර ලාභ පරීක්ෂණය ආයුගණක විසින් නිෂ්පාදන සැලැස්ම සහ මිලකරණයේ අවදානම අඩුකරමින්, ලාභ පරීක්ෂණය නිර්මාණය කර ඇත. තවද සමාගම විසින් ඉඩපවතින්නේ නම් වගකීම්වලට ආධාර කිරීම සඳහා (ALM) ගැලපුම් උපකරණ භාවිතා කරයි.

අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන රාමුවට යටතේ, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ලයිෆ් ලිමිටඩ් විසින් "දළ වාරික තක්සේරු කිරීමේ" යාන්ත්‍රණය යොදාගෙන ඇත. නුබුන්වත්කම් අවශ්‍යතාවයන් සඳහා වෙළෙඳපොළ අනුරූප ආකාරයෙන් වගකීම් ඇගයීම සඳහා මෙය අවශ්‍ය වේ. අවම නියාමක පදනමට සාපේක්ෂව අතිරික්තය ගණනය සඳහා වඩාත් විචක්ෂණ ඇගයීම් පදනමක් සමාගම විසින් යොදාගෙන ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

37. රක්ෂණය හා මූල්‍ය අවදානම (ඉතිරි කොටස)

37. (අ) රක්ෂණ අවදානම (ඉතිරි කොටස)

**37. (අ 3) ජීවිත රක්ෂණ අවදානම සඳහා සංවේදිතා විශ්ලේෂණ**

**ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම තීරණය කිරීමේ ප්‍රධාන උපකල්පනයන් පහත වගුවේ දක්වා ඇත.**

| උපකල්පනය | විස්තරය |
|---|---|
| මර්ත්‍යතාව | හොඳම ඇස්තමේන්තු අත්දැකීම් අනුපාතයට ඉඩදීමට වාර්ෂික නොවන ව්‍යාපාරය සඳහා අවුරුදු 67/70 සාධ්‍යකරණය වාර්ෂිකයන්ගේ මර්ත්‍යතාව ආසන්න වශයෙන් 1%කින් වර්ධනය කිරීමට ඉඩදීම සඳහා වයස වසරකින් අවහිර කිරීමෙන් පිරිමි (90)කින් හා කාන්තා (90)කින් සාමාන්‍යයට බර තැබීම |
| වියදම | සමාගමේ සහභාගි සහ සහභාගි නොවන ව්‍යාපාරවලට බෙදන ලද 2024 අභ්‍යන්තර වියදම් අධ්‍යයන සහ වියදම් මත පදනම් වේ. |
| අවලංගුවීම්/පවාරණ | අවසන් විමර්ශණ වසර තුළ තුළ පළපුරුද්ද ආවරණය කරමින් 2024 දෙසැම්බර් 31 දිනට පවත්වන ලද අත්දැකීම් අධ්‍යයනය පදනම් වේ. |
| රෝගාතුරවීම | සමාගමේ අභ්‍යන්තර පළපුරුදු සහ අපේක්ෂිත විශ්ලේෂණය අනුව සැබෑ ගණන මත පදනම් වේ. අපේක්ෂිත අනුපාත ප්‍රතිරක්ෂණ අනුපාත වගුව මත පදනම් වේ. |
| ප්‍රතිරක්ෂණය | ප්‍රතිරක්ෂණය සම්බන්ධයෙන් සමාගමේ අභ්‍යන්තර පළපුරුදු අධ්‍යයන මත පදනම් වේ |
| වට්ටම් අනුපාතය | 2024.12.31 දිනට ශ්‍රී ලංකා රක්‍ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් යෝජිත අවදානම් රහිත අනුපාත ව්‍යුහය |

සමාගම විසින් 2024 වර්ෂය පුරා සිය ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා ස්ථිර සහ ශක්තිමත් නුබුන්වත් අනුපාතයක් පවත්වාගෙන ගොස් ඇති අතර, 2024 දෙසැම්බර් 31 දිනට අවදානම් පදනම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 565% හි පැවති අතර, එය 2023 දෙසැම්බර් 31 දිනට 425% කි. මෙය අවම නියාමන අවශ්‍යතාවය වන 120% වඩා වඩාත් ඉහළ අගයකි.

| උපකල්පනය | උපකල්පනයේ වෙනස | වගකීම් මත ඇතිකරන බලපෑම (රු.) |
|---|---|---:|
| මර්ත්‍යතාව | +10% | මිලියන 886 |
| | -10% | මිලියන (890) |
| වියදම | +10% | මිලියන 2,638 |
| පැවැත්ම | +20% | මිලියන (2,265) |
| | -20% | මිලියන 2,002 |
| වට්ටම් අනුපාතය | අවදානම් පදනම් ප්‍රාග්ධනය යටතේ ඉහළ කම්පන අවස්ථාව | මිලියන (21,023) |
| | අවදානම් පදනම් ප්‍රාග්ධනය යටතේ පහළ කම්පන අවස්ථාව | මිලියන 27,595 |

අවදානම් පදනම් ප්‍රාග්ධන නීතිවලට අනුකූලව, දීර්ඝකාලීන රක්ෂණ ගිවිසුම් සඳහා සෘණාත්මක ඔප්පු වගකීම පිළිගත හැකි ලෙස සැළකිය හැකි අතර සෘණාත්මක ඔප්පු වගකීම සහිත තනි පුද්ගල ගිවිසුම් සම්බන්ධ වගකීම්වල වටිනාකම ශුන්‍ය දකවා අඩුවී නොමැත. කෙසේවෙතත් බෙදාහැරීමේ පදනම මත වූ වගකීම්වල අරමුණු සඳහා (එනම් SLFRS හී අරමුණු සඳහා) ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් විසින් වඩාත් විචක්ෂණ ප්‍රවේශයක් යොදාගෙන ඇති අතර, සෘණාත්මක වගකීම් ඔප්පු මට්ටමේදී බිංදුව දක්වා අඩුකොට ඇත.

නිෂ්පාදන වර්ගය මත පදනම් වී ඔප්පු වගකීම වෙන් කිරීම

| 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය | රක්ෂණ වගකීම් (ලාභ සහිත) රු. '000 | රක්ෂණ වගකීම් (ලාභ රහිත) රු. '000 | මුළු ප්‍රතිලාභ වගකීම් රු. '000 |
|---|---:|---:|---:|
| **සම්පූර්ණ ජීවිත** | 15,753 | 4,010 | 19,763 |
| දායාද රක්ෂණය | 95,304,980 | 7,884,963 | 103,189,943 |
| කාල සහතිකය | – | 2,919,583 | 2,919,583 |
| වාර්ෂිකය | 16,752,827 | 4,046,401 | 20,799,227 |
| රයිඩර් ප්‍රතිලාභ | 90,329 | 3,713,075 | 3,803,404 |
| **එකතුව** | 112,163,889 | 18,568,031 | 130,731,920 |

පහත වගුව මඟින් සමාගමේ සහභාගී සහ සහභාගී නොවන අරමුදල් තත්ත්වය පෙන්නුම් කරයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 37. රක්ෂණය හා මූල්‍ය අවදානම (ඉතිරි කොටස)

## 37. (අ) රක්ෂණ අවදානම (ඉතිරි කොටස)

## 37. (a 3) ජීවිත රක්ෂණ අවදානම සඳහා සංවේදීතා විශ්ලේෂණය (ඉතිරි කොටස)

**සහභාගී නොවන අරමුදල් අනුව සහභාගි අරමුදල**

| | සහභාගිත්ව රු. '000 | සහභාගිත්ව නොවන රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|
| 2024 | 194,546,922 | 18,681,308 | 213,228,229 |
| ප්‍රතිශතය | 91.24% | 8.76% | |

### 37. (ආ) ණය අවදානම

ණය අවදානම ආයෝජන සමාගම්, ප්‍රතිරක්ෂකයින් සහ වෙනත් ණයගැතියන් නියමිත ගෙවීම පැහැර හැරීමේ අවදානමයි. ඒ අනුව, ණය ගැතියෙක් බැඳී සිටින ගෙවීම් සිදු කිරීම අසමත්වීම මගින් ණයගැතියෙක් යම් ණය වර්ගයක් පැහැර හැරියහැකි අවදානම මින් අදහස් වේ. මෙම අවදානම මූලිකමව ණයගැතියා අතර පවතින අතර එයට මුල් මුදල හා පොලිය, මුදල් ප්‍රවාහ බිඳවැටීම සහ වැඩි වූ අයකිරීමේ පිරිවැය ඇතුළත් වේ.

සමාගම තනි රක්ෂකයෙකුගේ ආයෝජනවල සංකේන්ද්‍රණය සහ සමහර වත්කම් පන්ති මත එයට අයත් සීමා ස්ථාපිත කර ඇති අතර ද්‍රවශීල උපකරණවල ආයෝජන සීමා කරයි.

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂ බැංකු හැර කාලීන තැන්පතුවල කිසිදු ආයෝජනයක් සිදුකර නොමැත.

පිළිගත් ණය ශ්‍රේණිගතකරණ ආයතනයක් විසින් ආයතනය හා උපකරණය සඳහා ආයෝජන පන්ති ශ්‍රේණියේ ණය ශ්‍රේණිගතකරණය ආයතනික ණයකර හා වාණිජ පත්‍රිකා වල සියලුම ආයෝජන සඳහා අපේක්ෂා කෙරේ.

කිසිදු ණය ආයෝජනයක් සම් සම්බන්ධිත සමාගමක සිදු කර නොමැත.

ණය ඇපකරයක් තුළ යම් ආයෝජනයක් සිදු කිරීමට පෙර පුළුල් ණය විශ්ලේෂණයක් අභ්‍යන්තරව සිදු කෙරේ.

### 37. (ආ 1) ණය අවදානම් නිරාවරණය

ණය අවදානමට උපරිම නිරාවරණය

මූල්‍ය වත්කම්වල ධාරණ අගයෙන් උපරිම ණය නිරාවරණය නියෝජනය කරයි. වාර්තාකරණ දිනයට ණය අවදානමට උපරිම නිරාවරණය පහත පරිදි වේ:

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 රු. '000 | 2023 රු. '000 |
|---|---|---|---|
| කල්පිරීමට තබාගන්නා (HTM) | 7 | 79,756,987 | – |
| ණය හා ලැබීම් (L&R) | 7 | 35,573,902 | – |
| අලෙවිය සඳහා පවතින (AFS) | 7 | 75,278,788 | – |
| ඔප්පුහිමියන්ට ණය | 9 | 2,288,852 | – |
| ප්‍රතිරක්ෂණ ලැබීම් | 8 | 1,288,471 | – |
| වාරික ලැබීම් | 10 | 789,230 | – |
| වෙනත් වත්කම් | 11 | 1,835,674 | 50,000 |
| මුදල් හා මුදලට සමාන දෑ | 12 | 11,945,357 | 500,000 |
| **එකතුව** | | 208,757,261 | 550,000 |

කල්පිරෙන තෙක් තබාගන්නා (HTM)

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 37. රක්ෂණය හා මූල්‍ය අවදානම (ඉතිරි කොටස)

### 37. (අ) රක්ෂණ අවදානම (ඉතිරි කොටස)

### 37. (ආ 1) ණය අවදානම් නිරාවරණය (ඉතිරි කොටස)

කල්පිරෙන තෙක් තබාගන්නා මූල්‍ය වත්කම් සමාගම විසින් සිදුකළ භාණ්ඩාගාර බිල්පත්, ලැයිස්තුගත ණයකර, සහ භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමන්විත වේ. මේවා ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර සමාගමට කල්පිරෙන තෙක් තබා ගැනීමට අපේක්ෂාව සහ හැකියාව ඇති අවස්ථාවේදී ස්ථිර කල්පිරීම් කල්පිරෙන තෙක් තබා ගන්නා ලෙස වර්ගීකරණය කෙරේ. මෙවැනි වත්කම් සාධාරණ අගයට හා සෘජුව ආරෝපනය වන ගනුදෙනු පිරිවැයට මූලිකවම හඳුනා ගනී.

#### රජයේ සුරැකුම්පත්

රජයේ සුරැකුම්පත් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ප්‍රතිමිලදීගැනීමේ ප්‍රතිවර්තන ගිවිසුම්වල ආයෝජනවලින් සමන්විත වන අතර මේවා ස්වභාවය අනුව අවදානම් රහිත උපකරණ ලෙස හැඳින්වේ.

#### ණය හා ලැබීම් (L&R)

ණය හා ලැබීම් ලැයිස්තුගත නොකළ ආයතනික ණයකර, කාලීන තැන්පතු, වත්කම් පිටුලබය සහිත සුරැකුම්, සංවර්ධන බැඳුම්කර, වාණිජ පත්‍රිකා, වෙනත් ණය හා ලැබීම්, මුදල් හා මුදලට සමාන දෑ හි ආයෝජනවලින් සමන්විත වේ. ණය හා ලැබීම් යනු සක්‍රිය වෙළෙඳපොලක් තුළ ලැයිස්තුගත නොකළ ස්ථිර හෝ තීරණයකළහැකි ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. මෙවැනි වත්කම් සාධාරණ අගයට හා සෘජුව ආරෝපනය වන ගනුදෙනු පිරිවැයට මූලිකවම හඳුනා ගනී.

#### විකිණීමට තබා ඇති (AFS)

විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම්වලට ණය සුරැකුම්පත් ඇතුළත් වේ. මෙම වර්ගය තුළ සුරැකුම්පත් යනු කල්පිරෙන තෙක් තබා ගැනීමට අපේක්ෂා කරන සහ ද්‍රවශීලතාව සඳහා අවශ්‍යතාවයට හෝ වෙළෙඳපොල තත්ත්වයන් හී වෙනස්වීම්වලට ප්‍රතිචාරාත්මකව විකිණිය හැකි වත්කම් වෙති. සමාගමේ විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම් විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය නොකළ සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම් නොකළ හිමිකම් හා ණය සුරැකුම්පත්වලින් සමන්ත වේ.

#### ආයතනික ණය සුරැකුම්පත්

ආයතනික ණය සුරැකුම්පත් ආයතනික ණයකරවලින් සමන්විත වන අතර ඒවා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කරන සහ දේශීය හා විදේශීය ණය ශ්‍රේණිගතකරණ ආයතන විසින් සහතික කරන උපකරණ වෙති. ණය සුරැකුම්පත්වල රක්ෂකයින්ගේ ණය ශ්‍රේණිගතකරණ පිළිබඳ විශ්ලේෂණයක් මෙම සටහන් තුළ දැක්වේ.

#### ඔප්පුහිමියන්ට ණය

ඔප්පුහිමියන්ට ණය සඳහා අදාළ ණය අවදානම යනු මූල්‍ය අවදානමක් වන අතර එය ඔප්පුහිමියන් විසින් ණය නිරවුල් නොකිරීම හේතුවෙන් පැන නැගිය හැකිය.

සමාගම ඇපය ලෙස ඔප්පුවේ පවාරණ වටිනාකම සලකා බලමින් ඔප්පුහිමියන්ට ණය නිකුත් කර ඇත. වාර්තාකරණ දිනයට, ලබාදුන් ඔප්පුහිමියන්ට ණයවල ධාරණ අගය රු. මිලියන 1,978ක් වූ අතර අදාළ පවාරණ වටිනාකම රු. මිලියන 3,731ක් ය.

#### ප්‍රතිරක්ෂණ ලැබීම්

මෙය ප්‍රතිරක්ෂකයින්ට සමාගම වෙත සිය මූල්‍ය බැඳීම් ඉටු කිරීමට අසමත්වීමේ අවදානම වේ.

කළමනාකාරිත්වය නිරන්තර පදනමක් මත ප්‍රතිරක්ෂකයින්ගේ ණය වටිනාකම තක්සේරු කරන අතර ප්‍රතිරක්ෂණ වත්කම්වල හානිකරණය සඳහා සුදුසු දීමනාව නිශ්චය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිරක්ෂණ ලැබීම් සම්බන්ධයෙන් වාර්තාකරණ දිනයට මූල්‍ය ප්‍රකාශවල ප්‍රතිරක්ෂණ ලැබීම්වල වියහැකි හානිකරණය තක්සේරු කර ඇත.

#### වාරික ලැබීම්

මෙය ඔප්පුහිමියන්ගෙන් ලැබියයුතු වාරිකවලින් සමන්විත වන අතර එය හිඟ නිරවුල් නොකිරීම හේතුවෙන් සහ හිඟ පියවීමට සැලකියයුතු කාලයක් ගන්නා බැවින් මූල්‍ය අලාභ අවදානම ඇති කරයි. ජීවිත රක්ෂණය තුළ, ඔප්පුව නිකුත් කිරීමට පෙර වාරිකය අයකරන බැවින්, ණය අවදානම අවම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වාර්තාකරණ දිනයට වාරික ලැබීම් මත අලාභය තුළ වියහැකි හානිකරණය තක්සේරු කර ඇති අතර මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණවත් වෙන් කිරීම් සිදුකර ඇත.

#### වෙනත් ලැබීම්

ණය අවදානමට සමාගමේ නිරාවරණය එක් එක් ගනුදෙනුකරුගේ පුද්ගල ලක්ෂණ ප්‍රධාන වශයෙන් බලපෑම් කරයි. සමාගම හානිකරණය සඳහා දීමනාවක් ස්ථාපිත කරන අතර ඉන් වෙළෙඳ හා අනෙකුත් ලැබීම් සම්බන්ධයෙන් උචිත අලාභවල සිය ඇස්තමේන්තුව නියෝජනය කරයි.

#### මුදල් හා මුදලට සමාන දෑ

වාර්තාකරණ දිනයට කෙටි කාලීන ආයෝජන, බැංකුවේ මුදල් හා අතැති මුදල්වලින් මෙය සමන්විත වේ. කෙටි කාලීන තැන්පතුවලට බැංකු හා මූල්‍ය ආයතනවල ස්ථාපිත ස්ථිර තැන්පතු හා ඇමතුම් තැන්පතු ඇතුළත් වේ. තවද, බැංකුවල මුදල් ප්‍රධාන වශයෙන්ම පුද්ගලික හා රජයේ වාණිජ බැංකුවල ඉතුරුම් හා ජංගම ගිණුම්වල හිතකර ශේෂවලින් සමන්විත වේ.

ණය අවදානම් නිරාවරණය

| දෙසැම්බර් 31 දිනට | 2024 රු. '000 | වෙන්කිරීම්වල ප්‍රතිශතය | 2023 රු. '000 | වෙන්කිරීම්වල ප්‍රතිශතය |
|---|---|---|---|---|
| මූල්‍ය ආයෝජන | | | | |
| ණය සුරැකුම්පත් – ණය හා ලැබීම් | 34,368,649 | 36% | – | – |
| ණය සුරැකුම්පත – විකිණීමට තබා ඇති | 41,018,556 | 43% | – | – |
| ණය සුරැකුම්පත් – කල්පිරෙන තෙක් තබා ගන්නා | 18,708,638 | 20% | – | – |
| සේවක හා නියෝජිත ණය | 1,205,253 | 1% | – | – |
| එකතුව | 95,301,096 | 100% | – | – |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

37. රක්ෂණය හා මූල්‍ය අවදානම (ඉතිරි කොටස)

37. (ආ) ණය අවදානම (ඉතිරි කොටස)

**37. (ආ 2) ණය ශ්‍රේණිගතකරණ අනුව ණය සුරැකුම්පත් වෙන් කිරීම**

| දෙසැම්බර් 31 දිනට | 2024 | | 2023 | |
|---|---|---|---|---|
| ශ්‍රේණිගතකරණය | රු. මි. | එකතුවේ ප්‍රතිශතය | රු.මි. | එකතුවේ ප්‍රතිශතය |
| AAA | 21,894 | 23% | – | – |
| AA+ | – | 0% | – | – |
| AA | – | 0% | – | – |
| AA- | 17,950 | 19% | – | – |
| A+ | 9,411 | 10% | – | – |
| A | 26,579 | 28% | – | – |
| A- | 1,724 | 2% | – | – |
| BBB+ | 16,381 | 17% | – | – |
| BBB | 157 | 0% | – | – |
| BBB- | – | 0% | – | – |
| BB+ | – | 0% | – | – |
| BB- | – | 0% | – | – |
| අනුපාත නොකළ | 1,205 | 1% | – | – |
| එකතුව | 95,301 | 100% | – | – |

**37. (ඇ) වෙළෙඳපොල අවදානම**

වෙළෙඳපොල අවදානම යනු විදේශ විනිමය අනුපාත සහ පොලී අනුපාත වැනි වෙළෙඳපොල මිලෙහි වෙනස් වීමේ අවදානම වන අතර එය සමාගමේ ආදායමට හෝ එහි මූල්‍ය උපකරණවල දරාසිටීමේ වටිනාකම කෙරෙහි බලපායි. වෙළෙඳපොල අවදානම් කළමනාකරණයේ පරමාර්ථය වන්නේ ප්‍රතිලාභ ප්‍රශස්ත කරන අතරම පිළිගත හැකි පරාමිතීන් තුළ වෙළෙඳපොල අවදානම් නිරාවරණ කළමනාකරණය කිරීම සහ පාලනය කිරීමයි.

ආයෝජන කළඹ කළමනාකරණය කිරීමේදී ස්කන්ධය සඳහා උපරිම නිරාවරණ සීමාව සමාගම විසින් පවත්වාගෙන යනු ලැබේ. තවද, ක්‍රමානුකූල නොවන අවදානම් අවම කිරීම සඳහා සමාගම විසින් ආයෝජන කළඹ විවිධ අංශවලට විවිධාංගීකරණය කර ඇත.

**37. (ඇ 1) ස්කන්ධ වෙළෙඳපොල සංවේදිතාව**

| 2024 දෙසැම්බර් 31 දිනට | වෙළෙඳපොල පිබිදීම | | වෙළෙඳපොල බිඳවැටීම | |
|---|---|---|---|---|
| | ලාභයට ඇති බලපෑම රු. '000 | OCI ඇති බලපෑම රු. '000 | ලාභයට ඇති බලපෑම රු. '000 | OCI ඇති බලපෑම රු. '000 |
| කම්පන මට්ටම: | | | | |
| 5% | 641,405 | 638,882 | (641,405) | (638,882) |
| 10% | 1,282,810 | 1,277,764 | (1,282,810) | (1,277,764) |
| **එකතුව** | 1,924,215 | 1,916,646 | (1,924,215) | (1,916,646) |

| 2023 දෙසැම්බර් 31 දිනට | වෙළෙඳපොල පිබිදීම | | වෙළෙඳපොල බිඳවැටීම | |
|---|---|---|---|---|
| | ලාභයට ඇති බලපෑම රු. '000 | OCI ඇති බලපෑම රු. '000 | ලාභයට ඇති බලපෑම රු. '000 | OCI ඇති බලපෑම රු. '000 |
| කම්පන මට්ටම: | | | | |
| 5% | – | – | – | – |
| 10% | – | – | – | – |
| **එකතුව** | – | – | – | – |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 37. රක්ෂණය හා මූල්‍ය අවදානම (ඉතිරි කොටස)

### 37. (ඈ) විදේශ විනිමය අවදානම

ශ්‍රී ලංකා රුපියල හැර වෙනත් මුදල් ඒකකයකින් පෙන්නුම් කරන මූල්‍ය වත්කම් හි ආයෝජනය මත සමාගම විනිමය අවදානමට අනාවරණය වේ. මෙම ගණුදෙණු මූලික වශයෙන් පෙන්නුම් කරන විදේශ විනිමය වන්නේ ඇමෙරිකන් ඩොලර්ය (USD).

### 37. (ඈ 1) විනිමය අවදානමට නිරාවරණය

විදේශ මුදල් අවදානම සඳහා සමාගමේ නිරාවරණය වීම සංකල්පිත අගයන් මත පදනම් වේ. එය පහත පරිදි වේ.

| දෙසැම්බර් 31 දිනට | 2024<br>ධාරණ අගය<br>රු. '000 | 2023<br>ධාරණ අගය<br>රු. '000 |
|---|---|---|
| කාලීන තැන්පතු: | | |
| ඇමෙරිකන් ඩොලර් | 1,038,633 | – |
| **එකතුව** | 1,038,633 | – |

පහත සඳහන් සැලකියයුතු හුවමාරු අනුපාත වසර තුළ අදාළ විය.

| දෙසැම්බර් 31 දිනට | සාමාන්‍ය අනුපාතය 2024 රු. | වාර්තාකරණ දිනට පවතින අනුපාතය 2024 රු. | සාමාන්‍ය අනුපාතය 2023 රු. | වාර්තාකරණ දිනට පවතින අනුපාතය 2023 රු. |
|---|---|---|---|---|
| ඇමෙරිකන් ඩොලර් | 304.88 | 288.75 | – | – |

### 37. (ඈ 2) සංවේදීතා විශ්ලේෂණය

2024 දෙසැම්බර් 31 වන දිනට ඇමෙරිකාණු ඩොලරයට අනුව පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා රුපියලේ ශක්තිමත් වීමක් විදේශ මුදල් ලාභ/ආලාභ සහ පොළී ආදායම පහත දැක්වෙන අගයන්ගෙන් වැඩි වී/(අඩු වී) ඇත. අනෙකුත් සියලුම විචල්‍යතා විශේෂයෙන් පොළී අනුපාත නොවෙනස්ව පවතින බව මෙම විශ්ලේෂණයෙන් පිළිගනී.

| 2024 දෙසැම්බර් 31 දිනට | විනිමය අනුපාත කම්පන මට්ටම<br>1.0%<br>රු. '000 | 1.5%<br>රු. '000 | 2.0%<br>රු. '000 |
|---|---|---|---|
| විදේශ විනිමය ලාභ/අලාභ මත බලපෑම | | | |
| **පාවෙන අනුපාතය** | | | |
| ඇමෙරිකන් ඩොලර් | – | – | – |
| **ස්ථිර අනුපාතය** | | | |
| ඇමෙරිකන් ඩොලර් | 10,386 | 15,580 | 20,773 |
| **මුළු බලපෑම** | 10,386 | 15,580 | 20,773 |
| පොළී ආදායම මත බලපෑම | | | |
| **පාවෙන අනුපාතය** | | | |
| ඇමෙරිකන් ඩොලර් | – | – | – |
| **ස්ථිර අනුපාතය** | | | |
| ඇමෙරිකන් ඩොලර් | 151 | – | – |
| **මුළු බලපෑම** | 151 | – | – |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

37. රක්ෂණය හා මූල්‍ය අවදානම (ඉතිරි කොටස)

37. (ඇ) විදේශ විනිමය (ඉතිරි කොටස)

37. (ඇ 2) සංවේදිතා විශ්ලේෂණය (ඉතිරි කොටස)

| | විනිමය අනුපාත කම්පන මට්ටම | | |
|---|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට | 1.0% රු. '000 | 1.5% රු. '000 | 2.0% රු. '000 |
| විදේශ විනිමය ලාභ/අලාභ මත බලපෑම: | | | |
| **පාවෙන අනුපාතය** | | | |
| ඇමෙරිකන් ඩොලර් | – | – | – |
| **ස්ථිර අනුපාතය** | | | |
| ඇමෙරිකන් ඩොලර් | – | – | – |
| **මුළු බලපෑම** | – | – | – |
| පොළී ආදායම මත බලපෑම: | | | |
| **පාවෙන අනුපාතය** | | | |
| ඇමෙරිකන් ඩොලර් | – | – | – |
| **ස්ථිර අනුපාතය** | | | |
| ඇමෙරිකන් ඩොලර් | – | – | – |
| **මුළු බලපෑම** | – | – | – |

### 37. (ඉ) පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු අවදානම් රහිත පොළී අනුපාත ඵලදා වක්‍රය පුරා ණය පැතිරීමේ මට්ටම හෝ උච්චාවචනය තුළ වෙනස්වීම් හේතුවෙන් වත්කම් හා වගකීම්වල අගයන්හි සංවේදීතාව, ණය පැතිරීමේ අවදානම විස්තර කරන අතර ඵලදායී වක්‍රයේ හැඩයේ වෙනස්වීම් ඇතුළුව, පොළී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් සිදුවන අවදානමයි.

අවදානම් සීමාවන් සමඟ සමස්ථ තත්ත්වයට එකඟවීමෙන් එක් එක් ප්‍රධාන කල්පිරීම් රාමුව හරහා පොළී අනුපාත අවදානම කළමනාකරණය කෙරේ. ආයෝජන කමිටුව ස්ථාවර ආදායම් කළඹ සක්‍රියව කළමනාකරණය කළ අතර එහිදී අඩු ප්‍රතිලාභයක් සහිත ආයෝජන වලින් සාපේක්ෂව ඉහළ ප්‍රතිලාභයක් සහිත ආයෝජන වෙත උපායමාර්ගිකව මාරුවීම, නොගැලපීම් කාලසීමාව සමීපව නිරීක්ෂණය කිරීමෙන් පොළී ආදායම මත වන පීඩනය අවම කිරීම සිදුකර ඇත.

පොළී අනුපාත අවදානම අවම කිරීම සඳහා සමාගම විසින් පහත සඳහන් ප්‍රතිපත්ති යොදා ගෙන ඇත.

1. ආයෝජන වලින් සැලකිය යුතු කොටසක් අවදානම් රහිත ආයෝජන පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම විසින් නිකුත් කළ නීති හා රෙගුලාසි පිළිපදිමින් රජයේ සුරැකුම්පත්වල අවදානම් රහිත ආයෝජනවල සිදු කෙරේ.
2. ආයෝජන කළඹේ ප්‍රධාන කොටස ශ්‍රේණිගත මූල්‍ය ආයතනවල හෝ ශ්‍රේණිගත උපකරණවල සිදු කෙරේ.
3. ආයෝජන කමිටුව ආයෝජන තීරණ ගන්නා අතර අවශ්‍ය අවස්ථාවේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගනී.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

37. රක්ෂණය හා මූල්‍ය අවදානම (ඉතිරි කොටස)

37. (ඉ) පොලී අනුපාත අවදානම (ඉතිරි කොටස)

### 37. (ඉ 1) පොලී අනුපාත අවදානමට නිරාවරණය

සමාගමේ කළමනාකාරිත්වයට වාර්තා කර ඇති පරිදි සමාගමේ පොලී අනුපාත දරණ මූල්‍ය උපකරණවල පොලී අනුපාත විස්තර පහත පරිදි වේ.

| දෙසැම්බර් 31 දිනට | 2024 ධාරණ අගය රු. '000 | 2023 ධාරණ අගය රු. '000 |
|---|---|---|
| ස්ථාවර අනුපාත උපකරණ: | | |
| **කල් පිරීමට තබා ගන්නා (HTM)** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 61,048,349 | – |
| ලැයිස්තුගත ණයකර | 18,708,638 | – |
| **ණය සහ ලැබීම් (L&R)** | | |
| ලැයිස්තුගත නොකළ ණයකර | 19,468,838 | – |
| කාලීන තැන්පතු | 7,394,005 | – |
| සේවක ණය | 726,586 | – |
| නියෝජිත ණය | 478,667 | – |
| **විකිණීම සඳහා තබා ඇති (AFS)** | | |
| ලැයිස්තුගත ණයකර | 19,431,017 | – |
| භාණ්ඩාගාර බැඳුම්කර | 24,541,646 | – |
| වාණිජ පත්‍රිකා | 21,587,539 | – |
| පාවෙන අනුපාත උපකරණ: | | |
| **ණය සහ ලැබීම් (L&R)** | | |
| ලැයිස්තුගත නොකළ ණයකර | 7,505,806 | – |
| **විකිණීම සඳහා තබා ඇති (AFS)** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 9,718,586 | – |
| **එකතුව** | 190,609,668 | – |

### 37. (ඉ 2) සංවේදිතා විශ්ලේෂණය

වාර්තා කරන දිනට පොලී අනුපාතවල පදනම් ලකුණු 100 ක සාධාරණව වියහැකි වෙනස පහත දක්වා ඇති ගණන් වලින් සක්න්ධය සහ පොලී ආදායම ඉහළ නංවනු (පහළ හෙළනු) ඇත.

| 2024 දෙසැම්බර් 31 දිනට | ඵලදා වක්‍රයේ ඉහළට 100bps සමාන්තර විස්තාපනය | | ඵලදා වක්‍රයේ පහළට 100bps සමාන්තර විස්තාපනය | |
|---|---|---|---|---|
| | පොලී ආදායම කෙරෙහි බලපෑම රු. '000 | ස්කන්ධය කෙරෙහි බලපෑම රු. '000 | පොලී ආදායම කෙරෙහි බලපෑම රු. '000 | සක්න්ධය කෙරෙහි බලපෑම රු. '000 |
| **මූල්‍ය ආයෝජන** | | | | |
| කල්පිරීමට තබා ගන්නා (HTM) | – | – | – | – |
| ණය සහ ලැබීම් (L&R) | 730,000 | – | (730,000) | – |
| විකිණීම සඳහා තබා ඇති (AFS) | 162,978 | (1,045,622) | (162,978) | 667,664 |
| ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVTPL) | – | – | – | – |
| **එකතුව** | 892,978 | (1,045,622) | (892,978) | 667,664 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 37. රක්ෂණය හා මූල්‍ය අවදානම (ඉතිරි කොටස)

## 37. (ඉ) පොළී අනුපාත අවදානම (ඉතිරි කොටස)

## 37. (ඉ 2) සංවේදිතා විශ්ලේෂණය (ඉතිරි කොටස)

| 2023 දෙසැම්බර් 31 දිනට | එළදා වක්‍රයේ ඉහළට 100bps සමාන්තර විස්තාපනය | | එළදා වක්‍රයේ පහළට 100bps සමාන්තර විස්තාපනය | |
|---|---|---|---|---|
| | පොළී ආදායම කෙරෙහි බලපෑම රු. '000 | ස්කන්ධය කෙරෙහි බලපෑම රු. '000 | පොළී ආදායම කෙරෙහි බලපෑම රු. '000 | ස්කන්ධය කෙරෙහි බලපෑම රු. '000 |
| **මූල්‍ය ආයෝජන** | | | | |
| කල්පිරීමට තබා ගන්නා (HTM) | – | – | – | – |
| ණය සහ ලැබීම් (L&R) | – | – | – | – |
| විකිණීම සඳහා තබා ඇති (AFS) | – | – | – | – |
| ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVTPL) | – | – | – | – |
| **එකතුව** | – | – | – | – |

** එළදා වක්‍රයේ වෙනස්වීමක් වූ විටෙක පහත තත්ත්වයක් ඇතිවිය:*
*පොළී ආදායමේ හෝ HTM හා LGR යටතේ වර්ගීකරණය කර ඇති ස්ථිර අනුපාත ණය උපකරණ සඳහා ස්කන්ධයට කිසිදු බලපෑමක් ඇති වී නැත*
*HTM හා LGR යටතේ වර්ගීකරණය කර ඇති පාවෙන අනුපාත ණය උපකරණ සඳහා වූ ස්කන්ධයට කිසිදු බලපෑමක් නොවී පොළී ආදායමට බලපෑමක් ඇති වී ඇත*
*පොළී ආදායමට කිසිදු බලපෑමක් නොවුවද AFS යටතේ වර්ගකර ඇති ස්ථිර අනුපාත ණය උපකරණ සඳහා වූ ස්කන්ධයට බලපෑමක් ඇති වී ඇත.*
*පොළී ආදායමට බලපෑමක් වුවද AFS යටතේ වර්ගකර ඇති පාවෙන අනුපාත ණය උපකරණ සඳහා වූ ස්කන්ධයට කිසිදු බලපෑමක් එල්ල වී ඇත.*

## 37. (ඊ) වෙළෙඳපොළ අනුපාත අවදානම

ආයෝජන කළඹ කළමනාකරණය කිරීමේ දි ස්කන්ධ සඳහා උපරිම අනාවරණ සීමාවන් සමාගම විසින් පවත්වාගෙන යයි. තවද, අක්‍රමවත් අවදානම් අවම කිරීම සඳහා සමාගම ආයෝජන කළඹ විවිධ අංශවලට විවිධාංගීකරණයට ලක් කර ඇත.

## 37. (ඊ 1) ස්කන්ධ අවදානම් කළඹ විවිධාංගීකරණයි

ජීවිත රක්ෂණ ව්‍යාපාරය

| අංශය | කර්මාන්ත සමූහය | 2024 ධාරණ අගය රු. '000 | 2024 % | 2023 ධාරණ අගය රු. '000 | 2023 % |
|---|---|---|---|---|---|
| මූල්‍ය | බැංකු | 15,270,496 | 59.64% | – | – |
| | විවිධාංගීකරණය කළ මූල්‍ය | 2,394,442 | 9.35% | – | – |
| **මූල්‍ය** | | 17,664,938 | 68.99% | – | – |
| ගනුදෙනුකාර අභිමතිය | සිල්ලර | 47,049 | 0.18% | – | – |
| **ගනුදෙනුකාර අභිමතිය** | | 47,049 | 0.18% | – | – |
| **කර්මාන්ත** | ප්‍රාග්ධන භාණ්ඩ | 2,196,998 | 8.58% | – | – |
| **සෞඛ්‍යාරක්ෂාව** | සෞඛ්‍යාරක්ෂාව සහ උපකරණ හා සේවා | 201,006 | 0.79% | – | – |
| **විදුලි සංදේශ සේවා** | විදුලි සංදේශ සේවා | 1,213,716 | 4.74% | – | – |
| **අමුද්‍රව්‍ය** | අමුද්‍රව්‍ය | 1,564,478 | 6.11% | – | – |
| **පාරිභෝගික ද්‍රව්‍ය** | ආහාරපාන සහ දුම්කොළ | 921,850 | 3.60% | – | – |
| **නිශ්චල දේපල** | නිශ්චල දේපල | 113,441 | 0.44% | – | – |
| **බලශක්තිය** | බලශක්තිය | 1,037,736 | 4.05% | – | – |
| **උපයෝගිතා** | උපයෝගිතා | 644,534 | 2.52% | – | – |
| **එකතුව** | | 25,605,746 | 100.00% | – | – |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 37. රක්ෂණය හා මූල්‍ය අවදානම (ඉතිරි කොටස)

### 37. (උ) මෙහෙයුම් අවදානම්

මෙය අසමත්, ප්‍රමාණවත් නොවන, හෝ අසම්පූර්ණ අභ්‍යන්තර ක්‍රියාවලි, සේවකයින්, පද්ධති, පාලනයන් හේතුවෙන් හෝ බාහිර සිදුවීම් හේතුවෙන් සමාගමට සිය අරමුණු සපුරාලීමට නොහැකි වීමේ අවදානමයි. මූල්‍ය අවදානම් කළමනාකරණ සංදර්භය තුළ, මෙය මූල්‍ය අලාභ ඇති කළ හැකි මෙහෙයුම් අවදානම් කළමනාකරණය හා සම්බන්ධ වේ.

කළමනාකාරිත්වය දැඩි පාලන රාමුවක් පවත්වා ගනිමින් හා වියහැකි අවදානම් නියාමනය හා ඒවාට ප්‍රතිචාර දක්වමින් මෙහෙයුම් අවදානම් කළමනාකරණය කරයි. පාලනයන්ට රාජකාරි ඵලදායීව බෙදීම, පිවිසුම්, අධිකාරිය සහ සැසැඳීමේ ක්‍රියාපටිපාටි පාලනයන්, සදාචාර ව්‍යාපාර ව්‍යවහාර සහ ප්‍රමිති, සේවක අධ්‍යාපනය, පුහුණුව සහ ඇගයීමේ ක්‍රියාවලියන් මෙන්ම අභ්‍යන්තර විගණනයක් පැවැත් වීමද ඇතුළත් වේ.

### 37. (ඌ) ද්‍රවශීලීතා අවදානම

ද්‍රවශීලතා අනුපාතය යනු මුදල් හෝ වෙනත් මුල්‍යමය වත්කමක් ලබාදීමෙන් නිරවුල් කරන මුල්‍ය වගකීම් හා බැදී පවතින්නාවූ බැදියාවන් සපුරාලීමට සමාගමට දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුවන අවදානමයි.

### 37. (ඌ 1) කල්පිරීමේ විශ්ලේෂණයි

ගෙවීමට ඇති පොලිය සහ ලැබීමට ඇති පොලිය ඇතුලත්ව ඉතිරිව ඇති වට්ටම් රහිත ගිවිසුම් බැදියාවන් මත පදනම් කරගත් ව්‍යුත්පන්න නොවන මුල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල කල්පිරීමේ පැතිකඩ පහත වගුවෙන් සාරාංශ කරයි.

| 2024 දෙසැම්බර් 31 දිනට | ධාරණ අගය රු. '000 | ස්ථිර කාල ගණන රු. '000 | වසර 1 දක්වා රු. '000 | වසර 1 - 2 දක්වා රු. '000 | වසර 2 - 5 දක්වා රු. '000 | වසර 5 10 දක්වා රු. '000 | වසර 10ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය ආයෝජන | | | | | | | | |
| කල්පිරීමට තබා ගන්නා (HTM) | 79,756,987 | – | 5,420,990 | 4,050,000 | 19,577,717 | 35,800,000 | 10,250,000 | 75,098,707 |
| ණය හා ලැබීම් (L&R) | 35,573,902 | – | 32,503,094 | 500,000 | 5,000,000 | 10,305,253 | 3,000,000 | 51,308,347 |
| විකිණීමට තබා ඇති (AFS) | 89,306,808 | 14,028,021 | 6,917,956 | 9,880,110 | 23,098,878 | 14,145,182 | – | 68,070,147 |
| ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVTPL) | 15,283,758 | 15,283,759 | – | – | – | – | – | 15,283,759 |
| **එකතුව** | 219,921,456 | 29,311,780 | 44,842,040 | 14,430,110 | 47,676,595 | 60,250,435 | 13,250,000 | 209,760,960 |

| 2023 දෙසැම්බර් 31 දිනට | ධාරණ අගය රු. '000 | ස්ථිර කාල ගණන රු. '000 | වසර 1 දක්වා රු. '000 | වසර 1 - 2 දක්වා රු. '000 | වසර 2 - 5 දක්වා රු. '000 | වසර 5 10 දක්වා රු. '000 | වසර 10ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය ආයෝජන | | | | | | | | |
| කල්පිරීමට තබා ගන්නා (HTM) | – | – | – | – | – | – | – | – |
| ණය හා ලැබීම් (L&R) | – | – | – | – | – | – | – | – |
| විකිණීමට තබා ඇති (AFS) | – | – | – | – | – | – | – | – |
| ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVTPL) | – | – | – | – | – | – | – | – |
| **එකතුව** | – | – | – | – | – | – | – | – |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 38. බැඳීම්, අසම්භාව්‍යතා සහ ඇපකර

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමාගමට අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් (නෛතික හෝ හිතතකර) ඇති සහ බැඳීම නිරවුල් කිරීමට ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත්වල පිටතට ගලායාමක් අවශ්‍යවන සහ බැඳීමේ ප්‍රමාණය පහසුවෙන් ඇස්තමේන්තු කළ හැකි අවස්ථාවේදී වෙන් කිරීම් හඳුනා ගනී.

අසම්භාව්‍ය බැරකම් යනු වියහැකි බැඳීම් වන අතර, ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම විය නොහැකි හෝ පහසුවෙන් මැනිය නොහැකි අවස්ථාවේදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් මගින් පමණක් ඒවායේ පැවැත්ම තහවුරු කරනු ලැබේ. අසම්භාව්‍ය බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හඳුනා නොගන්නා නමුත් මූල්‍ය ප්‍රකාශවලට සටහන් ලෙස අනාවරණය කෙරේ.

### 38 (අ) නීතිමය ක්‍රියාපටිපාටි සහ රෙගුලාසි

2024 දෙසැම්බර් 31 දිනට නීතිමය ක්‍රියාපටිපාටි සහ රෙගුලාසි හේතුවෙන් අසම්භාව්‍යයන් කිසිවක් නොමැත.

### 38. (ආ) ප්‍රාග්ධන හා මූල්‍යමය බැඳීම්

38. (ආ 1) ප්‍රාග්ධන බැඳීම්

2024 දෙසැම්බර් 31 දිනට කිසිදු ප්‍රාග්ධන බැඳීමක් නොමැත.

38 (ආ 2) මූල්‍යමය බැඳීම්

2024 දෙසැම්බර් 31 දිනට කිසිදු මූල්‍යමය බැඳීමක් නොමැත.

### 38. (ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරු

2024 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් කිසිදු තක්සේරු කිරීමක් නොමැත.

### 38. (ඈ) වත්කම් ඇපය

2024 දෙසැම්බර් 31 දිනට බැඳීම් සඳහා සුරැකුම් ලෙස කිසිදු වත්කමක් පිරි නමා නැත.

## 39. වෙන් කිරීම

### වෙන් කිරීම සඳහා නෛතික පදනම (IRCSL අවශ්‍යතාව)

2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වගන්තියට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ වෙන් කිරීමේ මාර්ගෝපදේශ යොමුව: IBSL/DG/LEG/14/02/089 සහ IBSL/DG/ LEG/13/09/468)ල සහ අංක 23/0431/604/046 හා 2023 මාර්තු 17 දිනැති කැබිනට් තීරණය මෙන්ම අංක 23/2397/604/239 හා 2023 දෙසැම්බර් 18 දිනැති කැබිනට් තීරණය යටතේ අනුමතකළ වෙන් කිරීමේ ආදර්ශය අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙනම නෛතික ආයතන දෙකකට ප්‍රතිව්‍යුහගත කරන ලදී.

2023 දෙසැම්බර් 22 දින, දිස්ත්‍රික් උසාවියේ නඩුවක් ගොනු කළ අතර, 2024 ජනවාරි 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙන් කිරීම සඳහා උසාවි නියෝගය ලබාගන්නා ලදී. ඉන්පසුව, 2024 ජනවාරි 19 දින, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් 2007 අංක 7 දරන සමාගම් පනතේ 256 වගන්තිය පරිදි කොළඹ වාණිජ මහාධිකරණයේ පෙත්සමක් ගොනු කළ අතර වැඩපිළිවෙලේ යෝජනා ක්‍රමය සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. වත්කම් හා වගකීම් මාරු කිරීම ඇතුළුව 256 වගන්තියේ අයදුම්පත අනුව වාණිජ මහාධිකරණය මත පුළුල් බලය පවතී. සමාගම් පනතේ 257 (1) (අ) වගන්තියෙන් විශේෂයෙන් "ජංගම හෝ ස්ථාවර දේපල, වත්කම්, හිමිකම්, බලය, බැඳියාවන්, වගකීම්, ගිවිසුම් සහ සහභාගිත්වයන් මාරු කිරීම හෝ පැවරීම සඳහා" නියෝග කිරීමට උසාවියට ලබා දේ.

වෙන් කිරීමෙන් ඇතිවන ප්‍රධාන ගනුදෙනු අනුමත කිරීම පිණිස 2024 ජනවාරි 16 දින අති විශේෂ මහ සභා රැස්වීමක් පවත්වන ලදී. අමාත්‍ය මණ්ඩලය, උසාවියේ අවශ්‍යතාව සහ ලබාගත් කොටස්හිමියන්ගේ අනුමැතිය සමඟ, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් සිය ජීවිත සහ සාමාන්‍ය ව්‍යාපාරයෙන් රක්ෂණ ව්‍යාපාරය වෙන් කිරීම සිදුකිරීමේ නියාමන අවශ්‍යතාව සමඟ අනුකූල වී ඇත. ඉන් පසුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2024 පෙබරවාරි 01 දින සිට ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත වෙන වෙනම රක්ෂණ බලපත් ලබා දෙන ලදී.

#### නව නීතිමය ආයතන දෙකකට ව්‍යාපාර වත්කම් හා වගකීම් මාරු කිරීම

ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි තෝරාගත් වගක්ම් හා වගකීම් 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව SLICLL සහ SLICGL යන වෙනත් නෛතික ආයතන දෙකකට මාරු කර ඇත' SLICLL හි ව්‍යාපාරික මෙහෙයුම් 2024 පෙබරවාරි 01 දින සිට ආරම්භ කළ අතර නීතිමය ආයතනවල අංග සලකා බලමින් 2024 පෙබරවාරි 01 දින සිට ආරම්භව 2024 දෙසැම්බර් 31 දක්වා මාස 11ක කාලසීමාවක් සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කෙරේ. ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර දෙක අතර වත්කම් හා වගකීම් වෙන් කිරීම අනුමත වෙන් කිරීමේ සැලැස්මට අනුකූලව පවත්වන ලදී (වැඩපිළිවෙල යෝජනා ක්‍රමය) මෙහිදී එක් එක් ආයතනයට සිය අදාළ ව්‍යාපාර මාර්ගයට අනුරූපව වත්කම් හා වගකීම් ලබා දී ඇත. මහාධිකරණය විසින් අනුමත කළ වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව, වත්කම්වලට අනුරූප උපලබ්ධි නොවූ සංචිත මෙන්ම රඳවාගත් ඉපයීම්වලට අදාළ වගකීම් මාරු නොකරන ලද අතර පරිපාලක සමාගම සමඟ රඳවා ගන්නා ලද බව සඳහන් කළ යුතුය.

වෙන් කිරීමෙන් පසුව, සමාගමේ මුළු වත්කම් රු. බිලියන 201.33ක් වූ අතර මුළු සක්න්ධය හා මුළු වගකීම් පිළිවෙළින් රු. බිලියන 12.59 ක් හා රු. බිලියන 188.73ක් විය. සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. බිලියන 12.5කි.

ඒ අනුව, 2024 ජනවාරි 19 දිනැති එකී උසාවි නියෝගය පරිදි, සහ නීතිය ක්‍රියාත්මක කිරීම අනුව, 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ සියලුම වත්කම් SLICLL වෙත මාරු කරන ලද අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ සියලුම වත්කම් SLICGI වෙත මාරු කරන ලදී.

මාරුකරන ලද වත්කම්වල නෛතික හිමිකාරත්වය අදාළ බලධාරීන් විසින් අනුමත කළ වැඩපිළිවෙල යෝජනා ක්‍රමය මත මහාධිකරණය විසින් ලබා දුන් නියෝගය පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙතින් SLICLL සහ SLICGL වෙත මාරු කරන ලදී. කෙසේවෙතත්, යම් අදාළ බලධාරීන් විසින් පවත්වාගන්නා වාර්තාවල එකී මාරු කිරීම වාර්තා කිරීමට ක්‍රියාත්මක කළ යුතු වැඩිදුර ප්‍රායෝගික පියවර අවශ්‍ය වේ. එයට අවශ්‍ය පරිදි පරිපාලන නම වෙනස්වීම් ඇතුළුව වෙනත් යම් විධි ඇතුළත් වන අතර ඒ සඳහා එකී බලධාරීන්ට අවශ්‍යවන වෙනත් විධි සමඟ අදාළ බලධාරීන් වෙත උසාවි නියෝගය ඉදිරිපත් කළ යුතුය.

රක්ෂකයාගේ නමට තබාගත් වත්කම් සම්බන්ධයෙන් 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 30 වගන්තියට අනුව මහාධිකරණය විසින් අනුමත කළ වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව සියලුම වාර්තාවලින් නව නෛතික හිමිකාරත්වය පිළිබිඹුවන බව සහතික කිරීමට මෙම පරිපාලන සංක්‍රාන්තිය ක්‍රියාත්මක වෙමින් පවතී.

#### පරිපාලන නාමය වෙනස්වීම් ඇතුළුව වෙනත් විධි

- පරිපාලක සමාගමෙන් (SLIC) SLICLL වෙත මෝටර් රථවල පරිපාලන නමේ වෙනස

වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව, රු. මිලියන 236ක පිරිවැයක් සහිත මෝටර් වාහන සමාගම (SLICLL) වෙත 2024 පෙබරවාරි 01 දින සිට මාරු කරන ලදී. තවද, කළමනාකාරිත්වය පරිපාලක සමාගමෙන් මෝටර් වාහනවල නෛතික හිමිකම මාරු කිරීමේ ක්‍රියාවලියක නිරත වී සිටී. සමාගම මෝටර් රථ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති අතර 2025 අවසානය වන විට සමස්ත මාරු කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට අපේක්ෂා කරයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 39. වෙන් කිරීම (ඉතිරි කොටස)

- **පරිපාලක සමාගමෙන් (SLIC) SLICLL වෙත මූල්‍ය ආයෝජනවල පරිපාලන නමේ වෙනස**

වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව, රු. බිලියන 194.7ක පිරිවැය සහිත මූල්‍ය වත්කම් සමාගම (SLICLL) වෙත 2024 පෙබරවාරි 01 දින සිට මාරු කරන ලදි. මෙයට සමගාමීව, පරිපාලක සමාගමෙන් මෙම මූල්‍ය උපකරණවල හිමිකාරිත්වය මාරු කිරීමට ගතහැකි සියලු පියවර ගෙන ඇත. කෙසේවෙතත්, සමහර මූල්‍ය උපකරණ පරිපාලනමය වශයෙන් පරිපාලක සමාගමේ නම යටතේ තවදුරටත් පවතී. 2024 දෙසැම්බර් 31 දිනට හා 2025 මාර්තු 31 දිනට මාරු කිරීමේ ක්‍රියාවලියේ තත්ත්වය පහත පරිදි වේ:

| මූල්‍ය උපකරණ වර්ගය | බැංකුව/ආයතනය | සටහන | 2024 දෙසැම්බර් 31 දිනට රු. '000 | 2025 මාර්තු 31 දිනට නිමකළ රු. '000 | 2025 මාර්තු 31 දිනට ක්‍රියාත්මක රු. '000 | නිමකිරීම % |
|---|---|---|---|---|---|---|
| ලැයිස්තුගත කොටස් | CDS ගිණුම | 01 | **25,605,746** | – | 25,605,746 | – |
| ලැයිස්තුගත ණයකර | CDS ගිණුම | 02 | **38,139,646** | – | 38,139,646 | – |
| ලැයිස්තුගත නොකළ ණයකර | ලංකා බැංකුව | | **6,052,065** | 6,052,065 | – | 100 |
| | DFCC බැංකුව පීඑල්සී | | **1,857,062** | 1,857,062 | – | 100 |
| | මහජන බැංකුව | | **16,206,888** | 16,206,888 | – | 100 |
| | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | **2,858,630** | 2,858,630 | – | 100 |
| වාණිජ පත්‍රිකා | LOLC හෝල්ඩින්ග්ස් පීඑල්සී | | **21,587,539** | 21,587,539 | – | 100 |
| ස්ථිර තැන්පතු | ලංකා බැංකුව | | **2,389,315** | 2,389,315 | – | 100 |
| | මහජන බැංකුව | | **690,277** | 690,277 | – | 100 |
| | DFCC බැංකුව පීඑල්සී | | **1,188,744** | 1,188,744 | – | 100 |
| | ලංකා ඔරික්ස් ලීසින් කම්පැනි පීඑල්සී | | **697,685** | 697,685 | – | 100 |
| | පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්නස් පීඑල්සී | | **2,423,361** | 2,423,361 | – | 100 |
| | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | | **4,624** | 4,624 | – | 100 |
| ඒකක භාර | සිලෝන් ඇසට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | 03 | **2,047,025** | – | 2,047,025 | – |
| | JB ෆිනෑන්නස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | **1,659,009** | – | 1,659,009 | – |
| භාණ්ඩාගාර බැඳුම්කර | ලංකා බැංකුව | | **10,003,697** | – | 10,003,697 | – |
| | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | **460,676** | – | 460,676 | – |
| | මහජන බැංකුව | | **9,679,732** | – | 9,679,732 | – |
| | DFCC බැංකුව පීඑල්සී | | **4,061,209** | – | 4,061,209 | – |
| | හැටන් නැෂනල් බැංකුව පීඑල්සී | | **631,154** | – | 631,154 | – |
| | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | 02 | **33,416,195** | 33,416,195 | – | 100 |
| | සෙලාන් බැංකුව | | **296,451** | – | 296,451 | – |
| | ඇකුයිටි සිකියුරිටීස් | | **4,156,936** | – | 4,156,936 | – |
| | කැපිටල් එලායන්ස් | | **10,225,424** | – | 10,225,424 | – |
| | ෆස්ට් කැපිටල් සිකියුරිටීස් | | **6,425,034** | – | 6,425,034 | – |
| | පෑන් ඒෂියා | | **8,376,155** | – | 8,376,155 | – |
| | වෙල්ත් ට්‍රස්ට් | | **7,575,934** | – | 7,575,934 | – |
| ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | | **10,655,487** | 10,655,487 | – | 100 |

### සටහන 01

සමාගම වර්තමානයේ ලැයිස්තුගත කොටස් සහ ලැයිස්තුගත ණයකරවල පරිපාලන නමේ වෙනස සඳහා ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. ඉල්ලා ඇති සියලුම ලියවිලි විධිමත්ව ඉදිරිපත් කර ඇති අතර, කොමිෂන් සභාවේ විධිමත් අනුමැතිය විගණකගේ වාර්තාවේ දිනයට අපේක්ෂා කරයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

39. වෙන් කිරීම (ඉතිරි කොටස)

**සටහන 02**

සමාගම සියලුම ප්‍රාථමික වෙළෙන්දන් සමඟ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ 15 නියෝගයට අනුකූලව අරමුදල් අතර පදනමක් මත CDS ගිණුම් විවෘත කිරීමට අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. මෙම ක්‍රියාවලිය දැනටමත් එක් මූල්‍ය ආයතනයක් සමඟ (කොමර්ෂල් බැංකුව) සාර්ථකව නිම කර ඇත.

**සටහන 03**

සමාගම ඒකක භාරවල පරිපාලන නමේ වෙනස සකස් කර ගැනීම සඳහා අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී.

වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව, බැංකු ගිණුම්වල නෛතික හිමිකම 2024 පෙබරවාරි 01 දින සිට සමාගම (SLICLL) වෙත මාරු කරන ලදි. තවද, ප්‍රධාන බැංකු ගණනාවක පරිපාලන නම් 2025 මාර්තු 31 දිනට වෙනස් කර ඇති අතර කළමනාකාරිත්වය SLIC වෙතින් පවතින බැංකු ගිණුම්වල පරිපාලන නම් වෙනස් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී.

| බැංකුව | බැංකු ගිණුම් ගණන | 2025 මාර්තු 31 දිනට නිමකළ | නිමකිරීම % |
|---|---|---|---|
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 3 | 2 | 67% |
| මහජන බැංකුව | 5 | 5 | 100% |
| ලංකා බැංකුව | 10 | 10 | 100% |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | 7 | 7 | 100% |
| නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් | 1 | 1 | 100% |
| DFCC බැංකුව | 1 | – | 0% |
| හැටන් නැෂනල් බැංකුව | 4 | – | 0% |
| පැන් ඒෂියා බැංකුව පීඑල්සී | 1 | – | 0% |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 1 | – | 0% |
| සම්පත් බැංකුව | 2 | – | 0% |
| ස්ටෑන්ඩර්ට් චාර්ටඩ් බැංකුව | 2 | – | 0% |
| සෙලාන් බැංකුව | 1 | – | 0% |
| කාගිල්ස් බැංකුව | 2 | – | 0% |
| **එකතුව** | 40 | 25 | |

වෙන් කිරීමට අදාළ පරිපාලන නාමය වෙනස් කිරීම ඇතුළු ඇතැම් පරිපාලනමය කරුණු තවමත් සිදුවෙමින් පවතින බැවින් හා පුළුල් පශ්චාත් වෙන්කිරීමේ ක්‍රියාත්මක කිරීමේ කොටසක් ලෙස විසඳමින් බවතින බැවින් සහ විගණක වාර්තාවේ දිනට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් ලිඛිත ප්‍රතිචාරයක් ලැබීමේ ක්‍රියාවලියක යෙදී සිටින බැවින්, සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් දීර්ඝ කිරීමක් ඉල්ලා ඇත.

වෙන් කිරීම සඳහා SLFRS 3 අවශ්‍යතාවයෙන් ඉවත්වීම

SLFRS 3 – “ව්‍යාපාර සංයෝජන” අනුකූලව, පොදු පාලනය යටතේ ආයතන අතර ගනුදෙනු ප්‍රමිතියෙන් පිටත විශේෂයෙන් විෂයගත කර ඇත. එබැවින්, ගනුදෙනුවට පෙර සහ පසුව පාර්ශ්වය හෝ පාර්ශ්ව විසින් අවසානයේදී පාලනය කරන ආයතන අතර වෙන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වත්කම් හා වගකීම් මාරුකිරීම විෂයපථය බවත් කිරීම යටතේ SLFRS 3 වෙතින් ඉවත් කළ හැකිය.

ඒ අනුව, එවැනි ගනුදෙනු ගනුදෙනුවට පාදක වූ හරය පිළිබිඹුවන විකල්ප ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයෙන් ගිණුම්ගත කෙරේ. මෙම සංදර්භය තුළ, මහාධිකරණය විසින් අනුමත කළ වැඩපිළිවෙල යෝජනා ක්‍රමය තුළ දක්වා ඇති නියමයන් අනුව සහ 2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වගන්තියට අනුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ඉදිරිපත් කිරීම හා අනාවරණය පිළිබඳ මාර්ගෝපදේශ පරිදි, SLICLL මාරුකළ වත්කම් හා වගකීම් හඳුනා ගෙන ඇත. කීර්තිනාම හෝ අත්කර ගැනීම මත ලාභ හඳුනාගෙන නොමැති අතර පොත්වල වටිනාකමේ අඛණ්ඩතාව සහ වාර්තාකරන කාලසීමාවන් තුළ මූල්‍ය තොරතුරුවල ගැලපීම සහතික කරන ලදී.

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 40. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම් යනු වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර දී ඇති දිනය අතර සිදුවන හිතකර සහ අහිතකර සිදුවීම් වේ.

2024 දෙසැම්බර් 31 දිනෙන් පසුව, ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩල සංයුතියේ පහත වෙනස්කම් සිදු විය.

1. නිශාන්ත දයානන්ද මහතා, 2025 ජනවාරි 01 දින සිට ඉල්ලා අස්විය
2. අනිල් කොස්වත්ත මහතා, 2025 ජනවාරි 02 දින සිට ඉල්ලා අස්විය

තවද, 2025 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දැනට සිටින අධ්‍යක්ෂවරුන්ට අමතරව, සාංගමික ව්‍යවස්ථාවලිය සහ 2007 අංක 07 දරන සමාගම් පනත අනුව පහත පුද්ගලයින් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

1. ආර්. පී බුල්ජන්ස් මහතා
2. ආර්. ධර්මේන්ද්‍ර මහතා
3. එන්. ඩී. බී. උනන්බුව මහතා ජනාධිපති නීතිඥ

පහත අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරි වාර්ෂික මහ සභා රැස්වීම දක්වා නිලයන් දරනු ලබන අතර, සාංගමික ව්‍යවස්ථාවලියේ නියමයන් අනුව නැවත තෝරාගැනීම සඳහා සුදුසුකම් ලබයි.

| අධ්‍යක්ෂගේ නම | පත්වීම් දිනය |
|---|---|
| නුසිත් කුමාරතුංග මහතා | 2024 ඔක්තෝබර් 23 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා | 2023 ඔක්තෝබර් 06 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා | 2023 ජනවාරි 06 |
| ආර්. පී. බුල්ජන්ස් මහතා | 2025 ජනවාරි 01 |
| ආර්. ධර්මේන්ද්‍ර මහතා | 2025 ජනවාරි 01 |
| එන්. ඩී. බී. උනන්බුව මහතා ජනාධිපති නීතිඥ, | 2025 ජනවාරි 01 |

මෙම වෙනස්වීම්වලින් ශේෂ පත්‍රයේ දිනයට සමාගමේ මූල්‍ය තත්ත්වය කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇතැයි අපේක්ෂා කරනු නොලැබේ.

# 165

# අතිරේක තොරතුරු


166 ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් ආදායම් ප්‍රකාශය

167 ඔප්පුහිමියන්ගේ අරමුදලේ මූල්‍ය කාර්යසාධනය

168 අතිරේක මූල්‍ය තත්ත්වය ප්‍රකාශය – ඔප්පුහිමියන්ගේ

169 අරමුදල් අනුව ආයෝජන ආදායම

170 දස වසරක ආදායම් ප්‍රකාශන සාරාංශය

172 ශාඛා ජාලය

178 ආයතනික තොරතුරු

179 වාර්ෂික මහා සභා රැස්වීමේ නිවේදනය

# ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් ආදායම් ප්‍රකාශය

| | ව්‍යවස්ථාපිත වාර්තාකරණ අරමුණ | | කාර්යසාධන වාර්තාකරණ අරමුණ |
|---|---|---|---|
